(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மருத்துவர்கள் இன்மையால் நாடுபூராவும் பல கிராமிய வைத்தியசாலைகள் மூடப்பட்டுள்ளன என்பதையும்;

(ii) வைத்தியசாலைகளில் மருத்துவர்களின் பற்றாக் குறை நிலவுகின்ற சந்தர்ப்பத்தில், சுகாதார அமைச்சின் சில பதவிகளுக்கு பட்டப்பின் படிப்பு பட்டதாரி மருத்துவர்கள் நியமிக்கப்பட்டுள் ளார்கள் என்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) தற்போது மருத்துவர்கள் நியமிக்கப்பட்டுள்ள, அமைச்சின் மருத்துவம் சாராத பதவிகளுக்கு, தகைமையுடைய உத்தியோகத்தர்களை ஆட்சேர்க்காதிருப்பதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(ii) அமைச்சினுள் ஏனைய பதவிகளை வகிக்கின்ற மருத்துவர்களை, வைத்தியசாலைகளில் நிலவு கின்ற மருத்துவர்களுக்கான வெற்றிடங்களுக்கு நியமிப்பதற்கு நடவடிக்கை மேற்கொள்வாரா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Is he aware that -

(i) a number of rural hospitals across the country have been closed down due to the absence of doctors; and

(ii) postgraduate doctors have been appointed to certain posts of the Ministry of Health at a time a shortage of doctors exists in hospitals?

(b) Will he inform this House -

(i) the reasons for not recruiting a group of qualified officials for the other posts of the Ministry for which doctors have been appointed by now; and

(ii) whether action will be taken to appoint the group of doctors who are holding other posts in the Ministry to fill the existing vacancies of doctors in hospitals?

(c) If not, why ?

**ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)

(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) වෛද්‍යවරුන් නොමැති හේතුව මත කිසිදු ග්‍රාමීය රෝහලක් වසා නොමැත.

(ii) සෞඛ්‍ය අමාත්‍යාංශ පරිශ්‍රය තුළ අත්‍යවශ්‍ය වෛද්‍යමය රාජකාරි සඳහා පශ්චාත් උපාධිධාරී වෛද්‍යවරුන් පත් කොට ඇත. මෙම වෛද්‍යවරු පහත සඳහන් සායනික නොවන පශ්චාත් වෛද්‍ය විද්‍යා උපාධිධාරීහු වෙති.

වෛද්‍ය විශාරද වෛද්‍ය පරිපාලනය

වෛද්‍ය විශාරද ප්‍රජා සෞඛ්‍ය/ප්‍රජා දන්ත සෞඛ්‍ය

විද්‍යාපති වෛද්‍ය පරිපාලනය

විද්‍යාපති ප්‍රජා සෞඛ්‍ය/ප්‍රජා දන්ත සෞඛ්‍ය

විද්‍යාපති සෞඛ්‍ය තොරතුරුවේදය

(ආ) (i) සෞඛ්‍ය අමාත්‍යාංශය තුළ වෛද්‍යමය නොවන තනතුරු සඳහා වෛද්‍යවරුන් බඳවාගෙන නොමැත. සෞඛ්‍ය අමාත්‍යාංශ පරිශ්‍රය තුළ සේවය කරන වෛද්‍යවරුන් අමාත්‍යාංශයේ යන්ත්‍රණය තුළ සායනික නොවන අත්‍යවශ්‍ය රාජකාරි වගකීමක් ඉටු කරනු ලබන අතර, ඒ සඳහා වෛද්‍යමය පසු බිමක් අත්‍යවශ්‍යය. එබැවින් ඔවුන්ගේ රාජකාරි අන් නිලධාරීන් මඟින් ආවරණය කළ නොහැක.

(ii) සෞඛ්‍ය අමාත්‍යාංශය තුළ වෛද්‍යවරුන් වෙනත් නිලතල නොදරන බැවින් අදාළ නොවේ.

(ඇ) පැන නොනඟී.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**

(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)

(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි,සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිලතල දරන වෛද්‍යවරු 104 දෙනෙක් ඉන්නවා. අපේ රටේ ජන ගහනයෙන් ලක්ෂයකට ඉන්නේ වෛද්‍යවරු 71 දෙනායි. වෛද්‍යවරුන්ගේ හිඟයක් තිබෙද්දී, සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිල තල දරන වෛද්‍යවරු 104 දෙනෙක් ඉන්නවා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම මා දන්නා විධියට සෞඛ්‍ය අමාත්‍යතුමා ලේකම්තුමාට නියෝගයක් දුන්නා මේ ප්‍රමාණය සියයට 50කින් අඩු කරන්න කියලා. නමුත් මේ වන තුරු ඒ අඩු කිරීම කරලා නැහැ. සෞඛ්‍ය අමාත්‍යතුමා නියෝගයක් දීලා තියෙද්දීත් ඒ ප්‍රමාණය අඩු කරලා නැත්තේ ඇයි? පරිපාලන කටයුතු කරන්න මේ තරම් පිරිසක් ඇයි සෞඛ්‍ය අමාත්‍යාංශයේ රඳවාගෙන ඉන්නේ?

**ගරු ලලිත් දිසානායක මහතා**

(மாண்புமிகு லலித் திசாநாயக்க)

(The Hon. Lalith Dissanayake )

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ නැඟෙනහිර ප්‍රදේශය ඇතුළු ඒ ප්‍රදේශවල සෞඛ්‍ය මධ්‍යස්ථාන 140ක් පමණ තිබුණා. යුද්ධය අවසන් වීමත් එක්කම වසා දමා තිබුණු ඒ සියල්ලටම අපි වෛද්‍යවරුන් ලබා දුන්නා. ඉතින් මේ මන්ත්‍රීතුමා කියන වෛද්‍යවරුන් යම් කිසි රාජකාරියක යෙදී සිටිනවා නම්, අවශ්‍ය රාජකාරියක තමයි ඔවුන් යෙදී සිටින්නේ.

එම වෛද්‍යවරුන් නිසා අනෙකුත් රෝහල්වල වෛද්‍ය හිඟයක් ඇති වන්නේ නැහැ. රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය, රාජකාරි අවශ්‍යතාව මත තමයි ඔවුන් ලබා දීලා තිබෙන්නේ. සෞඛ්‍ය අමාත්‍යාංශයට රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සේවයත් නිලධාරිමය කටයුතුවලදී අවශ්‍ය වනවා. අනවශ්‍ය ලෙස වෛද්‍යවරුන් එහෙම සේවයේ යොදවලා නැහැ.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, කොටින්ම කියනවා නම් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ පිළිගැනීමේ නිලධාරියා වශයෙන් ඉන්නේත් වෛද්‍යවරයෙක්. ජනගහනයෙන් ලක්ෂයකට වෛද්‍යවරු 71 දෙනායි ඉන්නේ. අපට වාර්තා වෙලා තිබෙන කරුණු අනුව බොහෝ රෝහල්වල වෛද්‍යවරුන්ගේ හිඟයක් තිබෙනවා. මා එක උදාහරණයක් වශයෙන් කියන්නම්. කරාපිටිය රෝහලේ ළමා හදිසි අනතුරු අංශයේ දැඩි සත්කාර ඒකකයේ ඇඳන් හතරයි තිබෙන්නේ. එතැන වෛද්‍යවරුන් හතර දෙනෙක් ඉන්නවා. ඇඳන් හතරයි තිබෙන්නේ, ළමා විශේෂඥ වෛද්‍යවරුන් හතර දෙනෙක් එතැන ඉන්නවා. ඒ නිසා මේ සම්බන්ධ කළමනාකරණයක් කිරීමට අවශ්‍ය කටයුතු කරන්නේද කියලා මා ඔබතුමාගෙන් අහනවා.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු කථානායකතුමනි, වෛද්‍යවරුන්ගේ ස්ථාන මාරුවීම් රජයේ වෛද්‍ය නිලධාරි සංගමයෙන් කෙරෙන වෘත්තීමය දැනුම් දීමක් අනුව තමයි කෙරෙන්නේ. ඒකෙන් අපේ අමාත්‍යාංශයට ලොකු බලපෑමකුත් නැහැ. ඒ නිසා අපේ අමාත්‍යාංශයේ හිතුමතයට වෛද්‍යවරුන් සේවයේ යොදවන්න බැහැ. ඒ සංගමයේ ක්‍රමවේදයක් තිබෙනවා. ඒ අනුව තමයි වෛද්‍යවරුන් සේවා ස්ථානවලට යොමු කරන්නේ. තමුන්නාන්සේ ඔහොම කිව්වාට කරාපිටිය රෝහලට වැරදි විධියට -අනවශ්‍ය විධියට -පත් කිරීම් කරලා නැහැ.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, කරාපිටිය ළමා වාට්ටුවේ වෛද්‍යවරු හතර දෙනෙක් තියන්න පුළුවන්ද?

ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය. මම මීට පෙරත් නියෝජ්‍ය ඇමතිතුමාගෙන් ඇහුවා, හෘදය සැත්කම්වලට - heart surgeries - අදාළව තිබෙන waiting list එක ගැන. ඒ සම්බන්ධයෙන් මේ වන තෙක් කරලා තිබෙන්නේ මොනවාද?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු කථානායකතුමනි, මේ සඳහා විශේෂඥ වෛද්‍යවරු ශල්‍ය වෛද්‍ය විශේෂඥ හැටියට පුහුණු වෙන්න ඕනෑ. ඒ සඳහා කාලයක් ගත වෙනවා. සමහර විෂයන්වලට ගත වන කාලයත්, වෛද්‍ය විද්‍යාලයෙන් පිට වුණාට පසුව කැප කළ යුතු කාලයත් ගත්තාම ඒක දිග කාලයක්. විශේෂයෙන්ම මොළය සම්බන්ධයෙන් ගත්තොත් ඒ සම්බන්ධයෙන් ඉන්නේ විශේෂඥ වෛද්‍යවරුන් ටික දෙනයි. ඒ සඳහා ඔවුන්ගේ සම්පූර්ණ කාලයම කැප කරන්න ඕනෑ. එහෙම අය බිහි වෙන්න කාලයක් යනවා. නමුත් දැන් වකුගඩු අංශයේ පෝලිමක් නැහැ. ඒ කටයුතු කර ගෙන යනවා. අමාත්‍යාංශය හැටියට අපි හෘදය රෝග අංශයටත් අවශ්‍ය දේවල් දීලා තිබෙනවා. වෛද්‍යවරු ඉදිරිපත් වෙලා ශල්‍ය වෛද්‍යවරු හැටියට පුහුණු වෙන්න ඕනෑ. අපි වෛද්‍යවරුන්ට ඒ සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීලා තිබෙනවා. ඒ වෛද්‍යවරුන්ගේ හිඟය තමයි මේ පෝලිම ඇති වෙන්න හේතුව. පිට රටින් වෛද්‍යවරු ගෙන්වලා මේ සැත්කම් කරන්න ගියොත්, ඒක හරියන දෙයක් නොවෙයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 10 -3164/12'-(1), ගරු පාලිත තෙවරප්පෙරුම මහතා.

**ගරු පාලිත තෙවරප්පෙරුම මහතා**
(மாண்புமிகு பாலித தெவரப்பெரும)
(The Hon. Palitha Tewarapperuma)
ගරු කථානායකතුමනි, ඒ ප්‍රශ්නය මම අහනවා.

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා (පළාත් පාලන හා පළාත් සභා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க - உள்ளூராட்சி, மாகாண சபைகள் பிரதி அமைச்சர்)
(The Hon. Indika Bandaranayake - Deputy Minister of Local Government and Provincial Councils)
ගරු කථානායකතුමනි, මම පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## අම්බලන්ගොඩ තානායම : නැවත ඉදිකිරීම
## அம்பலாங்கொடை வாடிவீடு : மீள்நிர்மாணம்
## AMBALANGODA REST HOUSE : RECONSTRUCTION

1886/'11

**11. ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) ගාල්ල දිස්ත්‍රික්කයේ, අම්බලන්ගොඩ තානායමට අයත් ගොඩනැගිලි කඩා දමා යළි ඉදිකිරීමට මුල්ගල් තබා වර්ෂ දෙකකට වැඩි කාලයක් ගත වී ඇතත්, මේ දක්වා එම ඉදිකිරීම් කටයුතු ආරම්භකර නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම තානායම නැවත ඉදිකිරීමේ කටයුතු අතරමග නවතා දැමීමට හේතු කවරේද;

(ii) එම ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iii) එසේ නම්, වෙන් කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) අම්බලන්ගොඩ නගර සභාව සතු මෙම ගොඩනැගිලි කඩා දැමීමට රුහුණු සංචාරක කාර්යාලයට බලය හිමි වූයේ කෙසේද;

(ii) එම ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවදාද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු බුද්ධික පතිරණ මහතා]

உள்ளூராட்சி, மாகாண சபைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) காலி மாவட்டத்தின் அம்பலாங்கொடை வாடி வீட்டுக்குச் சொந்தமான கட்டிடங்களை உடைத்த கற்றி மீள நிர்மாணிப்பதற்காக அடிக்கல் நாட்டப்பட்டு இரண்டு வருடங்களுக்கு மேல் கடந்திருந்தும், இற்றைவரை மேற்படி நிர்மாணப் பணிகள் ஆரம்பிக்கப் படவில்லை என்பதை அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி வாடிவீட்டினை மீள நிர்மாணிக்கும் பணிகள் இடைநடுவில் நிறுத்தப்பட்டமைக்கான காரணம் யாதென்பதையும்,

(ii) மேற்படி நிர்மாணப் பணிகளுக்கு நிதி ஏற்பாடுகள் ஒதுக்கப்பட்டுள்ளதா என்பதையும்,

(iii) ஆமெனில், ஒதுக்கப்பட்டுள்ள பணத்தொகை யாதென்பதையும்,

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) அம்பலாங்கொடை நகர சபைக்கு சொந்தமான மேற்படி கட்டிடங்களை உடைப்பதற்கு ருகுணு உல்லாசப் பிரயாணக் காரியாலயத்திற்கு எவ்வாறு அதிகாரம் கிடைத்ததென்பதையும்,

(ii) மேற்படி நிர்மாணப் பணிகள் மீள ஆரம்பிக் கப்படுமா என்பதையும்,

(iii) ஆமெனில், அது எப்போதென்பதையும், அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Local Government and Provincial Councils:

(a) Is he aware that although a period of more than two years have elapsed since the foundation stone was laid for the reconstruction of the Ambalangoda Rest House in Galle District after its buildings had been demolished, the aforesaid construction work has not yet been commenced?

(b) Will he inform this House -

(i) of the reasons for stopping the reconstruction work of the aforesaid rest house halfway;

(ii) whether allocations have been made for the aforesaid construction; and

(iii) if so, the amount of money that has been allocated?

(c) Will he also inform this House -

(i) as to how the Ruhunu Tourist Office got powers to demolish the aforesaid buildings which belong to the Ambalangoda Urban Council;

(ii) whether the aforesaid construction work will be recommenced; and

(iii) if so, the date on which it will be done?

(d) If not, why?

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)

ගරු කථානායකතුමනි, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් මම ඒ ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) ඔව්.

(ආ) (i) රුහුණු සංචාරක කාර්යාංශය මඟින් 2009 ජූලි 28 දින මුල් ගල තබා ආරම්භ කළ අම්බලන්ගොඩ තානායම් ගොඩනැඟිල්ලේ වැඩ කටයුතු මූල්‍ය ප්‍රතිපාදන නොලැබීම මත අතරමඟ නතර වී ඇත.

(ii) නැත.

(iii) පැන නොනඟී.

(ඇ) (i) නාගරික සංවර්ධන අධිකාරියේ වැඩ බලන සභාපතිගේ 2008.03.28 දිනැති ලිපිය මඟින් අම්බලන්ගොඩ තානායම ප්‍රතිසංස්කරණය කිරීම, පවත්වා ගෙන යාම හා නඩත්තු කිරීම පිණිස දකුණු පළාත් සභාව වෙත පැවරීමට එම ආයතනයේ කළමනාකරණ රැස්වීමේදී තීරණය කර ඇති බව ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙත දැනුම් දී ඇත. ඒ අනුව එහි කළමනාකාරිත්වයේ අයිතිය තවදුරටත් නාගරික සංවර්ධන අධිකාරිය සතුව තබා ගැනීමේ අරමුණින් ගිවිසුමක් අත්සන් කිරීමට යටත්ව 2008.06.09 දින එහි කායික බුක්තිය දකුණු පළාත් සභාවේ රුහුණු කාර්යාංශය වෙත නාගරික සංවර්ධන අධිකාරිය විසින් පවරා ඇත.

(ii) රුහුණු සංචාරක කාර්යාංශයට පවරා ගන්නා ලද අම්බලන්ගොඩ තානායම නැවත දකුණු පළාත් අමාත්‍ය මණ්ඩල තීරණ අංක 608:5 අනුව රුහුණු සංචාරක කාර්යාංශය විසින් නැවත අම්බලන්ගොඩ නගර සභාව වෙත පවරා දීමට අනුමත කර ඇත. ඒ අනුව අම්බලන්ගොඩ නගර සභාව විසින් නැවත ටෙන්ඩර් කැඳවා සුදුසු ආයෝජකයකු තෝරාගෙන ඇති අතර ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතව ඇත.

(iii) ගිවිසුම් අත්සන් කළ වහාම

(ඈ) පැන නොනඟී.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමා මුලින්ම සඳහන් කළා, 2009 වසරේ මෙය ඉදි කරන්න මුල් ගල් තිබ්බා කියලා. ඊළඟට කිව්වා, ප්‍රතිපාදන නැහැ කියලා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

එතුමා කියාපු දේ නැවත නැවත කියන්න එපා. ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මා අහන්න කැමැතියි, ප්‍රතිපාදන නැත්නම් මුල් ගල් තියලා වැඩ පටන් ගත්තේ ඇයි කියලා.

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)
ගරු කථානායකතුමනි, මේකට අවශ්‍ය කරන මුල්‍ය ප්‍රතිපාදන මුදල් කොමිෂන් සභාවෙන් වෙන් කර නැහැ කියා දන්වපු නිසා ඒ වැඩ කටයුතු නතර කරන්න තීරණය කර තිබෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මුදල් නැහැ කියා මුදල් කොමිසමෙන් කියන්න කලින් මුල් ගල තිබ්බේ ඇයි? මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් අහන්නේ එයයි.

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)
ගරු කථානායකතුමනි, අපි මේ තොරතුරු ගන්නේ පළාත් සභාවෙනුයි. නැවත වතාවක් තොරතුරු ලබා ගෙන තමයි ඒ පිළිබඳව අපට දන්වන්න වෙලා තිබෙන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් තුන් වන අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
පළමු වන අතුරු ප්‍රශ්නය තමයි මම දෙවතාවක් ඇහුවේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙම අහන්න බැහැ. තුන් වන අතුරු ප්‍රශ්නය අහන්න. [බාධා කිරීමක්] දැන් තුන් වන අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
හොඳයි. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, දැන් මුදල් ප්‍රතිපාදන ලැබී තිබෙනවාද, ඉදි කිරීම් ආරම්භ කරන දවස කවදාද කියා මා අහනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ලැබී තිබෙනවාද කියා ඇහුවාම ඇති. එක ප්‍රශ්නයයි නේ අහන්නේ.

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)
ගරු කථානායකතුමනි, රුහුණු සංචාරක කාර්යාංශයට පවරා ගන්නා ලද අම්බලන්ගොඩ තානායම තිබුණු භූමිය දකුණු පළාත් අමාත්‍ය මණ්ඩල තීරණ අංක 608:5 අනුව රුහුණු සංචාරක කාර්යාංශය විසින් මේ දක්වා දරන ලද වියදම අය කර ගැනීමට යටත්ව නැවත අම්බලන්ගොඩ නගර සභාව වෙත පවරා දීමට දකුණු පළාත් අමාත්‍ය කාර්ය මණ්ඩලය විසින් අනුමත කර ඇත. රුහුණු සංචාරක කාර්යාංශය මේ දක්වා වියදම් කරන ලද රුපියල් පනස් ලක්ෂ හතළිස් හයදහස් විසිපහක මුදල අම්බලන්ගොඩ නගර සභාව මඟින් රුහුණු සංචාරක කාර්යාංශයට ගෙවීමට හැකියාවක් නොමැති බව අංක අ5/ නස/02/05(1) හා 2012.10.10 දිනැති ලිපිය මඟින් රුහුණු සංචාරක කාර්යාංශය වෙත දන්වා ඇත. අම්බලන්ගොඩ නගර සභාව විසින් තානායම් භූමියේ හෝටල් සංකීර්ණයක් ඉදි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. ඒ සඳහා පුද්ගලික ආයෝජකයන්ගෙන් අයදුම් පත් කැඳවීම සඳහා පුවත් පත් දැන්වීමක්ද පළ කර ඇත.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
දැන් තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්නද, ගරු කථානායකතුමනි?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පොඩ්ඩක් ඉන්න බලන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
අද න්‍යාය පත්‍රයේ මගේ ප්‍රශ්න දෙකයි නේ තිබෙන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඉස්සරහට ප්‍රශ්න දෙකම තමයි තිබෙන්නේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. දැන් මෙතුමා මේ ප්‍රශ්නයට දුන්න පිළිතුරු ඔක්කොම වැල්වටාරම් වාගේ වචේ කථා. මුලින්ම ගරු නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා සල්ලි නැහැයි කියලා. දැන් කියනවා, පණස් ලක්ෂයක් වියදම් කර තිබෙනවාය කියලා. එතකොට පණස් ලක්ෂයක් වියදම් කරන්න සල්ලි තිබුණේ කොහෙන්ද?

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)
ගරු කථානායකතුමනි, මේවා මුදලින් විතරක් වෙන් කරපුවා නොවෙයි. රුහුණු සංචාරක කාර්යාංශය මඟින් ඒ සඳහා වියදම් කළ මුදල්. මේවා මුදලින් විතරක් වෙන් කරපුවා නොවෙයි, නඩත්තු කටයුතු ඇතුළුව ඒ උදවිය ඒ කාලය තුළදී වියදම් කරපු මුදල් මේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. කඩලා දමලා හුඟක් කල්. ඒ ගැනත් බලන්න.

## 2018 පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල : සත්කාරකත්වය

பொதுநலவாய நாடுகளின் விளையாட்டு விழா 2018 : அனுசரணை உரிமை

COMMONWEALTH GAMES 2018 : SPONSORSHIP

2133/'11

**12.** **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3) :

(අ) (i) 2018 පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල ශ්‍රී ලංකාවට ලබා ගැනීම වෙනුවෙන් වියදම් කළ මුදල සපයා ගත් ආකාරය කවරේද;

(ii) එකී වියදම් සිදු කළ අයිතමයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත තරඟාවලියේ සත්කාරකත්වය ශ්‍රී ලංකාවට ලබා ගැනීම සඳහා සිදු කළ වියදම් හේතුවෙන් මෙරටට ප්‍රතිලාභයක් ලැබුණේද;

(ii) එසේ නම්, එම ප්‍රතිලාභ කවරේද;

(iii) එම ක්‍රීඩා උළෙල ශ්‍රී ලංකාවට ලබා ගැනීම සඳහා කටයුතු කළ කමිටුවේ සාමාජිකයින් සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් සාමාජිකයාගේ නම, තනතුර සහ ඒ සඳහා ඇති සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

விளையாட்டுத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2018 பொதுநலவாய நாடுகளின் விளையாட்டு விழாவை இலங்கை பெற்றுக்கொள்வதற்காக செலவிடப்பட்ட பணத்தொகை எவ்விதம் திரட்டப்பட்டதென்பதையும்;

(ii) மேற்படி செலவுகள் மேற்கொள்ளப்பட்ட விடயங்கள் தனித்தனியாக யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மேற்படி போட்டியின் அனுசரணை உரிமையை இலங்கைக்கு பெற்றுக்கொள்வதற்காக மேற்கொள்ளப்பட்டட செலவின் காரணமாக இந்நாட்டுக்கு பயன்கள் கிடைத்தனவா என்பதையும்;

(ii) ஆமெனின், கிடைத்த அத்தகைய பயன்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி விளையாட்டு விழாவை இலங்கை பெற்றுக்கொள்வதற்காக செயலாற்றிய குழுவின் அங்கத்தவர் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(iv) மேற்படி ஒவ்வொரு அங்கத்தவரினதும் பெயர், பதவி மற்றும் அதற்கான தகைமைகள் தனித்தனியே யாவை என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Sports:

(a) Will he state -

(i) the manner in which the amount of money spent to get the opportunity to host the Commonwealth Games - 2018 in Sri Lanka, was obtained; and

(ii) separately, the items on which the above expenses were made?

(b) Will he inform this House -

(i) whether Sri Lanka has received any benefit as a result of the expenses made to get the opportunity to host the aforesaid games in our country;

(ii) if so, the benefits gained;

(iii) the number of members in the Committee which took action to get the opportunity to host the aforesaid games in Sri Lanka; and

(iv) separately, the name, designation and relevant qualifications of each of the aforesaid members?

(c) If not, why?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) මුළු ආයෝජනයෙන් යම් ප්‍රතිශතයක් රජයෙන්ද හා ඉතිරිය පෞද්ගලික අංශයෙන්ද ප්‍රතිපාදන සපයා ගෙන ඇත.

පෞද්ගලික අංශයේ මැදිහත්වීම භෞතික හා මූල්‍යමය වශයෙන් අංශ දෙකකින් සිදු විය. භෞතිකව පෞද්ගලික අංශයේ ව්‍යාපාරිකයින්, ඉහළ මට්ටමේ ක්‍රීඩකයින්, ගායනයෙන්, නර්තන ශිල්පීන්, කලාකරුවන්, මාධ්‍යකරුවන්, වෛද්‍ය කාර්ය මණ්ඩලය, ක්‍රීඩා පරිපාලකයින්, පරිගණක විශේෂඥයින්, බැංකු කරුවන්, අපනයන ආනයනකරුවන් සහාය ලබා දී ඇත.

මූල්‍යමය වශයෙන් සෘජු මූල්‍ය සහායන් ගෘහ නිර්මාණ සේවා, නවාතැන් පහසුකම්, ගමන් පහසුකම් සහ පරිගණක, විදුලි සන්දේශ යන සේවා සැපයීමේදී නොමිලේ සහ අඩු මිලට ලබා දී ඇත.

(ii) ලංසු පත්‍රිකාව සකස් කිරීමේ කාර්යයේ යෙදුණු පී.එම්.සී. ලෙගසි සමාගම සඳහා

| | රුපියල් මිලියන |
|---|---|
| වෘත්තිමය සේවය | 331,354,502 |
| ගුවන් ටිකට්පත් සඳහා | 4,037,988 |
| නවාතැන් සහ අනිකුත් වියදම් | 2,959,072 |
| | 338,357,562 |

විශේෂ පර්යේෂණ කටයුතු සඳහා

| | රුපියල් මිලියන |
|---|---|
| නාගරික සංවර්ධන අධිකාරිය | 2,966,786 |
| ද නිල්සන් සමාගම | 1,313,760 |
| කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව | 61,000 |
| මුද්‍රණය කිරීමේ වියදම් | 3,064,500 |
| | 345,757,608 |

(ආ) (i) ඔව්.

(ii) 2018 පොදු රාජ්‍ය මණ්ඩලයීය ක්‍රීඩා උළෙල ශ්‍රී ලංකාවට ලබා ගැනීම අරමුණු කොට ලන්සු පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමේදී ඉහත සඳහන් වියදම් දැරීමට අනිවාර්යයෙන්ම සිදු වේ. එම ලන්සුව ශ්‍රී ලංකාවට නොලැබුණු බැවින් 2018 පොදු රාජ්‍ය මණ්ඩලයීය ක්‍රීඩා උළෙල ශ්‍රී ලංකාවේ පැවැත්වීමට තිබූ අවස්ථාව අහිමි විය.

(iii) සාමාජික සංඛ්‍යාව 04කි.

(iv)

| | නම | තනතුර සහ සුදුසුකම් |
|---|---|---|
| 01 | ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා | ක්‍රීඩා අමාත්‍ය |
| 02 | අජිත් නිවාඩ් කබ්රාල් මැතිතුමා | ශ්‍රී ලංකා මහ බැංකු අධිපති |
| 03 | ගරු නාමල් රාජපක්ෂ මැතිතුමා | පාර්ලිමේන්තු මන්ත්‍රී - හම්බන්තොට |
| 04 | ගරු ඩිලාන් පෙරේරා මැතිතුමා | විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබ සාධන අමාත්‍යතුමා සහ වොලිබෝල් සංගමයේ සභාපති |

(ඇ) පැන නොනඟී.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු ඇමතිතුමනි, 2018 පොදු රාජ්‍ය මණ්ඩලයීය ක්‍රීඩා උළෙලේ ලංසු තැබීමේ ලියවිල්ලට කීයක් වැය වුණාද කියලා ඔබතුමාට කියන්න පුළුවන්ද?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඒක මේ වෙලාවේ කියන්න අමාරුයි ගරු මන්ත්‍රීතුමා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ලංසුව සඳහා රුපියල් මිලියන 400ක් කියලා තමයි මේකේ සඳහන් වෙලා තිබෙන්නේ. අනෙක් වියදම අත හැරලා මම කිව්වේ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මට මේ වෙලාවේ ඒක හරියටම කියන්න අමාරුයි ගරු මන්ත්‍රීතුමා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමා ඒ කමිටුවේ සභාපතිතුමාද?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔව්, මම තමයි ඒ කමිටුවේ සභාපතිතුමා. නමුත් ඒකේ මූල්‍ය කටයුතු මහ බැංකු අධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් තමයි සිදු කෙරුණේ. තරගාවලිය සංවිධානය කිරීමේ කටයුත්ත තමයි එහිදී අපි කළේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මා ළඟ තිබෙන මේ පුවත් පත් ලිපියේ, ඒ කමිටුවේ සභාපතිතුමා විධියට සඳහන් කරලා තිබෙන්නේ අජිත් නිවාඩ් කබ්රාල් මහත්මයාගේ නම. ඒකයි මම මේ කියන්නේ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
නැහැ, සභාපතිතුමා හැටියට මමයි කටයුතු කළේ. එහි මූල්‍ය කටයුතු පිළිබඳ සභාපති විධියට කටයුතු කළේ එතුමා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
2011 වර්ෂයේ "ලංකාදීප" පත්‍රයක පළ කරලා තිබෙනවා,-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නය, ප්‍රශ්නය අහන්න. කථාවක් කරන්න බැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒක තමයි මම අහන්නේ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔය කීවැනි ප්‍රශ්නයද? ඔබතුමා දැන් අතුරු ප්‍රශ්න දෙකක් ඇහුවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
2018 පොදු රාජ්‍ය මණ්ඩලයීය ක්‍රීඩා උළෙලේ සංවිධායක කමිටුවේ සභාපති සහ මහ බැංකුවේ අධිපති කියලා තමයි සඳහන් කරලා තිබෙන්නේ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔය දෙවැනි අතුරු ප්‍රශ්නය නේද ඇහුවේ?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ, පළමුවැනි  අතුරු ප්‍රශ්නයට ඔබතුමා කිව්ව එකට,-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නැහැ, නැහැ, එහෙම බැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එහෙම බැහැ නේද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙම බැහැනේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
හොඳයි.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு  மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
දැන් තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
සභාපතිතුමා කවුද කියලා හොයා ගන්න බැරුවයි මම මේ දඟලන්නේ. [බාධා කිරීමක්] ගරු කථානායකතුමනි, මෙතුමා කියනවා "මම" කියලා. අජිත් නිවාඩ් කබ්රාල් මහත්මයා කියනවා එතුමා කියලා.

ලංසුවේ ගණන කීයද ඇහුවාම කමිටුවේ සභාපතිතුමා ඒක දන්නේ නැහැ. සභාපතිතුමා ඒක දැන ගන්න ඕනෑ නේ. එහෙම නම් මම නිවාඩ් කබ්රාල් මහත්මයාගෙන් ඒ ගැන අහන්නම්.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு  மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔය කී වෙනි අතුරු ප්‍රශ්නයද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේවා අදාළ පළමුවෙනි අතුරු ප්‍රශ්නයටම තමයි.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு  மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
නැහැ, මේ දෙවෙනි අතුරු ප්‍රශ්නය. ගරු මන්ත්‍රීතුමා, මම ඔබතුමාට පැහැදිලිවම කිව්වා මේ කමිටුවේ මූලා කටයුතු සම්බන්ධයෙන් සිටියේ නිවාඩ් කබ්රාල් මහත්මයා කියලා. එතුමා තමයි ඒ සියලු කටයුතු කළේ. ඔබතුමා ප්‍රශ්නයක් හැටියට ලංසුවේ ගණන විතරක් ඇහුවා නම් මම ඒ ප්‍රශ්නයට අද උත්තරය දෙනවා. ඔබතුමා මගෙන් අහන්නේ අවුරුදු 2කට පෙර වුණ සිද්ධියක් ගැන. ඔබතුමා මගෙන් මේ පිළිබඳව වෙනම ප්‍රශ්නයක් ඇහුවොත්, -ඕනෑ නම්- ඔබතුමාට වෙනම පාර්ලිමේන්තුවේදී පිළිතුරක් දෙන්නම්. දැන් අවසාන අතුරු ප්‍රශ්නය අහන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අවසාන අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, ඔබතුමා කියන නිසා මම එහෙම කරන්නම්. 2018 පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල ශ්‍රී ලංකාවට ලබා ගැනීම සඳහා කටයුතු කළ කමිටුවේ හිටපු සභාපතිතුමා විධියට මුදල් මෙපමණයි කියලා දැන ගන්න ඕනෑ නේ. සභාපතිවරයා දන්නවා මෙපමණ මුදල් ප්‍රමාණයක් ගියා කියලා. අවුරුදු කීයක් ගියත් ඔබතුමාට එහෙම අමතක වුණා කියලා කියන්න බැහැ. ඔබතුමා දක්ෂ ඇමතිවරයෙක් නේ. ඒ නිසා රුපියල් මිලියන 400ක් මේ ලංසුවට ගියා කියලා සභාපතිවරයා විධියට ඔබතුමා පිළිගන්නවාද?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு  மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමා, මට හරියටම සංඛ්‍යාව කියන්න අමාරුයි. නමුත් මේක ජාත්‍යන්තර තරගයකට ලංසු ඉදිරිපත් කිරීමක්. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තරගාවලියකට නොවෙයි මේ ලංසු ඉදිරිපත් කළේ. ලෝකයේ රටවල් විශාල ප්‍රමාණයක් ඡන්දය දෙන, ජාත්‍යන්තර තරගාවලියක්. එවැනි ක්‍රීඩා තරගයක් සඳහා ලංසු ඉදිරිපත් කිරීමේදී ලංසු ඉදිරිපත් කිරීමට පිළිගත් කෙනෙක් සොයන්නට ඕනෑ. අපි ඒ සඳහා යොදා ගත්තේ ජාත්‍යන්තර අත් දැකීම් තිබෙන සමාගමක්. ඒ සඳහා යම් මුදලක් වැය කළා. මම මේ සම්බන්ධයෙන් වැය වූ සියලුම මුදල් සම්බන්ධයෙන් කලින්, පාර්ලිමේන්තුවේදී උත්තර දීලා තිබෙනවා. ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා මගෙන් ඇහුවා. කොපමණ මුදලක් මේ සඳහා වැය කළාද කියන සියලු කාරණා සම්බන්ධයෙන් අපි උත්තර දීලා තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මුදල් වැය කරන විට පාර්ලිමේන්තුවට වාර්තා කරනවා නම්, මේ වාගේ කිසි ප්‍රශ්නයක් ඇති වෙන්නේ නැහැ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு  மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු කථානායකතුමනි, සමාවන්න. ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයේදී මේ සියලුම කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තා කළා. මෙතුමා මගෙන් මේ පිළිබඳව වෙනම ප්‍රශ්නයක් ඇහුවා නම් මට පිළිතුරු දෙන්න තිබුණා.

## ශ්‍රී ලංකා වරාය අධිකාරිය : වගකීම්
## இலங்கைத் துறைமுக அதிகாரசபை: பொறுப்புகள்
SRI LANKA PORTS AUTHORITY : LIABILITIES

2191/'11

**13.ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon.  Ravi Karunanayake)
වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2) :

(අ) (i) ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සමස්ත වගකීම් ප්‍රමාණය එක් එක් වරාය අනුව කවරේද;

(ii) වරාය අධිකාරිය විසින් ඇපවීම් සහ බැංකු ඇප ලබාදුන් හෝ ඔවුන් විසින් ලබා නොගත් ණය සඳහා වගකීම භාරගත් අවස්ථා කවරේද;

(iii) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සමඟ එළඹී ගිවිසුම ඉහත (අ)(i)හි දී ඇති වගකීම් සඳහා ඇතුළත් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දිවයින පුරා වරාය අධිකාරියට අයත් හෝ වරාය අධිකාරිය වෙත පවරා ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටි වරාය අධිකාරියට අයත් ඉඩම් එම ඉඩම්වල ප්‍රමාණයන්ද සමඟ වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ශ්‍රී ලංකා වරාය අධිකාරිය සඳහා වෙන් කර ඇති ඉඩම්වල සිදුකරමින් තිබෙන ක්‍රියාකාරකම් කවරේද;

(iv) වරාය අධිකාරිය විසින් නඩත්තු කිරීම සඳහා මුදල් වියදම් දරන ඉඩම් හෝ ගොඩනැගිලි සහිත ඉඩම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) 2011 වර්ෂයේ සිට මේ දක්වා වූ කාලය තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරිය ලැබූ ශුද්ධ ලාභය කොපමණද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

துறைமுகங்கள், நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கைத் துறைமுக அதிகாரசபையின் பொறுப்புகள் ஒவ்வொரு துறைமுகத்துக்குமாக தனித்தனியாகவும்;

(ii) துறைமுக அதிகாரசபை தங்களால் பெறப்படாத கடனுக்காக உத்தரவாதம் கொடுத்த அல்லது வங்கி உத்தரவாதம் கொடுத்த அல்லது பொறுப்புகளை வகிக்கும் சந்தர்ப்பங்களையும்;

(iii) (அ) (i) இல் குறிப்பிடப்பட்ட பொறுப்புகளில் இலங்கை கிரிக்கெட் சபைக்கு வழங்கப்பட்ட பொறுப்புகள் சிறப்பாக கூறப்பட்டுள்ளதா என்பதையும்

அவர் இச்சபைக்குத் தெரிவிப்பாரா?

(ஆ) (i) நாட்டில் துறைமுக அதிகாரசபைக்குச் சொந்தமான அல்லது துறைமுக அதிகாரசபைக்கு உரித்தான நிலங்களின் விஸ்தீரணத்தையும்;

(ii) கொழும்பு மாவட்டத்தில் துறைமுக அதிகாரசபைக்குச் சொந்தமான நிலங்களின் விஸ்தீரணத்தைத் தனித்தனியாகவும்;

(iii) துறைமுக அதிகாரசபையின் ஒதுக்கப்பட்டுள்ள அல்லது நிறுவப்பட்டுள்ள நிலங்களில் மேற்கொள்ளப்படும் செயற்பாடுகளையும்;

(iv) துறைமுக அதிகாரசபை பராமரிப்புக்காக செலவு செய்யும் நிலங்கள் அல்லது கட்டிடங்களைக் கொண்ட நிலங்களையும்

அவர் கூறுவாரா?

(இ) 2011ஆம் ஆண்டு முதல் இற்றைவரையான இலங்கைத் துறைமுக அதிகாரசபையின் தேறிய இலாபத்தையும் அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Ports and Highways:

(a) Will he inform this House -

(i) the total liability of Ports Authority of Sri Lanka on per port basis;

(ii) the instances where the Ports Authority has given guarantees, bank guarantees or undertaken liabilities for loans not taken by them; and

(iii) whether the undertaking given to Sri Lanka Cricket is highlighted within the liabilities given in (a) (i) above?

(b) Will he state -

(i) the extent of lands in the country owned by the Ports Authority or vested in the Ports Authority;

(ii) the lands in the Colombo District owned by the Ports Authority along with the extent separately;

(iii) the activities that are being done on the allocated or erected lands of the Ports Authority; and

(iv) the lands or lands with buildings that the Ports Authority expends money for maintenance?

(c) Will he also state the net profit of the Ports Authority of Sri Lanka for the year 2011 to date ?

(d) If not, why?

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා (වරාය හා මහාමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன - துறைமுகங்கள், நெடுஞ்சாலைகள் அமைச்சர்)
(The Hon. Rohitha Abeygunawardana - Minister of Ports and Highways)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි

(අ) (i)

ජංගම හා ජංගම නොවන වගකීම්.

| විස්තර | | 2011 | | |
|---|---|---|---|---|
| | කොළඹ වරාය (රු) | ත්‍රිකුණාමලය වරාය (රු) | ගාල්ල වරාය (රු) | එකතුව (රු) |
| ජංගම හා ජංගම නොවන වගකීම් | 135,217,363,257 (දහතුන් දහස් පන්සිය විසිඑක් කෝටි හැත්තෑතුන් ලක්ෂ හැට තුන්දහස් දෙසිය පනස් හතයි) | 179,692,284 (දාහත් කෝටි අනු හය ලක්ෂ අනූ දෙදහස් දෙසිය අසූ හතරයි) | 211,733,223 (විසි එක් කෝටි දාහත් ලක්ෂ තිස් තුන් දහස් දෙසිය විසි තුනයි) | 135,608,788,764 (දහතුන් දහස් පන්සිය හැට කෝටි අසූ හත් ලක්ෂ අසූ අටදහස් හත්සිය හැට හතරයි.) |

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

(ii) ශ්‍රී ලංකා වරය අධිකාරිය සූරියවැව ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනය ඉදිකිරීම් වෙනුවෙන් හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘති කොන්ත්‍රාත්තුව සඳහා විචල්‍ය නියෝගයක් නිකුත් කරන ලදි. මෙමඟින් කොන්ත්‍රාත්කරු සඳහා තාවකාලික වගකීමක් ඇති කර ඇත. මෙම වගකීමෙන් කොටසක් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් සපයන ලද මුදල්වලින් දැනටමත් පියවා ඇත.

(iii) නැත.

(ආ) (i)

| | වරාය | ඉඩම් ප්‍රමාණය අක්කර |
|---|---|---|
| 1 | කොළඹ වරාය | 522 |
| 2 | ත්‍රිකුණාමලය වරාය | 5108 |
| 3 | ඔලුවිල් වරාය | 175 |
| 4 | ගාල්ල වරාය | 94 |
| 5 | හම්බන්තොට වරාය ආශ්‍රිත ඉඩම් | 2728 |
| 6 | වෙනත් | 110 |
| 7 | එකතුව (7=1+2+3+4+5+6) | 8737 |

(ii) අදාළ තොරතුරු ඇමුණුමෙහි දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

(iii) සියලුම ඉඩම් සම්බන්ධයෙන් විස්තරයක් තිබෙනවා. කියවන්නට දීර්ඝ කාලයක් යනවා. මා එය **සභාගත*** කරනවා.

(iv) වරාය අධිකාරිය සතු සියලුම ඉඩම් හා දේපළ නඩත්තු කිරීම හා ආරක්ෂා කිරීම සඳහා වරාය අධිකාරිය කටයුතු කරනු ලබයි.

(ඇ)

| **කාලය** | **ශුද්ධ ලාභය(රු.මිලියන)** | **වෙනත් කරුණු** |
|---|---|---|
| 2011 වර්ෂය | 583 | බදු හා විදේශ විනිමය ලැබීම්/ පාඩු පසු ශුද්ධ ලාභය |
| 2012 ජූනි දක්වා | 7,213 | බදු හා විදේශ විනිමය ලැබීම්/ පාඩු පෙර ලාභය |

(ඈ) පැන නොනඟී.

***සභාමේසය මත තබන ලද ඇමුණුම:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
*Annex tabled:*

ඇමුණුම

**කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටි වරාය අධිකාරිය සතු ඉඩම්**

| අනු අංකය | විස්තරය | අක්කර | රූඩ් | පර්චස් |
|---|---|---|---|---|
| | **වරාය අධිකාරිය නිල නිවාස** | | | |
| 1 | තනිකඩ නේවාසිකාගාරය, රොක් හවුස්ලේන්, කොළඹ 15 | 0 | 3 | 6.00 |
| 2 | ද සේරම් පෙදෙස නිල නිවාස, කොළඹ 15 | 3 | 2 | 35.00 |
| 3 | එළිහවුස් පෙදෙස නිල නිවාස, කොළඹ 15 | 6 | 3 | 31.00 |
| 4 | ඩිප්දීන් නිල නිවාස, අළුත්මාවත පාර, කොළඹ 15 | 2 | 0 | 8.00 |
| 5 | සල්ගාදු නිල නිවාස, අළුත්මාවත පාර, කොළඹ 15 | 1 | 0 | 30.00 |
| 6 | ශාන්ත ජේම්ස් වීදිය නිල නිවාස, කොළඹ 15 | 0 | 1 | 2.00 |
| 7 | බ්ලූමැන්ඩල් පෙදෙසේ නිල නිවාස, කොළඹ 15 | 29 | 2 | 14.00 |
| 8 | රාමනාදන් මාවත නිල නිවාස, කොළඹ 13 | 1 | 1 | 23.00 |
| 9 | අළුත්මාවත නිල නිවාස (ගල්පල්ලිය අසල), කොළඹ 15 | 3 | 3 | 34.00 |
| 10 | අළුත්මාවත නිල නිවාස, කොළඹ 15 | 0 | 0 | 27.00 |
| 11 | අබ්දුල්හමීඩ් වීදිය නිල නිවාස, කොළඹ 12 | 0 | 1 | 36.00 |
| 12 | චාර්ලිමන්ට් පාර නිල නිවාස, කොළඹ 06 | 0 | 0 | 23.52 |
| 13 | බෞද්ධාලෝක මාවත නිල නිවාස, කොළඹ 07 | 0 | 1 | 21.76 |
| 14 | වෝල්ස් මාවත නිල නිවාස, කොළඹ 15 | 0 | 3 | 10.00 |
| 15 | මෝගන් පාර නිල නිවාස, කොළඹ 02 | 1 | 1 | 9.00 |
| | **ඉඩම** | | | |
| 16 | බේරේ වැව අවට ඉඩම් (ඩී.ආර්.විජේවර්ධන මාවත මොගන් පාර කිව් පාර) | 16 | 3 | 16.48 |
| 17 | කැනල් අංගනය, කොළඹ 01 | 5 | 1 | 32.00 |
| 18 | සෙබස්තියන් ඉඩම, කොළඹ 10 | 0 | 2 | 33.00 |
| 19 | වරාය පිවිසුම් මාර්ගයට යාබදව ඇති ගුදම හා ඉඩම | 1 | 2 | 13.70 |
| 20 | මහපොළ අභ්‍යාස ආයතනය, කොළඹ 15 | 13 | 6 | 27.00 |
| 21 | මහපොළ අභ්‍යාස ආයතනයට යාබද තෙල් ටැංකි සහිත ඉඩම කොළඹ 15 | 0 | 3 | 37.71 |
| 22 | මහපොළ අභ්‍යාස ආයතනය ඉදිරිපිට ඉඩම, කොළඹ 15 | 0 | 0 | 18.10 |
| 23 | ධීවර වරාය ප්‍රදේශය, කොළඹ 15 | 4 | 0 | 3.00 |
| 24 | අංක 126, අළුත්මාවත පාරේ කොළඹ 15 | 0 | 0 | 20.97 |
| 25 | රොක් හවුස් මාවතේ පිහිටි ඉඩම, කොළඹ 15 | 0 | 0 | 1.72 |
| 26 | රොක් හවුස් මාවතේ පිහිටි ඉඩම, කොළඹ 15 | 1 | 0 | 22.82 |
| 27 | වෝල්ස් පටුමගේ තෙල් ටැංකි සංකීර්ණය, කොළඹ 15 | 9 | 0 | 1.30 |
| 28 | බාන් ඔරලෝසු කණුව ඉදිරිපිට කොළඹ 01 | 0 | 0 | 2.20 |
| 29 | අංක670, බ්ලූමැන්ඩල් පාර, කොළඹ 15 | 0 | 0 | 10.00 |
| 30 | අංක 30, එලිලේන්, කොළඹ 15 | 0 | 1 | 4.87 |
| 31 | අංක 668, බ්ලූමැන්ඩල් පාර, කොළඹ 15 | 0 | 0 | 6.05 |
| 32 | අංක 680, බ්ලූමැන්ඩල් පාර, කොළඹ 15 | 0 | 0 | 17.00 |
| 33 | ඩිලාසාල් වීදිය, කොළඹ 15 | 0 | 0 | 30.26 |
| 34 | අළුත්මාවත පාර, කොළඹ 15 | 1 | 3 | 27.00 |
| 35 | සමර්හිල් පෙදෙසේ ඉඩම, කොළඹ 15 | 0 | 1 | 22.00 |
| 36 | බ්ලූමැන්ඩල් පාර ( හින්දු සිද්ධස්ථානය), කොළඹ 15 | 0 | 0 | 12.60 |
| 37 | ද සේරම් ගේට්ටුව අසල ඉඩම (බෞද්ධ සිද්ධස්ථානය), කොළඹ 15 | 0 | 0 | 23.62 |
| 38 | බ්ලූමැන්ඩල් පාර (බෞද්ධ සිද්ධස්ථානය), කොළඹ 15 | 0 | 0 | 30.00 |
| | **උප එකතුව** | **111** | **1** | **3.68** |
| 39 | කොළඹ වරාය ඇතුලත ඉඩම් | 410 | 0 | 0.00 |
| | | | | |
| | **මුළු එකතුව** | **521** | **1** | **3.68** |

** සභාමේසය මත තබන ලද ලේඛනය:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட ஆவணம் :*
** Document tabled:*

පැලිගොඩ ඉඩම ශ්‍රී ලංකා වරාය අධිකාරියේ බහළු මෙහෙයුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාමට භාවිතා කර ඇත.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ යෝජිත පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම් සඳහා කැනල් අංගනය වෙන් කර ඇත.

කිව් පාරේ පිහිටි ඉඩම වරාය අධිකාරියේ ඉංජිනේරු කොට්ඨාසය මඟින් ගබඩා ද්‍රව්‍ය සුරක්ෂිතව තැබීම සඳහා යොදවා ඇත.

කොළඹ 02 මෝගන් පාරේ පිහිටි ඉඩම වරාය සේවකයන් සඳහා නිල නිවාස ඉදි කිරීම සඳහා වෙන් කර ඇත.

බේරේ වැව අවට ඉඩම් රාජ්‍ය ආරක්ෂක හා සංවර්ධන අමාත්‍යාංශය සමඟ එක්ව සංචාරක කලාපයක් ඇති කිරීම සඳහා ව්‍යාපෘති ගණනාවක් ආරම්භ කිරීමට නියමිතව ඇත.

මහර ගල්වල පරිශ්‍රය නැව් අලුත්වැඩියා කිරීම සම්බන්ධ ආයතනයකට අංගනයක් ඉදිකිරීම සඳහා ලබා දීමට නියමිතය.

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පිහිටි ඉඩම් කොටස් කිහිපයක් වරාය ආශ්‍රිත කර්මාන්ත කිහිපයක් සඳහා බදු වශයෙන් ලබා දී ඇත. ඉතිරි ඉඩම් කොටස් සඳහා ආයෝජන කැඳවා ඇත. ඉඩම් කොටස් කිහිපයක අනවසර පදිංචිකරුවන් රැඳී සිටියි.

ඔලුවිල් වරාය ආශ්‍රිත ඉඩම් ඔලුවිල් වරාය ඉදිකිරීම් හා වරාය සංවර්ධන කටයුතු සඳහා යොදා ගෙන ඇත.

ගාල්ල වරාය ආශ්‍රිත ඉඩම් ඉදිරි සංවර්ධන කටයුතු සඳහා සහ සංවර්ධන සැලැස්මට අනුව පරිසර හිතකාමී සංවර්ධනයක් සඳහා යොදා ගැනීමට නියමිතය.

මාගම්පුර මහින්ද රාජපක්ෂ වරාය ආශ්‍රිත ඉඩම් වරාය කටයුතු හා ඉදිරි සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීමට නියමිතය.

කන්කසන්තුරේ හා පේදුරුතුඩුව වරායන් ආශ්‍රිත ඉඩම් වරාය කටයුතු හා ඉදිරි සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීමට නියමිතය.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ සම්බන්ධයෙන් අඟහරුවාදා උත්තරයක් දුන්නා. මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. ඔබතුමා කිව්වා, container movements අනුව ආදායමේ වර්ධනයක් තිබෙනවාය කියා. 2012 වර්ෂයේ නොවැම්බර් මාසය, දෙසැම්බර් මාසය සහ 2013 ජනවාරි මාසය වන විට සියයට 2.1ක් ඊට පෙර අවුරුද්දට වඩා ආදායම අඩු වෙලා තිබෙනවා. ඔබතුමා සඳහන් කළා, වාර්තාගත වැඩි වීමක් තිබෙනවාය කියා. ඒ අවස්ථාවේදී විස්තර මා ළඟ නොතිබුණු නිසයි ඇමතිතුමනි, අතුරු ප්‍රශ්න අහන්න බැරි වුණේ. ඔබතුමා දත්ත දීලා තිබුණේ 2011 වර්ෂයටයි. 2012 වර්ෂයේ ආදායම අඩු වෙලා තිබෙනවා. මේ සම්බන්ධව ඇමතිතුමා වශයෙන් ඔබතුමා මොනවාද කරන්නේ?

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
ගරු කථානායකතුමනි, රවි කරුණානායක මන්ත්‍රීතුමා ප්‍රශ්නයේ (ඇ) කොටසෙන් විතරයි අපේ ශුද්ධ ලාභය සහ පාඩුව ගැන අහලා තිබෙන්නේ. මුළු ප්‍රශ්නයෙන්ම අහලා තිබෙන්නේ වරාය අධිකාරිය සතු ඉඩම් සහ දේපොළ සම්බන්ධවයි. එදා ඔබතුමා ඇසූ ප්‍රශ්නවලට අපි පිළිතුරු සැපයුවා. වසර 5කදී අපේ වර්ධනය, ඒ වාගේම 2012 වර්ෂයේදී ලැබූ ලාභය සම්බන්ධයෙන් අපි ඔබතුමාට කරුණු ඉදිරිපත් කළා. තවත් ප්‍රශ්නයක් අහනවා නම් මට ඒකට උත්තර දෙන්න පුළුවන්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඇමතිතුමනි, ඔබතුමා පිළිතුර සභාගත කළාම ගෙදර ගිහින් ඒක විශ්ලේෂණය කරලා තමයි අතුරු ප්‍රශ්න අහන්න පුළුවන් වන්නේ.

අද ඔබතුමාගෙන් මේ ප්‍රශ්නය අහන්නේ ඔබතුමා විෂය භාර ඇමතිවරයා හැටියටයි. වරායේ සභාපති කැඳවූ අවස්ථාවේදී අප අහපු ප්‍රශ්නවලට එතුමා උත්තර දෙන කොට ඔබතුමා බලා ගෙන හිටියා. ඒ දී තිබෙන ගිණුම් හරිද? ඒකේ මූල්‍යමය කොටස මුදල් අමාත්‍යාංශයට බාර දී තිබෙනවා. වරාය අධිකාරියේ - Ports Authority එකේ- අලාභය, හම්බන්තොට වරායේ තිබෙන වියදමත් එක්ක ගත්තාට පස්සේ මිලියන 3,800යි. ඇයි මේවා වසන් කරන්නේ, ගරු ඇමතිතුමනි?

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
ගරු කථානායකතුමනි, -

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමාට මේක බාර දී නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
විස්තර නැතිව ප්‍රශ්නය අහන්න. ප්‍රශ්නය අහන්න, එතකොට එතුමාට පිළිතුරු දෙන්න පුළුවන්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්න වචන දෙකෙන්, තුනෙන් අහන්න ගියොත් අපි ප්‍රශ්න අහලා වැඩක් නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙම නම් මෙතැන තිබෙන ක්‍රමවේදයන් වෙනස් කරන්න ඕනෑ.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Standing Orders වෙනස් කරන්න වෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා, තමුන්නාන්සේට ඕනෑ විධියට බැහැ නේ මේක කරන්න. එහෙම නම් මේ ගැන සාකච්ඡා කරලා අප මේ ස්ථාවර නියෝග වෙනස් කරගෙන එහෙම කරමු. ඔය ඔක්කොම විස්තර කියන කොට පිළිතුරු දෙන එක්කෙනාටත් පැටලෙනවා. ඒ නිසා තමන්ට දැන ගන්න ඕනෑ දේ කෙටියෙන්, සෘජුව අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ස්ථාවර නියෝග අනුව -

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
ප්‍රශ්නය අහන්න. ප්‍රශ්නය අහනවා වෙනුවට ජාතක කථා කියන එක නවත්වන්න කියලායි කියන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එදා මා ප්‍රශ්න ඇහුවේ නැත්තේ ලාභයක් තිබුණාය කියලා කිවූ නිසායි. පස්සේ තමයි පෙනෙන්නේ ලාභය මූල්‍ය වියදම් වෙනුවෙන් සම්පූර්ණයෙන්ම මුදල් අමාත්‍යාංශයට වෙන් කළාය කියලා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ඇමතිතුමා, පිළිතුරු දෙන කොට විස්තර කරන්නේ නැතිව කෙටියෙන් පිළිතුරු දෙන්න. එතකොට එතුමාට අවස්ථාව තිබෙනවා, තව ප්‍රශ්න අහන්න.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
ගරු කථානායකතුමනි, මා බොහොම පැහැදිලිව එතුමාට ලාභය ගැන කිව්වා. එතුමාට මා දීපු එක - [බාධා කිරීමක්] මා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙන සංඛ්‍යා ලේඛන වැරදි නම් -

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අප මෝඩයෝ වශයෙන් සලකන්න එපා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
ඉතින් අහගෙන ඉන්නේ නැහැ නේ. [බාධා කිරීම්] මෙතුමාගෙන් ණය අරගෙන වාගෙයි හරියට කථා කරන්නේ. මා දී තිබෙන සංඛ්‍යා ලේඛන වැරදි නම් මේ පාර්ලිමේන්තුවට රීති ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්න, මා වැරදි තොරතුරු සපයනවාය කියලා. ගරු කථානායකතුමනි, මා වග කීමෙන් කියනවා, මා ඉදිරිපත් කළ හැම සංඛ්‍යා ලේඛනයක්ම සත්‍යයි කියා. සත්‍ය තොරතුරු තමයි මා තමුන්නාන්සේට ඉදිරිපත් කළේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හරි, දැන් එතුමා පිළිතුරක් දී තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඇයි මේක වසන් කරන්නේ? ඒක මුදල් අමාත්‍යාංශයට බාර දීලායි තිබෙන්නේ. ශුද්ධ ලාභය කිව්වාම මූල්‍ය වටිනාකමත් ඒකට එකතු කරන්න ඕනෑ.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
දෙවි හාමුදුරුවනේ! ශුද්ධ ලාභය ගැන තමයි දැන් කිව්වේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ශුද්ධ ලාභය කියන්නේ? එතැන දීලා තිබෙන්නේ operating profit එක. ඔබතුමන්ලා අපත් එක්ක ගිණුම් සම්බන්ධයෙන් සෙල්ලම් කරන්න එපා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena) \
මේ තොරතුරු දෙන්නම්, ගෙදර අරගෙන යන්න. මම ආපසු මේ ගැන කියන්නම් ගරු කථානායකතුමනි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මා හිතන හැටියට වාද කරන්න තිබෙන්නේ මෙතැන නොවෙයි. ඒකට අදාළ කමිටුවක් තිබෙනවා. ඒ කමිටුවට යන්න.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
උපදේශක කාරක සභාවට එන්න, මන්ත්‍රීතුමා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මට කියන්න කොයි උපදේශක කාරක සභාවටද කියලා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක සොයා ගන්න ඔබතුමා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා කියන දේ මම කරන්නම්. මට කියන්න කොහෙන්ද ඒක කරන්න පුළුවන් කියලා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මගේ කාමරයට ඇවිත් ඕක ඇහුවා නම් මම කියනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
පසුව මම ඇවිල්ලා ඔබතුමා එක්ක කථා කරන්නම්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මගේ දෙවන අතුරු ප්‍රශ්නය ගරු කථානායකතුමනි.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
මේ දෙවන අතුරු ප්‍රශ්නයලු, හතක් විතර අහලා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මේ අවසාන අතුරු ප්‍රශ්නය. ඉවසීමෙන් අහන්න. ඉවසීමෙන් පිළිතුරු දෙන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
දැන් වරායවල් ගණනාවක් හදලා තිබෙනවා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
පක්ෂයෙන් අහන්නත් බැහැ නේ, මගෙන් අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඇයි, පක්ෂයෙන් අහන්න බැරි මොකද? ඔබතුමා වයර් මාරු කර ගන්න එපා. අපේ පක්ෂයේ වැඩ ටික අපි කර ගන්නම්. මම මේ අහන්නේ ජාතික ප්‍රශ්නයක් ගැන.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
විහිළුවට ගන්න එපා. වගකීමෙන් කටයුතු කරන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
දැන් වරාය ගණනාවක් හදලා තිබෙනවා. කන්ටේනර් ප්‍රමාණය සියයට 2.4ක ප්‍රමාණයකින් අඩු වෙලා තිබෙනවා. ඉන්දියාවෙන් ලංකාවට අපනයනය කරන ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා. මින් පසුව කන්ටේනර් කොහෙන්ද සොයා ගන්න පුළුවන් වන්නේ, අලාභයක් නොවන විධියට කොහොමද කටයුතු කරන්නේ කියන එක ඇමතිතුමා කරුණාකරලා අපට හෙළිදරවු කරන්න.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
ගරු කථානායකතුමනි, අපි බොහොම පැහැදිලිව මතක් කරන්නට ඕනෑ. ලෝකයේ අනෙකුත් වරායවල් සමඟ තරගකාරිත්වයට ගැළපෙන ආකාරයට තමයි අපි දකුණු කොළඹ වරායේ වැඩ ආරම්භ කරලා තිබෙන්නේ. දිය කඩනය අවසන් කරලා තිබෙනවා. දකුණු කොළඹ වරාය, ඒ වාගේම පළමුවන දකුණු පර්යන්තය, නැඟෙනහිර පර්යන්තය යන මේවායේ වැඩ අවසන් කරන්නේ අවුරුදු 25කින් 50කින් -ඉදිරියේදී - එන විශාල නැව් ඇතුළත් කර ගනිමින් මේ වරාය ක්ෂේත්‍රය දියුණු කරන්නයි. අපට ඉදිරි අනාගතයේදී මේ කොළඹ වරායෙන් විතරක් මුළු ආසියාවම එක්ක තරග කරන්න බැහැ. ඒ නිසා තමයි අපි මේවා වැඩි දියුණු කර ගෙන අපේ බහලුම් වැඩි කර ගැනීමට මේ වරායවල් ඇති කරන්නේ. මේ රටවල් එක්ක තිබෙන තරගකාරිත්වයට අපිත් ඇතුළු වෙලා ලෝකයේ ප්‍රධාන වරායවල් දහයට ඇතුළත් වීමේ වගකීමෙන් අපි මේ කටයුතු කර ගෙන යනවා ගරු මන්ත්‍රීතුමා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙම නම් හොඳයි.

## "සැමට නිවසක් - හිතට සෙවණක්" වැඩ පිළිවෙළ: වතු සේවක නිවාස

### "செமட நிவசக்-ஹிதட செவணக்" வேலைத்திட்டம்: தோட்ட ஊழியர்களுக்கு வீடுகள்

### "SAMATA NIWASAK-HITHATA SEVANAK" PROGRAMME : HOUSES FOR ESTATE WORKERS

2221/'12

**14. ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3) :

(අ) මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති මාලාවේ, "සැමට නිවසක් - හිතට සෙවණක්" වැඩ පිළිවෙළ යටතේ, වර්ෂ 2015 වන විට සෑම වතු සේවක පවුලකටම මූලික පහසුකම් සහිත නව නිවසක් ලබා දෙන බවට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පොරොන්දුව පරිදි මේ වන විට නව නිවාස හිමි වූ වතු සේවක පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) දැනට ඉදි වෙමින් පවතින වතු නිවාස සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொதுவசதிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) மகிந்த சிந்தனை தொலைநோக்குக் கொள்கைகளில் "செமட நிவசக்-ஹிதட செவணக்" வேலைத்திட்டத்தின் கீழ் 2015ஆம் ஆண்டாகின்றபோது சகல தோட்ட ஊழியர்களின் குடும்பங்களுக்கும் அடிப்படை வசதிகளைக்கொண்ட புதிய வீடொன்றை வழங்குவதாக வாக்குறுதி அளிக்கப்பட்டுள்ளதை அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி வாக்குறுதிக்கமைய இதுவரை புதிய வீடுகள் கிடைக்கப்பெற்ற தோட்ட ஊழியர் குடும்பங்களின் எண்ணிக்கை எவ்வளவு எனப்தையும்;

(ii) தற்போது நிர்மாணிக்கப்பட்டுவரும் தோட்ட வீடுகளின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

asked the Minister of Construction, Engineering Services, Housing and Common Amenities:

(a) Is he aware that a pledge was made under the "Samata Niwasak - Hithata Sevanak" programme of the Mahinda Chintana - A vision for the future manifesto that each estate worker family would be provided with a new house with basic facilities by the year 2015 ?

(b) Will he inform this House of the number of -

(i) estate worker families that have received new houses as per the pledge mentioned above ; and

(ii) estate houses that are being constructed at present ?

(c) If not, why ?

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)

ගරු කථානායකතුමනි, ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) ඔව්.

(ආ) (i) වතු සේවක පවුල් 2,558යි.

නිවාස හිමි වූ වතු සේවක පවුල්

| වතු නිවාස ඉදි කරන ලද ආයතනය | ඉදි කරන ලද නිවාස සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|
| | 2010 | 2011 | 2012 | එකතුව |
| වැවිලි මානව සංවර්ධන භාරය | - | 161 | 70 | 231 |
| ජාතික නිවාස සංවර්ධන අධිකාරිය | 1619 | 397 | 311 | 2327 |
| එකතුව | | | | 2558 |

(ආ) (ii) වතු නිවාස සංඛ්‍යාව 4,031කි.

එක් එක් වර්ෂවල ඉදි වෙමින් පැවති වතු නිවාස

| වතු නිවාස ඉදි කරන ලද ආයතනය | ඉදි වෙමින් පවතින නිවාස සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|
| | 2010 | 2011 | 2012 | එකතුව |
| වැවිලි මානව සංවර්ධන භාරය | 378 | 489 | 603 | 1470 |
| ජාතික නිවාස සංවර්ධන අධිකාරිය | 1248 | 831 | 482 | 2561 |
| එකතුව | | | | 4031 |

(ඇ) අදාළ නොවේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, 1994 වන කොට වතු නිවාස 230,000ක අවශ්‍යතාවක් තිබුණා. මා අහන්න කැමැතියි, මහින්ද චින්තනයේ සඳහන් වූ ආකාරයට 2015 වන විට ඒ කාල වකවානුව තුළ වතු නිවාස සියල්ලේම අඩු පාඩු මඟ හරවා ගෙන මේ සියලුම වතු නිවාස ඉදි කරන්නට හැකියාව තිබෙනවාද කියලා.

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)

ගරු කථානායකතුමනි, අපි සඳහන් කළේ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් පමණක් ඉදි කරනු ලබන නිවාස සංඛ්‍යාවයි. ඊට අමතරව වතු යටිතල පහසුකම් අමාත්‍යාංශය විසින් අපිට වඩා වැඩි නිවාස ප්‍රමාණයක් ඉදි කර තිබෙනවා. ඒ වාගේම මහින්ද චින්තන ප්‍රතිපත්ති මාලාව තුළම සඳහන් කර තිබෙනවා, මේ සඳහා විදේශ ණය ආධාර ලබා ගැනීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා කියලා. මේ වන විට ඒ විදේශ ණය ආධාර ලබා ගැනීමේ අවසාන පියවරට ඇවිල්ලා තිබෙනවා. එම නිසා ඉදිරි කාල සීමාව තුළදී ඒ ඉලක්කය සපුරා ගන්න පුළුවන්කමක් තිබෙන බව මා වග කීමකින් යුතුව මේ ගරු සභාවට ප්‍රකාශ කරනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය. මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන් වී තිබෙන ආකාරයට, වතු නිවාස ප්‍රශ්නය විසඳන්නට වාර්ෂිකව රුපියල් කෝටි 500ක්, ඒ කියන්නේ රුපියල් මිලියන 5,000ක් වෙන් කරනවාය කියා තිබෙනවා. එලෙස ඔබතුමන්ලා වෙන් කර තිබෙනවාද?

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සහ අනෙකුත් සියලුම අමාත්‍යාංශ ඒකාබද්ධව ගත්තාම වෙන් කරන මුදල ඊට ආසන්න මුදලක් බවට පත් වෙයි. කෙසේ හෝ විදේශ ණය ආධාරත් සමඟ ඒ නිවාස ප්‍රමාණය සකස් කර, නිම කරනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා වග කීමෙන් ප්‍රකාශ කළා 2015 වන කොට අපේ රටේ වතු නිවාස ප්‍රශ්නය විසඳන්නට ඒ සියලුම නිවාස ඉදි කරනවාය කියා. 2015 වෙන්න තව අවුරුදු දෙකයි තිබෙන්නේ. එහෙම නම් ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අඩුම ගණනේ වසරකට වතු නිවාස පමණක් ලක්ෂයක් හැදෙන්නට ඕනෑ. ඔබතුමා වග කීමකින් මේ උත්තරීතර සභාවට ප්‍රකාශ කරනවාද, වාර්ෂිකව වතු නිවාස ලක්ෂය ගණනේ 2015 වන කොට -මේ අවුරුදු දෙක තුළ- ඒ 203,000ක නිවාස අවශ්‍යතාව සපුරනවා කියලා?

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)

ගරු කථානායකතුමනි, ඊයේත් මා මේ ගරු සභාවට කිව්වා, අපේ රටේ ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවෙන් මෑතකදී කරන ලද සමීක්ෂණය අනුව මෙතරම් වතු නිවාස ප්‍රමාණයක් ඉදි කිරීමට නියමිතව නැහැ කියලා. ගරු මන්ත්‍රීතුමනි, එම නිසා ඔබතුමාගේ සංඛ්‍යා ලේඛන අපි කොහෙත්ම පිළිගන්නේ නැහැ. රටේ අවශ්‍යතාව අනුව නිවාස ලබා දීමේ වගකීම අනිවාර්යයෙන්ම ආණ්ඩුවක් විධියට අපි භාර ගන්නවා.

## බයෝ බවර් ලංකා සමාගම නිෂ්පාදනය කළ බැක්ටීරියාව: ඩෙංගු මර්දනය

## பயோ பவர் லங்கா நிறுவன உற்பத்தியான பற்றீரியா : டெங்கு ஒழிப்பு

## BACTERIUM PRODUCED BY BIO BAUR LANKA COMPANY: ERADICATION OF DENGUE

2910/'12

**15.** ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) බයෝ බවර් ලංකා සමාගම විසින් මීට වර්ෂ තුනකට පෙර ඩෙංගු මදුරු මර්දනය සඳහා නිෂ්පාදනය කළ බැක්ටීරියාව ඒ සඳහා කියුබාවෙන් ගෙන්වන ලද බීටීඅයි බැක්ටීරියාවට වඩා සාර්ථක ප්‍රතිඵල පෙන්වා ඇති බවත්;

(ii) එසේ වුවද තවමත් එම බැක්ටීරියාව ඩෙංගු මදුරු මර්දනය සඳහා යොදා ගෙන නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) බීටීඅයි බැක්ටීරියාව සඳහා වැය වන මුදලින් අඩකට වඩා අඩු මුදලකින් සපයා ගත හැකි ඉහත සඳහන් බැක්ටීරියාව නිෂ්පාදනය කිරීමට අවශ්‍ය පියවර නොගැනීමට හේතු කවරේද;

(ii) දේශීය නිෂ්පාදනයක් වන එම ප්‍රබල බැක්ටීරියාව ඩෙංගු මර්දනය සඳහා යොදා ගැනීමට ඉදිරියේදී පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பயோ பவர் லங்கா நிறுவனத்தினால் இற்றைக்கு மூன்று வருடங்களுக்கு முன்னர் டெங்கு நுளம்பு ஒழிப்பிற்காக உற்பத்தி செய்யப்பட்ட பற்றீரியா, இதன் பொருட்டு கியுபாவிலிருந்து கொண்டுவரப்பட்ட பீ.ரீ.ஐ. பற்றீரியாவைவிடச் சிறந்த பெறுபேறுகளைக் காட்டியுள்ளது என்பதையும்;

(ii) எனினும், மேற்படி பற்றீரியா இதுவரை டெங்கு நுளம்பு ஒழிப்புக்காக பயன்படுத்தப்படவில்லை என்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) பீ.ரீ.ஐ. பற்றீரியாவுக்காகச் செலவாகும் பணத்தில் அரைவாசிக்கும் குறைவான பணத்தொகையில் பெற்றுக்கொள்ளக்கூடியதாக உள்ள மேலே குறிப்பிடப்பட்ட பற்றீரியாவை உற்பத்தி செய்வதற்குத் தேவையான நடவடிக்கைகள் மேற்கொள்ளப்படாமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

(ii) உள்நாட்டு உற்பத்தியான குறித்த ஆற்றல்மிக்க பற்றீரியாவை டெங்கு ஒழிப்புக்காக பயன்படுத்துவதற்கு எதிர்காலத்தில் நடவடிக்கை மேற்கொள்வாரா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health :

(a) Is he aware that-

(i) the bacterium produced by Bio Baur Lanka Company three years ago for the eradication of dengue, has shown better results than the BTI bacterium imported from Cuba for the same purpose; and

(ii) the aforesaid bacterium has not been used for the eradication of dengue up to now, despite its better performance?

(b) Will he state -

(i) the reasons for not taking steps to produce the aforementioned bacterium which could be produced at a cost which is less than half the cost of BTI bacterium ; and

(ii) whether measures will be taken in future to use that powerful bacterium which is a local product, for dengue eradication?

(c) If not, why ?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා ඒ ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) බයෝ බවර් ලංකා සමාගම විසින් නිෂ්පාදිත Bacto Bti සහ කියුබාවෙන් ගෙන්වන ලද Bactivec Bti යන දෙවර්ගයම මදුරු කීටයන් මර්දනය සඳහා සාර්ථක ප්‍රතිඵල පෙන්වා ඇත.

(ii) දැනටමත් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් බයෝ බවර් ලංකා සමාගම විසින් නිෂ්පාදනය කරන ලද Bacto Bti බැක්ටීරියාව කීට නාශක කටයුතු සඳහා යොදා ගෙන ඇත. 2010 සිට මේ දක්වා ලීටර් 4,000ක් පමණ මිලට ගෙන ඇත.

(ආ) (i) කාර්මික තාක්ෂණ ආයතනය මඟින් බයෝ බවර් ලංකා සමාගමට මෙම නිෂ්පාදන කටයුතු සඳහා අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබා දීම හා ගුණාත්මක විශ්ලේෂණ වාර්තාවක් නිකුත් කිරීමට කටයුතු කර ඇත.

(ii) ඔව්. ජලය එක් රැස්වී ඇති පහසුවෙන් ඉවත් කළ නොහැකි ස්ථාන සඳහා ඉදිරියේදී මෙම බැක්ටීරියාව යොදා ගැනීමට බලාපොරොත්තු වේ.

(ඇ) පැන නොනඟී.

ඔබතුමා අහපු ප්‍රශ්නයට අනුව දැනට ලබා ගෙන ඇති ප්‍රමාණයන් ගත්තොත්, දැනට බයෝ බවර් ලංකා සමාගමෙන් 2010 වර්ෂයේදී ලීටරයක මිල රුපියල් 2,492 බැගින් ලීටර් 2,000ක් අරගෙන තිබෙනවා. 2012 වර්ෂයේදී බයෝ බවර් ලංකා සමාගමෙන් ලීටරය රුපියල් 3,250 බැගින් ලීටර් 2,000ක් ලබාගෙන තිබෙනවා. කියුබාවෙන් ගෙන්වලා තිබෙන්නේ, 2010 අවුරුද්දේ ලීටරය රුපියල් 3,356 ගණනේ ලීටර් 10,000ක ප්‍රමාණයකුයි.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය නියෝජ්‍ය ඇමතිතුමා පිළිගත්තා, බයෝ බවර් ලංකා සමාගම මඟින් කරන දේවල් සාර්ථකව කරගෙන යනවා කියලා. මම තමුන්නාන්සේගෙන් මේ කාරණය අහන්න කැමැතියි. ජනාධිපති කාර්ය සාධක බලකාය පිහිටුවීම, ධූමායනය වැනි කෙටි කාලීන ක්‍රමවලට පසු ගිය කාලය තුළ සෞඛ්‍ය අමාත්‍යාංශය විශාල වියදමක් දරා තිබෙනවා. ඩෙංගු මර්දනය කිරීම සඳහා ලංකාවේ බැක්ටීරියාවක් නිෂ්පාදනය කරන්න පුළුවන්කම තිබෙන නිසා ඒ සඳහා මීට වඩා වැඩි දායකත්වයක් ලබා දිය යුතුයි කියලා මම හිතනවා. ඔබතුමා ඒ සම්බන්ධයෙන් ගන්නා වූ පියවර මොකක්ද?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු කථානායකතුමනි, ඩෙංගු මදුරුවා මර්දනය සම්බන්ධයෙන් ප්‍රධාන කරුණ මේක නොවෙයි. ජලය එක් රැස්වී ඇති, පහසුවෙන් ඉවත් කළ නොහැකි ස්ථාන සඳහා මෙම බැක්ටීරියාව යොදා ගැනීමට පුළුවන්. නමුත් මෙහි ක්‍රියා කාලය සතියක් විතර වාගේයි තිබෙන්නේ. ඩෙංගු මර්දනය කිරීමේදී ප්‍රධාන අරමුණ වෙන්නේ බෝවෙන ස්ථාන විනාශ කිරීමයි. මොකද මේ බැක්ටීරියා වතුර එකතු වෙන තැන්වලට දමන්න ඕනෑ. ඊට වඩා පහසුයි ඒ ස්ථාන නැති කර දැමීම. මොකද මේ බැක්ටීරියාව කීටයා බෝවෙන තැනට ඉසීමෙන් තමයි කීටයා නැති වෙන්නේ. කීටයා, බෝවෙන ස්ථානයෙන් තුරන් කර දැමීම තමයි ප්‍රධාන වෙන්නේ. මෙහි කාලයත් සතියයි තිබෙන්නේ. නැවත සතියකින් ඩෙංගු මදුරුවන් ඇති වෙනවා. ඒ නිසා ධූමායන කටයුතු හොඳයි. ගරු කථානායකතුමනි, මූලික වශයෙන්ම ඒ බෝවෙන ස්ථාන ඉවත් කිරීම තමයි ඉතාමත් අවශ්‍ය වෙන්නේ. මේ බැක්ටීරියාව එක ක්‍රමවේදයක් පමණයි.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. 2011 ඩෙංගු රෝගීන් 28,473ක් වාර්තා වෙද්දී 2012 දී 44,456කට එය වැඩි වෙලා තිබෙනවා. විශාල වර්ධනයක් වෙලා තිබෙනවා. 2012 වර්ෂයේ මරණ සංඛ්‍යාව 183යි. ඒ වෙන කොට මරණ සංඛ්‍යාව 21ක්ව තිබිලා තිබෙනවා.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

12යි.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

21ක් කියා තමයි අපට වාර්තා වෙලා තිබෙන්නේ. කොහොම වුණත් මෙය අපේ රටේ ඉතා බරපතළ ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ඩෙංගු පරීක්ෂාවට අවශ්‍ය උපකරණ සමහර රජයේ රෝහල්වල නැහැ. උදාහරණයක් විධියට මගේ කුලියාපිටිය ආසනයේ තිබෙන රෝහලකට ගිය අවස්ථාවක මට දැන ගන්න ලැබුණා, පිටතින් පරීක්ෂණ කර ගෙන එන්න කියා තුණ්ඩුවක් දෙන බව. ඉතින් මෙයින් සිද්ධ වන්නේ මරණ සංඛ්‍යාව වැඩි වන එකයි. ඒ වාගේම ඩෙංගු රෝගීන්ගේ ප්‍රතිශතය වැඩි වීමටත් එය බලපානවා. මේ සම්බන්ධයෙන් පියවර ගන්නේද?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திஸாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු කථානායකතුමනි, ප්‍රථමයෙන් කියන්න ඕනෑ, මේ රෝගයෙන් සිදු වන මරණ සංඛ්‍යාව අඩු කිරීම ගැන. පළමුවන අභියෝගය තමයි එය. සෞඛ්‍ය අමාත්‍යාංශය හැටියට අපි මරණ සංඛ්‍යාව අඩු කිරීම සඳහා කටයුතු කර තිබෙනවා. පැහැදිලිව බැලුවොත් මරණ සංඛ්‍යාවේ අඩු වීමක් තිබෙන බව පෙනෙනවා.

ඊළඟ දේ තමයි රෝගය පාලනය කිරීම. [බාධා කිරීමක්] මරණ සංඛ්‍යාව අවුරුද්දෙන් අවුරුද්ද අඩු වෙලා තිබෙනවා. [බාධා කිරීමක්] නැහැ. ඒ රෝගය බෝ වීමයි. රෝගය වැළඳීම නොවෙයි, මරණ සංඛ්‍යාව අඩු වෙලා තිබෙනවා. ප්‍රධාන දේ මරණයෙන් බේරා ගැනීමයි. වැඩි වටිනාකම තිබෙන්නේ ජීවිතයක නේ. ඒ සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය වගකීම් ඉටු කර තිබෙනවා. ගරු කථානායකතුමනි, මෙය ලෝකයේම සිද්ධ වනවා. තායිලන්තය, ඉන්දියාව වාගේ රටවල් ගත්තොත් ඒ රටවල මෙම රෝගයෙන් විශාල මරණ සංඛ්‍යාවක් සිදු වනවා. නමුත් අපි එය පාලනය කර තිබෙනවා. මහ ජනතාවගේ දායකත්වය මෙයට අවශ්‍ය වනවා. අපි වෛද්‍යවරු පුහුණු කර තිබෙනවා. රෝහල්වල ඒ පහසුකම් තිබෙනවා. කෙනෙක් ඉක්මනින් ප්‍රතිකාර ගන්න ඕනෑය කියා පිටතට ගියොත් හැරෙන්නට, අපේ රෝහල්වල තිබෙන labsවලින් මේ කටයුතු කර ගන්නට අවශ්‍ය සියලු පහසුකම් අපි ලබා දීලා තිබෙනවා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ඔබතුමාගේ පිළිතුරට මා එකඟ වන්නේ නැහැ. ඉක්මනින් කර ගන්න ඕනෑ නිසා නොවෙයි, රෝගීන් පෞද්ගලිකව ප්‍රතිකාර ගන්නේ, ගරු කථානායකතුමනි. පෞද්ගලිකව සල්ලි දීලා කර ගන්න බැරි වීම නිසා බොහෝ අය මැරෙනවා. මොකද, බොහෝ අයට ලේ සාම්පලයක් අරගෙන ගිහින් පෞද්ගලිකව කර ගන්න හැකියාවක් නැහැ, ගරු කථානායකතුමනි. ඒ විධියට අහිංසක මිනිසුන්ව ලඝු කරන්න එපා.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු කථානායකතුමනි, අතිගරු ජනාධිපතිතුමා සෞඛ්‍ය සේවාව වෙනුවෙන් රුපියල් බිලියන 125ක් වෙන් කර තිබෙනවා. එම නිසා එය හෑල්ලුවට ලක් කරන්න එපා. සෞඛ්‍ය සේවාවේ ගුණාත්මකභාවය වැඩි කිරීම සඳහා අපි කටයුතු කර තිබෙනවා. එක රෝහලක එහෙම සිදු වුණා කියලා තමුන්නාන්සේ එහෙම කියන්න එපා. ඊට වඩා දෙගුණයකින් අපි ඒ සේවාව ලබා දී තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

දෙවන වටය.

## චීන සංස්කෘතික මධ්‍යස්ථානය : විස්තර
சீன கலாசார நிலையம்: விபரம்
CHINESE CULTURAL CENTRE : DETAILS

1554/'11

**1. ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) විහාරමහා දේවී උද්‍යානය අසල ඉදි කර ඇති චීන සංස්කෘතික මධ්‍යස්ථානය 2002 - 2004 කාල සීමාව තුළදී ගරු රනිල් වික්‍රමසිංහ මහතාගේ අග්‍රාමාත්‍ය ධූරය යටතේ චීන රජයෙන් ශ්‍රී ලංකා රජයට ලැබුණු ත්‍යාගයක්ද;

(ii) එය පූර්ණ ප්‍රදානයක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) චීන සංස්කෘතික මධ්‍යස්ථානයේ ඉදි කිරීම් ආරම්භ වූ දිනය සහ අවසන් වූ දිනය කවරේද;

(ii) ඉහත ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කළ මුළු පිරිවැය සහ එය අවසන් කිරීමේදී දැරීමට සිදු වූ පිරිවැය කොපමණද;

(iii) එම ව්‍යාපෘතියෙහි ශ්‍රමය සඳහා වැය වූ පිරිවැය කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ව්‍යාපෘතියේ සේවයේ යෙදවූ දේශීය සහ විදේශීය සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත කී ව්‍යාපෘතියේ විදේශික ශ්‍රමිකයන්ට, ඔවුන් ශ්‍රී ලංකාවට ගෙන එනු ලැබූ සමාගම හෝ රට විසින් ලබා දී තිබූ තනතුරු නාමයන් කවරේද;

(iii) චීන සංස්කෘතික මධ්‍යස්ථාන ඉදි කිරීම් ව්‍යාපෘතියේ සේවකයන් වෙනුවෙන් සේවක අර්ථ සාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල වෙත ගෙවන ලද දායක මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

கலாசார, கலை அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) விகாரமகாதேவி பூங்காவிற்கு அருகில் நிர்மாணிக்கப்பட்டுள்ள சீன கலாசார நிலையம், கௌரவ ரணில் விக்கிரமசிங்க அவர்கள் பிரதமராகப் பதவி வகித்த 2002 - 2004 வரையான காலப்பகுதியில் சீன அரசாங்கத் திடமிருந்து இலங்கை அரசாங்கத்திற்குக் கிடைத்த ஒரு நன்கொடையா என்பதையும்;

(ii) அது ஒரு பூரணமான நன்கொடையா என்பதையும்

அவர் கூறுவாரா?

(ஆ) (i) சீன கலாசார நிலைய நிர்மாணத்தின் ஆரம்பத் திகதி மற்றும் முடிவுத் திகதி ஆகியவற்றையும்;

(ii) மேற்படி கருத்திட்டம் தொடர்பாக உத்தேசிக்கப் பட்ட மொத்தச் செலவு மற்றும் அது முடிவுறும் வேளையில் இறுதிச்செலவு ஆகியவற்றையும்;

(iii) ஊழியத்துக்காகச் செலவுசெய்யப்பட்ட செல வினத்தையும்

அவர் மேலும் கூறுவாரா?

(இ) (i) இக்கருத்திட்டத்தில் வேலைக்கமர்த்தப்பட்ட உள்நாட்டு மற்றும் வெளிநாட்டுத் தொழிலா ளர்களின் எண்ணிக்கையை வெவ்வேறாகவும்;

(ii) மேற்படி கருத்திட்டத்துக்காக கம்பனி அல்லது நாடு ஒன்றினால் இலங்கைக்குக் கொண்டு வரப்பட்ட வெளிநாட்டுத் தொழிலாளர்களுக்கு வழங்கப்பட்ட பதவிப் பெயர்கள் யாவை என்பதையும்;

(iii ) சீன கலாசார நிலைய நிர்மாணக் கருத் திட்டத்தின் தொழிலாளர்கள் சார்பாகச் செலுத்தப்பட்ட ஊழியர் சேமலாப நிதி மற்றும் ஊழியர் நம்பிக்கைப் பொறுப்பு நிதி ஆகிய வற்றின் பெறுமதிகளையும்

அவர் இச்சபைக்குத் தெரிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Culture and the Arts:

(a) Will he state whether -

(i) the Chinese Cultural Centre constructed near Viharamahadevi Park was a gift from the Chinese Government to the Sri Lankan Government received under the premiership of the Hon. Ranil Wickramasinghe during 2002 - 2004; and

(ii) it was an outright gift?

(b) Will he also state -

(i) the commencing date and the completion date of the construction of the Chinese Cultural Centre;

(ii) the total cost estimated for the above project and the final cost at the time of its completion; and

(iii) the cost incurred on the labour?

(c) Will he inform this House -

(i) the number of local and foreign workers employed in the project, separately;

(ii) the designations given to the foreign workers of the aforesaid project by the company or country by whom they were brought to Sri Lanka; and

(iii) the values of the EPF and ETF paid on behalf of the workers of the Chinese Cultural Centre construction project?

(d) If not why?

**ගරු ටී. බී. ඒකනායක මහතා (සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க - கலாசார, கலை அலுவல்கள் அமைச்சர்)
(The Hon. T.B. Ekanayake - Minister of Culture and the Arts)

ගරු කථානායකතුමනි, මෙතුමා අසා තිබෙන්නේ විහාරමහා දේවී උද්‍යානය අසල ඉදි කර අති චීන සංස්කෘතික මධ්‍යස්ථානයක් සම්බන්ධයෙනුයි. එහෙම මධ්‍යස්ථානයක් විහාරමහා දේවී උද්‍යානය අසල නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙම නම් එච්චරයි. එහෙමද?

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
මා හිතන්නේ එසේයි. එතුමා අසා තිබෙන්නේ චීන සංස්කෘතික මධ්‍යස්ථානයක් ගැනයි. එහෙම එකක් නැහැ.

## රොෂෙන් චානක මරණය : වන්දි
### ரொஷேன் சானக்கவின் மரணம் : நட்டஈடு
### DEATH OF ROSHEN CHANAKA: COMPENSATION

2550/'12

**5. ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) 2011 මැයි 30 දින කටුනායක ප්‍රදේශයේදී සිදු වූ වෙඩි තැබීමකින් රොෂෙන් චානක නැමැති තරුණයෙකු මිය යෑම සම්බන්ධයෙන් පොලිස් පරීක්ෂණ සිදු කළේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් තරුණයා මිය යෑම පිළිබඳව සෙවීමට පත් කළ මහානාම තිලකරත්න ඒකපුද්ගල කොමිෂන් සභා වාර්තාව ඉදිරිපත් කරන්නේද;

(ii) මිය ගිය තරුණයාගේ පවුලට වන්දි මුදල් ලබාදී තිබේද;

(iii) එසේ නම්, එම මුදල කොපමණද;

(iv) මෙම සිදුවීමේදී තුවාල ලැබූ අයට හා දේපළ හානි වූ ආයතනවලට වන්දි ලබා දීමට කටයුතු කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්,ඒ මන්ද?

பிரதம அமைச்சரும் பௌத்தசாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) 2011 மே மாதம் 30ஆம் திகதி கட்டுநாயக்க பிரதேசத்தில் இடம்பெற்ற துப்பாக்கிச் சூட்டினால் ரொஷேன் சானக்க எனும் இளைஞன் மரண மடைந்தமை சம்பந்தமாக பொலிஸ் விசாரணை இடம் பெற்றதா என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மேலே குறிப்பிட்ட இளைஞனின் மரணம் தொடர்பாக கண்டறிய நியமிக்கப்பட்ட மஹாநாம திலக்கரத்ன தனிநபர் ஆணைக்குழு வின் அறிக்கையைச் சமாப்பிப்பாரா என்பதையும்;

(ii) இறந்த இளைஞனின் குடும்பத்திற்கு நட்டஈட்டுத் தொகை வழங்கப்பட்டுள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், அப்பணத்தொகை எவ்வளவு என்பதையும்;

(iv) இச்சம்பவத்தில் காயமடைந்தவர்களுக்கும் உடைமைகள் சேதமடைந்த நிறுவனங்களுக்கும் நட்டஈடு செலுத்த நடவடிக்கை எடுக்கப் பட்டுள்ளதா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he state whether police investigations were conducted with regard to the death of a youth named Roshen Chanaka that was caused by a shooting which took place in Katunayake area on 30th May, 2011?

(b) Will he inform this House -

(i) whether the report of the Mahanama Thilakarathna one-man Commission that was appointed to investigate into the death of the aforesaid youth, will be submitted;

(ii) whether compensation has been paid to the family of the deceased youth;

(iii) if so, the amount of money so paid; and

(iv) whether arrangements have been made to compensate the persons who sustained injuries and the institutions of which properties were damaged in this incident ?

(c) If not, why ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) ඔව්.

(ආ) (i) මම පිළිතුරක් දෙන්නේ නැහැ, ගරු කථානායකතුමනි.

(ii) ඔව්.

(iii) රුපියල් මිලියන එකක්.

(iv) ඔව්.

(ඇ) අදාළ නැත.

ගරු කථානායකතුමනි, අධිකරණයේ තවම මේ නඩු කටයුත්ත පවතිනවා. ඒ නිසා පිළිතුරු දිය හැකි ආකාරයට තමයි මම පිළිතුර දුන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
බොහොම හොඳයි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මම අහන්නේ මහානාම තිලකරත්න ඒකපුද්ගල කොමිෂන් සභා වාර්තාව ගැනයි. ඒක අධිකරණයට අදාළ එකක් නොවෙයි. රොෂෙන් චානකගේ ඝාතනය පිළිබඳව පත් කළ ඒකපුද්ගල කමිටුවේ වාර්තාව ඉදිරිපත් කරන්නේද කියලායි මම අහන්නේ. ගරු කථානායකතුමනි, ඒක අධිකරණයේ වාර්තාවක් නොවෙයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අතිගරු ජනාධිපතිතුමා මේ සම්බන්ධයෙන් ඒකපුද්ගල කමිටුවක් පත් කළා. ඒ කමිටුවෙන් එතුමාට වාර්තාවක් ලබා දීලා තිබෙනවා. සාමාන්‍යයෙන් අතිගරු ජනාධිපතිතුමාට ලබා දෙන වාර්තා ප්‍රසිද්ධියට පත් කරන්නේ නැහැ. ඒ නිසායි මම ඒ ප්‍රශ්නයට පිළිතුර දුන්නේ නැත්තේ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය පළමුවැනි අතුරු ප්‍රශ්නයටම අදාළයි. ගරු කථානායකතුමනි, ඒ ප්‍රශ්නය ජනාධිපතිතුමා සහ මහානාම තිලකරත්න මහතා අතර ඇති වූ ප්‍රශ්නයක් නොවෙයි. සාමකාමී උද්ඝෝෂණයකදී වෙඩි පහරකින් රොෂෙන් චානක නැමැති තරුණයා ඝාතනයට ලක් වුණා. එය ප්‍රසිද්ධියේ වූ සිද්ධියක්. එහිදී තවත් අය තුවාල වුණා. එතකොට ඒ පිළිබඳ පත් කළ කමිටුවේ වාර්තාව මේ රටේ ජනතාව දැන ගත යුතු නැද්ද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒ ගැන පොලිස් පරීක්ෂණයක් කරලා සැකකරුවන් අධිකරණයට ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ නිසා අධිකරණයට වඩා ඉහළින් ඔබතුමාටවත්, අපටවත් කටයුතු කරන්න බැහැ. අධිකරණයේ තවම ඒ පරීක්ෂණය පැවැත්වෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, ඒ කාරණාවට අදාළව සිටි පොලිස්පතිතුමාට උසස්වීමක් ලැබුණා, බ්‍රසීලයේ තානාපති ධුරයට. ඒ සිදුවීමෙන් තුවාල වූ බොහෝ පිරිසක් සිටිනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ පැහැදිලි කිරීමේදී කිව්වා, දේපළවලට සහ අත පයවලට හානි වුණු අයට වන්දි ගෙව්වා කියලා. ඒ ගෙවූ වන්දි මුදල කොපමණ ප්‍රමාණයක්ද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමා ඒක අහලා නැහැ. ඒක අහන්න.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ප්‍රශ්න අංක 5 (ආ) (iv)න් අසා තිබෙන්නේ එයයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ඒ සිද්ධිය සම්බන්ධයෙන් අධිකරණයේ විභාගයක් පැවැත්වෙනවා. ගරු ෆීලික්ස් පෙරේරා ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් පත් කළ කමිටුව මඟින්, සේවකයන් 68දෙනකුට වන්දි මුදල් ගෙවීම පිළිබඳ පරීක්ෂණ කටයුතු කරමින් තිබෙනවා. ඒ අතරතුර 13 දෙනෙක් ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහින් තිබෙනවා. ඒ නිසා දැනට වැඩ කටයුතු නැවතිලා තිබෙනවා. අද තත්ත්වය ඒකයි.

හිටපු පොලිස්පතිතුමා තානාපති කෙනකු කළේ මේ කාරණය නිසා නොවෙයි. ඒ කාලයේ ජේවීපී එක ඝාතනය කරන්න කටයුතු කරපු පොලිස්පතිලාටත් තානාපතිකම් දීලා තිබෙනවා, ජේවීපී එකයි අපියි හිටපු හවුල් ආණ්ඩුවෙන්. අපේ හවුල් ආණ්ඩුවේ හිටපු ජේවීපී එකේ මන්ත්‍රීතුමන්ලාත් එය අනුමත කළා. ඔවුන් කළ සේවාව සලකා තමයි තානාපති සේවාවට පත් කරන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 6, ගරු අනුර දිසානායක මහතා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය ඇහුවේ නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අතුරු ප්‍රශ්න තුනක් ඇහුවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
පළමුවැනි අතුරු ප්‍රශ්නයේම කොටසක් හැටියට තමයි එකක් ඇහුවේ. අතුරු ප්‍රශ්නයක් නොවෙයි ඒක. ගරු කථානායකතුමනි, තුන්වන අතුරු ප්‍රශ්නය අහන්න මට ඉඩ දෙන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අහන්න.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු ඇමතිතුමා, ඒ හිටපු පොලිස්පතිතුමා භාර ගත්තා ඒ ඝාතනයේ වගකීම. ඒකට එතුමාට ලැබුණු දඬුවම තමයි තානාපති ධුරයට උසස්වීම. ගරු ඇමතිතුමනි, මා අහන්න කැමැතියි, ඔබතුමා කියපු, අපි ආණ්ඩුව සමඟ හිටපු කාලයේ තනතුරු දුන්නේ කාටද කියලා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නය අහන ක්‍රමයට අහන්න, තමන්ගේ අදහස් ප්‍රකාශ කරන්නේ නැතිව.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ක්‍රමයට ඇහුවේ. පිළිගත් ක්‍රමයට ඇහුවේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, එතුමාගේ ප්‍රශ්නයෙන් අහලා තිබෙන්නේ අධිකරණයේ විභාගයට භාජන වෙලා තිබෙන කාරණයක් සම්බන්ධයෙන්. හිටපු පොලිස්පතිතුමා එතැනට ගිහින් කාටවත් වෙඩි තැබුවේ නැහැ. ඒ නිසා ගරු මන්ත්‍රීතුමනි, තමුන් කරන ප්‍රකාශය අධිකරණයට සම්බන්ධ බරපතළ ප්‍රශ්නයක් කර ගැනීමට උත්සාහ දරන්න එපා. ඕනෑ නම් දැන් ඔබතුමාට පුළුවන් අධිකරණය හමුවට ගිහින් පාර්ශ්වකරුවකු හැටියට ඒකට මැදිහත් වන්න. මෙතැනට ඇවිත් එක් එක්කෙනාට චෝදනා නොකර, ඒ චෝදනා අරගෙන අධිකරණයට ගිහින් පාර්ශ්වකරුවකු හැටියට මැදිහත් වෙන්න. මට දිය හැකි එකම උපදෙස එයයි.

## පළාත් සභා පාසල් : විදුහල්පති පුරප්පාඩු
### மாகாண சபை பாடசாலைகள்: அதிபர் வெற்றிடங்கள்
### PROVINCIAL COUNCIL SCHOOLS : VACANCIES FOR PRINCIPALS

2906/'12

**6. ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා - (ගරු අනුර දිසානායක මහතා වෙනුවට)**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - மாண்புமிகு அநுர திஸாநாயக்க சார்பாக)
(The Hon. Sunil Handunnetti on behalf of the Hon. Anura Dissanayake )

අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මේ වන විට පළාත් සභා යටතේ පාලනය වන පාසල්වල පවතින විදුහල්පති පුරප්පාඩු සංඛ්‍යාව පළාත් මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම විදුහල්පති පුරප්පාඩු පිරවීම සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தற்போது மாகாண சபைகளின் கீழ் நிருவகிக்கப்படும் பாடசாலைகளில் நிலவும் அதிபர்களுக்கான வெற்றிடங்களின் எண்ணிக்கை மாகாண வாரியாக வெவ்வேறாக யாதென்பதையும்;

(ii) மேற்படி அதிபர் வெற்றிடங்களை நிரப்புவதற்காக எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he state -

(i) separately, in relation to each province, of the number of vacancies for principals existing at present in the schools which come under Provincial Councils; and

(ii) of the action that has been taken to fill the aforesaid vacancies?

(b) If not, why ?

**ගරු බන්දුල ගුණවර්ධන මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு பந்துல குணவர்தன - கல்வி அமைச்சர்)
(The Hon. Bandula Gunawardane - Minister of Education)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i)

| | |
|---|---|
| බස්නාහිර | 922 |
| වයඹ | 373 |
| නැගෙනහිර | 734 |
| උතුර | 536 |
| උතුරු මැද | 464 |
| ඌව | 547 |
| දකුණ | 650 |
| මධ්‍යම | 645 |
| සබරගමුව | 295 |
| | 5,166 |

(ii) 2005 වර්ෂයේ පවත්වන ලද සීමිත තරග විභාගය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කර තිබූ 212/2010 හා 979/2009 නඩුවල තීන්දු 2012.01.24 හා 2012.01.26 දෙදින ලැබීමෙන් අනතුරුව

v 2012 වර්ෂයේ සම්මුඛ පරීක්ෂණ පවත්වා

ශ්‍රී ලංකා විදුහල්පති සේවය 3 පන්තිය සඳහා - 1,115 ද

ශ්‍රී ලංකා විදුහල්පති සේවය 2 - II ශ්‍රේණිය සඳහා - 1,616 වශයෙන් 2,731

2012.12.31 දින වන විට 2,731දෙනකු සඳහා විදුහල්පති පත්වීම් ලබා දී පළාත් සභා වෙත නිදහස් කර ඇත.

v ශ්‍රී ලංකා විදුහල්පති සේවය 2-II ශ්‍රේණිය සඳහා බඳවාගත් නිලධාරීන් 1,800ක් පමණ 2013 වර්ෂය අවසන් වන විට පළාත් සභා වෙත නිදහස් කිරීමට කටයුතු කරමින් පවතී.

ඒ අනුව 4,500ක් පමණ 2013 වර්ෂය අවසන් වන විට පළාත් සභා වෙත නිදහස් කෙරෙනු ඇත.

v ශ්‍රී ලංකා විදුහල්පති සේවය I පන්තිය සඳහා උසස් කිරීම් සඳහා ගැසට් නිවේදනය පළ කර අයදුම් පත් කැඳවා ඇත. 2013 වර්ෂය තුළ එම උසස්වීම් සිදු කරනු ලබයි.

v ශ්‍රී ලංකා විදුහල්පති සේවය 3 පන්තිය සඳහා බඳවාගැනීමේ ගැසට් නිවේදනය 2013 සැප්තැම්බර් මස සිදු කිරීමටද කටයුතු කරමින් පවතී.

(ආ) අදාළ නොවේ.

## ඒ.එච්.එම්. මොහිදීන් මහතා : වන්දි මුදල්
### திரு.ஏ.எச்.எம்.மொஹிதீன்: நட்டஈடு
### MR. A.H.M. MOHIDEEN : COMPENSATION

3010/'12

**8. ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා - (ගරු මොහමඩ් අස්ලම් මහතා වෙනුවට)**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் - மாண்புமிகு மொஹமட் அஸ்லம் சார்பாக)
(The Hon. Alhaj A.H.M. Azwer on behalf of the Hon. Mohamed Aslam )

වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ගාල්ල - කොළඹ ප්‍රධාන මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය සඳහා ගාල්ල ව්‍යාපාරිකයන්ගේ වාණිජ ඉඩම් අත් පත් කරගනු ලැබූ බවත්;

(ii) ඒ යටතේ ඉඩම් අත් පත් කරගැනීමේ පනතේ 460වැනි පරිච්ඡේදයේ 10(1)(අ) වගන්තිය යටතේ නිකුත් කළ අංක ගාකස/මුඅ/3/1/2002/08 හා 2005.10.13 දිනැති නිවේදනය අනුව පවරාගත් ගාල්ල, දංගෙදර, ජිෆ්රියා මාවතේ, අංක 79බී දරන ස්ථානයේ පදිංචි ඒ.එච්.එම්. මොහිදීන් මහතාගේ ව්‍යාපාරික ස්ථානය පිහිටි අංක 215 දරන ඉඩම් කැබැල්ල වෙනුවෙන් වන්දි මුදලක් මෙතෙක් ලබා දී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ව්‍යාපාරික ස්ථානය කඩා ඉවත් කොට පවරාගත් ඉහත සඳහන් ඉඩම වෙනුවෙන් මොහිදීන් මහතාට නොපමාව වන්දි මුදලක් ලබා දීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

துறைமுகங்கள், நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) காலி - கொழும்பு பிரதான வீதியை விஸ்தரிக்கும் கருத்திட்டத்திற்காக காலி வர்த்தகர்களின் வணிகக் காணிகள் சுவீகரிக்கப்பட்டுள்ளன என்பதையும்;

(ii) இதன்கீழ் காணி கொள்ளல் சட்டத்தின் 460 ஆம் அத்தியாயத்தின் 10(1)(அ) பிரிவின்கீழ் வெளியிடப்பட்ட காகச/முஅ/3/1/2002/08 ஆம் இலக்க 2005/10/13ஆம் திகதிய அறிவித்தலின் பிரகாரம் சுவீகரிக்கப்பட்ட, காலி, தங்கெதர ஜிப்ரியா மாவத்தையில் 79 பி இலக்க இடத்தில் வசிக்கும் திரு.ஏ.எச்.எம்.மொஹிதீனின் வர்த்தக நிலையம் அமைந்துள்ள 215ஆம் இலக்க காணித்துண்டு சார்பாக இதுவரை நட்டஈட்டுத் தொகை வழங்கப்படவில்லை என்பதையும்

அவர் அறிவாரா?

(ஆ) மேற்படி வர்த்தக நிலையத்தை உடைத்தகற்றி, சுவீகரிக்கப்பட்ட மேற்படி காணியின் சார்பாக திரு. மொஹிதீனுக்கு தாமதமின்றி நட்டஈட்டுத் தொகையை வழங்குவதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Ports and Highways:

(a) Is he aware that -

(i) commercial lands of the businessmen of Galle were acquired for the Galle-Colombo main road expansion project; and

(ii) no compensation has been awarded up to now for lot No. 215 acquired under the said project as per the notice bearing No. ගාකස/මුඅ/3/1/2002/08 and dated 13/10/2005 issued in terms of Section 10(1) (a) of Chapter 460 of the Land Acquisition Act, where the business premises of Mr. A.H.M. Mohideen residing at No. 79B, Jiffriya Road, Dangedara, Galle, was located?

(b) Will he inform this House whether steps will be taken to pay compensation to Mr. Mohideen immediately for the said land acquired after demolishing and removing the business premises?

(c) If not, why ?

**ගරු නිර්මල කොතලාවල මහතා (වරාය හා මහාමාර්ග අමාත්‍යතුමා)**

(மாண்புமிகு நிர்மல கொத்தலாவல - துறைமுகங்கள், நெடுஞ்சாலைகள் அமைச்சர்)

(The Hon. Nirmala Kotalawala - Minister of Ports and Highways)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(ආ) ඔව්.

ගාල්ල - කොළඹ - හම්බන්තොට මාර්ගයේ කි.මී. 115.5 - 116.5 දක්වා කොටස පුළුල් කිරීමේදී අංක 215 දරන ඉඩම් කැබැල්ලෙන් හෙක්ටෙයාර 0.0022ක ප්‍රමාණයක් අත් පත් කරගෙන ඇත. ඒ සඳහා වන්දි වශයෙන් රුපියල් 323,000.00ක මුදලක් අනුමත කර තිබුණි. නමුත් එම මුදල ප්‍රමාණවත් නොවන බවට අදාළ ඉඩම් හිමියා විසින් ඉඩම් අත් පත් කරගැනීමේ සමාලෝචන මණ්ඩලය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. එමඟින් තීරණය වූ වන්දි මුදල පිළිබඳව මෙතෙක් ගාලු කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත දැනුම් දී නැත. එම තීරණය ලැබුණු වහාම අදාළ ගෙවීම් කළ හැකි බව කාරුණිකව දන්වමි.

(ඇ) පැන නොනඟී.

## රජයේ සේවකයන් : දේපොළ ණය

### அரச ஊழியர்கள் : ஆதனக் கடன்

### PUBLIC SERVANTS : PROPERTY LOAN

3163/'12

**9. ගරු ජෝන් අමරතුංග මහතා - (ගරු චන්ද්‍රානි බණ්ඩාර ජයසිංහ මහත්මිය වෙනුවට)**

(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு (திருமதி) சந்திராணி பண்டார ஜயசிங்க சார்பாக)

(The Hon. John Amaratunga on behalf of the Hon. (Mrs.) Chandrani Bandara Jayasinghe )

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) රජයේ සේවකයන් සඳහා සියයට හතරක පොලී පදනම මත රාජ්‍ය බැංකුවලින් ලබා දෙන දේපළ ණය මුදල් ලබා දීම මේ වන විට අත් හිටුවා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, රජයේ සේවකයන් සඳහා එම දේපළ ණය නැවත ලබා දීම ආරම්භ කරන දිනය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) அரச ஊழியர்களுக்கு நான்கு சதவீத வட்டி அடிப்படையில் அரச வங்கிகளிலிருந்து வழங்கப்படுகின்ற ஆதனக் கடன் வழங்கல் தற்போது இடைநிறுத்தப்பட்டுள்ளதென்பதை அவர் அறிவாரா?

(ஆ) ஆமெனில், அரச ஊழியர்களுக்கான மேற்படி ஆதனக் கடன் வழங்குதலை மீண்டும் ஆரம்பிக்கும் திகதி யாதென்பதை அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

[ගරු ජෝන් අමරතුංග මහතා]

asked the Minister of Finance and Planning:

(a) Is he aware that the property loans, which are granted to public servants by state banks at an interest rate of 4 per cent have been suspended by now ?

(b) If so, will he state the date on which the granting of property loans to public servants will be recommenced?

(c) If not, why ?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා (ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம - சர்வதேச நிதிய கூட்டிணைப்பு அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Sarath Amunugama - Minister of International Monetary Co-operation and Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) අත් හිටුවා නැත.

2005 වර්ෂයේ සිට 2012.12.31 දක්වා 82363 දෙනෙකු සඳහා ණය මුදල් නිදහස් කර ඇති අතර, ලබා දී ඇති මුළු ණය මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 70,461කි.

දේපළ ණය පොලී ගෙවීම වෙනුවෙන් 2012 වර්ෂයේ දී රුපියල් බිලියන 1.7ක ප්‍රතිපාදන රජය මඟින් වෙන් කර ඇති අතර, ඒ සඳහා 2013 වර්ෂය වෙනුවෙන් ඇස්තමේන්තුගත කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් බිලියන 1.9කි.

(ආ) අදාළ නොවේ.

(ඇ) පැන නොනඟී.

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ස්ථාවර නියෝග අංක 7 හි විධිවිධානවල සහ 2010.07.09 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.00 සිට අ. භා. 7.00 දක්වා විය යුතුය. අ. භා. 2.00 ට ස්ථාවර නියෝග අංක 7(5) ක්‍රියාත්මක විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

## අධ්‍යාපනය සඳහා ප්‍රමාණවත් නොවන ප්‍රතිපාදන
## கல்விக்கான நிதி ஒதுக்கீடு போதாமை
## INSUFFICIENT ALLOCATION OF FUNDS FOR EDUCATION

[අ.භා. 1.55]

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

ගරු කථානායකතුමනි, සභාව කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කිරීමට පෙර, වෙනිසියුලානු ජන රජයේ ජනාධිපති හියුගෝ චාවේස් මැතිතුමාගේ අභාවය පිළිබඳව අපගේ ශෝකය ප්‍රකාශ කරන අතර, හියුගෝ චාවේස් ජනාධිපතිවරයාට අපේ ආචාරය පිරිනමනවා.

ගරු කථානායකතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ දී මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"මේ වනවිට ග්‍රාමීය පාසල් විශාල වශයෙන් වැසී ගොස් ඇති අතර තවත් පාසල් විශාල ප්‍රමාණයක් වැසී යාමේ අනතුරකට මුහුණ පා තිබේ. මෙය සාපේක්ෂ වශයෙන් සාක්ෂරතාව ඉහළ අගයක ඇතැයි රටකට ආඩම්බර විය හැකි තත්ත්වයක් නොවේ.

එසේම ග්‍රාමීය පාසල්වල නඩත්තු කටයුතු බිඳ වැටී ඇති අතර සනීපාරක්ෂක පහසුකම්, ක්‍රීඩා පහසුකම්, විද්‍යාගාර පහසුකම් අවම වෙමින් තිබේ. තිබෙන අවම පහසුකම්වල නඩත්තු කටයුතු සඳහා යැයි කියමින් දෙමව්පියන්ගෙන් මුදල් අය කිරීම විවිධ අවස්ථාවල සිදුවන අතර, එය දෙමවුපියන් මත අමතර බරක් පටවා තිබේ.

මෙම තත්ත්වය විසින් පෙන්වා දෙන්නේ, ආණ්ඩුව විසින් පාසල් අධ්‍යාපනය සඳහා වෙන් කරනු ලබන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවෙමින් ඇති බවය. එබැවින් අධ්‍යාපනය සඳහා අවශ්‍ය තරමේ ප්‍රතිපාදන වෙන් කිරීමක් සිදු කළ යුතු බවට මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි. "

ගරු කථානායකතුමනි, අධ්‍යාපනය කියන්නේ රටේ අනාගත සංවර්ධනයේ පදනමයි. විද්‍යාවේ හා තාක්ෂණයේ දියුණුවත් එක්ක ලෝකය, සමාජය වෙනස් කරන්න පුළුවන් වන්නේ දැනුම තුළින්. දැනුමෙන් ලබා ගන්නා ඒ තොරතුරු, කරුණු, තාර්කික බුද්ධියත් එක්ක සංකලනය වුණාම තමයි අලුත් නිර්මාණශීලී දේවල් ලෝකයට, සමාජයට එකතු වන්නේ. ඒ නිසා අනාගත ශ්‍රී ලාංකීය සමාජයේ සංවර්ධනයේ පදනම අධ්‍යාපනය කියන එක ගැන විවාදයක් නැහැ. එය කවුරුත් පිළිගන්නා දෙයක්. ඒ නිසා තමයි රටක අධ්‍යාපනය ආණ්ඩුවේ ප්‍රධාන භාරදූර වගකීමක් විධියට සැලකෙන්නේ. ලංකාවේ අධ්‍යාපනය සම්බන්ධයෙනුත් එම භාර දූර වගකීම, පවතින ආණ්ඩුව වෙත පැවරිලා තිබෙන්නේ අන්න ඒ කියන අර්ථයෙන්. නමුත් ආණ්ඩුවේම ප්‍රධාන අමාත්‍යවරයකු වන

අපේ දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා පසු ගිය දවසක ඉතා පැහැදිලිව, විවෘතව කියලා තිබුණා, "අපේ රටේ නිදහස් අධ්‍යාපනය සහ සෞඛ්‍ය සේවාව බරපතළ සෝදා පාළුවකට ලක් වී ඇත." කියලා. අධ්‍යාපනය පිළිබඳව කථා කරන මේ අවස්ථාවේ දී මා ඒ කරුණ මතක් කරන්න කැමැතියි.

"අධ්‍යාපනය විතරක් නොවෙයි, සෞඛ්‍ය ක්ෂේත්‍රයත් බරපතළ සෝදාපාළුවට ලක් වී ඇත" යනුවෙන් ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන අමාත්‍යවරයකු විධියට එතුමා පිළිගෙන තිබෙනවා. එතකොට, අධ්‍යාපනය සංවර්ධනයේ පදනමයි කියන ඒ ශ්‍රේෂ්ඨ කියමන, ඒ ශ්‍රේෂ්ඨ දැක්ම මත ඉඳ ගෙන අපි අපේ රටේ අධ්‍යාපනය පිළිබඳව සාකච්ඡා කරද්දී, ගරු දිනේෂ් ගුණවර්ධන අමාත්‍යතුමාගේ ප්‍රකාශය ඉතාම වැදගත් කාලෝචිත එකක් වන බව මා හිතනවා. එතුමාගේම පක්ෂයේ හිටපු පරණ හිත මිත්‍ර බන්දුල ගුණවර්ධන මහතා තමයි දැන් අධ්‍යාපන ඇමතිවරයා හැටියට ඉන්නේ.

මධ්‍යම ආණ්ඩුවේ සහ පළාත් සභාවල අධ්‍යාපන ඇමතිවරුම 12 දෙනෙකුට ආසන්න ප්‍රමාණයක් ඉන්නවා. ඒ අධ්‍යාපන ඇමතිවරු 12 දෙනාම රටේ අධ්‍යාපනය සෝදාපාළුවට ලක් කළාය කියන එක තමයි ඒ ප්‍රකාශය තුළ එතුමා පැහැදිලිව කිව්වේ. ඒක තමයි ගරු කථානායකතුමනි, අද රට මුහුණ දී තිබෙන බරපතළ ප්‍රශ්නය.

පාසල්වලට මුදල් අය කිරීමේ ප්‍රශ්නය මෑත කාලීනව යම් සංවාදයකට ලක් වුණේ, හොරණ ප්‍රදේශයේ අවුරුදු 13ක් වයසැති පුංචි දැරියකගේ සිද්ධියයි. පාසලේ තීන්ත ආලේප කරන්න සල්ලි ගෙනෙන්න කිව්වාට පස්සේ, දෙමව්පියන්ට ඒ සල්ලි දෙන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. ඒ තාත්තා ගල් වළක කුලී වැඩ කරනවා; ඒ තත්තාට හරිහමන් ආදායමක් නැහැ. ඒ අම්මා බඩේ තුවාලයක් නිසා අසනීප වෙලා. ඒ අම්මාට බෙහෙත් ගන්න සල්ලි ටිකක් සොයා ගන්න විධියක් නැහැ. එවැනි තත්ත්වයක ඉන්න පවුලක පුංචි දැරියකට, තීන්ත ගාන්න රුපියල් 800ක් ගේන්න කියලා ඉස්කෝලෙන් කිව්වාම, තාත්තාගෙන් ඒ මුදල ඉල්ලා ගන්න විධියක් නැහැ; අම්මාගෙන් ඉල්ලා ගන්න විධියක් නැහැ. ඒ නිසා අල්ලපු පොල් වත්තට පැනලා පොල් ගෙඩි අටක් සොරකම් කරලා පාසලේ තීන්ත ගාන්න සල්ලි අරගෙන යන්න සූදානම් වුණා. ඉතින්, මේ සිදු වීමත් එක්ක ඇති වුණු ආන්දෝලනාත්මක තත්ත්වය නිසා තමයි, පාසල්වල සල්ලි අය කිරීම් පිළිබඳව මෑත කාලීනව නැවත ඇත්තටම සංවාදයක් ඇති වුණේ. නමුත් ඒ සිද්ධිය මත පදනම් වෙලා ඒ සංවාදය ඇති වුණාට පාසල්වල මුදල් අය කිරීම කියන එක අද ඊයේ පටන් ගත් එකක් නොවෙයි. මෙහි ඉතිහාසය කියනවා නම්, බන්දුල ගුණවර්ධන ඇමතිතුමා දන්නේත් නැතිව ඇති, සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා අධ්‍යාපන ඇමතිවරයා වශයෙන් ඉන්න කාලයටත් කලින්, තාරා ද මෙල් මහත්මිය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරිය වශයෙන් සිටි අවධියේ පාසල් කළමනාකරණ කමිටු පිහිටුවීම පිළිබඳව කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් වුණා.

පාසල් කළමනාකරණ කමිටු පිහිටුවා පාසලේ සියලුම නඩත්තු කටයුතු, ඉදි කිරීම් කටයුතු, පාසල් ගුරුවරුන්ගේ පඩිනඩි ගෙවීම් ආදී ඒ සියලු කටයුතු දෙමාපියන්, පාසලේ ආදි ශිෂ්‍යයින් වාගේම ගුරුවරුන් මත පටවන පාසල් කළමනාකරණ කමිටු ඇති කරන කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් වුණා. ඒ කැබිනට් පත්‍රිකාව එදා පරාද කළා. ඒ නිසා ඒක ක්‍රියාත්මක කරන්න බැරි වුණා. ඒ වෙලාවේ සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා පැහැදිලිව කිව්වා, "මේක කැබිනට් පත්‍රිකාවක් නැතිව චක්‍රලේඛන මඟින් ක්‍රියාත්මක කරන්න පුළුවන් වැඩක්. මම අධ්‍යාපන ඇමති වෙලා හිටියා නම් මම කරන්නේ ඒ වැඩේ." කියලා. පසු කාලීනව එතුමා අධ්‍යාපන ඇමති ධුරය දරන කොට, පාසල්වල නඩත්තුව දෙමාපියන්, ආදී ශිෂ්‍යයින් සහ ගුරුවරුන් මත පැටවෙන පාසල් කළමනාකරණ කමිටු පිහිටුවීමේ චක්‍රලේඛ එන්න පටන් ගත්තා අපි දැක්කා. ඒ චක්‍රලේඛනවලින් තමයි ඇත්තටම අද වන කොට ඉඩ ප්‍රස්ථාව හදලා තිබෙන්නේ පාසල්වලින්, පාසල්වල ළමයින්ගෙන් සල්ලි අය කරන්න. ආණ්ඩුව කොයි තරම් කිව්වත් මේ මුදල් අය කරන්න එපා, මුදල් අය කරන්න නීතියෙන් තහනම් කියලා, ඒවා පට්ටපල් බොරු. අර සිද්ධිය ඇති වුණු වෙලාවේ ජනාධිපතිවරයාගේ හිතේ එක පාරටම මහා සංවේදීකමක් ඇති වුණා වාගේ කිව්වා, "පාසල් ළමයින්ගෙන් මුදල් අය කරන එක සම්පූර්ණයෙන්ම තහනම්. මේක වහාම නතර කරන්න" කියලා. එතුමාත් ඉන්න කැබිනට් මණ්ඩලය තමයි මේ අධ්‍යාපන කැබිනට් පත්‍රිකාව ගෙනාවේ. එතුමාත් ඉන්න අමාත්‍ය මණ්ඩලය තමයි මේවාට අදාළ කරන ප්‍රතිපත්ති සම්පාදනය කරන්නේ. මේ නොදන්නා දෙයක් නොවෙයි. එක පාරටම හීනෙන් නැඟිටලා වාගේ, එහෙම නැත්නම් බබෙක් වාගේ කථා කිරීමේ අවශ්‍යතාවක් නැහැ. වරදින කොට එහෙම තමයි. මොනවාවත් දන්නේ නැහැ. තොත්ත බබා. අනේ! ඔක්කෝම කියලා දෙන්න ඕනෑ. ඒ විහිළුව කරලා, ඒ ප්‍රෝඩාව කරලා මේ රටේ ජනතාව, දෙමාපියන් රවටන්නයි හදන්නේ.

ගරු කථානායකතුමනි, ඉතා පැහැදිලියි මේ ක්‍රියාවලිය එන්නේ ලෝක බැංකු උපදෙස් මත බව. කොයි තරම් අධිරාජ්‍ය විරෝධය ගැන කෑ ගැසුවත්, කොයි තරම් මූල්‍ය අරමුදල, ලෝක බැංකුව පිළිබඳව විවේචන ඉදිරිපත් කළත් මේ කොල්ලකාරී ආර්ථිකයේ සුජාත දියණියක් බඳු වූ ලෝක බැංකු උපදෙස් මත අධ්‍යාපනය පවත්වා ගෙන යාම මේ ආණ්ඩුවටත් යථාර්ථයක් වෙලා තිබෙනවා. ඒ නිසා තමයි ලෝක බැංකුවේ ණය ආධාර මත ක්‍රියාත්මක වන ඔය සපිරි පාසල් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්නේ. ඔවුන් තමයි කියන්නේ, අද අධ්‍යාපනය සඳහා ආණ්ඩුව වෙන් කරන ප්‍රතිපාදන ප්‍රමාණය වැඩියි; ඒකත් අඩු කරන්න; තව තවත් අධ්‍යාපනය පෞද්ගලික අංශයට පවරන්න; ඒ සඳහා අවශ්‍ය කරන සැලසුම් හදන්න; ඒකට අවශ්‍ය කරන වැඩ පිළිවෙළ හදන්න; ඒ වැඩ පිළිවෙළ හදන්න ප්‍රතිපත්ති සම්පාදනය කරන්න, අවශ්‍ය තරම් ණය ආධාර දෙන්න අපි සූදානම් කියලා.

ඒක තමයි ලෝක බැංකුව කියපු දේ. ඒ විතරක් නොවෙයි. ඊයේ පෙරේදා සෞඛ්‍ය ක්ෂේත්‍රයටත් තවත් ඩොලර් මිලියන 200ක ණය ආධාර මුදලක් දෙන්න ලෝක බැංකුව එකඟ වුණා. ඒකේ ව්‍යාපෘතිය මොකක්ද? ඒ ව්‍යාපෘතියෙන් කියන්නෙත් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ පෞද්ගලික අංශය ප්‍රවර්ධනය කිරීම සඳහා ඩොලර් මිලියන 200ක ණය ආධාරයක් දෙනවාය කියායි. සෞඛ්‍ය ක්ෂේත්‍රයත් පෞද්ගලික අංශයට පැවරීම සඳහා ලෝක බැංකුව ඉතා පැහැදිලිව පිඹුරු පත් හදා, සැලසුම් හදා මේ ආණ්ඩුවේ ඇමතිවරුන්ට දෙනවා. ඇමතිවරු ගිරව් වාගේ ඒවා කැබිනට් මණ්ඩලයට දමලා, කැබිනට් මණ්ඩලයෙන් අනුමත කරවා ගෙන, කැබිනට් මණ්ඩලයෙන් ඒ අධ්‍යාපනය පෞද්ගලීකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනවා. ඒක තමයි මේ සිද්ධ වෙලා තිබෙන්නේ. මේක බන්දුල ගුණවර්ධන ඇමතිතුමා පසු කාලයකදී කර ගහපු දෙයක්. එතුමාට කලින් මේ ක්‍රියාවලිය ආවා. එතුමාට ඒක වෙනස් කරන්න තිබුණා. නමුත් එතුමා ඒක වෙනස් කෙළේ නැහැ. එතුමා නිදහස් අධ්‍යාපනය ගැන කොයි තරම් යටිගිරියෙන් කෑ ගැහුවත් එතුමා ඒක වෙනස් කළේ නැහැ. ඒක තමයි ඇත්ත කථාව.

ඇත්ත වශයෙන්ම ඉතා පැහැදිලිව කියනවා නම් පන්ති කාමරයෙන් තමයි මේක පටන් ගත්තේ. පන්ති කාමරයට කොස්සක් ඕනෑ වුණාම, ඉදලක් ඕනෑ වුණාම, ගුරුතුමියගේ මේසයට මේස රෙද්දක් ඕනෑ වුණාම ළමයින්ට කියලා දෙමව්පියන් හරහා කොස්සක් ගන්න, ඉදලක් ගන්න එහෙම නැත්නම් මේස රෙද්දක් ගන්න පුංචි මුදලක් එකතු කළා. එතැනින් තමයි මේක පටන් ගත්තේ. ඒක තමයි මේකේ ප්‍රාථමික අවධිය වුණේ. ප්‍රාථමික අවධියේ ඒක නතර කර ගන්න බැරි වුණා. එදා තිබුණු

[ගරු විජිත හේරත් මහතා]

ආණ්ඩුවලට ඒක නතර කර ගන්න වුවමනාවක් තිබුණේ නැහැ. ඒ නිසා ඒක වර්ධනය වුණා. ඒ නිසා දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? මේ වනකොට ඉස්කෝලෙ විදුලි බිල, ගුරුවරුන්ගේ පඩි නඩි, මුරකාරයාගේ පඩිය, ඒ පාසලට මොනවා හරි සේවාවක් සඳහා අමතරව බඳවා ගන්නා ඕනෑම සේවකයෙකුගේ පඩි නඩි ගෙවන්න, පාසලේ නඩත්තු කටයුතු, බාහිර ක්‍රියාකාරකම් ආදී සියල්ලකටම දැන් ළමයින්ගෙන් සල්ලි අය කරන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. පාසලේ ක්‍රීඩා උත්සවය පවත්වන්න මුදල් නැහැ. ඊට අවශ්‍ය මුදල් එකතු කරන්න- [බාධා කිරීමක්] ඒ ආණ්ඩුවේ ඉඳලා තමයි අපි කැබිනට් පත්‍රිකා පැරැද්දුවේ. ඒ ආණ්ඩුවෙන් තමයි කැබිනට් පත්‍රිකා ගෙනාවේ. එදා තමයි අපි කැබිනට් පත්‍රිකා පැරැද්දුවේ. ඒ කාලයේත් කිව්වා. ඒ කාලයේ කිව්වේ මෙහේ නොවෙයි. කැබිනට් මණ්ඩලයේදීත් කිව්වා; අපි එළියේදීත් කිව්වා. ඒ නිසා තමයි අපි කැබිනට් පත්‍රිකාව පැරැද්දුවේ. එතකොට අපි ආවා විතරයි. අවුරුදු 22යි. එතකොට ඔය කළමනාකරණ කමිටු ගැන අපි දන්නෙත් නැහැ. එතකොට අපේ ළා බාල අවධිය. ඒ නිසා ඒ කාලයේ අපි ඔය කළමනාකරණ කමිටු ගැන දැනගෙන සිටියේ නැහැ. ඊයේ පෙරේදා පිනට පහළ වෙලා, මොකක්දෝ ප්‍රශ්නයක් නිසා ඇමතිකමක් හම්බ වුණාට.

අද සල්ලි නැත්නම් පාසලේ ක්‍රීඩාවලට සම්බන්ධ වෙන්න විධියක් නැහැ. ඒක තමයි ඇත්ත කථාව. ශිෂ්‍ය භටයෙක් වෙන්න, නැත්නම් බාලදක්ෂ කණ්ඩායමට බැඳෙන්න, තූර්ය වාදක කණ්ඩායමට බැඳෙන්න අවශ්‍ය කරන ඇඳුම් පැළඳුම් ගන්න, ඒ අවශ්‍ය කරන උපකරණ ගන්න අද සල්ලි එකතු කරන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. කොයි තරම් දක්ෂතාව තිබුණත්, කොයි තරම් ක්‍රීඩා කුසලතාව තිබුණත් සල්ලි නැත්නම් ඒ ක්‍රීඩා තරගවලට සහභාගි වෙන්න බැරි තත්ත්වයක් අද ළමයින්ට උදා වෙලා තිබෙනවා. මේ ඛේදනීය ඉරණම අද මුළු රටේම තිබෙනවා. ඈත පිටිසර සූරියවැව ඉස්කෝලේ ඉඳලා, කිලිනොච්චි, මුලතිව්, වවුනියාවේ පාසල්වල, මඩකලපුවේ පාසල්වල සහ කොළඹ, ආනන්ද, නාලන්ද රාජකීය ආදී ජනප්‍රිය ජාතික යයි කියන ප්‍රධාන පාසල්වල පවා අද මේක යථාර්ථයක් වෙලා තිබෙනවා. ඇයි ඒ? රජය නිදහස් අධ්‍යාපනය සඳහා වෙන් කරන ප්‍රතිපාදන එන්න එන්නම කප්පාදු කර තිබෙනවා. අධ්‍යාපන වගකීමෙන් අද ආණ්ඩුව මිදිලා තිබෙනවා. ආණ්ඩුව ඒ වගකීමෙන් මිදිලා තිබෙන නිසා තමයි දෙමව්පියන් මත මේ බර පැටවිලා තිබෙන්නේ. පොල් ගෙඩි 8කට අවුරුදු දහතුනේ දැරිය හිරේ යන කොට, මේ තත්ත්වයට මුහුණ දීපු දහස් සංඛ්‍යාත දරු දැරියන් මේ රටේ අද ඉතාම දුක්ඛිත තත්ත්වයෙන් අධ්‍යාපනය හදාරන කොට, මේ පාසල් දූ දරුවෝ තමන්ගේ දෙමව්පියන් මත බර පටවලා ඒ අම්මලා තාත්තලාගෙන් ඉල්ලා ගන්න සල්ලිවලින් ඉස්කෝලය නඩත්තු කරන කොට ඒක මේ ආඩම්බරකාර තාත්තාට පේන්නේ නැහැ. මහින්ද චින්තනයේ නිදහස් අධ්‍යාපනය වෙනුවෙන් මැදිහත් වෙනවාය කියපු ආඩම්බරකාර තාත්තාට ඒක දැනෙන්නේ නැහැ; පේන්නේ නැහැ. ඒක තමයි ඇත්ත ප්‍රශ්නය.

2010 දී අධ්‍යාපනයට දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1.54ක් වෙන් කළා. 2010 දී වෙන් කරපු ඒ ගණන 2013 -මේ අවුරුද්ද- වෙන කොට දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1.17 දක්වා අඩු වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, පසු ගිය කාලයේ විශ්වවිද්‍යාල ආචාර්යවරු, මහාචාර්යවරු ඉතිහාසයේ පළමුවෙනි වතාවට picket boards අරගෙන, සටන් පාඨ කියමින්, පෙළපාළි ගිහිල්ලා උද්ඝෝෂණය කළේ වෙන මොකටවත් නොවෙයි. අධ්‍යාපනයට රජය වෙන් කරන මුදල සියයට 6ක් දක්වා වැඩි කරන්නැයි කියන්න. එය අනුමත වුණු යුනෙස්කෝ සංවිධානය හමුවට ගිහිල්ලා මේ ආණ්ඩුව එකඟ වුණු ඒ මුදල - ප්‍රතිපාදනය- වෙන් කරන්න කියන එක තමයි එදා ඒ විශ්වවිද්‍යාල ආචාර්යවරු හඬ නහලා කිව්වේ. එතකොට බොහෝ දෙමව්පියන්ට, ගුරුවරුන්ට ඒක හරියටම දැනුණේ නැහැ. සමහර අයට තේරුණේ නැහැ. පොල් ගෙඩි 8ක් හොරකම් කරපු නිසා ඒ දරුවා උසාවි දමලා දඬ නියම වෙන කොට තමයි මේ ප්‍රශ්නයේ සංවේදීකම, බරපතළකම දැනෙන්න පටන් ගත්තේ. වෙනත් වචනවලින් හරි, වෙනත් අර්ථවලින් හරි එදා සියයට 6ක් අධ්‍යාපනයට වෙන් කරන්න කියලා විශ්වවිද්‍යාල ආචාර්යවරු කිව්වේ මෙන්න මේ තත්ත්වය දැකපු නිසායි.

අද ලංකාවේ ජනගහනය වැඩි වෙනවා. පාසල් ශිෂ්‍ය ජනගහනය වැඩි වෙනවා. හතළිස් දෙලක්ෂයක් වන අපේ පාසල් සිසු දරු දැරියන්ට අධ්‍යාපනය සඳහා වෙන් කරන මුදල එන්න එන්නම කප්පාදු කරනවා නම් අනාගත සංවර්ධනයේ පදනම අධ්‍යාපනය බවට පත් වන්නේ නැහැ. අනාගත සංවර්ධනයේ පදනම අධ්‍යාපනය කියලා අපි පිළිගන්නවා නම්, දැනුමේ කේන්ද්‍රස්ථානය බවට ලංකාව පත් කරනවා කියලා කයිවාරු ගහනවා නම් ප්‍රතිපාදන අඩු කිරීමෙන් කවදාවත් ඒ අරමුණ කරා - ඒ ඉලක්කය කරා- යන්න බැහැ. නමුත් අද මොකක්ද තිබෙන තත්ත්වය? ගරු කථානායකතුමනි, 2010 දී පළාත් සභා පාසල්වලට, ඒ කියන්නේ ග්‍රාමීය මට්ටමේ පාසල්වලට දළ දේශීය නිෂ්පාදිතයෙන් වෙන් කරපු ප්‍රතිශතය සියයට 1.04යි. ඒ ප්‍රමාණයත් 2013 වෙන කොට සියයට 0.74 දක්වා අඩු වුණා. ඒ කියන්නේ මොකක්ද? අපේ රටේ පාසල්වලින් වැඩි ප්‍රමාණයක්ම තිබෙන්නේ ග්‍රාමීය ප්‍රදේශවල පිහිටි පාසල්. මුළු පාසල් ප්‍රමාණයෙන් සියයට 80ක් පමණ තිබෙන්නේ ග්‍රාමීය වශයෙන් පිහිටි පාසල් ලෙසයි. ඒ පාසල්වලට වෙන් කරන ප්‍රතිපාදන තමයි බරපතළ විධියට කප්පාදු කරලා තිබෙන්නේ. මේ වසර තුන ඇතුළත -2010 සිට 2013 දක්වා- වෙන් කරපු මුදල් ප්‍රමාණය සියයට 1.04 සිට සියයට 0.74 දක්වා අඩු වෙනවා කියලා කියන්නේ, හරියටම අවුරුදු තුනකදී සියයට 25කින් ග්‍රාමීය පාසල්වලට වෙන් කරන ප්‍රතිපාදන ආඩම්බරකාර තාත්තාගේ ආණ්ඩුව කප්පාදු කරලා තිබෙනවා කියන එකයි. ඒක තමයි ඇත්ත කථාව. ඒ කප්පාදු කිරීම නිසා තමයි අවුරුදු 13ක අහිංසක දැරියට පොල් ගෙඩි 8ක් හොරකම් කරන්න සිද්ධ වුණේ. ඒක විදුහල්පතිවරයාගේ ප්‍රශ්නයක් නොවෙයි; ඒක පාසලේ ගුරුවරුන්ගේ ප්‍රශ්නයක් නොවෙයි. පාසලේ ගුරුවරුන්ට බැණලා වැඩක් නැහැ; පාසලේ විදුහල්පතිවරයාට බැණලා වැඩක් නැහැ. විදුහල්පතිවරයා සහ ගුරුවරුන් මේ විධියට සල්ලි අය කරන තත්ත්වයට පත් කළේ ආණ්ඩුව සල්ලි දෙන්නේ නැති නිසායි. පළාත් සභාවෙන් සල්ලි දෙන්නේ නැහැ, මධ්‍යම ආණ්ඩුවෙන් සල්ලි දෙන්නේ නැහැ. ඒ වුණත් පාසල පවත්වාගෙන යන්න සිද්ධ වෙනවා. ඒ වගකීම පැවරෙන්නේ විදුහල්පතිවරයාටයි; ඒ වගකීම පැවරෙන්නේ ආචාර්ය මණ්ඩලයටයි. ඒ අයට කරන්න දෙයක් නැහැ. මොකක්ද ඒ අය කරන්නේ? දෙමව්පියෝ, ආදී ශිෂ්‍යයෝ රැස් කරනවා, පාසල් සංවර්ධන කමිටුව රැස් කරනවා. එහෙම රැස් කරලා ඒ දෙමව්පියන්ට, ඒ ආදී ශිෂ්‍යයන්ට,- [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Order, please! මේ අවස්ථාවේ සම්භාවනීය අමුත්තන්ගේ ගැලරියේ අසුන් ගෙන සිටින ජාතික මුද්‍රා නාට්‍ය කලාවේ උන්නතියට මහඟු සේවයක් කළ වජිරා චිත්‍රසේන මැතිනිය මම ගෞරවයෙන් පිළිගනිමි.

මේ අවස්ථාවේදී ගරු ආර්. යෝගරාජන් මන්ත්‍රීතුමාගේ නම මූලාසනයට යෝජනා කරන්න.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු කථානායකතුමනි, "ගරු ආර්. යෝගරාජන් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු ආර්. යෝගරාජන් මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஆர். யோகராஜன் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. SPEAKER *left the Chair, and* THE HON. R. YOGARAJAN *took the Chair.*

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම පැහැදිලිව නිල වශයෙන්, නීත්‍යානුකූලව 1975 නිකුත් කළ චක්‍රලේඛනය අනුව, - මුලදී තිබුණේ- පාසල් සංවර්ධන සමිතියේ වාර්ෂික සාමාජික මුදල රුපියල් 3යි. පාසල් සංවර්ධන කමිටුවේ පහසුකම් හා සේවා ගාස්තුව පළමුවෙනි වසරේ සිට පස්වන පන්තිය දක්වා මසකට රුපියල් 3යි. ඒ කියන්නේ අවුරුද්දට රුපියල් 36යි. හයවෙනි පන්තියේ සිට ඉහළ දක්වා මසකට රුපියල් 5 බැගින් අවුරුද්දකට රුපියල් 60යි. ඒක තමයි 1975 නිකුත් කළ චක්‍රලේඛනය අනුව පාසල්වල අනුමත පහසුකම් හා සේවා ගාස්තුව වාගේම පාසල් සංවර්ධන කමිටුවේ කටයුතු සඳහා අය කළ යුතු නිල, නීත්‍යානුකූල මුදල. ඒ තත්ත්වය තමයි අද මේ වෙනස් කර ගෙන, වෙනස් කර ගෙන ඇවිල්ලා තිබෙන්නේ. රුපියල් 5 නොවෙයි, මාසයකට රුපියල් 5 නොවෙයි ඒ වාගේ දහස් ගුණයක් අය කරනවා. රුපියල් 5,000, 7,000 මාසයකට අය කරන තත්ත්වයට අද පත් වෙලා තිබෙනවා. ඔබතුමන්ලාගේ ගණන් මිනුම්වලට අනුව අද ලංකාවේ තිබෙන පාසල් 9,731න් මධ්‍යම ආණ්ඩුවට අයත් වෙලා තිබෙන පාසල් 342 හැරුණාම පළාත් සභාවලට තිබෙන පාසල් 9,389ම ගම්බදව පිහිටා තිබෙන ගම්බද ළමයි අධ්‍යාපනය ලබන තැන්. ඒ අයගෙන් තමයි වැඩි පුරම මේ මුදල් අය කිරීම සිදු වෙන්නේ. ඒ අයගේ දෙමවුපියන් තමයි මේකෙන් වැඩිම පීඩාවට පත් වෙන්නේ. ඒ පීඩාවට පත් කිරීම සඳහා දැන් අය වැය තුළ ප්‍රතිපත්ති සකස් කරලා තිබෙනවා. අපි දැක්කා, 2012 නොවැම්බර් මාසයේ ඉදිරිපත් කළ අය වැය යෝජනාව. මුදල් ඇමතිවරයා විධියට අතිගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ ඒ අය වැය යෝජනාව. ඒ අය වැය යෝජනා තුළ, ඒ අය වැය කථාවේ ඉතා පැහැදිලිව එතුමා මොකක්ද කිව්වේ? අධ්‍යාපනය සඳහා අපි දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 4ක් වෙන් කරලා තිබෙනවා. නමුත් ඒ සියයට 4ක් වෙන් කරලා තිබෙනවා කියලා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*{Expunged on the order of the Chair.]*

ඊට පස්සේ වාක්‍යයෙන් එතුමා කිව්වේ මොකක්ද, දෙමවුපියන් විසින් දරන වියදමද ඇතුළත්ව තමයි ඒ සියයට 4 තිබෙන්නේ කියලා.

එතුමාම අනියමින් පිළිගත්තා, ඒ කථාව ඇතුළේ දෙමව්පියන්ගෙන් මුදල් අය කරනවාය කියා. අය වැය කථාවේදී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 4ක් වෙන් කර තිබෙනවා. හැබැයි මේකේ වැඩි පංගුවක් තිබෙන්නේ දෙමවුපියන්ගෙන් අය කරන මුදල්ය කියා පිළිගත්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

හිටපු ගමන් පොල් ගෙඩි අට කැඩුව දැරියගේ සිද්ධියේදී, තමා එහෙම එකක් අය වැයේදී කිව්වා නේද කියා අමතක වුණා. බලන්න කොයි තරම් හාස්‍යජනක ද කියා; කොයි තරම් විහිළුජනක ද කියා; කොයි තරම් ජුගුප්සාජනකද කියා. අය වැය කථාවේදී කියනවා, සියයට හතරක් වෙන් කරනවාය කියා. හැබැයි ඒ සියයට හතරේ වැඩි පංගුවක් තිබෙන්නේ දෙමව්පියන්ගෙන් අය කරන ඒවාය කියපු ජනාධිපතිවරයාට-

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! There is a point of Order being raised.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, he is violating the Standing Orders. He is referring directly and through innuendos to the Head of the Government. That is the Executive President. ඒ. Executive President තමයි රටේ ළමයින්ට ඉතාමත් ම ආදරය දක්වන තාත්තා. ඒක දැන ගන්න ඕනෑ. රටේ ළමයින්ට ආදරය දක්වන තාත්තා එතුමා තමයි. ඒක දැන ගන්න. [බාධා කිරීම්]

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම අසත්‍යයක් කිව්වේ නැහැ. මම ජනාධිපතිවරයාට අපහාස කළේත් නැහැ. ජනාධිපතිවරයා විවේචනය කළේත් නැහැ. ජනාධිපතිවරයා මේ පාර්ලිමේන්තුවේ ඔය තමුන්නාන්සේගේ පැත්තේ ඉඳලා කිව්ව කථාව මතක් කළා. ඒ කථාව මොකක් ද? රටේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 4ක් අධ්‍යාපනයට වෙන් කරනවා. ඒකෙන් වැඩි පංගුවක් දෙමවුපියන්ගෙන්; දෙමවුපියන් දරන්නේ කියා එතුමා කිව්වා. [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! The Hon. Member was referring to the Hon. Minister of Finance. [බාධා කිරීම්]

**ගරු විජිත හේරත් මහතා**
**(மாண்புமிகு விஜித ஹேரத்)**
(The Hon. Vijitha Herath)

එතුමා කියපු එක අර හොරණ ළමයා පොල් ගෙඩි අට කඩා ගත් වෙලාවේ අමතක වුණා ද කියන ප්‍රශ්නය- [බාධා කිරීම්]ඒක හැන්සාඩ්වලින් ඉවත් කරන්න බැහැ. ඒක ඔය පුත්තලම් බුරුවන්ට තේරෙන්නේ නැති වුණාට ඉස්කෝලේ ගිය ළමයෙකුට තේරෙනවා. ඒක පුත්තලම් බුරුවන්ට තේරෙන්නේ නැහැ. ඒක පුත්තලම් බුරුවන්ට තේරුම් ගන්නට පුළුවන් අධ්‍යාපනයක් ලැබුණේ නැහැ. අධ්‍යාපනය වෙන් කළ මුදල් අල්හාජ් බදිඋද්දීන් මොහමඩ් හිටපු අධ්‍යාපන ඇමතිවරයා හරියට වෙන් කළා නම් මේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

මොළය පැදෙන්නට තිබුණා. නමුත් ඒ තත්ත්වය අද ඇති වෙලා නැහැ. ඒකට මට කරන්නට දෙයක් නැහැ මූලසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ කථාවට අනුවම 2012 වර්ෂයේදී පළාත් පාසල් 3389ට වෙන කළ මුදල -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
**(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)**
(The Presiding Member)

Order, please! If there is anything against the Standing Orders, that will be expunged from the Hansard. However, the Hon. Member was referring to the speech of the Hon. Minister of Finance.

**ගරු විජිත හේරත් මහතා**
**(மாண்புமிகு விஜித ஹேரத்)**
(The Hon. Vijitha Herath)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2012 වර්ෂයේදී පාසල් 3389ට වෙන කළ මුදල එතුමාගේ කථාවට අනුවම රුපියල් මිලියන 61,646 යි. ඒ වාගේම 2012 වර්ෂයේදී අමතර පන්ති ගාස්තු සහ දෙමාපියන් විසින් දරන ලද මුළු වියදම රුපියල් මිලිය 64,950යි.

ඔිකෙන් තමයි සියයට 4 හැදුණේ. ඒ ගැන පැහැදිලිව කියනවා. ආණ්ඩුවෙන් වෙන් කළ ගණන රුපියල් මිලියන 61,646යි. දෙමවුපියන්ගෙන් අය කරන ගණන රුපියල් මිලියන 64,950යි කියා. දැන් කොයි එකද වැඩි? ආණ්ඩුවෙන් වෙන් කළ ගණනද? දෙමවුපියන් වෙන් කළ ගණනද? මේක තේරෙන්නේ නැත්තේ කාටද? මේක පුත්තලම් බුරුවන්ට තේරුණේ නැති වුණාට, මේ රටේ අධ්‍යාපනය හදාරන අධ්‍යාපනය ගැන අබමල් රේණුවක හෝ කැක්කුමක් තිබෙන ඕනෑම කෙනෙකුට තේරෙනවා. දෙමවුපියන් තමයි වැඩිපුර මුදල් -රුපියල් මිලියන 64,950ක්- වෙන් කර තිබෙන්නේ; වියදම් කර තිබෙන්නේ. ඒක තමයි ඇත්ත. ඒ තත්ත්වයට අද මේ රටේ අධ්‍යාපනය කඩා ගෙන වැටිලා තිබෙනවා. මේක නිකම්ම ආවේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේක ආවේ චක්‍රලේඛ හරහා.

මුලදී කැබිනට් පත්‍රිකාවෙන් කර ගන්න බැරි වුණු දේ වෙනුවෙන් චක්‍රලේඛ නිකුත් කළා. ආරම්භක චක්‍රලේඛය 2008 සැප්තැම්බර් මාසයේ 7 වන දා නිකුත් කළා. ඒක තමයි 2008/35 චක්‍රලේඛය. හැබැයි, ඒ චක්‍රලේඛයෙන් වංචාවක්, ප්‍රෝඩාවක් කළා. මේක නියාමන ව්‍යාපෘතියක් විධියට තමයි ඉදිරිපත් කළේ. තෝරා ගත්ත පාසල් කිහිපයක් නම් කර, කලාප අටක් නම් කර, ඒ කලාප අට සඳහා නියාමන ව්‍යාපෘතියක් විධියට මේක ක්‍රියාත්මක කර බලනවාය කියා, අන්න ඒ සඳහා ඉඩ ප්‍රස්ථාව හදන්න තමයි චක්‍රලේඛ නිකුත් කළේ. ඒ චක්‍රලේඛ නිකුත් කරන විට හරි සුන්දර වචන දමා තිබෙනවා. ආරම්භයේ ඉඳලා හරි ලස්සන වචනවලින් මේ වගකීම දෙමවුපියන්ට සහ පාසල් ආදි ශිෂ්‍යයන්ට පැවරුවාම පාසල ගැන ආදරයක් ඇති වෙනවා; කැක්කුමක් ඇති වෙනවා; ඒ කැක්කුම ආදරය මත පාසල දියුණු වෙනවා. එහෙම ලස්සන වචන දැම්මා. ඇත්තටම ගත්තොත් ලස්සන සුරංගනා වචනවලින් පුරවා ඒක ඇතුළත විස කවපු, අධ්‍යාපන ක්ෂේත්‍රයට විස බැස්සූ චක්‍රලේඛ. ඒක හරියටම ගත්තොත් අනාගත සිසු පරපුරේ පණ හිඳින වස ගුලියක් චක්‍රලේඛවල තිබෙනවා. අනාගත ශිෂ්‍ය පරම්පරාවේ පණ හිඳින වස ගුලියක් තමයි මේ 2008/35 චක්‍රලේඛයත්, 2010 ඉදිරිපත් කළ චක්‍රලේඛයත්. මේ චක්‍රලේඛවලට මොනවාද කළේ? ඒ කාලයේදී වෛවර්ණ දවටනවල ඔතලා ඒක අලෙවි කළා. ඒ වෛවර්ණ දවටනවල තමයි තිබෙන්නේ, පාසලේ නඩත්තුව, පාසලට ආදරය කිරීම, මේ ඔබේ දරුවාගේ පාසලයි, එය රැක ගැනීම අපේ පරම යුතුකමයි කියා. එවැනි ලස්සන වචන දමා වෛවර්ණ දවටනවල ඔතලා තමයි අනාගත දරු පරම්පරාවේ පණ නසන විස ගුලිය මේ චක්‍රලේඛ හරහා අධ්‍යාපන අමාත්‍යාංශය සම්මත කර ක්‍රියාවට නඟන්නේ. ඒ චක්‍රලේඛයේ මොනවාද සඳහන් වී තිබෙන්නේ? 2008/35 චක්‍රලේඛයේ පැහැදිලිව මෙහෙම සඳහන් වෙනවා:

> "පාසලේ ගුණාත්මක සංවර්ධනය වැඩි දියුණු කිරීම සඳහා පාසල් නඟා සිටුවීමේ නියාමන වැඩසටහන 2006 වර්ෂයේ කොළඹ, වත්තේගම, අම්බලන්ගොඩ, වව්නියා දකුණ (යාපනය වෙනුවට), හලාවත, තඹුත්තේගම, වැල්ලවාය, කෑගල්ල යන කලාප 08ක සියලු ම පාසල්වල ද ජාතික පාසල්වල ද නවෝදයා පාසල්වල ද ක්‍රියාත්මක කිරීමට අංක 2005/24 දරන චක්‍රලේඛයෙන් උපදෙස් දෙන ලදී..."

> "2006 වසරේ දී ක්‍රියාත්මක වූ කලාප හා අනෙකුත් පාසල්වලට අමතරව 2007 වර්ෂයේ දී පළාතකින් එක් කලාපයක් බැගින් තවත් කලාප 09ක එනම් කළුතර, හඟුරන්කෙත, කංගල්ල, මන්නාරම, සමන්තුරේ, කුලියාපිටිය, හිඟුරක්කොඩ, බදුල්ල හා ඇඹිලිපිටිය යන කලාපවල මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදී. 2008 වර්ෂයේ එක් පළාතකින් කලාප දෙක බැගින් වන පරිදි තෝරා ගත් කලාප 18ක මෙම නියාමන ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. මිනුවන්ගොඩ, කැලණිය, ගලේවෙල, හැටන්, අකුරැස්ස, හම්බන්තොට, වලිකාමම්, වව්නියා (උතුර), පදිරිප්පු, අක්කරෙයිපත්තු, ඉබ්බාගමුව, නිකවැරටිය, පොලොන්නරුව, දිඹුලාගල, වැලිමඩ, බිබිල, නිවිතිගල හා බලංගොඩ මෙම කලාප වේ. මේ අනුව මේ වන විට තෝරා ගත් කලාප 35ක මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ."

පටන් ගත්තේ කලාප අටකින්. එයට තව කලාප 9ක් එකතු කළා. ආපසු වතාවක් තව කලාප 18ක් එකතු කළා. සියල්ල එකතු වෙලා එන කොට කලාප 35ක මෙය ක්‍රියාත්මක වෙනවා. අඩියරෙන් අඩියර, පියවරෙන් පියවර දැන් මේ නියාමන ව්‍යාපෘතිය ව්‍යාප්ත කරගෙන ආවා. ඉස්සෙල්ලාම පටන් ගත්තේ කොස්සට ඉදලට සල්ලි ගන්නයි. ඊට පස්සේ නියාමන ව්‍යාපෘතියක් විධියට චක්‍රලේඛනයක් මඟින් කලාප මට්ටමින් ව්‍යාප්ත කරගෙන අවසානයේ දී මුළු රටේම ක්‍රියාත්මක වන තත්ත්වයට ආවා. අද තිබෙන්නේ අන්න ඒ ඛේදනීය තත්ත්වයයි. මට මතක හැටියට පෙබරවාරි 28 වැනිදා ගරු බන්දුල ඇමතිතුමා දින නියම කරලා කිව්වා, පාසල් ළමයින්ගෙන් මුදල් අය කිරීම සම්පූර්ණයෙන්ම නතර කරන චක්‍රලේඛන ගෙනෙනවාය කියලා. අද වන තුරු ඒ චක්‍රලේඛන ගෙනාවේ නැහැ. එතුමාට ඒක ගෙනෙන්න බැහැ. පාසල් ළමයින්ගෙන් ශත පහක්වත් සල්ලි අය කරන්නේ නැහැ, අය කරන්න දෙන්නේ නැහැ, ඒ සඳහා නීති පනවනවා, නීති ක්‍රියාත්මක කරනවා කියලා පුළුවන් නම් අද මේ සභාවට කියන්න කියලා මා එතුමාට අභියෝග කරනවා. ප්‍රායෝගිකව එය ඔප්පු කරලා පෙන්වන්න. එතුමාට ඒක කියන්න බැහැ. එතුමා ඒක කිව්වොත් හෙට ගෙදර යන්න වෙනවා. මුදල් අමාත්‍යාංශයෙන් මේ කටයුත්ත සඳහා මුදල් වෙන් කරන්නේ නැහැ. අධ්‍යාපනයට මුදල් වෙන් කරන්නේ මුදල් අමාත්‍යාංශයෙනුයි. එහෙම වුණොත්

එතුමාට ඇමතිකම නැති වෙනවා. ඒක එතුමාගේ පෞද්ගලික ප්‍රශ්නයක් නොවෙයි. එතුමා මුහුණ දී තිබෙන මේ ඇත්ත අර්බුදයේ තත්ත්වය මේකයි. මේ අර්බුදය නිසා එතුමා කර වටක් ගිලිලා ඉන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ප්‍රශ්නය තිබෙන්නේ පළාත් සභා පාසල්වලයි.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
පළාත් සභා පාසල්වලත් ඒකයි සිදු වෙන්නේ. "පළාත් සභා පාසල් මට අයිති නැහැ. ඒක අයිති ශක්‍රයාගේ පුතා වයිමාට. වයිමා ආවොත් පුළුවන් පළාත් සභා පාසල්වල අධ්‍යාපනය නඟා සිටුවන්න. මට කරන්න දෙයක් නැහැ"යි කියන කථාවලින් මේකට උත්තර ලැබෙන්නේ නැහැ. පළාත් සභාවලට හෝ මධ්‍යම ආණ්ඩුවට හෝ මේ කවර ආයතනයකට අයිති වුණත් මේ රටේ සමස්ත අධ්‍යාපනය අයිති මධ්‍යම ආණ්ඩුවට. ඒ වාගේම ඒවා පාලනය කරන්න ඕනෑ මධ්‍යම ආණ්ඩුවෙන්; මේ පාර්ලිමේන්තුවෙන්. ඒකට වග කියන්න ඕනෑ රටේ අධ්‍යාපන ඇමතිවරු. ඇමතිවරු පැටවූ ගැහුවාට මේකට උත්තර ලැබෙන්නේ නැහැ. ඒකට ප්‍රතිපත්ති සැලැසුම් ක්‍රියාත්මක වෙන්න ඕනෑ. චක්‍රලේඛන වෙනස් කරනවාය කියලා කිව්වේ මේ කරුණු පරණ චක්‍රලේඛනයේ තිබෙනවාය කියලා ඇමතිතුමා දන්නා නිසයි. එක එක ආණ්ඩුවල ඇමතිවරු කියනවා එහෙම සල්ලි ගන්න බැහැ, එහෙම නීතියක් නැහැ කියලා. අධ්‍යාපන සේවා අමාත්‍යතුමා වශයෙන් අලුතින් පත් කරපු අපේ දුමින්ද දිසානායක ඇමතිතුමා හොරණ සිද්ධිය ඇති වුණු වෙලාවේ මාධ්‍යවලින් කිව්වා, "අපි අය කරන්නේ නැහැ, දෙමව්පියෝ තමයි කැමැත්තෙන් සල්ලි දෙන්නේ" කියලා. මේකේ වැරැද්දත් ආපසු දෙමව්පියන්ට පැටෙව්වා. ඇත්තටම මොකක්ද වෙන්නේ ගරු ඇමතිතුමා? ඉස්කෝලේට දෙමව්පියෝ සහ ආදි ශිෂ්‍යයෝ ටික කැඳවනවා. කැඳෙව්වාට පස්සේ වේදිකාව ඉස්සරහ විදුහල්පතිතුමා වාඩි වෙනවා. වාඩි වෙලා රැස්වීමේ මූලික න්‍යාය පත්‍රය පටන් අර ගන්නවා. ඊට පස්සේ කියනවා, "මේ ඔබේ දරුවා යන පාසල. බලන්න ඔය වහල දිහා. උළු කැට කැඩිලා. ඔය වහලින් තෙමෙනවා. ඔබේ දරුවා තමයි ඔය පන්තියේ ඉන්නේ. ඔබේ දරුවා තමයි තෙමෙන්නේ. බලන්න බිම. සිමෙන්ති පොළොව කැඩිලා. හැම තැනම වළවල්. ඒ පන්තියේ ඉන්නේ ඔබේ දරුවා. බලන්න ඔය පන්ති කාමරයේ කළු ලෑල්ල දිහා. ඒකේ ඇණ ටික ගැලවිලා. ලියන්න චෝක් කෑල්ලක් නැහැ. ඒ පන්තියේ ඉන්නේ ඔබේ දරුවා" කියලා. ඉතින් හදවත පැළෙන්න එනවා ඒ දෙමව්පියන්ට. ඉස්කෝලේ හැම තැනම කැලේ හැදිලා ගේට්ටුව කැඩිලා තාප්පේ ගැලවිලා නම් විදුහල්පතිතුමා කියනවා, "අර බලන්න තාප්පය දිහා. තාප්පය ගැලවිලා. ගේට්ටුව කැඩිලා. ළමයි ටික interval එකේ ඔතැනින් දුවනවා. එහෙම දුවන කොට පාරේ වාහනයකට හැප්පෙන්න පුළුවන්. ඒ ඔබේ දරුවා. ඔබේ දරුවා තමයි මේ ඉස්කෝලේ ඉගෙන ගන්නේ. ඒ නිසා මොනවා හරි කරලා මේ ප්‍රශ්නයට උත්තරයක් හොයන්න" කියලා. එහෙම කිව්වාම මොන අම්මාගෙද, මොන තාත්තාගෙද හදවත උණු වෙන්නේ නැත්තේ? හැම අම්මා තාත්තා කෙනෙකුගේම හදවත උණු වෙනවා. ආණ්ඩුව සල්ලි දෙන්නේ නැහැ. අධ්‍යාපන ඇමතිගේ අම්මා මුත්තා මතක් වෙනවා. හැබැයි කරන්න දෙයක් නැහැ. අහිංසකකමට, නැති බැරිකමට කුලී වැඩක් කරලා හෝ අර පන්ති කාමරයේ සිමෙන්ති දාන්න, පන්ති කාමරයේ වහලයට උළු කැටයක් දමන්න යෝජනා කරනවා.

තාත්තා කෙනෙක් නැඟිටලා කියනවා, "ගරු විදුහල්පතිතුමනි, අපිට මේ ප්‍රශ්නය තේරෙනවා. ඔබතුමා උපරිමයෙන් මහන්සි වන බවත් අපට තේරෙනවා. ඔබතුමා කලාප අධ්‍යාපන කාර්යාලයට ගිහිල්ලා සල්ලි ඉල්ලූ බවත් අපි දැක්කා. ඔබතුමා අධ්‍යාපන ඇමතිතුමා ළඟට ගිහින් රස්තියාදු වෙලා පින්සෙන්ඩු වෙන හැටිත් අපි දැක්කා. ඔබතුමාට මේකට උත්තරයක් නැති බව අපට තේරෙනවා. ඉතින් එම නිසා මම යෝජනා කරනවා, එක දෙමවුපියකුගෙන් මාසයකට රුපියල් 1,200 ගණනේ සියලුම දෙමවුපියන්ගෙන් මුදල් අය කරන්න" කියලා. එහෙම කිව්වාම තව අම්මා කෙනෙක් "ඔව්, මගේ දරුවාත් මේ ඉස්කෝලයට එනවා. අපි ඒකට එකඟයි. අමාරුවෙන් හරි අපි ඒ සල්ලි දෙන්නම්. ඒ යෝජනාව මම ස්ථිර කරනවා ගරු විදුහල්පතිතුමනි" කියලා කියනවා. අනෙක් අම්මලාට කර කියා ගන්න දෙයක් නැහැ, ලජ්ජාවෙන් ඉන්නවා. දැන් මේකට විරුද්ධ කවුද? එතකොට විදුහල්පතිතුමා අහනවා, "දැන් කියන්න, කවුද මේ යෝජනාවට විරුද්ධ? විරුද්ධ එක අම්මා කෙනෙක් ඉන්නවාද, තාත්තා කෙනෙක් ඉන්නවාද" කියලා. අනේ! අම්මලා වෙව්ලනවා. විරුද්ධව අත උස්සන්න පුළුවන්ද? විරුද්ධව අත උස්සන්න බැහැ. එහෙම අත ඉස්සුවොත් මොකද වෙන්නේ? පහුවදා තමන්ගේ ළමයා ඉස්කෝලේ යවන්න බැහැ. එහෙම වුණොත් පන්ති භාර ගුරුතුමිය, එහෙම නැත්නම් විදුහල්පතිතුමා ඒ ළමයාට අරියාදු කරනවා. ඒ ළමයා පන්තියේ කොන් වෙනවා. ඉතින් මේකට භය වෙච්ච අම්මා තාත්තා ගල් කඩලා, කුලී වැඩ කරලා හෝ තමන්ගේ ඔරුව විකුණලා හෝ ඉස්කෝලෙට ඕනෑ කරන රුපියල් 1,200 දෙනවා. ඒක තමයි ඇත්ත. හැම මාසයටම විවිධ පාසල්වල විවිධ දේවල්වලට මුදල් එකතු කරනවා. මම ගණන් හදලා කියන්නම්. මම ඒවා පෙන්වන්නම්.

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
ඔබතුමා කිව්ව ආකාරයට හැම මාසයකම මුදල් අය කරන විද්‍යාලයක් පුළුවන් නම් කියන්න?

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
කොළඹ රාජකීය විද්‍යාලය. මම පෙන්වන්නම් රිසිට් එක. රුපියල් 5,700ක් එකතු කරනවා. මම තව උදාහරණ පෙන්වන්නම්. ඔබතුමා මේ ප්‍රශ්නය අහපු වෙලාවේ මම මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා අධ්‍යාපන ඇමති කාලයේ සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීවරයා රිසිට් පෙන්වලා පාසල්වල සල්ලි එකතු කරනවා කියලා කිව්වාම සුසිල් ඇමතිතුමා කිව්වා, "පුළුවන් නම් මට කියන්න කොයි ඉස්කෝලෙද කියලා. රිසිට් එකක් පෙන්වන්න. හෙටම ඒ සල්ලි ටික ආපහු අය කරනවා" කියලා. අද වන තුරු ඒ සල්ලි ආපහු අය කළේ නැහැ. ඒ නිසා මම අභියෝග කරනවා. දැන් රිසිට් පෙන්වන්නම්. විදුලි ගාස්තු, security ගාස්තු අය කරපු බිල් පෙන්වන්නම්. පුළුවන් නම් ආපහු අය කරලා පෙන්වන්න.

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
රාජකීය විද්‍යාලය-[බාධා කිරීමක්]

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
රාජකීය විද්‍යාලය විතරක් නොවෙයි. උඩ වලවේ ඉස්කෝලෙත් අය කරනවා. රාජකීය විද්‍යාලයේ සිට ඈත පිටිසර උඩ වලවේ කනිෂ්ඨ විද්‍යාලය දක්වා, සූරියවැව ඉස්කෝලය දක්වා අය කරනවා. මේ තියෙන්නේ ලියුම්-කියුම් දෙමවුපියන් එවපු. මේ තිබෙන්නේ ඒ පාසලෙන් නිකුත් කරපු කුවිතාන්සි. මාසයක් පතා

[ගරු විජිත හේරත් මහතා]

සල්ලි එකතු කරන කුවිතාන්සි. ඕනෑ නම් තව මිටි ගණන් ගෙනැල්ලා පෙන්වන්නම්. මම ඔබතුමාට කිව්වේ එක උදාහරණයයි. මේ ලියුම්වල තිබෙන්නේ ඒවා. සල්ලි එකතු කරන ප්‍රමාණයන් ගැන දෙමවුපියන් කියලා තිබෙනවා. මේක තිබෙන්නේ 2008/35 දරන චක්‍රලේඛයේ. එහි 7(1) වගන්තියේ මෙය ඉතා පැහැදිලිව කියනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සල්ලි එකතු කරන්න බලය පවරලා විතරක් නොවෙයි, මෙන්න මෙහෙමයි කියන්නේ:

"07. පාසල් සංවර්ධන කමිටුවේ කාර්ය

7.1 සැළසුම්කරණය

(අ) පාසල් සැළසුම්කරණය මඟින් පාසලේ අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීම සඳහා පස් අවුරුදු පාසල් සංවර්ධන සැලැස්මක් සහ එක් අවුරුදු ක්‍රියාත්මක කිරීමේ සැලැස්මක් පිළියෙල කළ යුතු ය."

කවුද ඒක කරන්න ඕනෑ? අර කියපු කමිටුවෙන්. පස් අවුරුදු සැලැස්ම සහ එක් අවුරුදු ක්‍රියාත්මක වැඩ පිළිවෙළ කියන මේ දෙකම ඒ කමිටුවෙන් තමයි ක්‍රියාත්මක කරන්න ඕනෑ. එතකොට තමයි පාසලේ සියලු කටයුතු අර විධියට වෙන්නේ.

මේ චක්‍රලේඛනයේ 10.4 වගන්තියෙන් -මේ විෂ ගුලියේ 10.4 වගන්තියෙන්- මොකක්ද කියන්නේ? එහි මෙසේ සඳහන් වනවා:

"10.4 පාසල මඟින් ක්‍රියාත්මක කරන විවිධ වැඩසටහන් සඳහා මුදල් එකතු කිරීමට හෝ වෙනත් විවිධාකාර ආධාර ලබා ගැනීමට කටයුතු කළ හැකිය."

දැන් අධ්‍යාපන සේවා ඇමතිතුමාට කියන්න පුළුවන්ද, සල්ලි එකතු කරන්න නීතියක් නැහැ කියලා. පුළුවන් නම් මට කියන්න, මේ චක්‍රලේඛනය වැරදියි කියලා. මාධ්‍යවලට, FM නාලිකාවට එතුමා කිව්වේ "නැහැ, එහෙම සල්ලි එකතු කරන්නේ නැහැ, සල්ලි එකතු කරන්න බැහැ, නීතියෙන් තහනම්" කියලා. නීතියෙන් තහනම් නැහැ. 2008/35 චක්‍රලේඛනයේ 10.4 වගන්තිය කියන්නේ මොකක්ද?

අධ්‍යාපන සේවා ඇමතිතුමනි, දන්නේ නැත්නම් චක්‍රලේඛය දැන්වත් කියවන්න. ඒ චක්‍රලේඛය යටතේ තිබෙන, පාසල් නඟා සිටුවීමේ වැඩසටහන පිළිබඳ උපදෙස් සංග්‍රහයේ 10.4 යටතේ මෙසේ සඳහන් වෙනවා:

"පාසල මඟින් ක්‍රියාත්මක කරන විවිධ වැඩසටහන් සඳහා මුදල් එකතු කිරීමට හෝ වෙනත් විවිධාකාර ආධාර ලබා ගැනීමට කටයුතු කළ හැකි ය. ......"

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙමයි තිබෙන්නේ. ඒ අනුව තමයි සල්ලි එකතු කරන්නේ. ඊළඟට එහි 10.6 යටතේ මෙසේ සඳහන් වෙනවා:

"පාසල් නඟා සිටුවීමේ ගිණුමට

-ගිණුමකුත් තිබෙනවා. ගිණුමක් විවෘත කරන්නත් ඉඩ ප්‍රස්ථාව මේ චක්‍රලේඛයෙන් හදලා තිබෙනවා-

පහත සඳහන් මූලාශ්‍රවලින් ලැබෙන මූල්‍යමය ලැබීම් ගිණුම් ගත කළ යුතු ය."

සල්ලි ගිණුම්ගත කරන්න ඕනෑ විධියත් කියනවා. දැන් මොකක්ද කියන්නේ? ඒකේ යෝජනා හතක් තිබෙනවා. ගොඩක් දෙමවුපියෝ මේවා දන්නේ නැහැ. ගොඩක් දෙමවුපියෝ විදුහල්පතිතුමාට බණිනවා. මේ ඉස්කෝලේ විදුහල්පති සල්ලි හම්බ කරනවා; හොරකම් කරනවා; ගත්ත සල්ලිවලට කරන දෙයක් නැහැ කියලා ඒ දෙමවුපියෝ විදුහල්පතිතුමාට බණිනවා. නමුත් බණින්න ඕනෑ කාටද? මේ ආණ්ඩුවටයි. මේ ආණ්ඩුවේ ඇමතිවරු තමයි මේ චක්‍රලේඛ නිකුත් කරන්නේ. එතැන තමයි මේ ප්‍රශ්නයේ මුල තිබෙන්නේ. එහෙම නැතුව අහිංසක විදුහල්පතිතුමාව අල්ලා ගෙන වැඩක් නැහැ. ඒ වාගේම එම උපදෙස් සංග්‍රහයේ 10.6 යටතේ මොකක්ද කියන්නේ? එහි යෝජනා 7ක් තිබෙනවා. පළමුවැනි එක මොකක්ද? රාජ්‍ය අරමුදල්. ඒ කියන්නේ, ආණ්ඩුවෙන් ලැබෙන මුදල්. දෙවැනි එක, දෙමාපිය පරිත්‍යාග. අන්න මා කිව්වේ ඒකයි. සුන්දර වචනය දාලා දවටනයක ඔතලා තිබෙන්නේ. මුදල් බලෙන් ගන්නවා නොවෙයි, "පරිත්‍යාග" කියා තිබෙන්නේ. පරිත්‍යාග කියා වචනය තිබෙනවා. නමුත් ඒ සල්ලි ගන්න විධිය මේ රටේ ලක්ෂ සංඛ්‍යාත දෙමවුපියෝ දන්නවා. මේ රටේ හතළිස් දෙලක්ෂයක් දරුවෝ දන්නවා, සල්ලි ගන්නේ කොහොමද කියලා. පරිත්‍යාගවලින්ද කියලා ඒ අය දන්නවා. තුන්වැනි එක, සුභපතන්නන්ගේ පරිත්‍යාග. පාසලට සුභපතන්නන්ගෙනුත් සල්ලි ගන්නවා. All the best! හතරවැනි එක, ගොඩනැඟිලි, භූමිය හා උපකරණ භාවිත කිරීමට දීමෙන් ලැබෙන ආදායම්. ඉස්කෝලේ පිට්ටනිය, ඉස්කෝලේ ශාලාව භාවිත කිරීමට දෙන්න පුළුවන්. දැන් අපි දකිනවා ඉස්කෝලවල සංගීත සංදර්ශන තිබෙනවා. පිට්ටනියේ සංගීත සාජ්ජ තිබෙනවා. ඒවා තිබෙන කොට විකාර සිද්ධ වෙනවා. එහිදී වන සංස්කෘතික පරිහානිය, ළමයින්ගේ අධ්‍යාපනයට වන හානිය ගැන නොසලකා විදුහල්පතිවරයා හා ආචාර්ය මණ්ඩලය සල්ලි ගැන හිතලා පිට්ටනියේ, ශාලාවේ විවිධ ප්‍රසංග පවත්වනවා. මොකටද, සල්ලි හම්බ කර ගන්න. වෙන කරන්න දෙයක් නැහැ. ඒක විදුහල්පතිතුමාට පැවරිලා තිබෙන වගකීමක්.

ඊළඟට පස්වැනි එක, විෂයයක් යටතේ නිෂ්පාදිත භාණ්ඩ විකිණීමෙන් ලැබෙන මුදල්. භාණ්ඩ විකුණලා සල්ලි හම්බ කරන්න පුළුවන්. ඉතින් දිනයක් නියම කර ගෙන ඉස්කෝලේ පොළක් පවත්වනවා. පොළෙන් භාණ්ඩ ගන්න කියා දෙමවුපියන්ට ආරාධනා කරනවා. අනේ, එන්නේ දෙමවුපියෝ ටික දෙනායි. ඉස්කෝලේම ගුරුවරුයි, ළමයින්ගේම දෙමවුපියෝයි විකුණන්න ගෙනාපු බඩු ටික අරගෙන යනවා. ඒ අම්මලාම තමයි පොළට බඩු ගෙනාවේ. තමන්ගේ දරුවාට කිව්වා, මුකුණුවැන්න මිටියක් අරගෙන යන්න කියලා. තමන්ගේ දරුවාට කිව්වා කෙහෙල් මුවක් අරගෙන යන්න කියලා. හැබැයි ගන්න කෙනෙකු නැහැ. ඒවා ගෙනියපු ළමයාගේ දෙමවුපියෝම නැවත සල්ලි දීලා ගන්නවා. ඉතින් පොළේ ආදායම ඉස්කෝලේට එනවා. ඒ සල්ලිවලින් ඉස්කෝලේ තීන්ත ආලේප කරනවා. මෙන්න ක්‍රමය. ඒ ක්‍රමය චක්‍රලේඛයේ තිබෙන්නේ.

ඊළඟට හයවැනි එක, අනුමත විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති තුළින් උපයා ගන්නා ආදායම්. විවිධ ව්‍යාපෘති අනුමත කර ගෙන ඒ තුළින් සල්ලි උපයන්න පුළුවන්. ඊළඟට හත්වැනි එක, වෙනත් ආදායම්. ආදායම් ලබා ගන්න මාර්ග විවෘත - open - කර තිබෙනවා. වෙනත් ආදායම්වලින් සල්ලි හම්බ කරන්න ක්‍රම තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කැසිනෝවලින්ද?

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
කැසිනෝවලින්ද කියා දන්නෙත් නැහැ. මොකද, එහෙම තහනම් කියලාත් නැහැ. කැසිනෝවලින් හෝ බූරු පොළක්

ඉස්කෝලේ දාලා හෝ සල්ලි හම්බ කරන්න ඉඩ ප්‍රස්ථාව තිබෙනවා. මොකද, එහෙම කරන්න එපා කියලා නැහැ. ඒවාත් වෙනත් ආදායම් ක්‍රම. එකම දේ කමිටුවෙන් අනුමත කරන්නේ. කමිටුවේ පිස්සු හාදයෙකු හෝ දෙදෙනෙකු හිටියොත් ඒවා අනුමත වෙනවා. සල්ලි මත පාසලේ අධ්‍යාපනය තීරණය කරන චක්‍රලේඛ නිකුත් කළාම ඒවා වළක්වන්න බැහැ. ඊට පස්සේ තව හොඳ chance එකක් දෙනවා සල්ලි එකතු කරන අයට. බලන්න අධ්‍යාපන සේවා ඇමතිතුමනි, උපදෙස් සංග්‍රහය. මොකක්ද කියන්නේ? දැන් සල්ලි එකතු කරන්න යෝජනා 7ක් යටතේ ඉඩ පහසුකම් දීලා, නිකම් ඉන්නේ නැහැ. ඒකට මූලික වෙලා, මැදිහත් වනවා නේ කට්ටියක්. සාමාන්‍යයෙන් ආදි ශිෂ්‍ය සංගමයේ කිහිප දෙනෙකු මේකට පොඩ්ඩක් කර තියලා, බර තියලා අදිනවා. සමහර අය ඇත්තටම පාසලට ආදරයට එලෙස කරනවා. සමහර අය වෙන වෙන වුවමනාවලට කරනවා. මොකද, උපදෙස් සංග්‍රහයේ තව කරුණක් පැහැදිලිව තිබෙනවා. එහි 10.14 යටතේ මොකක්ද කියන්නේ? එහි මෙසේ සඳහන් වෙනවා:

> "එසේම මෙම ආදායම් ඉපයීමට සම්බන්ධ වූ අය සිටී නම් එම පාර්ශ්වයන්ට එම ආදායමෙන් කොටස් බෙදා දීමේ සීමාව හා ගිණුමට බැර කිරීමේ සීමාව පාසල් සංවර්ධන කමිටුව විසින් තීරණය කළ යුතු ය."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බලන්න දුන්නු උපදෙස්. සල්ලි එකතු කරන්නත් පුළුවන්. එකතු කර ගන්න යෝජනාත් තිබෙනවා. ඊට පස්සේ කියනවා, කොටස් බෙදා ගන්නත් පුළුවන් කියලා.

මෙම ආදායම් ඉපයීමට සම්බන්ධ වූ අය සිටී නම් -ඒ සල්ලි උපයන්න සම්බන්ධ වුණු අය සිටී නම්- එම පාර්ශ්වයන්ට එම ආදායමෙන් කොටස් බෙදා දීමේ සීමාව හා ගිණුමට බැර කිරීමේ සීමාව පාසල් සංවර්ධන කමිටුව විසින් තීරණය කළ යුතුය. ලක්ෂ පහක්, දහයක් හෙව්වොත් කොයි තරම් ප්‍රමාණයක් පාසලේ පොදු ගිණුමට දානවාද, කොයි තරම් ප්‍රමාණයක් උපයන්න මැදිහත් වුණු අය අතරේ කොටස් බෙදා ගන්නවාද කියලා පාසල් සංවර්ධන කමිටුව විසින් තීරණය කරනවා. මේ අනුව බලන විට කොටස් වෙළෙඳ පොළක් වෙලා - share market එකක්- වෙලා තිබෙන්නේ. දැන් අධ්‍යාපන ඇමතිතුමා කියනවා, සල්ලි එකතු කරන්න බැරි ලු. සල්ලි එකතු කරන්න නොවෙයි, මේ චක්‍රලේඛයට අනුව එකතු කරපු සල්ලිවල කොටස් බෙදා ගන්නත් නීතිය තිබෙනවා. ඒකයි ඇත්ත කථාව. මේ චක්‍රලේඛය වෙනස් කරන්නේ නැතුව, "අනේ සල්ලි එකතු කරන්න බැහැ, ඒක නීතියෙන් තහනම්, කිසිම දෙමව්පියෙකුගෙන් සල්ලි එකතු කරන්න බැහැ, කවුරු හරි එකතු කරලා තිබෙනවා නම් මට කියන්න" කියලා බොරුවට කෑ ගහලා වැඩක් නැහැ. මේ රටේ දෙමව්පියෝ, මේ රටේ සමහර ගුරුවරු පවා ඇත්තටම මේ චක්‍රලේඛ ගැන තවම හරියට දන්නේ නැහැ. සමහර ගුරුවරු විදුහල්පතිතුමාට බනිනවා. මොකද ගුරුවරු හිතනවා, විදුහල්පතිතුමා තනියෙන් හම්බ කරගෙන කනවා, විදුහල්පතිතුමා මේ සල්ලි හොරකම් කරනවා කියලා. මේ චක්‍රලේඛයෙන් ඒ කමිටුවට බලය පවරලා තිබෙනවා. ඒ කමිටුව මඟින් සල්ලි එකතු කරනවා විතරක් නොවෙයි, කොටස් බෙදා ගැනීමකුත් කරනවා. ඒකට අවශ්‍ය කරන ප්‍රතිපාදන මේ චක්‍රලේඛවල තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊ ළඟට මෙහි 11.11 වගන්තියෙන් මොකක්ද කියන්නේ? 11.11 වගන්තියේ මෙසේ සඳහන් වනවා:

> "පාසල් සඳහා සේවාවක් ලබා ගැනීම පිණිස තාවකාලික ව යම් කිසි පුද්ගලයකු බඳවා ගනු ලබන්නේ නම් එම පුද්ගලයාගේ නම සඳහන් කර පාසල් සංවර්ධන කමිටුවෙන් අවසර ලබා ගත යුතු ය."

ඒක දැන් හරි පැහැදිලියි. දැන් ගුරුවරු ආණ්ඩුවෙන් දෙන්නේ නැහැ. ළමයි උපවාස කරනවා, තමන්ගේ ඉස්කෝලේ ගුරුවරු නැහැ, ගුරුවරයෙක් දෙන්න කියලා. ඒ ළමයින්ට පොලීසිය තඩි බානවා. ළමයින් ඒ උපවාසය කරමින් සිටි කූඩාරමට පොලීසිය ගිහිල්ලා මාරාන්තික විධියට පහර දුන්නා. ඒ ළමයි මොනවාද ඉල්ලුවේ? ඒ ළමයි ලැම්බෝගිනි ඉල්ලුවේ නැහැ. ඒ පාසලේ දරුවෝ ලැම්බෝගිනි ඉල්ලලා උපවාස කළේ නැහැ. Race පදින්න racing cars ඉල්ලලා උපවාස කළේ නැහැ. ඒ ළමයි ඉල්ලුවේ, අපට ඉගෙන ගන්න අපේ පාසලට ගුරුවරයෙක් දෙන්න කියලායි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
මට විනාඩි 50ක් තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
යෝජනාව ස්ථිර කරන්න විනාඩි 5ක් වෙන් කරලා තිබෙනවා.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාසල් ගුරුවරුන්ට පඩි ගෙවන්න, සේවකයන්ට පඩි ගෙවන්න, මුරකාරයන්ට පඩි ගෙවන්න කියලා තිබෙනවා. ඒක තමයි නියාමන ව්‍යාපෘති විධියට පටන් ගත්තේ. මේ තිබෙන්නේ, "පාසල් නඟා සිටුවීමේ නියාමන වැඩසටහන" සියලුම පාසල්වල ක්‍රියාත්මක කරනවා කියන චක්‍රලේඛයයි. මේ චක්‍රලේඛ දෙකම හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා.

ඒ චක්‍රලේඛයේ ඉතා පැහැදිලිව තිබෙනවා, කොහොමද සල්ලි එකතු කරන්නේ කියලා. අපේ ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා ප්‍රශ්නයක් ඇහුවා, කොහොමද සල්ලි එකතු කරන්නේ, කොහේද receipt තිබෙන්නේ කියලා. මම පෙන්වන්නම් Royal College එකේ රිසිට් පත. [බාධා කිරීමක්] නැහැ, නැහැ. මම ඒවා කියන්න ඕනෑ.

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
අහපු දේ කියන්න.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
අහපු දේත් කිව්වා. ඊට වැඩි පුරයි මේ කියන්නේ. ඔබතුමා කිව්වා කොළඹ රාජකීය විද්‍යාලයට වාගේ ඒවාට එන්නේ සල්ලි තිබෙන ළමයි කියලා. සල්ලි තිබෙන ළමයි කිහිප දෙනෙක් එනවා ඇති. නමුත් සමහර දරුවන් දුෂ්කර ගම්මානවලින් ශිෂ්‍යත්ව

---

** කථාව අවසානයේ පළ කර ඇත.*
** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of speech.*

[ගරු විජිත හේරත් මහතා]

විභාගයෙන් වැඩි ලකුණු අරගෙන ණය වෙලා, කුඹුරු උකස් කරලා තමයි කොළඹ රාජකීය විද්‍යාලයට ඉගෙන ගන්න එන්නේ. එහෙම නැතුව හැමෝම පොහොසත් අය නොවෙයි. මෙහි තිබෙනවා, school fees එකතු කරන විධිය. SDS Fees යටතේ Security Fund එකට රුපියල් 1,020යි. Record Books and Stationery Fund එකට රුපියල් 780යි. Library Fund එකට රුපියල් 420යි. Sports Fund එකට රුපියල් 720යි. Electricity Fund එකට රුපියල් 720යි. Technological Expenses Fund එකට රුපියල් 600යි. Repair and Maintenance Expenses Fund එකට රුපියල් 480යි. Sanitary Services Fund එකට රුපියල් 480යි. වැසිකිළි හෝදන්න, වැසිකිළිවල නඩත්තු කටයුතු සඳහාත් ළමයින්ගෙන් සල්ලි එකතු කරනවා. Miscellaneous Expenses Fund එකට රුපියල් 480යි. ඊට අමතරව තමයි පහසුකම් ගාස්තු - Facility Fees - රුපියල් 60ක් එකතු කරන්නේ. මේ තිබෙන්නේ කුවිතාන්සිය.

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
ඔය අය කිරීම කරලා තිබෙන්නේ අවුරුද්දකටද, මාසයකටද?

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
රාජකීය විද්‍යාලයේ එක ළමයෙකුගෙන් පාසලට ලැබෙන මුදල රුපියල් 5,736යි. ආසන්න වශයෙන් ළමයින් 8,400ක් ඉන්නවා. කොළඹ රාජකීය විද්‍යාලය, රුපියල් 5,736 ගණනේ හැම ළමයෙකුගෙන්ම එකතු කරන මුදලෙහි එකතුව රුපියල් හාරකෝටි අසූඑක් ලක්ෂ අසූදෙදහස් හාරසියයි.

එම මුදල දොළහෙන් බෙදුවාම එක මාසයකට රුපියල් 40,15,200ක් එකතු කරනවා. මේ කියන ගාස්තු සඳහා කොළඹ රාජකීය විද්‍යාලය එක මාසයකට රුපියල් 40,15,200ක් එකතු කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රත්නපුර, දියවින්න විද්‍යාලයේ ළමයි 140දෙනායි ඉන්නේ. එම පාසලේ නිවාසාන්තර මලල ක්‍රීඩා තරගයට එක ළමයකුගෙන් රුපියල් 1,000 ගණනේ සල්ලි එකතු කරනවා. එතකොට sports meet එකට විතරක් රුපියල් 1,40,000ක් සල්ලි එකතු කරනවා. හැම දෙමවුපියකුම රුපියල් 1,000ක් යවන්න ඕනෑ. මේක තමයි තත්ත්වය. එම නිසා මේ අපරාධය වහාම නතර කරන්න. පාසලට ළමයකු ඇතුළත් කර ගනිද්දී, පාසලේ ළමයින් ඉගෙන ගනිද්දී මේ විධියට පාසල් ළමයින්ගෙන් සල්ලි එකතු කරලා දෙමවුපියන් මත බර පටවන එක වහාම නතර කරන්න. මේ චක්‍රලේඛය නතර කරලා, නීතිය ක්‍රියාත්මක කරලා, අධ්‍යාපනයට වෙන් කරන ප්‍රතිපාදන වහාම වැඩි කරන්න කියා රජයට බල කරමින් මගේ කථාව අවසන් කරනවා.

***සභාමේසය මත තබන ලද චක්‍රලේඛ:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட சுற்றுநிருபங்கள்:*
*Circulars tabled:*



දුරකථන/தொலைபேசி இல./Telephone Nos.
අමාත්‍යතුමා / அமைச்சர் / Minister: 2784832, 2784807, 2785617
ලේකම් / செயலாளர் / Secretary: 2784812
කාර්යාලය / அலுவலகம் / Office: 2785141-50, Fax: 2784846
ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk
ඔබේ අංකය / உமது இல. / Your No. ..........

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education
"ඉසුරුපාය" බත්තරමුල්ල.
"இசுருபாயா" பத்தரமுல்ல.
"Isurupaya" Battaramulla.
පාසල් කටයුතු හා පෞද්ගලික පාසල් ශාඛාව
මගේ අංකය / எமது இல. / My No. ED/01/12/06/14/0
දිනය / திகதி / Date 2009.01 ෧

චක්‍රලේඛ අංක – 2008/35 (I)

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලුම කොට්ඨාස භාර නියෝජ්‍ය/ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලුම විදුහල්පතිවරුන්

පාසල් නගා සිටුවීමේ නියාමන වැඩසටහන

පාසලේ ගුණාත්මක සංවර්ධනය වැඩි දියුණු කිරීම පිණිස හඳුන්වා දී ඇති පාසල් නගා සිටුවීමේ නියාමන වැඩසටහන පිළිබඳ නිකුත් කර ඇති 2008.09.15 දිනැති හා අංක 2008/35 දරන චක්‍රලේඛයට අමතර වශයෙනි.

02. අංක 2008/35 දරන චක්‍රලේඛය මගින් මෙම වැඩසටහන සඳහා හඳුන්වා දී ඇති පාසල්වලට අමතරව 2006 සිට 2008 දක්වා ඉසුරු පාසල් ලෙස තෝරා ගෙන ඇති පාසල් සඳහා ද 2009 වර්ෂයේ දී තෝරා ගැනීමට නියමිත ඉසුරු පාසල්වල ද මෙම පාසල් නගා සිටුවීමේ වැඩසටහන මින් ඉදිරියට ක්‍රියාත්මක කිරීමට නියමිතය.

03. තවද හෝමාගම, විල්ගමුව, මුලටියන, වඩමාරච්චි, කන්තලේ, ගිරිඋල්ල, ගලෙන්බිඳුනුවැව, මහියංගණය හා මාවනැල්ල යන කලාපයන්හි සියලු පාසල්වල ද මෙම වැඩසටහන 2009 වර්ෂයේ සිට ක්‍රියාත්මක කෙරේ.

04. ඉහත සඳහන් කළ පාසල්වල මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අංක 2008/35 දරන චක්‍රලේඛයේ සඳහන් උපදෙස් සංග්‍රහය අනුව කටයුතු කරන ලෙස දන්වමි.

05. පාසල් නගා සිටුවීමේ වැඩසටහනේ අරමුණු හා අපේක්ෂිත ප්‍රතිඵල ළඟාකර ගත හැකි වන පරිදි පාසල් සංවර්ධන කමිටුව හා පාසල් කළමනාකරණ කණ්ඩායම කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරමි.

එම්.එම්.එන්.ඩී.බණ්ඩාර
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත්
1. විගණකාධිපති
2. සභාපති, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
3. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය
4. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
5. කොට්ඨාස භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්



දුරකථන/தொலைபேசி இல./Telephone Nos.
අමාත්‍යතුමා / அமைச்சர் / Minister: 2784832, 2784807, 2785617
ලේකම් / செயலாளர் / Secretary: 2784811
කාර්යාලය / அலுவலகம் / Office: 2785141-50, Fax: 2784846
ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk
ඔබේ අංකය / உமது இல / Your No. ..........

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education
'ඉසුරුපාය', ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ බත්තරමුල්ල
"இசுருபாயா" ஸ்ரீ ஜயவர்தனபுர கோட்டை பத்தரமுல்ல
"Isurupaya", Sri Jayawardhanapura Kotte Battaramulla.
පාසල් කටයුතු හා පෞද්ගලික පාසල් ශාඛාව
මගේ අංකය / எமது இல. / My No. ED/01/12/06/14/01
දිනය / திகதி / Date 2010.09.07

චක්‍රලේඛ අංක : **2010/28**

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කොට්ඨාස භාර නියෝජ්‍ය/ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම විදුහල්පතිවරුන්

පාසල් නගා සිටුවීමේ වැඩසටහන

පාසල් නගා සිටුවීමේ වැඩසටහන පිළිබඳව මීට පෙර නිකුත් කර ඇති 2008.09.15 දිනැති අංක 2008/35, 2009.01.09 දිනැති 2008/35 (i) හා 2010.02.10 දිනැති 2008/35 (ii) දරන චක්‍රලේඛයන්ට අමතර වශයෙනි.

02. ඉහත චක්‍රලේඛ හා චක්‍රලේඛ සංශෝධන මගින් වාර්ෂිකව පාසල් නගා සිටුවීමේ වැඩසටහන් ක්‍රියාත්මක වන කලාප හා පාසල් සඳහන් කර ඇත. එම කලාප හා පාසල්වල මෙම වැඩසටහන නියාමන වැඩසටහනක් ලෙස හඳුන්වා දී ඇත. එහෙත් පාසල් නගා සිටුවීමේ වැඩසටහන මින් ඉදිරියේ දී නියාමන වැඩසටහනක් නොවන බව දන්වමි. පාසල් නගා සිටුවීමේ වැඩසටහන මින් ඉදිරියට දිවයිනේ සියලුම රජයේ පාසල්වල ක්‍රියාත්මක කළ යුතු ය.

03. මෙම වැඩසටහන මෙතෙක් ක්‍රියාත්මක පාසල්වල හා මින් ඉදිරියට ක්‍රියාත්මක කරනු ලබන පාසල්වල අංක 2008/35 චක්‍රලේඛයේ පාසල් නගා සිටුවීමේ වැඩසටහන පිළිබඳ උපදෙස් සංග්‍රහය හා ඊට අදාළ ඉහත සංශෝධන චක්‍රලේඛ අනුව කටයුතු කරන ලෙස දන්වමි.

04. පාසල් නගා සිටුවීමේ වැඩසටහනේ අරමුණු හා අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගත හැකි වන පරිදි පාසල් සංවර්ධන කමිටුව හා පාසල් කළමනාකරණ කණ්ඩායම කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරමි.

සුනිල් එස්. සිරිසේන
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත්
1. විගණකාධිපති
2. සභාපති, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
3. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය
4. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
5. කොට්ඨාස භාර නියෝජ්‍ය/ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද කාලීන වැදගත්කමකින් යුත් යෝජනාව මා ස්ථිර කරනවා. ඒ සම්බන්ධව මා පසුව කථා කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මීළඟට ගරු ටී.බී. ඒකනායක අමාත්‍යතුමා.

[අ.භා. 2.42]

**ගරු ටී. බී. ඒකනායක මහතා (සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க - கலாசார, கலை அலுவல்கள் அமைச்சர்)
(The Hon. T.B. Ekanayake - Minister of Culture and the Arts)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාව පටන් ගන්න කලින්, වමේ දේශපාලනයේ ඉතා ශක්තිමත් නායකයකු විධියට බටහිරට ගැති නොවී, වමේ දේශපාලනය ශක්තිමත් කරමින්, වමේ ව්‍යාපාරය ශක්තිමත් කරමින්, දක්ෂිණාංශයට යට නොවී සිටි වෙනිසියුලාවේ හිටපු ජනාධිපති හියුගෝ චාවේස් මැතිතුමාගේ අභාවය පිළිබඳව අපේ කනගාටුව පළ කරන්න කැමැතියි. දරුණු අසනීප තත්ත්වයක් හේතුවෙන් මිය ගිය එතුමා වෙනුවෙන් මුළු රටේම වමේ ව්‍යාපාරය ආචාරය, ගෞරවය පළ කරන මේ මොහොතේ, අතිගරු ජනාධිපතිතුමා වෙනුවෙනුත්, රජය වෙනුවෙනුත් අපේ ශෝකය හා ආචාරය පළ කරනවා. එතුමාට ආචාර කිරීම සඳහා ගරු විමල් වීරවංශ අමාත්‍යතුමාත්, විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමාත් එම අවමංගල උත්සවයට සහභාගි වී තිබෙන බවත් මේ අවස්ථාවේ සඳහන් කරන්න කැමැතියි. අවසාන වශයෙන්, වමේ ව්‍යාපාරයේ නායකයකු වෙනුවෙන් අපේ ආචාරය යළිත් පුද කරනවා.

අද දින සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කරමින් අපේ විජිත හේරත් මන්ත්‍රීතුමා විවිධ කාරණා පැහැදිලි කළා. හැබැයි, අද අධ්‍යාපනය පිළිබඳව ඇති ශක්තිමත් ප්‍රවේශය ගැන එතුමාට කියන්න අමාරු වුණා. එතුමා පොල් ගෙඩි අටේ සිද්ධිය ගැන පුන-පුනා කථා කළා.

පසු ගිය වර්ෂ 16ක කාලය පුරාම ශ්‍රී ලංකාව තුළ පාසල් අධ්‍යාපනයේ සංවර්ධනයක් සිදු වී ඇති බව පැහැදිලියි. මෙහිදී සාක්ෂරතාව නඟා සිටුවීම සඳහා වූ අධ්‍යාපනයේ දායකත්වය බැලිය යුත්තේ, 1940 දී සියයට 40ක් වශයෙනුත්, 1960 දී සියයට 72ක් වශයෙනුත් තිබූ සාක්ෂරතාව 2010 වසර වන කොට සියයට 96 දක්වා වර්ධනය වීම තුළිනි. මෙහි ඉතා ඉහළ වර්ධනයක් තිබෙන බව මහ බැංකු වාර්තාවට අනුව පැහැදිලියි. මෙය සම්පූර්ණයෙන්ම නිදහස් අධ්‍යාපනය තුළින් ළඟා කර ගත් ජාතික ඉලක්කයක් බව කියන්න ඕනෑ. 1994 වසරේ සියයට 90.6ක් වූ ද්විතීයික චක්‍රයට පිවිසෙන ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතය, 2011 වසර වන විට සියයට 98.5 දක්වා වර්ධනය වීම තුළින් පෙන්නුම් කරන්නේ, ප්‍රාථමික චක්‍රය සාර්ථකව නිමවා ද්විතීයික අධ්‍යාපන චක්‍රය සඳහා ප්‍රවේශ වීමේ අවස්ථා වැඩි වී ඇති බවයි. මේ ආකාරයටම 1994 සිට 2011 දක්වා ප්‍රාථමික අධ්‍යාපනය සඳහා ඇතුළත් වීම සියයට 89.4 සිට සියයට 98.26 දක්වා වර්ධනය වීමත් සුවිශේෂී ජයග්‍රහණයක් බව කියන්න කැමතියි. 1994 දී 22ක් වූ ගුරු ශිෂ්‍ය අනුපාතය, 2011 වන විට 17 දක්වා අඩු වීම තුළ ඉගෙනුම් අවශ්‍යතා සඳහා ගුරුවරුන්ගේ සැපයීම කොතරම් දුරට සහතික කර ඇති බව පැහැදිලියි.

අධ්‍යාපන ක්ෂේත්‍රයේ පරිගණක පහසුකම් පුළුල් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස 2005 දී සියයට 16ක් වූ පරිගණක සාක්ෂරතාව, 2011වන විට සියයට 38 දක්වා වර්ධනය වීම අධ්‍යාපන ක්ෂේත්‍රය ලබා ඇති විශාල ජයග්‍රහණයක් බව කියන්න ඕනෑ. එය දැනුම් කේන්ද්‍රීය සමාජයක් කරා යෑමේ මූලික අඩිතාලම බවත් කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම ඉලක්ක සපුරාලීමට අපි ක්‍රියාත්මක විය යුතුයි. ජාත්‍යන්තර වශයෙන් සැසඳීමේදී 2010 වසරේ ශ්‍රී ලංකාවේ ගුරු ශිෂ්‍ය අනුපාතය සියයට17යි. බංගලාදේශය සියයට 43යි, නේපාලය සියයට 32යි, පාකිස්තානය සියයට 40යි. මේ ආසියාවේ රටවල තත්ත්වයයි.

ප්‍රාථමික චක්‍රය සම්පූර්ණ කරන ශිෂ්‍ය අනුපාතය 2010 වසරේ සංඛ්‍යා ලේඛන අනුව බැලුවාම, ශ්‍රී ලංකාව සියයට 99.5ක ඉලක්කයකට ඇවිල්ලා තිබෙනවා. ඕස්ට්‍රේලියාව සියයට 98.1යි, ජර්මනිය සියයට 100යි, ජපානය සියයට 100යි, කොරියාව සියයට 100යි, ස්වීඩනය සියයට 99.0යි, නෝර්වේ සියයට 99.0යි, සවුදි අරාබිය සියයට 85.0යි, නයිජීරියාව 74.0යි, පාකිස්තානය 67.0යි.

සංඛ්‍යා ලේඛන අනුව ද්විතීයික චක්‍රය සඳහා ශිෂ්‍ය සහභාගිත්ව අනුපාතය ශ්‍රී ලංකාව සියයට 98.5යි, ඕස්ට්‍රේලියාව සියයට 85යි, සයිප්‍රසය සියයට 96යි, ප්‍රංශය සියයට 99යි, හොංකොං සියයට 75යි, අයර්ලන්තය සියයට 99යි, කොලොම්බියාව සියයට 74යි, භූතානය සියයට 52යි, බංගලාදේශය සියයට 47යි. මේ සංඛ්‍යා අනුව, ඉතිහාසය පුරා අපේ අධ්‍යාපනයේ වර්ධනය සිදුව ඇත්තේ කෙසේද කියා අපට මැනවින් තහවුරු වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම විවිධ අවස්ථාවලදී අපොස සාමාන්‍ය පෙළ විභාගයේදී ගණිතය, විද්‍යාව, ඉංග්‍රීසි කියන විෂයයන් සමත් ශිෂ්‍ය අනුපාත ගත්තාම 2002 වසරේ ගණිතය සියයට 39.97යි, විද්‍යාව සියයට 54.56යි, ඉංග්‍රීසි භාෂාව සියයට 23.84යි.

2005 වසරේ මේ අනුපාතයේ වර්ධනයක් ඇති වෙලා තිබෙනවා. 2005 වසරේ ගණිතය සියයට 44.03යි, විද්‍යාව සියයට 54.75යි, ඉංග්‍රීසි භාෂාව 36.18යි. 2010 වසරේ නැවත මේ අනුපාතය වර්ධනය වෙලා තිබෙනවා. 2010 වසරේ ගණිතය සියයට 60.38යි, විද්‍යාව සියයට 61.72යි, ඉංග්‍රීසි භාෂාව සියයට 42.36යි. 2011 දී නැවත එම අනුපාතයේ වර්ධනය ආරම්භ වනවා. 2011 වසරේ ගණිතය සියයට 55.33යි, විද්‍යාව සියයට 62.40යි, ඉංග්‍රීසි භාෂාව සියයට 44.57යි.

මේ ආකාරයෙන් වර්ධන වේගය පිළිබඳව විවිධ සංඛ්‍යාලේඛන තියෙද්දී පාසල් වැසී යෑමේ කාරණයත් අපට කථා කරන්න වනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දරුවන් පාසල්වලට ඇතුළු කිරීමේ ප්‍රතිශතය පළාතෙන් පළාතට අද අඩු වෙලා තිබෙනවා. මේක ජාතික ප්‍රශ්නයක්. අතීතයේ පවුලක සිටි දරුවන් සංඛ්‍යාව සහ අද පවුලක සිටින දරුවන් සංඛ්‍යාව දිහා බැලුවාම, අද පවුලක සිටින්නේ දරුවන් එක්කෙනයි, දෙන්නයි. වැඩිම වුණොත් තුන් දෙනායි. ඒ නිසා උපත් අනුපාතය පිළිබඳ ප්‍රශ්නය පාසල්වලට දරුවන් ඇතුළු කිරීමේදී බලපාන බව විවිධ සංඛ්‍යා ලේඛනවලින් අපට පැහැදිලි වෙලා තිබෙනවා.

2005 සහ 2012 වසර අතර කාලය තුළ වැසුණු පාසල් ප්‍රමාණය දැක්වෙන වාර්තා මා ළඟ තිබෙනවා. බස්නාහිර, මධ්‍යම, දකුණ, උතුර, නැඟෙනහිර, වයඹ, උතුරු මැද, ඌව, සබරගමුව කියන සියලු පළාත්වල 2005 දී පාසල් 39ක්, 2006 දී පාසල් 40ක්, 2007 දී පාසල් 74ක්, 2008 දී පාසල් 14ක්, 2009 දී පාසල් 104ක්, 2010 දී පාසල් 79ක්, 2011 දී පාසල් 16ක්, 2012 දී පාසල් 36ක් වසා දමා තිබෙනවා.

මෙසේ වසා තිබී, පාසල් 1,000 වැඩ සටහන යටතේ නැවත විවෘත කරන ලද පාසල්වල තොරතුරු මා ළඟ තිබෙනවා. ඒ අනුව බස්නාහිර පළාතේ නැවත විවෘත කළ පාසල් ගණන 08යි; ඒවාට ඇතුළත් කළ සිසුන් සංඛ්‍යාව 189යි. මධ්‍යම පළාතේ නැවත විවෘත කළ පාසල් ගණන 2යි; ඇතුළත් කළ සිසුන් සංඛ්‍යාව 55යි. දකුණ

[ගරු ටී. බී. ඒකනායක මහතා]

පළාතේ නැවත විවෘත කළ පාසල් ගණන 2යි; ඇතුළත් කළ සිසුන් සංඛ්‍යාව 373යි. උතුර පළාතේ නැවත විවෘත කළ පාසල් ගණන 6යි; ඇතුළත් කළ සිසුන් සංඛ්‍යාව 204යි. නැඟෙනහිර පළාතේ නැවත විවෘත කළ පාසල් ගණන 5යි; ඇතුළත් කළ සිසුන් සංඛ්‍යාව 87යි. වයඹ පළාතේ නැවත විවෘත කළ පාසල් ගණන 7යි; ඇතුළත් කළ සිසුන් සංඛ්‍යාව 161යි. උතුරු මැද පළාතේ නැවත විවෘත කළ පාසල් ගණන 3යි; ඇතුළත් කළ සිසුන් සංඛ්‍යාව 174යි. සබරගමුව පළාතේ නැවත විවෘත කළ පාසල් ගණන 1යි; ඇතුළත් කළ සිසුන් සංඛ්‍යාව 82යි. මේ අනුව වසා තිබූ පාසල් 34ක් පාසල් 1000 වැඩ සටහන යටතේ අලුතින් ආරම්භ කරන්න පුළුවන් වෙලා තිබෙනවා; නව සිසුන් 1,325ක් ඇතුළත් කරගන්න හැකියාව ලැබිලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධ්‍යාපන ක්ෂේත්‍රය ගැන කථා කරද්දී අප විශේෂයෙන් කියන්න ඕනෑ, පසු ගිය ඉතිහාසයේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ වසා දැමූ පාසල් පවා අද ක්‍රියාත්මක වන වැඩ සටහන් යටතේ විවෘත කර තිබෙන බව. උදාහරණයක් හැටියට මහව කලාපය ගන්න පුළුවන්. මහව කලාපයේ වලස්වැව විද්‍යාලය, මොරගස්වැව විද්‍යාලය සහ තවත් පාසලක් එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ වසා දමා තිබුණා. අද ඒ පාසල් තුනම නැවත විවෘත කරලා ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපනය ලබා දෙන ඉහළම පාසල් බවට පත් කරන්න අපි කටයුතු කර තිබෙනවා. ගරු අධ්‍යාපන අමාත්‍ය බන්දුල ගුණවර්ධන මැතිතුමා වලස්වැව විද්‍යාලය ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබා දෙන පාසලක් විධියට ප්‍රවර්ධනය කරන්න කටයුතු කළා. ඒ වාගේම පලාපත්වල විද්‍යාලයත් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ප්‍රාථමික අධ්‍යාපනය ලබා දෙන විද්‍යාලයක් ලෙස ප්‍රවර්ධනය කරන්න කටයුතු කර තිබෙනවා. ඒ අනුව අපට පෙනෙනවා අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ, ප්‍රාථමික අධ්‍යාපනයෙහි අලුත් වෙනසක් ඇති වෙලා තිබෙන බව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාසල්වල මුදල් අය කිරීම පිළිබඳව අපේ ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා කථා කළා. හුඟක් පාසල්වල දෙමව්පියන් කැමැතියි තම දරුවන් යන පාසල් තවතවත් ප්‍රවර්ධනය කිරීම සඳහා බාහිර ක්‍රියාකාරකම් වර්ධනය කරන්න. උදාහරණයක් විධියට ක්‍රීඩා අංශය ගන්න පුළුවන්. ක්‍රීඩා අංශයේ විවිධ ඉසව් තිබෙනවා. රගර් ක්‍රීඩාව ප්‍රවර්ධනය කරන්න ගියාම අතිවිශාල මුදලක් වැය වනවා. ක්‍රිකට් ක්‍රීඩාව ප්‍රවර්ධනය කරන්න ගියාමත් අතිවිශාල මුදලක් වැය වනවා. ඒ සඳහා වැය වන මුදලින් සියයට සියයක්ම රජයෙන් ලැබෙන්නේ නැති වන්න පුළුවන්. තමන්ගේ දරුවා ක්‍රිකට් ක්‍රීඩාවෙන් දක්ෂයකු කිරීම සඳහා ආනන්ද විද්‍යාලයේ ක්‍රීඩා අංශයට දෙමව්පියන් කොපමණ මුදල් පරිත්‍යාග කරනවාද කියලා අපේ ගරු අර්ජුන රණතුංග මැතිතුමා දන්නවා. ඒ වාගේම, රාජකීය විද්‍යාලයේ රගර් ක්‍රීඩාව ප්‍රවර්ධනය කිරීම සඳහා දෙමව්පියන් කොපමණ දායකත්වයක් ලබා දෙනවාද? බස් රථ ගන්න දායකත්වය ලබා දෙනවා. අපි දන්නවා කුරුණෑගල මලියදේව විද්‍යාලයේ rugger team එක ශක්තිමත් කරන්න දෙමව්පියන් විශාල වශයෙන් දායක වූ බව.

ජපානයට සම්බන්ධකම් තිබුණු දෙමව්පියෝ විද්‍යාලයට බස් රථ ගෙනැවිත් දුන්නා; වෑන් රථ ගෙනැවිත් දුන්නා. මහනුවර ට්‍රිනිටි විද්‍යාලයේ දෙමව්පියන් පාසලේ බාහිර අංශ, අධ්‍යාපන අංශ ප්‍රවර්ධනය කරන්න විශාල වශයෙන් මුදල් ලබා දෙනවා. එය බලකිරීමක් නිසා වත්, ආණ්ඩුවේ දායකත්වය නියෝජනය කිරීම සඳහා වත් කරන දෙයක් නොවෙයි. ඒ නිසා ඒ කාරණය මේ ආණ්ඩුවේ වැරැද්දක් විධියට, අධ්‍යාපන අමාත්‍යාංශයේ හා අධ්‍යාපන ඇමතිවරයාගේ වැරැද්දක් විධියට හුවා දැක්වීම බංකොලොත් ක්‍රියාවක් කියලා මම හිතනවා. මව්පියන් කරන ඒ කාර්යයෙන් සිද්ධ වන්නේ පාසල් තවතවත් ශක්තිමත් වීමයි. ලංකාවේ පාසල් ප්‍රමාණය අනුව පාසල් විසි ගණනක් තමයි තරගකාරී මට්ටමේ පාසල් විධියට තිබෙන්නේ. තරගකාරී මට්ටමේ තිබෙන ඒ සෑම පාසලක්ම කල්පනා කරනවා අනෙක් තරගකාරී පාසල්වලට වඩා තමන්ගේ පාසල අධ්‍යාපනයෙන් විතරක් නොව, බාහිර ක්‍රියාකාරකම්වලින්ද ශක්තිමත්ව ගොඩ නඟන්න. අපි දන්නවා, රජයේ මුදල් පාවිච්චි කරන, ඒ වාගේම විදේශ මුදල්ද පාවිච්චි කරන, වෙනත් සමාගම්වලින් පාලනය කරන පාසල් තිබෙන බව. ගල්කිස්ස සාන්ත තෝමස් විද්‍යාලය, කිංස්වුඩ් විද්‍යාලය වාගේ බාහිර විධියට පාලනය වන පාසල් ගත්තාම ඒවායෙහි අති විශාල මුදලක් අය කරනවා. එසේ අය කරන මුදල් ප්‍රමාණයවත් රජයක් විධියට අපි දන්නේ නැහැ. ඒ විද්‍යාලයේ විදුහල්පතිවරයා පත් කිරීමේ අයිතියවත් රජයට නැහැ. නමුත් රජය අතිවිශාල මුදලක් -භාගයකට වඩා වැඩි මුදල් ප්‍රමාණයක්- ඒ පාසල්වලට වියදම් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
**(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)**
(The Presiding Member)
ගරු ඇමතිතුමනි, තවත් විනාඩියයි තිබෙන්නේ ඔබතුමාට.

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
එහෙම තමයි ඒ විද්‍යාල පෙළ හැඩ ගැහිලා තිබෙන්නේ.

ඒ නිසා මොන ආකාරයෙන් චක්‍ර ලේඛ ක්‍රියාත්මක වුණත්, ආදී ශිෂ්‍යයන් විසින් පාසල් සංවර්ධන සමිති පිහිටුවාගෙන ඒ මඟින් තමන්ගේ පාසල වෙනුවෙන් උදවු උපකාර කරන්න ඒ අය කටයුතු කරනවා. අපි දන්නවා ආනන්ද විද්‍යාලය, නාලන්ද විද්‍යාලය, රෝයල් කොලේජ් එක වාගේ පාසල් ගත්තාම ඒවායේ ආදී ශිෂ්‍යයින් 2001 කණ්ඩායම, 2002 කණ්ඩායම, 2003 කණ්ඩායම, 2004 කණ්ඩායම යනුවෙන් ආදී ශිෂ්‍ය සංගම් හදාගෙන සිටින බව. මොකද, පාසල වෙනුවෙන් උදවු උපකාර කරන්න ආදී ශිෂ්‍යයින්ගේ ඒ තරම් උනන්දුවක් තිබෙනවා. ඒ විධියට කණ්ඩායම් හදා ගෙන තමන් ඉගෙන ගත් පාසලට මුදල් ආධාර ලබා දෙන්න ඒ අය සංවිධානාත්මකව පෙළ ගැසෙනවා. ඒ විධියට පෙළ ගැසෙන්න බැහැයි කියලා කාටවත් චක්‍රලේඛ යවන්න පුළුවන්කමක් නැහැ. ඉස්කෝලෙට උදවු කරන්න එපා කියලා ආදී ශිෂ්‍ය සංගම්වලට, ඒ වාගේම පාසල් සංවර්ධන සමිතිවලට කියන්න පුළුවන්කමක් නැහැ. මොකද, ඒක පාසලේ ඉගෙන ගත් ශිෂ්‍යයන් විසින් පිහිටුවාගෙන තිබෙන පාසල් සංවර්ධන සමිතිවල අයිතියක්. ඒ නිසා මේ කාරණය පිළිබඳව ඉතාමත් කල්පනාවෙන් ක්‍රියා කළ යුතුයි.

අපේ ගරු විජිත හේරත් මන්ත්‍රීතුමාටත් මතක ඇති, ජනතා විමුක්ති පෙරමුණ කාලයක් පාසල්වල විද්‍යාගාර කඩලා බෝම්බ හදන්න රසායනික ද්‍රව්‍ය ඇතුළු විවිධ උපකරණ අරගෙන ගියා. පොරමඩල විද්‍යාලයේ විද්‍යාගාරය කැඩුවා; ඉබ්බාගමුව මහා විද්‍යාලයේ විද්‍යාගාරය කැඩුවා; විජයබා විද්‍යාලයේ විද්‍යාගාරය කැඩුවා. දරුවන්ගේ ප්‍රයෝජනය සඳහා තිබුණු ඒවා තමයි එහෙම අරගෙන ගියේ. ඒවා ගැන අද කවුරුවත් කථා කළේ නැහැ. නිදහස් අධ්‍යාපනය ලබා ගත්තේ ඒ සම්පත්වලින්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේවා අපි දන්න දේවල්. ඒ විද්‍යාගාර සම්පූර්ණයෙන්ම කඩලා ඒ සම්පත් අරගෙන ගියා. ඒ පිළිබඳව අදටත් පොලීසියේ පැමිණිලි තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
**(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)**
(The Presiding Member)
ගරු ඇමතිතුමා, ඔබතුමාගේ කථාව දැන් අවසන් කළ යුතුයි. ඔබතුමාට වෙන් කර තිබෙන කාලය අවසානයි.

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)

ඒ නිසා වීදුරු කාමරවල ඉඳගෙන ගල් ගසන්න එපා. යහපත් අධ්‍යාපනයක් ලබා දීම සඳහා ගෙන යන වැඩ පිළිවෙළේ දී ඒක විපක්ෂයේද, ආණ්ඩුවේද, එහෙම නැත්නම් වෙනත් පක්ෂයකද කියන එක නොවෙයි වැදගත් වන්නේ. නිදහස් අධ්‍යාපනය කාටත් පොදුයි. කන්නන්ගර මැතිතුමා බලාපොරොත්තු වුණේ නිදහස් අධ්‍යාපනය තුළින් සියලු දෙනාටම හොඳ අධ්‍යාපනයක් ලබා දෙන්නයි. අද අපි ඒක හොඳින් ඉටු කරනවා. තමුන්නාන්සේලා හැමදාම කරන්නේ මඩ ගහන එක. මේ ආඩම්බරකාර තාත්තා තමයි අධ්‍යාපනය ගැන විශාල හැඟීමක් තිබෙන කෙනෙකු විධියට, දරුවන්ට ලෙන්ගතුකමක් තිබෙන කෙනෙකු විධියට, අද ගමේ අධ්‍යාපන ප්‍රතිඵල වැඩි වැඩියෙන් ලැබෙනකොට ඒ ගැන වැඩියෙන්ම සන්තෝෂ වන්නේ.

නැණ පහන් දල්වන්න, බාහිර ක්‍රියාකාරකම් ශක්තිමත් කරන්න අද රජය ගෙන යන වැඩ පිළිවෙළ ගැන අතිගරු ජනාධිපතිතුමාටත්, අධ්‍යාපන ඇමතිතුමාටත්, අධ්‍යාපන සේවා ඇමතිතුමාටත්, විශේෂයෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමා ප්‍රමුඛ සියලු දෙනාටමත් අපේ ගෞරවය පුද කරන්නට ඕනෑ. එතුමන්ලා කරන ජාතික සේවාවට අපි එතුමන්ලාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. බොහොම ස්තුතියි.

[අ.භා. 2.58]

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම සභාව කල් තැබීමේ යෝජනාව සම්බන්ධයෙන් වන විවාදයට සහභාගි වෙමින් මා කියා සිටින්න කැමැතියි, අධ්‍යාපනය ගැන අපි බොහෝ දේවල් කථා කර තිබෙන බව. අධ්‍යාපනය පිළිබඳව නොයෙක් අවස්ථාවල කල් තැබීමේ යෝජනා ඉදිරිපත් කරමින් විවාද කර තිබෙනවා. ඒ වාගේම මේ සභාවෙන් පිටතදීත් මේ ගැන කථා කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධයෙන් අපි එකක් කියනවා; ආණ්ඩුව තව එකක් කියනවා. ඒක තමයි හැමදාමත් සිදු වන්නේ. මේ සම්බන්ධයෙන් බොහෝ දේවල් පෙන්වා දුන්නත්, බොහෝ දේවල් සම්බන්ධයෙන් කථා කළත්, ඒවා නිවැරදි වන ආකාරයක් පිළිබඳව නම් අපට පෙනෙන්නේ නැහැ. ඒ ගැන බොහොම කනගාටුයි. එකක් නොවෙයි, නොයෙකුත් චක්‍රලේඛ නිකුත් කරනවා. අධ්‍යාපන අමාත්‍යාංශය තරම් චක්‍රලේඛ නිකුත් කර තිබෙන අමාත්‍යාංශයක් තව නැතිව ඇති. හැබැයි ඒවායින් මොන චක්‍රලේඛයද ක්‍රියාත්මක වන්නේ කියන එක ගැන අප පසු විපරමක් කළ යුතුයි.

අපේ අධ්‍යාපන ඇමතිතුමා පාසල්වල මුදල් එකතු කිරීම සම්බන්ධයෙනුත් අලුතෙන් චක්‍රලේඛයක් නිකුත් කරනවා කියලා තිබෙනවා. එම චක්‍රලේඛය දැන් මුද්‍රණය කරලාද, නැද්ද කියන්න මම දන්නේ නැහැ. සති දෙකක් ඇතුළත ඒ චක්‍රලේඛය පාසල්වලට යවනවාය කියනවා. මා දන්න විධියට නම් ඔය චක්‍රලේඛය යැව්වත් වැඩක් වන්නේ නැහැ. චක්‍රලේඛ උල්ලංඝනය කරන එක ගැන නම් අධ්‍යාපන අමාත්‍යාංශයේ උඩ ඉඳලා පහළට යනකන් - පාසල් දක්වාම යනකන් - ගාණක්වත් නැහැ. මේ පාසල්වල මුදල් එකතු කිරීම සම්බන්ධයෙන් මේ දිනවල අපි දිගින් දිගටම කථා කරනවා. රටේ ලොකු මතයක් ඒ පිළිබඳව ඇති වෙලා තිබෙනවා. රටේ නිදහස් අධ්‍යාපනයේ ඵල ලබා ගැනීමේ දී ඒ සඳහා කඩ ඉම් - වැටවල් - යොදමින් පවතිනවා වාගේ තමයි දැන් පෙනෙන්නේ. මොකද, දෙමවුපියන්ට තමන්ගේ දරුවන්ව නඩත්තු කර ගන්නවත් බැරිව; පාසල් යවලා ළමයින්ට අධ්‍යාපනය ලබා දෙන්නටවත් බැරිව අද ලතවෙමින් සිටින අවස්ථාවක පාසලට තීන්ත ගාන්න, තවත් දේවල්වලට සල්ලි ගෙනෙන්න කියලා පාසල්වලින් කියනවා. ළමයාව ඉස්කෝලෙට දමා ගන්නත් සල්ලි ගෙනෙන්න කියනවා. ඉතින් දෙමවුපියන් මේවා කරගන්නේ කොහොමද?

මා එක දෙයකින් ආරම්භ කරන්නම්. පාසල්වල මුදල් එකතු කිරීම තහනම් කරලා තිබෙද්දීත් එවැනි සිදුවීමක් ගැන අද උදේ මට එක්කෙනෙක් කථා කරලා කිව්වා. මහර, කැන්දලියද්දපාළුව, වැලිපිල්ලෑව ජයකොඩි විද්‍යාලයේ 8වී ශ්‍රේණියේ පන්ති භාර ගුරුවරයා ළමයින්ගෙන් රුපියල් 500 ගණනේ එකතු කරනවා කියලා දැන ගන්නට ලැබී තිබෙනවා. ඊයේත් එකතු කර තිබෙනවා. අද මේ වනකොටත් එකතු කරනවාලු. ඕනෑ නම් සොයලා බලන්න. අර පොල් ගෙඩි සොරකම් කරපු කථාව අපි පැත්තකින් තබමු කෝ. මම මේ වග කීමෙන් කියන්නේ. "The Island" පුවත්පතේ එවැනි ප්‍රවෘත්තියක් පළ වෙලා තිබෙනවා. මේක ජනාධිපතිතුමාගේ ප්‍රදේශයේ පාසලක්.

තංගල්ල ප්‍රදේශයේ හුංගම විජයබා ජාතික පාසලට තම දරුවා ඇතුළත් කර ගන්න රුපියල් 4000ක් දෙන්න චන්ද්‍රසේන මහත්මයා තමන්ගේ ඔරුවයි හබලයි විකුණලා තිබෙනවා. ඉතින් මේවා විපක්ෂයේ අපි කියන ඒවා විතරක් නොවෙයි නේ. මේවා මාධ්‍යවේදීන් වාර්තා කරන ඒවා. මේ විධියට සල්ලි එකතු කර ගැනීම් පිළිබඳව ෆයිල්ස්වලින් තවත් ඕනෑ තරම් දේවල් කියන්න පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතින් ඔය චක්‍රලේඛ ගැහුවා කියලා ප්‍රතිඵලයක් තිබෙනවාද? ඒවා ශත පහකට ගණන් ගන්නවාද? ළමයි ඇතුළත් කිරීම සම්බන්ධයෙන් මෙච්චර කල් තිබුණ චක්‍රලේඛ බලන්න. මුදල් ගන්න බැහැ. එක පන්තියකට ළමයි 45කට වැඩිය ගන්න බැහැ. එහෙම තිබෙන්නේ මොන පන්තියේද? මම මෙතැන කට කැඩෙනකම්, ඕනෑ තරම් කියලා තිබෙනවා ආනන්ද, නාලන්ද, රෝයල් වාගේ පාසල්වල පන්තියක ළමයි පනස් ගණන් ඉන්නවා, මේ චක්‍රලේඛ ක්‍රියාත්මක වෙනවා නම් ඒ ළමයි ගියේ කොහොමද කියලා වැඩිපුර ඉන්න අය ගැන කියන්න කියලා. මම අභියෝග කරලා තිබෙනවා. ළමයි 45ට වඩා, 46, 47, 48, 49 වැනි තැනට ඒ පාසලට ගිය ළමයි ඇතුළත් කර ගත්තේ කොහොමද කියලා විදුහල්පතිවරයාගෙන් අහලා තිබෙනවාද? ඒ ගැන පරීක්ෂණ පවත්වලා තිබෙනවාද? අපි දැකලා තිබෙනවා ඕනෑ තරම් ආයතනවල -පොලීසියේ වෙන්න පුළුවන්, වෙනත් ආයතන වෙන්න පුළුවන්- වැඩ තහනම් කර තිබෙනවා. අධ්‍යාපනයේ මෙච්චර ප්‍රශ්න තිබෙනවා. හරිහැටි දඬුවම් දීලා තිබෙන්නේ කාටද? අපි පෙන්වා දීලා තිබෙන ඒවායින් දඬුවම් දීලා තිබෙන්නේ කාටද? දඬුවම් දුන්නත් ඒවා නිකම් දියාරු වෙන ඒවා. එකයි ඇත්ත.

දැන් බලන්න පසු ගිය දවස්වල අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විද්‍යාව ප්‍රශ්න පත්‍රය පිළිබඳව ප්‍රශ්නයක් ආවා. ඒ විද්‍යාව ප්‍රශ්න පත්‍රය පිළිබඳව ප්‍රශ්නය ආවාම විභාග දෙපාර්තමේන්තුවෙන් අභ්‍යන්තර පරීක්ෂණයක් පැවැත්වුවා. ඒ කරපු පරීක්ෂණයේ වාර්තාව තවම ඉදිරිපත් කරලා නැහැ. ඉතින් මේවා මොකටද? දැන් ජනාධිපතිතුමාත් කියනවා, පාසල්වලට සල්ලි එකතු කරන්න බැහැයි කියලා. සල්ලි එකතු කරන්න බැහැයි කියලා ජනාධිපතිතුමා තදින්ම කියලා තිබෙනවා මම දැක්කා. ඒ කියන්නේ ජනාධිපතිතුමාටත් මේ රට පාලනය කර ගන්න බැහැයි කියන එකද? අධ්‍යාපන ඇමතිතුමා හොරකම් කරන්නේ නැති, පුද්ගලයෙක් වශයෙන් හොඳ කෙනෙක් බව මම පෞද්ගලිකව දන්නවා. නමුත් මේක කර ගන්න බැරි ඇයි? මේක කර ගන්න බැහැ නේ. උපදේශක කාරක සභාවට ගියත්, වෙනත් තැනක් ගත්තත් අධ්‍යාපනය සම්පූර්ණයෙන්ම විනාශ වෙලා ඉවරයි නේ. කඩා වැටිලා ඉවරයි නේ. ඉස්සර පාසල්වල ප්‍රගතිය බලන පාසල්

[ගරු අකිල විරාජ් කාරියවසම් මහතා]

පරීක්ෂකවරු හිටියා. දැන් ඒ පරීක්ෂකවරු පාසල්වලට යන්නේ කොහොමද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පාසලට යන කොට කෝල් එකක් දීලා කියනවා" මචං අද අපි එනවා" කියලා. මේවා මට ගුරුවරු කියන ඒවා. එහෙම තමයි යන්නේ. ඉස්සර පාසල් පරීක්ෂවරු කඩා පනිනවා. ඒ අය ඇවිල්ලා බලනවා, ගුරුවරු උගන්වනවාද කියලා. අද ගුරුවරයාගේ ප්‍රගතිය බලන්නේ කවුද? ටියුෂන් ගුරුවරුන්ට පින් සිද්ධ වෙන්න අද පාසල්වල ප්‍රතිඵල ගන්නවා. කීයෙන් කී දෙනාද පාසල්වල හරියට වැඩ කරන්නේ? අපි නිදහස් අධ්‍යාපනය ගැන කථා කරනවා. නමුත් ඒකයි යථාර්ථය. ඒක නිසා තමයි පාසල්වලට සල්ලි දෙන්න සමහර ළමයින් පූජා භූමි ළඟ මල් විකුණන්නේ. එහෙම නැත්නම් තමන්ගේ අධ්‍යාපනය ලබා ගන්න තවත් දුක් ගැහැට විඳින්නේ. පාර දිගේ මල් විකිණීම වාගේ දේවල් තමයි අද කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ.

ඒ, එක පැත්තක්. අනෙක් පැත්තෙන් බැලුවාම විදුහල්පතිවරු පාසල් නඩත්තු කරන්නේ කොහොමද? විදුලිබිල ගෙවන්න තිබෙනවා. ගරා වැටෙන ගොඩනැඟිලි යථා තත්ත්වයට පත් කරන්න තිබෙනවා. ටෙලිෆෝන් බිල් ගෙවන්න තිබෙනවා. මේක නිසා නේ අපි කියන්නේ අධ්‍යාපනයට මීට වැඩියෙන් මුදල් වෙන් කරන්න කියලා. අපේ සටන ඒකයි. අපි හැම තිස්සේම කියන්නේ ජාතික අය වැයෙන් අධ්‍යාපනයට මීට වඩා මුදල් වෙන් කරන්න කියලායි. පසු ගිය කාලය පුරාම විශ්වවිද්‍යාල ආචාර්යවරු පාරවල් ගානේ ගියේත්, අපි මේ පාර්ලිමේන්තුව දෙවනත් වන තෙක් කෑ ගැහුවේත් ඒ විධියට මුදල් වෙන් කරන්න කියලායි. මේකට මුදල් වෙන් කරන්න බැරි වුණාට අනෙක් ඕනෑ එකකට මුදල් වෙන් කරන්න ආණ්ඩුවට පුළුවන් නේ. කටුනායක වහලා හරි මත්තල එයාර්පෝට් එකට මුදල් වෙන් කරන්න පුළුවන්. නැව් එන්නේ නැති වරායවලට මුදල් වෙන් කරන්න පුළුවන්. හම්බන්තොට ප්‍රදේශයේ ඉඳලා හිටලා වාහන එන ගම් ඇතුළේ පාරවල් දැවැන්ත විධියට කාපට් කරන්න සල්ලි තිබෙනවා. ඒවා කරන්න පුළුවන්. මේ රටේ ජීවනාලිය බඳු අධ්‍යාපනයට සල්ලි වෙන් කරන්න ආණ්ඩුවට බැහැ. එහෙම නම් මේකේ වෙනස මොකක්ද? ඒකෙන්ම තේරෙනවා නේද මේ ආණ්ඩුවේ තිබෙන කළමනාකරණය; ආණ්ඩුවේ තිබෙන අසාර්ථකකම; ප්‍රමුඛත්වය දෙන්න ඕනෑ මොනවාටද කියලා හඳුනා ගෙන නොමැතිකම. මේ රටේ වෙන මොනවාද තිබෙන්නේ? තෙල් තිබෙනවාද? වෙනත් වටිනා වස්තු තිබෙනවාද? අපට තිබෙන්නේ මානව සම්පත පමණයි. මේ රටේ පාසල් දරු දැරියෝ ලක්ෂ 40ක් ඉන්නවා. මේ ඔළු ටික හදන්නේ නැතිව, මේවාට අවශ්‍ය සම්පත් ටික දෙන්නේ නැතිව, මේවාට අවශ්‍ය ක්‍රමවේද හදන්නේ නැතිව, අධ්‍යාපනය තුළ කරන දේශපාලන ව්‍යාපාරවලින් අන්තිමට මොකක්ද වෙන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රට විනාශය කරා යන එකයි. කාටවත් ඒක වළක්වන්න බැහැ. දැන් විවිධ ව්‍යාපෘති පටන් ගන්නවා. එක කාලයක "ඉසුරු පාසල්" පටන් ගත්තා. ඊළඟට "නවෝදා‍ය පාසල්" පටන් ගත්තා. දැන් පාසල් 1000ක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියක් පටන් ගත්තා. ඊට පස්සේ දෙමව්පියන් විරුද්ධ වුණාම ඒවා අයින් කර දමනවා. ඉතින් ඒ සැලැස්මක් නැතිකම නේ. පටන් ගන්න කලින් හරියට සමීක්ෂණයක් කරන්න ඕනෑ. මේ පාසල් දහසට ගන්නේ මොන පාසල්ද? භූගෝලීය පසුබිම හරියට අධ්‍යයනය කරන්න ඕනෑ. දැන් බලන්න, පෝෂක පාසල් ආදි වශයෙන් වර්ගීකරණය කරගෙන සමහර ප්‍රාථමික පාසල් වැහුවා. වැහුවාම මොකක්ද වුණේ? ඒ අවට ඉන්න දෙමාපියන්ට කිලෝ මීටර් 10ක්, 15ක් දුර ගෙවා ගෙන යන්න ඕනෑ තමන්ගේ දරුවා ඉස්කෝලයට යවන්න. එහෙම වුණේ සැලැස්මක් නැතිකම නිසානේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සැලැස්මක් නැතිව කොහොමද මේ රටේ දරුවන්ට අධ්‍යාපනය දෙන්නේ? අපි හැමදාම කියන්නේ ඒකනේ. සමබර පෞරුෂයකින් යුත් පුරවැසියෙක් බිහි කරනවා කියනවා. කොහේද බිහි කරලා තිබෙන්නේ? එහෙම වෙලා තිබෙනවා නම් අන්තර් ජාලය තුළින් sex පිළිබඳව වැඩිපුරම බලන අය ඉන්න රට වෙනවාද අපේ ලංකාව? සමබර දරුවන් බිහි කරන තැනට අපේ රට තල්ලු කර තිබෙනවාද? ඒ තැනට ගෙනෙන්න අරගෙන තිබෙන ක්‍රියා මාර්ග මොනවාද? ඒ කෙරෙහි අපි අවධානය යොමු කළ යුතුයි. හැබැයි ඒ වෙනුවෙන් අවධානය යොමු කරන්න බැරි වුණාට අධ්‍යාපන අමාත්‍යාංශයට -මා දන්නේ නැහැ, කාගේ උවමනාව මතද කියලා- කර්නල්වරු පත් කිරීම වාගේ කටයුතුවලට ආණ්ඩුවට ඕනෑ තරම් ප්‍රතිපාදන සහ උවමනාව තිබෙනවා. දැන් එක වතාවක් කර්නල්වරු පත් කළා. ඔය කර්නල්වරු හිටපු ඉස්කෝලවල තමයි ඊයේ පෙරේදා ගහ ගත්තේ. ඒ කියන්නේ, ප්‍රධාන පාසල් දෙකක. ඒ පාසල්වල ඔය කර්නල්වරු තමයි ඉන්නේ. පුහුණුවකුත් දීලයි ගෙනාවේ. හමුදා පාලනය ගෙනැල්ලාත් ඒවා ටික පාලනය කර ගන්න බැහැ. ඊළඟට ඊට පහළ පාසල්වලටත් දෙනවා, මේජර්වරු, කපිතාන්වරු. දැන් පහළ පාසල්වලටත් කර්නල්වරු දෙනවා. මොකක්ද මේ කරන්න හදන්නේ? පාසල් නවදහස් ගණනක් තිබෙනවා. හාරදහස් ගණනක් පාලනය වෙන්නේ හමුදාවේ නිලතල එක්ක. මා දන්නේ නැහැ, මේ හදන්නේ චක්‍රාකාරව පාසල් පද්ධතියත් හමුදාව විසින් පාලනය කරන්නද කියලා. මොකද, පාසල් පන්දහසක් පාලනය කරනවා බැසිල් රාජපක්ෂ මැතිතුමා. ඉතිරි පාසල් ටික පාලනය කරන්න ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට දුන්නාට පසු මා දන්නේ නැහැ, මෙතුමාට පාලනය කරන්න පුළුවන් වේවිද කියලා. මේවා වැරදි සංකල්ප. රටේ අධ්‍යාපනය වෙනුවෙන් මීට වඩා කරන්න ඕනෑ තරම් දේවල් තිබෙනවා. ඒවා නොකර මේවා කරන එකයි අපට තිබෙන ප්‍රශ්නය. අපේ රටේ පාසල් යන දරුවන්ගෙන් සියයට 30ක් විතර මන්ද පෝෂණයෙන් පෙළෙනවා. පසු ගිය දිනවල එක දරුවකුට ප්‍රශ්නයක් වුණාම ජනාධිපතිතුමා කියා තිබුණා, මින් ඉදිරියට ක්‍රීඩා තරගවලට සහභාගි වන ළමයින්ගේ ශාරීරික යෝග්‍යතාව පරීක්ෂා කරන්න කියලා. මේ ක්‍රීඩා කරන ළමයින්ගේ ශාරීරික යෝග්‍යතාව පරීක්ෂා කළොත්, ඒ අයගෙන් භාගයකට ක්‍රීඩා කරන්න හම්බ වෙන්නේ නැහැ. මොකද, එතරම් සෞඛ්‍ය සම්පන්න දරුවන්ම නොවෙයි අපේ රටේ ඉන්නේ. තුන් වේල කන්න බැරි තත්ත්වයේ ඉන්නවා පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්. හරියකට කිරි ටිකක් බොන්න විධියක් නැතිව ඉන්නවා පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්. ඒත් දෙමාපියන් දුක් විඳලා කොහොම හරි ඒ ළමයින්ව පාසල් යවනවා ඒ දරුවන්ගේ ඇස් පාදලා ඒ ළමයින්ගෙන්වත් ජීවිතය ගොඩ යන්න ඕනෑ කියලා හිතන නිසා. ඒ නිසා මේ එක එක නීති රාමු දැම්මා කියලා, එක එක චක්‍රලේඛන ඉදිරිපත් කළා කියලා මේවා එකකවත් වලංගුතාවක් නොමැති වීම පිළිබඳව අපි කනගාටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක වෙලාවකට මට හිතෙනවා මේ අධ්‍යාපන පරිපාලන සේවයේ විභාග තිබියදී, රාජ්‍ය පරිපාලන සේවයේ නිලධාරිනුත් අධ්‍යාපන අමාත්‍යාංශයට දාලා කටයුතු කරන එකත් වරදක් කියලා. මොකද, SLEAS සහ SLAS කියලා විභාග දෙකක් තිබෙනවා. රාජ්‍ය පරිපාලන සේවකයන්ට තිබෙන්නේ එක විභාගයක්, අධ්‍යාපන පරිපාලන සේවකයන්ට තිබෙන්නේ තව විභාගයක්. මේ තනතුරුවලට පත් වෙන්න ඕනෑ ඇත්ත වශයෙන්ම අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරින්. ඒකෙදී රාජ්‍ය පරිපාලන සේවයේ නිලධාරින්ට වැරදි කියලා හරි යන්නේ නැහැ. ඉහළ මට්ටමින් ඒ දේවල් හරියාකාරව කරන්න දැන ගන්න ඕනෑ. ඒවාට නිසි සුදුසුකම් තිබෙන පුද්ගලයින් පත් කරන්න ඒ අය දැන ගන්න ඕනෑ. එතකොට අධ්‍යාපන සේවාව -Education Service- ගැන අවබෝධයක් තිබෙන අය පත් වෙනවා. විදුහල්පතිවරු මාරු කිරීමේදී, උසස්වීම් දීමේදී එය ඉතා

වැදගත් වෙනවා. පසු ගිය කාලයේ ශ්‍රේණිධාරි විදුහල්පතිවරුන්ට අසාධාරණකම් වුණා. දේශපාලනික අවශ්‍යතාව මත දිගින් දිගටම පත්වීම් දුන්නා. මේ ළඟදීත් එක්දහස් හත්සිය ගණනකට පත්වීම් දුන්නා කියලා අමාත්‍යතුමාම පාර්ලිමේන්තුවේදී පිළිගත්තා. එහෙම වුණාම මේවා කඩා වැටෙන එක නවත්වන්න පුළුවන්ද? මොන චක්‍රලේඛන දැම්මත්, මොන නීති දැම්මත් ඒවා පහළ මට්ටමින් ක්‍රියාත්මක වෙන්නේ නැත්තේ ඇයි? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ චක්‍රලේඛන අද නිකම් joke එකක් වෙලාතේ. අද මේ චක්‍රලේඛන විහිළුවක් වෙලා තිබෙන්නේ. ඉතින් අපි කොච්චර කථා කළත් මෙතැනින් එහාට මේකට මොකක්ද කරන්න තිබෙන්නේ. සුදුසුකම් නැති මිනිස්සු දානවා නම්, ඉවක් බවක් නැතිව මුදල් එකතු කිරීම් කරනවා නම්, ඉවක් බවක් නැතිව පරිපාලනයේ ගැටලු තිබෙනවා නම්, ඒවා විසඳන්නේ නැත්නම්, ඒ අයට දඬුවම් දෙන්නේ නැත්නම් මොකක්ද කරන්න ඕනෑ.

මම මීට කලිනුත් ගරු අමාත්‍යතුමාට කිව්වා, මා නියෝජනය කරන කුලියාපිටිය ආසනයේ කලාප අධ්‍යක්ෂවරයා පසු ගිය දිනක කර තිබෙන දෙයක් සම්බන්ධව. පාසල් 164ක විදුහල්පතිවරු කැඳවා එතුමා කියා තිබෙනවා, "දැන් වයඹ පළාත් සභා මැතිවරණය ළඟ එනවා. මහ ඇමතිවරයාට උදව් කරන්න campaign එකක් හදන්නයි තමුන්නාන්සේලා කැඳෙව්වේ" කියලා. තවම මහ ඇමතිවරයාවත් එතුමාගේ campaign එක ගැන සාකච්ඡා කරන්න අවශ්‍ය අය කැඳවා නැහැ. මා මේ වගකීමෙන් කියන්නේ. එතකොට විදුහල්පතිවරු ටික වැඩේට ලෑස්තියි. හැබැයි ඔක්කෝම නොවෙයි. එතැන හිටපු බොහෝ අය කලකිරීමට පත් වෙලා තිබෙනවා. ඒ අය කියනවා, "අපි විරුද්ධ වුණොත් අපිව ගෙදර යවනවා, කවුද අපේ ළමයින්ට කන්න බොන්න දෙන්නේ" කියලා. මීට කලින් ප්‍රශ්නයක් දාලා ඒ පැත්තේ එක් කෙනෙක් interdict කළා.

පුදුම දේශපාලනයක් තිබෙන්නේ. ඡන්ද කාලයක බලන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මොන කාලයේද විදුහල්පතිවරු ගෙවල් ගානේ ඇවිදින්න ගියේ? මම මගේ ආසනය ආශ්‍රයෙන් මේවා කියන්නේ. ඔබතුමා හොයලා බලන්න, මේ අසත්‍ය නොවෙයි. අපේ නිලධාරිතුමන්ලාත් ඉන්නවා. පසු ගිය ඡන්ද හැම එකකදීම එහෙමයි කළේ. කෙළින්ම කලාප කාර්යාලය ළඟට යනවා, බස් එකක දෙකක ඔක්කොම සෙනඟ දමා ගන්නවා. බෝතල් ටිකකුත් දමා ගන්නවා. ඊට පස්සේ යනවා. හැබැයි යන්නේ අපේ ආසනයට නොවෙයි. ගල්ගමුවට, යාපහුවට යනවා ඇවිදින්න. ගුරුවරු, විදුහල්පතිවරු ගෙවල් ගානේ ඇවිදිනවා. මෙහෙම වුණාම විදුහල්පතිවරු සත පහකට ගණන් ගන්නවාද? අනිත් අය එක්ක එකට මත්පැන් බොනවා. එහෙම කළාම විදුහල්පතිවරුන්ට ඒ පාසල් පාලනය කරන්න පුළුවන්ද? මෙන්න මේ තත්ත්වයට අද ඔවුන් පිරිහිලා තිබෙනවා. එදා මම මේ ගැන ඇමතිතුමාට කිව්වා. ඇමතිතුමා ඒ ගැන බැලුවාද දන්නේ නැහැ. මේවා ගැන බලන්න ගරු ඇමතිතුමනි. අප ඔබතුමාට ගරු කරනවා. මේවා සම්බන්ධයෙන් ක්‍රියා මාර්ග ගන්න.

මට තව කාරණයක් කියන්න තිබෙනවා. මේ කාරණය උසස් අධ්‍යාපනයට සම්බන්ධ ප්‍රශ්නයක්. විශ්වවිද්‍යාලවලට තේරුණු සිසුන්ට දැන් හමුදා පුහුණුව දෙනවා නේ. විශ්වවිද්‍යාලවලට යන්න ඉස්සර වෙලා මේ හමුදා පුහුණුව ලබා දෙන්න පසු ගිය දවස්වල මාදුරුඔය ප්‍රදේශයට දරුවන් පිරිසක් අරගෙන ගියා. මේ පුහුණුව ලබා දීමේදී එක ළමයෙකුට අවුලක් ඇති වුණා. ඒ පුහුණුව නිසා ඒ ළමයා පොඩ්ඩක් upset ගියා. අන්තිමට මොකක්ද වුණේ? මට දැන් ඒක මෙතැන කියන්න බැහැ. ඒක කියන එක ඒ ළමයාට කරන අගෞරවයක්. අන්තිමට ඒ ළමයා මානසිකව යම් ප්‍රශ්නයකට මුහුණ දුන්නා. ඊට පස්සේ ඒ මානසික ප්‍රශ්නයක් තිබෙන මේ ළමයා ගම්පහ එක තැනකදී බස් රථයෙන් බැස්සුවා. ඔබතුමා හොයා බලන්න. දැන් ඒ ළමයාගේ මනස අවුල් වෙලා පිස්සු හැදිලා ඉන්නේ. ඒ ළමයා නාන්න, ඇඳුම් හෝදන්න වතුර බාල්දි 200ක් ඇදලා තිබෙනවා. ඒ දෙමවුපියන් තමයි ඒ ගැන කියන්නේ. ඒ ළමයා දැන් mentally out. දෙමවුපියන්ට කියලාත් නැහැ. ඒ විදුහල්පතිවරයාගෙන් අහලා බලන්න, මාදුරුඔයේදී මොනවාද වුණේ කියලා. මේවා ගැන කවුරුවත් හරියට බලන්නේ නැහැ; පසු විපරම් කරන්නේ නැහැ; මොකක් හරි ප්‍රශ්නයක් වුණාම ගෙනැත් දමනවා. මීට ඉස්සර වෙලා දියතලාව පැත්තෙත් ඔහොම වුණා. ඕනෑ ඒවා නොවෙයි නේ මේ කරන්නේ. මේක මිලිටරිකරණය කරන්න ඕනෑ නම් කෙළින්ම ඔක්කොම කර ගන්න. මේක චක්‍රව කරන්න එපා. විශ්වවිද්‍යාල ළමයින්ටත් මේක කරනවා; පාසල්වල විදුහල්පතිවරුන්ටත් මේ පුහුණුව දෙනවා. ඊළඟට ගුරුවරුන්ටත් දෙන්න ගනීවි. මේක ලොකු අවුලක්. මේ අවුලෙන් අන්තිමට දුක් විඳින්නේ මේ රටේ අහිංසක තරුණ පරපුර. අපේ ජාතියටයි මේකෙන් අන්තිමට දුක් විඳින්න වන්නේ. මම ඉතාම කනගාටුවෙන් කියනවා, අප පසු ගිය කාලයේ පෙන්වා දුන් ඒ ප්‍රශ්නවලට හරියාකාරව කටයුතු කර නැති බව. "දුන්න දූනුගමුවේ, ඊතල සබරගමුවේ" කියනවා වාගේ අධ්‍යාපන අමාත්‍යාංශයෙන් අවශ්‍ය දේට නොවෙයි විසඳුම් ලබා දෙන්නේ. අපේ කථාවලදී මේවා පෙන්වා දෙන වෙලාවට මොකක් හරි නිකම් වචන හරඹයක් කරන්නේ නැතිව මේවා ඇත්තටම වටහා ගෙන කටයුතු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 3.14]

**ගරු දුමින්ද දිසානායක මහතා (අධ්‍යාපන සේවා අමාත්‍යතුමා)**

(மாண்புமிகு துமிந்த திசாநாயக்க - கல்விச் சேவைகள் அமைச்சர்)

(The Hon. Duminda Dissanayake - Minister of Education Services)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගැන වචන කීපයක් කථා කරන්න අවස්ථාව ලැබීම පිළිබඳව මා සතුටු වෙනවා. මගේ හිත මිත්‍ර, උගත්, බුද්ධිමත් විජිත හේරත් මන්ත්‍රීතුමා මේ ගරු සභාවේ දැන් හිටියා නම් හොඳයි කියලා මට හිතෙනවා. එතුමන්ලා රටේ තරුණයන් ගැන කථා කරනවා; රටේ තරුණයන් ගැන හඬ නඟනවා. එතුමාගේ කථාවේදී ප්‍රකාශ කළා වයස 22න් පාර්ලිමේන්තුවට ආපු මම ඒ කාලයේ ඒවා මොනවාද දන්නේ කියලා. මම පාර්ලිමේන්තුවට ආවේ අවුරුදු 22දී නොවෙයි 21දී, ලංකාවේ ළාබාලම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා විධියට. තරුණයෙක් ළාබාල වයසින් පාර්ලිමේන්තුවට ආවාම ඒක හෑල්ලුවට ලක් කරන විජිත හේරත් මන්ත්‍රීතුමන්ලා, එළියට ගිහින් තරුණයන් වෙනුවෙන් පෙනී සිටින්නේ කොහොමද කියන එක පිළිබඳව මට ප්‍රශ්නයක් තිබෙනවා. තරුණයෙක් මේ වාගේ තැනකට ආවාම ඒකේ වටිනාකමක් දකින්නේ නැති උදවිය රටේ සමස්ත තරුණයන් ගැන කථා කරන්නේ කොහොමද කියන ප්‍රශ්නය මම මේ රටේ තරුණයන්ගෙනුත් අහනවා. තරුණයෙක් විධියට ඒ පිළිබඳව මම කනගාටු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ පරණ කියමනකුත් තිබෙනවා නේ, "බල්ලෙක් බිරුවාට කන්දක් පහත් වෙන්නේ නැහැ" කියලා. මම මේ වෙලාවේ ඒකත් මේ ගරු සභාවට මතක් කරනවා.

විජිත හේරත් මන්ත්‍රීතුමා අද සභාව කල් තබන අවස්ථාවේදී ග්‍රාමීය පාසල් වහන එක ගැනයි මේ යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ. මා හිතන හැටියට පාසල් වැහෙන ප්‍රමාණය සහ අරින ප්‍රමාණය පිළිබඳව නොවෙයි අද අපට ප්‍රශ්නය තිබෙන්නේ.

අපේ රටේ තරුණ තරුණියන්ට, දූ දරුවන්ට අවශ්‍ය කරන දැනුම පාසල තුළින් ලැබෙනවාද? අපි ආසියාවේ ආශ්චර්යය කරා යන්න හදන මේ ගමනේදී රටේ පාලම් හදනවා; පාරවල් හදනවා;

[ගරු දුමින්ද දිසානායක මහතා]

රට සංවර්ධනය වෙනවා. අපේ හිතවත් අකිල විරාජ් කාරියවසම් මන්ත්‍රීතුමා මතක් කළා අද නැව් එන්නේ නැති වරායයන් හදනවාය කියා. ඔව්, නැව් ආවේ නැති වුණත් අපි වරායයන් ටික හදන්න ඕනෑ; ගුවන් තොටුපළවල් හදන්න ඕනෑ; රට සංවර්ධනය කරන්න ඕනෑ. මොකද, ඒවා හදන්නේ නැතිව කවුරුවත් එන්නේ නැහැ. රටේ භෞතික සම්පත් සංවර්ධනය වෙනකොට ඒවා කළමනාකරණය කරන්න හොඳ මානව සම්පතක් ඉන්න ඕනෑ. ඒ සඳහා මේ රටට හොඳ බුද්ධිමත් පිරිසක් බිහි කර ගන්න ඕනෑ. ඒ වෙනුවෙන් තමයි වර්තමාන අධ්‍යාපන අමාත්‍යවරයා විධියට ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමා අධ්‍යාපන ක්ෂේත්‍රයේ මහා පෙරළියක් ඇති කරමින් වෙනස්කම් රාශියක් ඇති කරන්න යන්නේ. ඒ වෙනස්කම්වලින් කිහිපයක් මේ වනකොට ස්ථාපිත කර තිබෙනවා. අපි පිළිගන්නවා, යම් යම් ප්‍රශ්න, ගැටලු තිබෙන බව. මොකද, අපි වැඩ කරන්නේ විශාල පිරිසක් එක්කයි. අද රටේ ශිෂ්‍ය ප්‍රජාව එහෙම නැත්නම් පාසල් දූ දරුවන් සංඛ්‍යාව ලක්ෂ 40කට -මිලියන හතරකට- ආසන්නයි. ඒ වාගේම සේවක මහත්ම මහත්මීන්, ගුරුවරුන් සංඛ්‍යාවත් විශාල ප්‍රමාණයක් වෙනවා. ඒ අයත් එක්ක කටයුතු කරනකොට සමහර වෙලාවට අතපසු වීම් වෙන්න පුළුවන්. සමහර වෙලාවට වැරදි සිද්ධ වෙන්න පුළුවන්. හැබැයි මේ සුළු අතපසු වීම් වෙනුවෙන්, එක්කෙනෙක් දෙදෙනෙක් කරන වැරදි වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශය, අධ්‍යාපන සේවා අමාත්‍යාංශය හෝ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යන සමස්තයටම දොස් කියන්න බැහැ.

මං කලින් මතක් කළ විධියට අපි කල්පනා කරන්න ඕනෑ වැහෙන පාසල් ප්‍රමාණයයි, ඇරෙන පාසල් ප්‍රමාණයයි ගැන නොවෙයි. තිබෙන පාසල්වලින් නිසි අධ්‍යාපනයක් ලැබෙනවාද, නිසි අධ්‍යාපනයක් ලබා දෙන්නට අවශ්‍ය කරන පහසුකම් ටික ලබා දී තිබෙනවාද කියන කරුණු ගැනයි. පාසලක් වහන්න ප්‍රධානම හේතුව තමයි පාසලට අවශ්‍ය කරන ප්‍රමාණයට සෑහෙන දරුවන් ප්‍රමාණයක් නොසිටීම. මම හිතන හැටියට අපේ ගරු ඇමතිතුමා සංඛ්‍යා ලේඛන සහිතව ඒ කරුණු ඉදිරිපත් කරාවි. ළමයින් 20ට අඩු පාසල් කීයද, ළමයින් 10ට අඩු පාසල් කීයද යනාදී කරුණු ගැන විස්තර සහිතව එතුමා කතා කරාවි. අපි දරුවන්ට හරි අධ්‍යාපනයක් ලබා දෙනවා නම් අපට පාසල් සංඛ්‍යාව ගැන නොවෙයි ප්‍රශ්නය තිබෙන්නේ. මේක මගේ පෞද්ගලික මතය. අධ්‍යාපන සේවා අමාතවරයා විධියට නොවෙයි මම මේ කියන්නේ. අවශ්‍ය ළමයින් ප්‍රමාණය ඉන්නවා නම් අපි ඒ පාසල ශක්තිමත් කරන්න ඕනෑ. ඒ වාගේම අවශ්‍ය ළමයින් ප්‍රමාණය නැත්නම් නමට විතරක් ඒ පාසල පවත්වා ගෙන ගිහින් වැඩක් නැහැ. ඒ පාසලේ තිබෙන්නේ 1 වසරේ සිට 5 වසර දක්වා විතරක් නම් අපට ගුරුවරුන් අඩු ප්‍රමාණයක් තියා ගන්න පුළුවන්. හැබැයි 6 වසරෙන් ඉහළට එක පන්තියක ළමයින් දෙන්නෙක්, තුන් දෙනෙක් තියා ගෙන ඒ ළමයින්ට විෂයයන් අටක් උගන්වන්න සුදුසු ගුරු මණ්ඩලයක් දෙන්න බැරි නම් ඒ පාසල නිකම් ඇරලා තිබුණාට තේරුමක් වෙන්නේ නැහැ. එහෙම නම් ඒ පාසල ගැන හිතනවාට වඩා ඒ දරුවො ටික පහසුකම් තිබෙන වෙනත් පාසලකට අරගෙන ගිහින් ඒ දරුවන්ට හොඳ අධ්‍යාපනයක් දෙන්න අපට පුළුවන්. ඒක මගේ පෞද්ගලික මතය මිසක් අධ්‍යාපන අමාත්‍යාංශයේවත්, අධ්‍යාපන සේවා අමාත්‍යාංශයේවත්, මේ ආණ්ඩුවේවත් මතය නොවෙයි. තරුණයෙක් විධියට මා දරන මතය ඒකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ගරු විජිත හේරත් මන්ත්‍රීතුමාගේ කථාවේදී භාගයක්ම කියැවුණේ පාසල්වලින් සල්ලි එකතු කරන එක ගැනයි. එතුමා මගේ නමත් සඳහන් කළා. මුදල් එකතු කරන්න ආණ්ඩුවෙන් කියා නැති බව මම FM නාලිකාවලට කිව්වාය කියා එතුමා කිව්වා. එතුමාට පොඩ්ඩක් වැරදුණා. මම කිව්වේ දරුවන්ගෙන් මුදල් එකතු කරන්නය කියා නැහැ කියන එකයි. හැබැයි එතුමා ඒ චක්‍රලේඛය මුල ඉඳලා අගට යනකම් කියෙව්වා. අපි කියා තිබෙන්නේ පාසල් නගා සිටුවීමේ සමිතියට මුදල් එකතු කරන්න පුළුවන් විධියේ චක්‍ර ලේඛයක් තිබෙනවාය කියන එකයි. ඒ, පාසල් නගා සිටුවීම සඳහායි. අපි එතුමාට මතක් කරන්න ඕනෑ, ඒ වාගේම අනෙක් උදවියටත් මතක් කරන්න ඕනෑ, ගමේ පන්සල හැදුණේ කොහොමද කියන එක ගැන. ගමේ පන්සල හැදුවේ ආණ්ඩුවෙන් නොවෙයි. ගමේ දායකයෝ එකතු වෙලා තමන්ගේ අස්වැන්නෙන් වී බුසලක්, දෙකක් එකතු කරලා ගමේ චෛත්‍යය හැදුවා, ගමේ ආවාසය හැදුවා, ගමේ පන්සල සංවර්ධනය කළා. එහෙම තමයි ගමට පන්සලක් ලැබුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තමයි අපි අද මහා ඉස්කෝලය හැටියට කියා ගන්නා ඒවා, සංවර්ධිතයි කියන ඉස්කෝල බොහෝ ප්‍රමාණයක අතීතය ගැන බැලුවොත් ඒ පාසල්වල මුලින් තිබිලා තිබෙන්නේ hall එකක් විතරයි. ඒ hall එකේ තිබෙන්නේ asbestos sheetsවත්, උළුවත් නොවෙයි. ගමේ උදවිය එකතු වෙලා කණු 4ක්, 5ක්, 6ක් සිටුවලා, කොට බිත්තියට මැටි ගහලා, බිමට මැටි දාලා, පොල් අතුවලින් සෙවිලි කළ පාසල් තමයි අද මහා පාසලක් බවට පත් වෙලා තිබෙන්නේ. එහෙම නම් මේ පාසල් පද්ධතිය පෝෂණය වුණේ, මේ පාසල් පද්ධතිය සංවර්ධනය වුණේ තනිකරම ආණ්ඩුවේ මැදිහත් වීම තුළ නොවෙයි. ආණ්ඩුව ක්‍රමවේදය හැදුවා, ආණ්ඩුව වැඩ පිළිවෙළ හැදුවා, ආණ්ඩුව අවශ්‍ය පහසුකම් ටික ලබා දුන්නා. ඊට අමතර සියලු පහසුකම් ටික ගමේ දෙමව්පියෝ එකතු වෙලා, ගමේ දානපතියෝ එකතු වෙලා ලබා දුන්නා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි, අපේ දරුවෙක් අපි ගිය පාසලට නොගියත් අපි අදටත් ඒ පාසල්වලට ආදරෙයි. අනුරාධපුර මධ්‍ය මහා විද්‍යාලය ඇතුළු විද්‍යාල 4ක ආදි ශිෂ්‍යයෙක් විධියට මම අදටත් ඒ විද්‍යාල 4ටම ආදරෙයි. ඒ, අධ්‍යාපන සේවා අමාත්‍යවරයා විධියට නොවෙයි. මගේ අතීතය ගැන කථා කරන කොට මම ගිය මුල් පාසලේ සිට රාජකීය විද්‍යාලය දක්වාම මතක් කරනවා. ඒ මොකද, අපි අකුරු කළේ අහවල් පාසලේ, අපි මේ තත්ත්වයට ගෙන ආවේ මේ පාසලයි කියලා අප තුළ කෙළෙහි ගුණ දැක්වීමක් තිබෙනවා. දානපතියෝ, එහෙම නැත්නම් පාසලේ ආදි ශිෂ්‍යයෝ නිසා පාසල ශක්තිමත් වන ස්වභාවයක් එදා ඉඳලා තිබුණා. මම අනුරාධපුර මධ්‍ය මහා විද්‍යාලයට යන කාලයේ එදාත් පන්තිය paint කරන්න ඕනෑ වෙන කොට, desks ටික පාට කරන්න ඕනෑ වෙන කොට අපි ගෙදරින් තීන්ත ටින් එක, පින්සල අරගෙන ගිහිල්ලා තමයි ඒ කටයුත්ත කළේ. මේක අමුතුවෙන් සිද්ධ වුණු, එහෙම නැත්නම් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඇතුළු එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුවෙන් සිද්ධ වුණු කාරණයක් නොවෙයි. මේ ආකාරයට පාසල රැකගෙන ආවත් මම කලින් කිව්වා වාගේ,-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමා, ඔබතුමාට කථා කරන්න තව විනාඩියයි තිබෙන්නේ.

**ගරු දුමින්ද දිසානායක මහතා**
(மாண்புமிகு துமிந்த திசாநாயக்க)
(The Hon. Duminda Dissanayake)
විනාඩි 15ක් තිබෙනවා කියලායි මම හිතුවේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
විනාඩි 10ක් දක්වා අඩු කළා.

**ගරු දුමින්ද දිසානායක මහතා**
(மாண்புமிகு துமிந்த திசாநாயக்க)
(The Hon. Duminda Dissanayake)
තව විනාඩි දෙකකවත් කාලයක් දෙන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේක මහා අරුමයක් නොවෙයි. එදා ඉඳලා මේ ක්‍රමය පැවතුණා. හැබැයි, අපි දන්නවා මේ ක්‍රමවේදය ඇතුළේ වැරදිකාරයෝ ඉන්නවා කියා. සමහර වෙලාවට එක විදුහල්පති කෙනෙක් හෝ කණ්ඩායමක් මේ ක්‍රමවේදය වැරැදි විධියට පාවිච්චි කරන්න පුළුවන්. අපි කියන්නේ මේකයි. සමස්තය ගැන කථා කරන්න. එක වැරැදිකාරයෙක් නිසා මුළු පාසල් පද්ධතියම අඩාළ කරන්න සූදානම් වෙන්න එපා. ඔබතුමන්ලා ගුරුවරු ගැන, විදුහල්පතිවරු ගැන සැක කරලා ඒ හැමෝටම එක හා සමානව එක හැන්දෙන් බෙදන්න එපා. වැරැදි කරන පුද්ගලයා කවුද කියලා අපට නම් කරන්න. අපි ඔබතුමන්ලා දෙගොල්ලෝ එකතු වෙලා වැරදිකාරයා හොයලා දඬුවම් දෙමු. හැබැයි එක වැරැදිකාරයෙක් නිසා විද්‍යාල දියුණු කරපු ගුරුවරුන්ගේ, විද්‍යාල දියුණු කරපු විදුහල්පතිවරුන්ගේ චිත්ත ශක්තිය, මානසික ශක්තිය කඩා බිඳ දමන්න ඔබතුමන්ලා සූදානම් වෙන්න එපා. අපි දෙගොල්ලෝ එකතු වෙලා අධ්‍යාපන පද්ධතිය ශක්තිමත් කළ යුතුයි කියන කාරණාව මා මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් පොල් ගෙඩි අටේ කථාවත් මා මතක් කරන්න ඕනෑ. මේ කාරණය එළියට ප්‍රසිද්ධ කරන්න එපා කියලා මා මාධ්‍ය ආයතනවලින් ඉල්ලනවා. ඒකට හේතුව තමයි අද විජිත හේරත් මන්ත්‍රීතුමන්ලා ඒ දරුවාව ආරක්ෂා කරන්න කථා කරනවා. මමත් බන්දුල ගුණවර්ධන ඇමතිතුමාත්, මුළු ආණ්ඩුවමත් ඒ පොල් ගෙඩි අටේ සිද්ධිය වෙලාවේ විදුහල්පතිවරයාත් රැක්කා; දරුවාත් රැක්කා. අද කවුරු හරි කියන්න උත්සාහ කරනවා නම්, දරුවා පොල් ගෙඩි අට හොරකම් කළේ පාසලෙන් කියපු රුපියල් 800 ගෙනියන්න කියලා අපි ඒක පිළිගන්නේ නැහැ. පිළිගන්නේ නැති වෙන්න එක කාරණයක් තමයි පොල් ගෙඩියක අද තිබෙන මිල බැලුවත් පොල් ගෙඩි අටෙන් රුපියල් 800ක් හොයන්න බැරි වීම.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි අපි වැඩිහිටියෝ විධියට, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු විධියට, දේශපාලනඥයෝ විධියට පුංචි එකා හරි වැරැද්දක් කළා නම් ඒ වැරැද්ද කියලා දෙනවා මිසක් ඒ වැරැද්ද වෙනුවෙන් පෙනී සිටින්න අපි සූදානම් වෙන්නේ නැහැ. ඒ දරුවා තමන්ගේ නොතේරුම්කමට හෝ ඒ වැඩේ කළා නම් අපි ඒ දරුවාට ඒ වැරැද්ද පහදලා දෙනවා මිසක් ඒ දරුවාගේ පැත්තේ හිටගෙන ඒ දරුවා කරපු වැඩේ නිවැරදියි කියලා ඒ දරුවාට කියනවා නම් ඒක වැරැදියි. දරුවෝ ඉන්න තාත්තෙකුට ඒක කියන්න පුළුවන්කමක් නැහැ. තමන් හදන දරුවෝ තමන්ගේ නොවෙයි නම් ඒ දේ කියන්න පුළුවන්කම තිබෙනවා. ඒ නිසා අපි ඉල්ලීමක් කරන්න කැමැතියි. දරුවෝ ගැන හිතන කොට, දරුවෝ ගැන කථා කරන කොට අපි මේ කථා කරන්නේ අනාගතයේ මේ රට භාර ගන්න සිටින දරුවා ගැන, අනාගතයේ අපේ පුටුවේ වාඩි වෙන්න සිටින දරුවා ගැන, අනාගතයේ මේ රටේ සංවර්ධනයට නායකත්වය දෙන්න ඉන්න පුද්ගලයෝ ගැන කියන එක අමතක කරන්න එපා. ඒ නිසා ඒ දරුවන්ව යහ මඟ යවනවා මිසක්, ඒ දරුවන්ට හරි මාර්ගය පෙන්වා දෙනවා මිසක්, ඒ දරුවන් වැරැදි පාරේ යන කණ්ඩායමක වැරැදි පූර්වාදර්ශයක් බවට පත් කරන්න එපා කියන කාරණාව මා මතක් කරනවා.

අපේ ගරු බන්දුල ගුණවර්ධන අමාත්‍යතුමාගේ අධ්‍යාපන අමාත්‍යාංශයත්, අධ්‍යාපන සේවා අමාත්‍යාංශයත්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයත් මේ රටේ මානව සම්පත මෙහෙය වන අමාත්‍යාංශ විධියට මේ දරුවන්ගේ අනාගතය වෙනුවෙන් පාසල් අරින්නට, පාසල් වහන්නට දරුවන්ගේ අනාගතය සුබවාදී කරන්නට, සංවර්ධනය කරන්නට පුළුවන් උපරිම දේ කරනවා කියන කාරණය මා මතක් කරනවා. ඒ වෙනුවෙන් බුද්ධිමත් උදවියට, අපිත් සමඟ අත් වැල් බැඳ ගන්න කැමැති උදවියට පක්ෂ විපක්ෂ භේදයකින් තොරව -හන්දි ගාණේ mike ඉස්සරහා කථා කරන්නේ නැතිව- අපිත් එක්ක විවෘතව කථා කරන්න එන්න කියා ආරාධනා කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Then, the Hon. Sajith Premadasa.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ලබා දී ඇති වෙලාව කොපමණද?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Thirty minutes.

[අ.භා. 3.26]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම රටට දැයට වැදගත් වන අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිබඳ මේ විවාදයට එකතු වෙලා මගේ අදහස් ඉදිරිපත් කරන්නට අවස්ථාව ලැබීම ගැන මා සතුටු වෙනවා. අධ්‍යාපන ක්ෂේත්‍රය ගැන කථා කරන විට වරෙක ආණ්ඩු පාර්ශ්වයෙන් කියනවා, ඉතිහාසයේ කිසිම දවසක මේ වාගේ සම්පත් ප්‍රමාණයක් අධ්‍යාපන ක්ෂේත්‍රයට වෙන් කරලා නැහැයි කියලා. 2005 දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට අධ්‍යාපනයට වෙන් වුණේ 3.03යි. එය 2011 වන විට 1.86 දක්වා අඩු වෙලා තිබෙනවා. නමුත් අධ්‍යාපන ක්ෂේත්‍රය නැංවීමට දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට මෙය සියයට 6ක් කරන්නට ඕනෑය කියා අප කියනවා. අධ්‍යාපනය වෙනුවෙන් වැය කරන මුදල දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6 දක්වා නංවාලිය යුත්තේ ඇයි කියන තර්කය මගේ කථාව තුළ තහවුරු කරන්නට - සාක්ෂාත් කරන්නට- මා බලාපොරොත්තු වෙනවා. පාසල්වලට යන දූ දරුවන්ගෙන් මුදල් අය කිරීම අද ප්‍රධාන මාතෘකාවක් බවට අප සියලු දෙනාම හඳුනා ගෙන තිබෙනවා.

ඇත්ත වශයෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශය තුළින් නිකුත් කර තිබෙන චක්‍රලේඛ සමූහය දිහා බැලුවාම, මේ හැම චක්‍රලේඛයකින්ම මුදල් අය කිරීම තහනම් කරලා තිබෙනවා. 2012/19 චක්‍රලේඛයෙන් පළමු වසරට ඇතුළත් වෙන දූ දරුවන්ගෙන් මුදල් ඉපැයීම, මුදල් අය කිරීම තහනම් කරලා තිබෙනවා. 2008/17 චක්‍රලේඛයෙන් 6 සිට 11 වසර දක්වා ළමයින් ඇතුළත් කරන මොහොතේ මුදල් අය කිරීම තහනම් කරලා තිබෙනවා. 2008/47 චක්‍රලේඛය තුළින් උසස් පෙළට ඇතුළු වෙන දූ දරුවන්ගෙන් මුදල් අය කිරීම තහනම් කරලා තිබෙනවා. 2008/41 චක්‍රලේඛය තුළින් පාසල් ආදි ශිෂ්‍යයින්ට එහෙමත් නැත්නම් වෙනත් සංගම්වලට පාසල් යන දූ දරුවන්ගෙන් මුදල් අය කිරීම තහනම් කරලා තිබෙනවා. නමුත් මේ චක්‍රලේඛ සමූහය

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

දිහා බලන විට එක චක්‍රලේඛයක් තිබෙනවා. මේක සැහවුණු චක්‍රලේඛයක්. ඒ, 2008/35 චක්‍රලේඛය. ඒකෙන් මොකක්ද අදහස් කරන්නේ? සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමාට පින් සිදු වන්නට මේ රටේ බිහි වුණු නිදහස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ පාසල් යන දූ දරුවන්ගෙන් වක්‍රාකාරයෙන් මුදල් එකතු කිරීම හෝ එම කර්තව්‍යයට අනුබල ලබා දීමයි. විශේෂයෙන්ම අපේ ආණ්ඩු පාර්ශ්වයේ අධ්‍යාපන ක්ෂේත්‍රය නියෝජනය කරන ගරු ඇමතිතුමන්ලාගෙන් මම මේ කාරණය අහන්න කැමැතියි. මේ රටේ නිදහස් අධ්‍යාපනයක් ක්‍රියාත්මක වෙනවා නම්, ජනාධිපතිතුමා නියෝජනය කරන හම්බන්තොට දිස්ත්‍රික්කයේ හුංගම විජයබා ජාතික පාසලේ උසස් පෙළ පන්තියට එස්.එච්. චන්ද්‍රසේන මැතිතුමාගේ දරුවාව ඇතුළත් කරන විට රුපියල් 4,000ක් සොයා ගන්නට බැරිව, තමන්ගේ ඔරුව විකුණලා තමයි එතුමා රුපියල් 4,000 සොයා ගත්තේ. නිදහස් අධ්‍යාපනයක් ක්‍රියාත්මක වෙනවා නම් හුංගම විජයබා ජාතික පාසල එතුමාගෙන් මුදල් අය කරන්නේ ඇයි? එක් අයෙකුගෙන් පමණක් නොවෙයි උසස් පෙළ සඳහා ඇතුළු වුණ දූ දරුවන් 130 දෙනාගෙන්ම ඒ මුදල අය කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි රුපියල් 4,000ක් අය කර ගෙන රුපියල් 1,460කට රිසිට් පතක් දීලා තිබෙනවා.

අපේ රටේ නිදහස් අධ්‍යාපනයක් ක්‍රියාත්මක වෙනවා නම්, අපේ රටේ අධ්‍යාපනය නිවහල් නම්, මධ්‍යම ආණ්ඩුවෙන්, පළාත් සභාවෙන් ඇයි මේ පාසල්වලට අවශ්‍ය පහසුකම් සපයන්නේ නැත්තේ? දුරකථන බිල්පත් පියවන්න, විදුලි බිල්පත් පියවන්න, ජල බිල්පත් පියවන්න ප්‍රමාණවත් මුදලක් අද අධ්‍යාපන ක්ෂේත්‍රයට ලැබෙන්නේ නැහැ. ඒ හේතුව නිසා තමයි අද රට තුළ ලොකු ඉල්ලීමක් තිබෙන්නේ දළ දෙශීය නිෂ්පාදනයෙන් සියයට 6ක් වැනි ප්‍රමාණයක් අධ්‍යාපන ක්ෂේත්‍රයට වෙන් කරන්න කියලා. මේ මුදල් අය කිරීම පිළිබඳව අද විවිධ තර්ක විතර්ක, වාද විවාද ඇති වුණා. 2008/35 චක්‍රලේඛනයෙන් ස්ථාපනය කරනු ලබන, පාසල නඟා සිටුවීමේ කමිටු කියන නාමයෙන් මේ මුදල් එකතු කර ගන්නා ක්‍රියාවලිය ක්‍රියාත්මක වන්නේ ඇයි?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි උදාහරණ දෙකක් ගනිමු. අනුරාධපුර මධ්‍ය මහා විද්‍යාලය ජාතික පාසලක්. ඒ පාසලේ වාර්ෂික ජල බිල්පත හා විදුලි බිල්පත රුපියල් ලක්ෂ 8ක් වෙනවා. හැබැයි, රජයෙන් ලබා දෙන දායකත්වය එක්ලක්ෂ පණස්දාහයි. ඉතිරි හය ලක්ෂ පණස්දාහ පාසල හොයා ගන්න ඕනෑ. එපමණක් නොවෙයි. අනුරාධපුර ස්වර්ණපාලි බාලිකා විද්‍යාලයේ මාසික විදුලි බිල්පත රුපියල් 60,000යි. ජල බිල්පත රුපියල් 1,80,000යි. මුළු ගණන එකතු කළොත් අවුරුද්දකට රුපියල් 7,80,000ක් වෙනවා. හැබැයි රජයේ ලැබෙන්නේ රුපියල් එක්ලක්ෂ හතළිස්හතර දාහයි. ඉතිරි ටික කොහෙන් ලබා ගන්න ද? ඒ ටික දරුවන්ගෙන් අය කර ගන්නවා. අනුරාධපුර ස්වර්ණපාලි බාලිකා විද්‍යාලයේ දූ දරුවන් 4460ක් දැනුම-මිනුම ලබා ගන්නවා. අනුරාධපුර මධ්‍ය මහා විද්‍යාල ජාතික පාසලේ දූ දරුවන් 4500ක් අධ්‍යාපනය ලබා ගන්නවා. රජයෙන් ලබා නොදෙන -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! The Hon. Deputy Chairman of Committees will now take the Chair.

***අනතුරුව ගරු ආර්. යෝගරාජන් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு,* மாண்புமிகு ஆர். யோகராஜன் அவர்கள் *அக்கிராசனத்தினின்று அகலவே,* குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார் அவர்கள்] *தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. R.. YOGARAJAN *left the Chair and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියොජ්‍ය කාරක සභාපතිතුමනි, රජයෙන් ලබා නොදෙන ඒ හිඟ මුදල ලබා ගන්න සිදු වෙලා තිබෙන්නේ, පාසලේ දූ දරුවන්ගෙන්. ලජ්ජයි කථා කරන්න, ගරු ජනාධිපතිතුමා බිහි වුණු හම්බන්තොට දිස්ත්‍රික්කයේ පාසල්වලිනුත් අද වන විට ළමයින්ගෙන් මුදල් අය කර ගැනීමේ නින්දිත ක්‍රියාවලිය ක්‍රියාත්මක වෙනවා. නමුත් ගරු ඇමතිතුමා මේ උත්තරීතර සභාවට ඇවිත් කියනවා, මේ සියලු දෙයම නතර කරන්න සති දෙකකින් චක්‍රලේඛනයක් නිකුත් කරනවා කියලා. ඒ චක්‍රලේඛනයටත් බාලගිරි දෝෂය. මේ මොහොත වෙනතෙක්, ඉදිරිපත් කරනවාය කියන ඒ චක්‍රලේඛනය ඉදිරිපත් කර නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන් අපේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රය දිහා බලනවිට, මුළු අධ්‍යාපන ක්ෂේත්‍රයේම බරපතළ කඩා වැටීමක් තිබෙනවා. බරපතළ පහළ වැටීමක් තිබෙනවා. බලන්න, අද අධ්‍යාපන ක්ෂේත්‍රය සහමුලින්ම දේශපාලනීකරණය වෙලා.

පසු ගිය කාලයේ -2010.12.31 වන දා - ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ තුන් වන ශ්‍රේණියට බඳවා ගන්න අයදුම් පත් කැඳෙව්වා. අයදුම් පත් 37,000ක් ආවා. විභාගයකුත් තිබ්බා. ඒ විභාගයට අය කරන විභාග ගාස්තුත් රුපියල් තුන්සියයේ සිට රුපියල් දාහ දක්වා වැඩි කළා. 37,000ක් පැමිණි ඒ විභාගයෙන් 410 දෙනෙක් තෝරා ගත්තා. හැබැයි, ඒ 410 තෝරාගත්තාට පස්සේ, ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට තමන්ගේ දේශපාලන හෙංචයියන් 783 දෙනෙක් බඳවා ගන්න අංක 2012/ ඊඩී/ඊ13 දරන වෙනම ම කැබිනට් පත්‍රිකාවක් ගරු ඇමතිතුමා 2012.03.28 වන දා ඉදිරිපත් කළා. තමන්ගේ පර්ශ්වයට සම්බන්ධ දේශපාලන ගෝල බාලයින් 783 දෙනෙක් ශ්‍රී ලංකා අධ්‍යාපන පිරිපාලන සේවයට බඳවා ගන්නට කටයුතු කරනවා.

මේක එක තැනක සිදු වන දෙයක් නොවෙයි. අද මේ ක්ෂේත්‍රවල සිටින ගුරුවරුන්ගේ, විදුහල්පතිවරුන්ගේ, අධ්‍යාපන පරිපාලකයන්ගේ අනුදැනුම නොමැතිව, අත්තනෝමතිකව, ඒකාධිපති වියරුවෙන් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථාව, ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාව, ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාව සංශෝධනය කරන කුට ක්‍රමයක් ක්‍රියාත්මක වෙනවා. අද අපේ රටේ ගුරුවරු 219,000 දෙනෙක් ඉන්නවා. විදුහල්පතිවරු 14,000 දෙනෙකුට ආසන්න ප්‍රමාණයක් ඉන්නවා. අද මේ කිසිම කෙනෙකුගේ අදහස් උදහස් විමසන්නේ නැතුව, ඒ අයගේ සේවා ව්‍යවස්ථා සංශෝධනයට ලක් කරලා අධ්‍යාපන සේවාව කප්පාදු කිරීමේ කුට වැඩසටහනක් ක්‍රියාත්මක වෙනවාය කියන එක මේ අවස්ථාවේ මම ප්‍රකාශ කරන්න කැමැතියි.

අද අධ්‍යාපන ක්ෂේත්‍රයේ පවතින බරපතළ ප්‍රශ්නයක් තමයි ගුරුවරුන්ගේ සහ විදුහල්පතිවරුන්ගේ වැටුප් විෂමතාව. 2008.12.03 වන දා සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා පිළිගත්තා, අතුරු වැටුප් යෝජනාවක් දමලා ගුරු, විදුහල්පති වැටුප් විෂමතාව ඉවත් කරන්න වැඩ පිළිවෙළක් යොදන්න ඕනෑ කියලා. ඒ අනුව, රුපියල් මිලියන 6700ක් -රුපියල් බිලියන 6.7ක්- වෙන් කළ

යුතුයි කියන යෝජනාව මත 2009 අය වැයෙන් රුපියල් මිලියන 3,000ක් වෙන් වුණා. නමුත් මුදල් වෙන් වුණේ නමට පමණයි. ගුරු වැටුප්, විදුහල්පති වැටුප් විෂමතාව විසඳන්න ඒ තඹ සතයක්වත් යොදා ගෙන නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විදුහල්පති සේවය ගැන කථා කරන විට 2006 දී ගැසට් පත්‍රයක් නිකුත් කරලා, විභාගයක් පවත්වා 2009 නොවැම්බර් 13 වන දා 2 - II ශ්‍රේණියට 1980 දෙනෙක් බඳවා ගත්තා. 3 වන ශ්‍රේණියට 2200 දෙනෙක් බඳවා ගත්තා. ඊට අමතරව 2012 ඔක්තෝබර් 2 වන දා නැවත වරක් 3 වන ශ්‍රේණියට 1700 දෙනෙකුත්,

2 - II ශ්‍රේණියට 2000කට ආසන්න ප්‍රමාණයකුත් බඳවා ගත්තා. ඒ අය අරලියගහ මන්දිරයට ගෙන්වා තමයි බඳවා ගැනීම සිදු කළේ. විදුහල්පති ශ්‍රේණියට 7880 දෙනෙක් බඳවා ගත්තා. හැබැයි, කනගාටුදායක කාරණාව මොකක්ද? ඒ අයගෙන් බහුතරයකට විදුහල්පති තනතුරු ලබා දීලා නැහැ. දේශපාලන හෙංචයියන් වැඩ බලන විදුහල්පතිවරුන් හැටියට පත් කරලා, නීත්‍යානුකූල ක්‍රමයට බඳවා ගත්ත 7880 දෙනා අද වන විට නියෝජ්‍ය විදුහල්පතිවරුන්, අංශ ප්‍රධානීන්, උප ගුරුවරුන් වැනි පහළ මට්ටමට දමලා තිබෙනවා. ඇමතිතුමා සේවා ව්‍යවස්ථාව උල්ලංඝනය කරමින් 2012.08.08 වන දා 12/111101/530/035 යන කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කරලා යෝජනා කළා, දේශපාලන ගෝලබාලයින් හෙංචයියන් පිරිසක් විදුහල්පතිවරුන් හැටියට පත් කරන්න. විභාග ක්‍රමයෙන් 7880 දෙනෙක් බඳවා ගත්තත් ඒ අයට විදුහල්පති තනතුරු නැහැ. නමුත් තමන්ගේ දේශපාලන ගෝලබාලයින් පිරිසකට වැඩ බලන පත්වීම් ලබා දීලා, කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා, ඒ අය ස්ථිර කරන්න. විශේෂයෙන්ම මේ වැඩ බලන හෙංචයියන් බොහෝ දෙනකු විභාගය අසමත් වුණු අය. එහෙම නැත්නම් ඒ විභාගයට පෙනී නොසිටි උදවිය. අද මොකක්ද මේ සිදු වන විහිළුව?

විදුහල්පති ශ්‍රේණියේ පළමු වන ශ්‍රේණියේ 23 දෙනෙකුට කර්නල් තනතුරු දුන්නා. තවත් පිරිසක් සම්මුඛ පරීක්ෂණයකට ලක් කරමින් සිටිනවා ලෙප්ටිනන්, කර්නල් තනතුරු, කපිතාන් තනතුරු, මේජර් තනතුරු ලබා දෙන්න. කපිතාන් තනතුරු, මේජර් තනතුරු ලබා දෙන්න පෙර, අර බඳවා ගත් 7880ක් වන පිරිසට නියම විදුහල්පති තනතුර ලබා දෙන්න කටයුතු කරන්න කියා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මහින්ද චින්තන දිනවමු ශ්‍රී ලංකා වැඩ පිළිවෙළේ තිබෙනවා, "දරුවන්ට දිවා ආහාරය සඳහා බත් වේලක් නොමිලේ ලබා දෙන්නෙමි" කියලා. මෙහෙම සඳහන් වන්නේ 18 වන පිටුවේ, අනු අංක 5 වන පොරොන්දුව යටතේ. සියලුම දරුවන්ට දිවා ආහාරයක් ලබා දෙනවාය කියනවා. අද පාසල් 9,714ට යන දූ දරුවන් 39,68,104 දෙනෙක් සිටිනවා. හැබැයි, දිවා ආහාරය ලබා දෙන්නේ තෝරා බේරලා 88,890 දෙනෙකුට.

සිසු පරපුරෙන් සියයට 27කටයි දිවා ආහාරය ලබා දෙන්නේ. අද සිසු පරපුරෙන් සියයට 27කට දිවා ආහාරය ලබා දෙන කොට, එදා රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ ආණ්ඩුව සියලුම දූ දරුවන්ට - හතළිස් තුන්ලක්ෂයකට- නිල ඇඳුම් ලබා දුන්නා. එදා රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ ආණ්ඩුව දූ දරුවන් හතළිස් තුන්ලක්ෂයකට දිවා ආහාර මුද්දරය ලබා දෙන කොට, මේ ආණ්ඩුව මොකක්ද කරන්නේ? පාසල් දූ දරුවන් සියයට 27කට දිවා ආහාරය ලබා දෙන අතර, සියයට 73කගේ දිවා ආහාර අයිතිවාසිකම කප්පාදු කරනවා. මෙලෙස දිවා ආහාර අයිතිවාසිකම කප්පාදු කරන්නේ ඇයි? විජිත් විජයමුණි ද සොයිසා හිටපු අධ්‍යාපන නියෝජ්‍ය ඇමතිතුමා 2011 අගෝස්තු 11 වැනිදා මේ සම්බන්ධයෙන් මා අහපු ප්‍රශ්නයකට මේ උත්තරීතර සභාවේ දී පිළිතුරක් දී තිබෙනවා. හැන්සාඩ් වාර්තාවේ ඒක ඇතුළත් වෙලා තිබෙනවා. මේ රටේ පාසල් යන දූ දරුවන්ගේ මන්ද පෝෂණ ප්‍රතිශතය 2005 වර්ෂයේ සියයට 12යි, 2010 වර්ෂය වන කොට එය සියයට 17 දක්වා වැඩි වෙලා තිබෙනවාය කියලා විජිත් විජයමුණි ද සොයිසා අධ්‍යාපන නියෝජ්‍ය ඇමතිතුමා මේ උත්තරීතර සභාවට ප්‍රකාශ කර තිබෙනවා. ඒ බව 2011 අගෝස්තු මස 11 වැනි දින හැන්සාඩ් වාර්තාවේ ඇතුළත් වෙලා තිබෙනවා. පාසල් යන දූ දරුවන්ගේ මන්ද පෝෂණ තත්ත්වය ඉහළ යමින් තිබෙන මොහොතකත්, පාසල් යන දූ දරුවන්ගෙන් සියයට 27කට පමණක් දිවා ආහාරය ලබා දී, ඉතුරු සියයට 73ට දිවා ආහාරය ලබා දීම කප්පාදු කරන්නේ ඇයි කියන කාරණය මා මේ අවස්ථාවේ අහන්න කැමැතියි.

මිහින් ලංකා ව්‍යාපෘතිය වැනි නාස්තිකාර ව්‍යාපෘතිවලට මේ රටේ රාජ්‍ය සම්පතින් රුපියල් මිලියන 8,500ක් වැය කර තිබෙනවා. මේ වාගේ අසාර්ථක, අලාභදායී ව්‍යාපෘති වෙනුවෙන් රටේ ජනතාවගේ මුදල් ධනස්කන්ධයක් වැය කරන්න පුළුවන් මොහොතක, මේ රටේ පාසල් යන දූ දරුවන්ගෙන් කොටසකට පමණක් -සියයට 27කට පමණක්- තෝරා බේරා, පෙරලා, කිරලා, මැනලා දිවා ආහාරය ලබා දෙනවා. සියයට 73කගේ දිවා ආහාර අයිතිවාසිකම මේ ආශ්චර්යවත් ආණ්ඩුව කප්පාදු කරන්නේ ඇයි කියන කාරණය මා නැවත වරක් අහන්නට කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රය ශක්තිමත් කරන්නටත්, අපේ රටේ පාසල්වල ගුරුවරුන්ගේ අවශ්‍යතාව සම්පූර්ණ කරන්නටත් අධ්‍යාපන බලධාරින් කටයුතු කරන්නට ඕනෑ. ගුරු හිඟයක් තිබෙන තැනක අධ්‍යාපන ක්ෂේත්‍රය ශක්තිමත් වන්නේ නැහැ; පරිපූර්ණ වන්නේ නැහැ. මා ගරු ඇමතිතුමාගෙන් මේ කාරණය අහන්නට කැමැතියි. ගරු ඇමතිතුමනි, අප හැමෝම බලාපොරොත්තු වුණු ඒ කුරිරු කොටි ත්‍රස්තවාදය සුනු විසුනු කර ලබා ගත් යුද ජයග්‍රහණයෙන් පස්සේ අලුත් ශ්‍රී ලංකාවක් ගොඩ නඟන්නට කටයුතු කරන මේ වාගේ මොහොතක මධ්‍යම පළාතේ ගුරුවරුන් 1,338ක හිඟයක් තිබෙන්නේ ඇයි? උතුරු මැද පළාතේ ගුරුවරුන් 1,374ක හිඟයක් තිබෙන්නේ ඇයි? වයඹ පළාතේ ගුරුවරුන් 580ක හිඟයක් තිබෙන්නේ ඇයි? ඌව පළාතේ ගුරුවරුන් 699ක හිඟයක් තිබෙන්නේ ඇයි? බස්නාහිර පළාතේ ගුරුවරුන් 1,723ක හිඟයක් තිබෙන්නේ ඇයි? මේ පළාත් පහ දිහා බැලුවොත් පෙනෙනවා, ඉංග්‍රීසි විෂයය උගන්වන ගුරුවරුන් 1,063ක් හිඟයි. විද්‍යාව විෂයය උගන්වන ගුරුවරුන් 667ක් හිඟයි. ගණිත විෂයය උගන්වන ගුරුවරුන් 704ක් හිඟයි. සෞන්දර්යය විෂයය උගන්වන ගුරුවරුන් 2,134ක් හිඟයි. තාක්ෂණ විෂයය උගන්වන ගුරුවරුන් 1,206ක් හිඟයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මාර්තු 18 වැනිදා මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ විවෘත වෙනවා. ඒ පිළිබඳව අප සතුටු වෙනවා. අප දේශපාලන කුහකයෝ නොවෙයි. හොඳ වැඩක් කරන කොට හොඳයි කියලා කොන්ද කෙළින් තියාගෙන ප්‍රකාශ කරන්න පුළුවන් දේශපාලන ශක්තියක් අපට තිබෙනවා. නමුත් මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ කෝටි ප්‍රකෝටි ගණනක මුදලක් වැය කර මාර්තු 18 වැනිදා විවෘත වනවා. ගරු අධ්‍යාපන ඇමතිතුමනි, ගරු ජනාධිපතිතුමාගේ දිස්ත්‍රික්කයේ අධ්‍යාපන කලාප තුනක් තිබෙනවා. ඒ තමයි තංගල්ල කලාපය, හම්බන්තොට කලාපය සහ වලස්මුල්ල කලාපය. ලජ්ජයි කියන්න, තංගල්ල කලාපයේ ගුරුවරුන් 100ක හිඟයක් තිබෙනවා. හම්බන්තොට කලාපයේ ගුරුවරුන් 45ක හිඟයක් තිබෙනවා. වලස්මුල්ල කලාපයේ ගුරුවරුන් 40කගේ හිඟයක් තිබෙනවා. හම්බන්තොට දිස්ත්‍රික්කයේ මේ රටේ දෙවැනි ජාත්‍යන්තර ගුවන් තොටුපොළ මාර්තු 18 වැනිදාට විවෘත වන

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

කොට ඔබතුමාට හයියක් තිබෙනවා නම්, කොන්දක් තිබෙනවා නම්, හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගුරු හිඟය මේ ජාත්‍යන්තර ගුවන් තොටු පොළ විවෘත වීමත් සමඟම ඉක්මනින්ම පුරවන්නට ඔබතුමා කටයුතු කරන්න කියලා මා මේ අවස්ථාවේ ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

එපමණක් නොවෙයි ගරු ඇමතිතුමනි, ඊයේ පෙරේදා මහවිලච්චිය කොට්ඨාසයේ, සිද්ධාර්ථ විද්‍යාලයේ ළමුන් 1,200ක් සමඟ දෙමවුපියන් මහ පාරේ සිටියේ. ඇයි? ගුරුවරුන් 18ක් හිඟයි ඒ ඉස්කෝලෙට. පැල්මඩුල්ල, කහවත්ත, පෝරනුව, පඤ්ඤානන්ද විදුහලේ ගුරු හිඟය නිසා පාසල් දූ දරුවන් දෙමවුපියන් ඊයේ පෙරේදා මහ පාරට බැස්සා. ඒ නිසා විශේෂයෙන්ම මම ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේ ප්‍රශ්න ගැන සොයලා බලලා කරුණාකරලා යථාර්ථවාදීව, ප්‍රායෝගිකව, ප්‍රතිඵලදායකව මේ ප්‍රශ්නවලට විසඳුම් සපයන්න කියලා.

මට තව කොපමණ වෙලාවක් තිබෙනවාද?

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
You have 10 minutes.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රය ශක්තිමත් කරන්නට නම් අපි හැම විටම සත්‍යවාදීව, තොරතුරු කරුණු දත්ත අවබෝධ කර ගෙන, යථාර්ථය හඳුනා ගෙන මේ වැඩසටහන ක්‍රියාත්මක කරන්නට ඕනෑ. අධ්‍යාපන ඇමතිතුමා මේ රටේ හතළිස් ලක්ෂයක් දූ දරුවන්ගේ නැණ පහන දල්වන වැඩසටහනේ ආඩම්බරකාර පියා හැටියට, මේ මහා අධ්‍යාපන ව්‍යාපෘතිය මෙහෙයවන ප්‍රධාන පෙර මඟ ගමන්කරුවා හැටියට අධ්‍යාපන ක්ෂේත්‍රයේ තොරතුරු දත්ත පිළිබඳව ඇති තතු දැන ගන්නට ඕනෑ. ඇති තතු දැන ගත්තාට මදි. ඒ ඇති තතු ගැන මේ අපි හැමෝම ගරු කරන මේ උත්තරීතර සභාවේ අපි සියලු දෙනාවම දැනුවත් කරන්නට ඕනෑ; ප්‍රචාරණය කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම කැමැතියි, හැන්සාඩ් වාර්තාවකින් උපුටා දැක්වීමක් කරලා, හැරිසන් මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයකට බන්දුල ගුණවර්ධන මැතිතුමා දුන්නු උත්තරයක් මේ අවස්ථාවේදී ඉදිරිපත් කරන්න. හැරිසන් මන්ත්‍රීතුමා බන්දුල ගුණවර්ධන මැතිතුමාගෙන් ප්‍රශ්නයක් අහනවා, සිවිල් ආරක්ෂක අංශයේ පුද්ගලයන් ගුරු සේවයේ නියැලී සිටිනවායි කියන එක ගැන. ඇමතිතුමා කියනවා, "මගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට එසේ යොදවන්නට බැහැ" කියලා. කවුද මේ කියන්නේ? අපේ රටේ අධ්‍යාපන ඇමතිතුමා. අධ්‍යාපන ඇමතිතුමා දන්නේ නැහැ, සිවිල් ආරක්ෂක ක්ෂේත්‍රයේ නිලධාරින් ගුරු සේවයට ගුරු වෘත්තියට යොදවලා තිබෙනවාද නැද්ද කියන එක. මේ, රටේ අධ්‍යාපන ඇමතිතුමා. එහෙම නම් මම එතුමාගේ නොදැනුවත්කම ගැන කනගාටුවෙමින් ඇත්ත තත්ත්වය ගැන පොඩ්ඩක් පැහැදිලි කර දෙන්න කැමැතියි.

ගරු ඇමතිතුමනි, මුලතිව් දිස්ත්‍රික්කයේ මුලතිව් අධ්‍යාපන කලාපයට අයත් සම්පත්නුවර අධ්‍යාපන කොට්ඨාසයේ, ජනකපුර ප්‍රාථමික විද්‍යාලයේ සිවිල් ආරක්ෂක ක්ෂේත්‍ර නිලධාරින් තුන් දෙනෙක් ගුරුවරුන් හැටියට කටයුතු කරනවා. කිරිඉබ්බන්ආර විද්‍යාලයේ හත්දෙනෙක්, ඇහැටුගස්වැව විද්‍යාලයේ අට දෙනෙක්, සම්පත්නුවර මහා විද්‍යාලයේ පස් දෙනෙක්, කල්‍යාණපුර විද්‍යාලයේ තුන් දෙනෙක්, ඇතා වැටුණු වැව විද්‍යාලයේ පස් දෙනෙක්. එතැනින් නතර වන්නේ නැහැ. අපි යමු, කැබිතිගොල්ලෑව අධ්‍යාපන කලාපයට. කෝන්කැටියාව ප්‍රාථමික විද්‍යාලයේ දෙන්නෙක්, ඊ යාය, 5 කණුව, මහසෙන් විද්‍යාලයේ දෙන්නෙක්, පදවිය මහසෙන් මහා විද්‍යාලයේ තුන් දෙනෙක්, රත්මලේ විද්‍යාලයේ දෙන්නෙක්, බාලයාවැව කණිෂ්ඨ විද්‍යාලයේ තුන් දෙනෙක්, මෛත්‍රීපුර විද්‍යාලයේ දෙන්නෙක්, පියවර 4, අනුර ප්‍රාථමික විද්‍යාලයේ තුන් දෙනෙක් යනාදී වශයෙන් අපේ රටේ විවිධ ප්‍රදේශවල ගුරු වෘත්තියේ නියැලී සිටිනවා, ගුරුවරුන් නොවෙයි, සිවිල් ආරක්ෂක ක්ෂේත්‍රයේ නිලධාරින්.

මම පිළිගන්නවා, යුද්ධය කාලය තුළ මේ ප්‍රශ්න තිබෙන්නට ඉඩ තිබුණු බව. ඒ නිසා සිවිල් ආරක්ෂක ක්ෂේත්‍රයේ නිලධාරින් උපයෝගී කර ගෙන ඒ දුෂ්කර අවස්ථාවේදී මේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ වැඩ කටයුතු කළායි කියන එක මට පිළිගන්නට පුළුවන්. වැරදි වුණත් පිළිගන්න වෙනවා. නමුත් ගරු ඇමතිතුමනි, යුද්ධය අවසන් වෙලා වසර තුනකට වැඩි කාලයක් දැනට ගත වෙලා. වසර හතරකටත් ආසන්න වන මේ මොහොතේ අදටත් මේ පාසල්වල ගුරු ප්‍රශ්නයට විසඳුමක් නැත්තේ ඇයි? අඩුම ගණනේ ඒ සුදුසුකම් තිබෙන සිවිල් ආරක්ෂක ක්ෂේත්‍රයේ නිලධාරින් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට බඳවා ගෙන ගුරු පුහුණුවකට යොදවලා මෙය නියමානුකූල කරන්න පිළිවෙළකට සකස් කරලා සැලැස්මක් අනුව ක්‍රියාත්මක කරන්න ඔබතුමාට හැකියාව තිබුණා. කොටින්ම කියනවා නම් රටේ අධ්‍යාපන ඇමතිතුමා දන්නේ නැහැ, රටේ එක්තරා ප්‍රදේශයක ගුරු වෘත්තියේ සිවිල් ආරක්ෂක නිලධාරින් නියැලී සිටින කාරණාව. රටේ අධ්‍යාපන ඇමතිතුමා එය නොදැන, එතුමාගේ නොදැනුවත්කම තුළින් මේ පාර්ලිමේන්තුව නොමඟ යැවීම තුළ අපේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රයට අත්වන ඵල විපාක ගැන අමුතුවෙන් දේශනාවක් කරන්නට මට අවශ්‍ය නැහැ. ඇත්ත වශයෙන්ම ගරු ඇමතිතුමනි, මේ ගරු සභාවේ කරුණු කාරණා තොරතුරු ඉදිරිපත් කරන කොට මීට වඩා වැඩි වගකීමකින් කටයුතු කරන්න.

අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ සිවිල් ආරක්ෂක නිලධාරින් රැකියාවක් කරනවාද, නැද්ද කියන එක ගැන ඔබතුමා තොරතුරු දන්නේ නැත්නම් මමවත් දෙන්නම් ඔබතුමාට තොරතුරු ටික. ඔබතුමා ඒ තොරතුරු ලබා ගන්න කාර්යක්ෂම නැත්නම්, මම හෝ ලබා දෙන්නම් ඒ තොරතුරු ටික. කරුණාකරලා ඒ තොරතුරු, දත්ත හඳුනා ගෙන සත්‍යවාදීව මේ උත්තරීතර සභාවට කරුණු ඉදිරිපත් කරන්න කියලා මා ඉල්ලීමක් කරනවා.

ගරු ඇමතිතුමා අපේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිබඳව අසත්‍ය කරුණු කියලා මේ ගරු සභාව නොමඟ යවපු පළමුවැනි අවස්ථාව නොවෙයි මේ. මට මතකයි පසු ගිය සති කිහිපය තුළ මා එතුමාගෙන් ප්‍රශ්න කිහිපයක් ඇහුවා. වැඩි කාලයක් නොවෙයි. 2013 පෙබරවාරි 6වැනිදා මා එතුමාගෙන් අතුරු ප්‍රශ්නයක් ඇහුවා. ඒ තමයි, පාසල් 9,731කින් 1,563කට -සියයට 16කට- විදුලිය නැහැ. 1,463කට -සියයට 15කට- ජලය නැහැ. 859කට -සියයට 8.8කට- වැසිකිළි කැසිකිළි පහසුකම් නැහැ. 4,283කට, ඒ කියන්නේ පාසල් පද්ධතියෙන් සියයට 44කට පුස්තකාල පහසුකම් නැහැ. ඒක ඇත්තක්ද කියා මා ගරු ඇමතිතුමාගෙන් ඇහුවා. එතකොට බන්දුල ගුණවර්ධන ඇමතිතුමා දෙනවා මෙන්න මෙහෙම උත්තරයක්.

> "... මෙතුමාගේ සංඛ්‍යා ලේඛන මම සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරනවා. මේ පාසල්වල ඇති වෙලා තිබෙන යථාර්ථවාදී තත්ත්වය සත්‍ය සංඛ්‍යා ලේඛන සහිතව, අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රකාශනයක් ලෙස මේ ගරු සභාවේ සියලුම මන්ත්‍රීතුමන්ලාගේ දැන ගැනීම සඳහා ඊළඟ වාරයේදී මම ඉදිරිපත් කරනවා."

එතුමා ඊළඟ වාරයේ ඉදිරිපත් කළෙත් නැහැ. අද මා පැහැදිලිව නැවතත් වරක් කියනවා, මා ඉදිරිපත් කළ සංඛ්‍යා ලේඛන සත්‍යවාදී සංඛ්‍යා ලේඛන බව. එපමණක් නොවෙයි, මා මේ සංඛ්‍යා ලේඛන ලබා ගත්තේ අධ්‍යාපන අමාත්‍යාංශයේ, සංඛ්‍යා ලේඛන ශාඛාවේ, නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංඛ්‍යා ලේඛන) කේ.එම්.ඩී.එස්.ඩී. කරුණාරත්න මැතිතුමාගෙන් බවත් මා කියන්න කැමැතියි. මේ අවස්ථාවේදී මා ඒ සංඛ්‍යා ලේඛන හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා ***සභාගත** කරනවා.

දැන් බලන්න ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පාර්ලිමේන්තුවේදී අපි ප්‍රශ්නයක් අහන කොට මෙතුමා කියනවා, අපි ඉදිරිපත් කළ තොරතුරු වැරදියි කියලා. නමුත් එතුමාගේම අමාත්‍යාංශයේ, සංඛ්‍යා ලේඛන අධ්‍යක්ෂ කරුණාරත්න මැතිතුමා කියනවා, "මේවා තමයි හරි සංඛ්‍යා ලේඛන" කියලා. මේ උත්තරීතර සභාවට ඇවිල්ලා රටේ අධ්‍යාපන ඇමතිතුමා, රටේ අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ දත්ත පිළිබඳව, ප්‍රශ්න පිළිබඳව මේ උත්තරීතර සභාව නොමඟ යවනවා නම්, රට නොමඟ යවනවා නම් අපේ රටේ අධ්‍යාපන කෂේත්‍රයට යන කල දසාව මොකක්ද කියා මා අහන්න කැමැතියි? ගරු ඇමතිතුමනි, පිළිගන්න. මේ රටේ විදුලිය නැති පාසල් සියයට 16ක් තිබෙනවා. ජලය නැති පාසල් සියයට 15ක් තිබෙනවා. සනීපාරක්ෂක පහසුකම් නැති පාසල් සියයට 8.8ක් තිබෙනවා. පුස්තකාල පහසුකම් නැති පාසල් සියයට 44ක් තිබෙනවා. ලජ්ජයි කියන්න. නමුත් ඒකයි යථාර්ථය. එපමණක් නොවෙයි ගරු ඇමතිතුමනි. මා ඔබතුමාට කියන්න කැමැතියි, නමුත් ලජ්ජයි මේක කියන්න. සාමාන්‍ය පෙළ විද්‍යා විෂය සහිත පාසල් 6,788න් පාසල් 4,100කට සාමාන්‍ය පෙළ විද්‍යාගාර පහසුකම් නැහැ. ඒ කියන්නේ, සියයට 60කට සාමාන්‍ය පෙළ විද්‍යාගාර පහසුකම් නැහැ. කොහොමද විද්‍යා විෂයයෙන් අපේ දූ දරුවන් ඉදිරියට යනවාය කියන දේ බලාපොරොත්තු වෙන්නේ? ඒ විතරක් නොවෙයි. උසස් පෙළ විද්‍යා විෂය සහිත පාසල් අපේ රටේ 716ක් තිබෙනවා. ඒ පාසල්වලිනුත් 101කට, ඒ කියන්නේ සියයට 14කට උසස් පෙළ විද්‍යාගාර පහසුකම් නැහැ.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, your time is up.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Please give me one more minute.

ගරු ඇමතිතුමනි, උසස් පෙළ විද්‍යාගාර පහසුකම් නැහැ කියලා මා නොවෙයි කියන්නේ. කේ.එම්.ඩී.එස්.ඩී. කරුණාරත්න මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂ, සංඛ්‍යා ලේඛන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය බත්තරමුල්ල. එහෙම නම් ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ආඩම්බරකාර තාත්තා හැටියට අධ්‍යාපන ක්ෂේත්‍රය ශක්තිමත් කරන්න කටයුතු කරන මේ මොහොතේ, අසත්‍ය දත්ත ඉදිරිපත් කරලා, අසත්‍ය තර්ක ඉදිරිපත් කරලා මේ රටේ ජනතාව නොමඟ යැවීම තුළින් ඔබතුමා ආඩම්බරකාර තාත්තා කෙනෙකු නොවෙයි, අධ්‍යාපන ක්ෂේත්‍රයට ආඩම්බරකාර දේවදත්තයෙක් වෙලා තිබෙනවාය කියන දේ මා කියන්න කැමැතියි. අන්න ඒ නිසා, මා මේ ඉදිරිපත් කරපු තොරතුරු, කරුණු කාරණා, දත්ත සහ තර්ක විතර්ක ගැන කරුණාකරලා ඔබතුමා හොඳට අවධානය යොමු කරලා, ඒ තොරතුරුවලට අනුකූලව අලුත් විධියට හිතලා නිර්මාණශීලී වැඩ සටහනක් සකස් කරන්න. ඒ තුළින් මේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රය කුණු බක්කියට ගෙන යන, මහා ප්‍රපාතයට ගෙන යන මේ ගමන නතර කරන්න. විශේෂයෙන්ම අද දළ දේශීය නිෂ්පාදනයෙන් අධ්‍යාපන ක්ෂේත්‍රය වෙනුවෙන් වැය කරන මේ සොච්චම් සියයට 1.86 නොවෙයි, අඩුම ගණනේ සියයට 6ක්වත් වෙන් කරලා, මේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රය වෙනුවෙන් යොදවලා, මේ රටේ අනාගතය භාර ගන්නට සිටින දූ දරුවන් වෙනුවෙන් අද ඉඳලාවත් යුතුකම් ඉෂ්ට කරන්නය කියලා ඉල්ලීමක් කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

***සභාමේසය මත තබන ලද ලියවිල්ල :***
*சபாபீடத்தில் வைக்கப்பட்ட ஆவணம்:*
*Document tabled:*



| District | No. Of Schools | | | | |
|---|---|---|---|---|---|
| | Total | Electricity Facilities Available | Water Facilities Available | Sanitary Facilities Available | Library Facilities Available |
| Colombo | 403 | 401 | 400 | 394 | 340 |
| Gampaha | 531 | 529 | 515 | 513 | 361 |
| Kalutara | 399 | 384 | 381 | 360 | 260 |
| Kandy | 637 | 568 | 528 | 595 | 364 |
| Mathale | 307 | 239 | 252 | 276 | 169 |
| Nuwara Eliya | 517 | 395 | 404 | 446 | 203 |
| Galle | 423 | 404 | 377 | 391 | 301 |
| Matara | 358 | 347 | 314 | 323 | 273 |
| Hambantota | 312 | 293 | 285 | 294 | 220 |
| Jaffna | 416 | 377 | 395 | 405 | 171 |
| Kilinochchi | 88 | 11 | 75 | 76 | 16 |
| Mannar | 115 | 68 | 92 | 99 | 39 |
| Vavuniya | 188 | 88 | 157 | 152 | 48 |
| Mullaitivu | 83 | 22 | 79 | 67 | 19 |
| Batticaloa | 332 | 246 | 283 | 308 | 150 |
| Ampara | 406 | 345 | 298 | 358 | 207 |
| Trincomalee | 280 | 227 | 233 | 251 | 125 |
| Kurunegala | 867 | 780 | 734 | 798 | 509 |
| Putalam | 348 | 315 | 288 | 333 | 223 |
| Anuradapura | 540 | 377 | 419 | 499 | 300 |
| Polonnaruwa | 236 | 190 | 185 | 217 | 134 |
| Badulla | 574 | 467 | 437 | 489 | 301 |
| Monaragala | 264 | 192 | 216 | 229 | 159 |
| Ratnapura | 582 | 479 | 498 | 513 | 290 |
| Kegalle | 523 | 426 | 425 | 456 | 246 |
| Total | 9731 | 8168 | 8268 | 8872 | 5448 |

***[මෙම ඇමුණුම පුස්තකාලයේ ද තබා ඇත.]***
*[இந்த இணைப்பு நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]*
*[This annex is also placed in the Library.]*

[අ.භා. 3.56]

**ගරු ලසන්ත අලගියවන්න මහතා (ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லசந்த அலகியவன்ன - நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொதுவசதிகள் பிரதி அமைச்சர்)
(The Hon. Lasantha Alagiyawanna - Deputy Minister of Construction, Engineering Services, Housing and Common Amenities)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද මේ විවාදයට සහභාගී වීමට ලැබීම ගැන මා එක පැත්තකින් සතුටුවන අතර, අනෙක් පැත්තෙන් අපේ රටේ අධ්‍යාපනය පිළිබඳව මෙවැනි ආකාරයෙන් අදහස්, යෝජනා ඉදිරිපත් වීම ගැන ඉතාම කනගාටු වෙනවා. අපි මොන මොන දේශපාලන මති මතාන්තර දැරුවත් මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන බහුතර මන්ත්‍රීවරුන් සංඛ්‍යාවකගේ දූ දරුවෝ තවමත් පාසල් යනවා. මගේ දූ දරුවෝත් පාසල් යනවා. එතකොට අපි අපේ දූ දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් කොපමණ වෙහෙස මහන්සි වෙනවාද, අපි අවධානය යොමු කරනවාද කියලා අමුතුවෙන් සඳහන් කරන්නට අවශ්‍යතාවක් නැහැ. ඒ වාගේම තමයි සියලුම දෙමව්පියන්ගේ එකම බලාපොරොත්තුව, පැතුම, අරමුණ තමන්ගේ දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබා දීමයි. එම නිසා, අපි ගැනම හිතලා අධ්‍යාපනය වෙනුවෙන් දේශපාලන වාසි ලබා ගැනීම සඳහා කටයුතු කළ යුතු නැහැයි කියන එකයි මා පෞද්ගලිකව දරන මතය. අපි වෙන ඕනෑම ප්‍රශ්නයකදී වෙන් වුණත් රට වෙනුවෙන්

** කථාව අවසානයේ පළ කර ඇත.*
** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of speech.*

[ගරු ලසන්ත අලගියවන්නමහතා]

සහ අධ්‍යාපනය වෙනුවෙන් තීන්දු, තීරණ ගන්නා අවස්ථාවන්වලදී බොහොම පැහැදිලිව පක්ෂ භේදයකින් තොරව දරුවන්ගේ ඉදිරි අනාගතය වෙනුවෙන් ඒ තීන්දු, තීරණ ගත යුතුයි, අදහස් යෝජනා ඉදිරිපත් කළ යුතුයි කියන එකයි මගේ පෞද්ගලික මතය.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ රටේ ජනගහනය ලක්ෂ 200යි. ලක්ෂ 40ක් පාසල් දරුවන් ඉන්නවා. අපේ රටේ ඒ දරුවන්ගේ දෙමව්පියොත් එක්ක ගත්තොත් එක්කෝටි විසි ලක්ෂයක් විතර සෘජුවම අධ්‍යාපනයට සම්බන්ධයි. අධ්‍යාපනයට සමස්ත රටම සම්බන්ධයි වාගේම ඔවුන් සෘජුවම සම්බන්ධයි. මෙන්න මේ තත්ත්වය නිසා අද ඇතැම් දේශපාලනඥයන් හිතනවා, අධ්‍යාපනය වෙනුවෙන් අපි කථා කරන්න ඕනෑ, අධ්‍යාපනය වෙනුවෙන් කටයුතු කරන්න ඕනෑ කියලා. එම නිසා කොතරම් යහපත් දෙයක් කළත් මේක විවේචනය කිරීම තමයි ජනතාවගේ පැත්තෙන් හොඳම දේ කියලා හිතලා අද විපක්ෂයේ කාර්ය භාරය බවට පත් වෙලා තිබෙන්නේ මේ අධ්‍යාපන ක්‍රමය විවේචනය කිරීමයි. ඉතින් ඒ අය කියන විධියට අද අධ්‍යාපනයේ කිසිම දියුණුවක් නැහැ. අද අධ්‍යාපනය කඩා වැටිලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා කියපු විධියට එතුමාගේ පියා ජනාධිපති කාලයේදීත්, එතුමා නියෝජ්‍ය ඇමති කාලයේදීත් මීට වඩා අඩු පාඩු තිබුණා. හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගුරු පුරප්පාඩු ගැන කිව්වා. මම අභියෝගයක් කරනවා, එතුමාගේ පියා ජනාධිපති වෙලා ඉන්න කාලයේ සහ එතුමා නියෝජ්‍ය ඇමති වෙලා ඉන්න කාලයේ මීට වඩා වැඩි ගුරු හිඟයක් හම්බන්තොට කලාපය තුළ තිබුණේ නැහැය කියලා ඔප්පු කරන්න කියලා. අද ගුරු හිඟය ඊට වඩා අඩුයි. ඇත්ත කථාව ඒකයි. වැසිකිළි, කැසිකිළි නැති පාසල් සියයට 8ක් තිබෙනවා කිව්වා. එතුමාගේ පියා ජනාධිපති කාලයේ සියයට 50කට විතර වැසිකිළි, කැසිකිළි නැහැ. විදුලිය සියයට 60කට විතර නැහැ. මේ පාර්ලිමේන්තුවේදී මම දැක්කේ නැහැ, කරපු හොඳ දේවල් ගැන කියනවා. පසු ගිය උසස් පෙළ විභාගයේ ලංකාවේ ඉහළම තැන ගත්තේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ දූ දරුවෝයි. ඉතින් මේවාට සතුටු වෙන්න ඕනෑ. මේවා අගයන්න ඕනෑ. එම නිසා මේ අයට ඒ පිළිබඳව පිළිතුරු ලබා දෙන්න අපි බලාපොරොත්තු වෙන්නේ නැහැ.

මෙම අවස්ථාවේදී අපි මේ රටේ බුද්ධිමත් ජනතාවට ආරාධනා කරනවා, මේ කරුණු පිළිබඳව ඉතාමත් බුද්ධියෙන් යුතුව බලා තීන්දු තීරණ ගන්න කියලා. අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් යුත් අපේ රජය අධ්‍යාපනය කෙරෙහි තමයි වැඩිම ප්‍රමුඛතාව ලබා දීලා තිබෙන්නේ. අද මේ රටේ අධ්‍යාපනය ඉතාමත් දියුණුයි. දියුණු නැහැයි කියා කාටවත් කියන්න පුළුවන්කමක් නැහැ. 1994 දී අපේ රටේ සාමාන්‍ය පෙළ විභාගයෙන් සමත් වුණේ සියයට 17යි; උසස් පෙළ විභාගයෙන් සමත් වුණේ සියයට 27යි. එතුමන්ලා අවුරුදු 17ක් ආණ්ඩු කළා. ගණිතය, විද්‍යාව, සිංහල විෂයයන්ගේ ප්‍රතිඵල වෙන්න පුළුවන්, අද ඒ සෑම විෂයයකින්ම අධ්‍යාපනයේ දියුණුවක් ලබා තිබෙන බව තර්කානුකූලව කරුණු ඇතුව ඉතාමත් පැහැදිලිව සඳහන් කරන්න පුළුවන්.

මා සතුටු වනවා, අපේ විජිත හේරත් මන්ත්‍රීතුමා මේ අවස්ථාවේදී හෝ මෙම සභාවට පැමිණීම පිළිබඳව. එතුමා සඳහන් කළා, දෙමවුපියෝ එනවා, අර උළු කැටය, මේ උළු කැටය කියලා මාසයකට මෙන්න මේ ආකාරයේ මුදලක් ලබා දෙන්න කියා යෝජනා කරනවා, ඒ අනුව අපේ රටේ පාසල්වල හැම මාසයකම මේ විධියට මුදල් ගෙවලායි අපේ රටේ දෙමවුපියෝ දරුවන් පාසල් යවන්නේ කියලා. එතුමා උදාහරණයක් කිව්වා, රාජකීය විද්‍යාලයේ විදුහල්පතිතුමා ඒ සම්බන්ධයෙන් ලිඛිතව එවා තිබෙනවා කියලා. එවැනි මුදල් එකතු කිරීමක් අනිවාර්යයෙන්ම මාසිකව සිද්ධ කරන්නේ නැහැ. අවුරුද්දකට පහසුකම් ගාස්තු ගන්නවා. මා වේයන්ගොඩ ශාන්ත මරියා විද්‍යාලයේ ප්‍රාථමික අධ්‍යාපනය හැදෑරුවා. ඊට පස්සේ නිට්ටඹුව සංඝබෝධි විද්‍යාලයට ගියා. එතකොට ඩෙස්ක් එක, පුටුව අරගෙන ගිහින්, පහසුකම් ගාස්තු ගෙවලා තමයි අපි පාසල් ගියේ. ඒක අලුත් දෙයක් නොවෙයි. අපේ රටේ සෑම පාසල් දරුවකුගෙන්ම, සෑම මාසයකම සල්ලි අය කරන කුමන හෝ පාසලක් තිබෙනවා නම් කරුණු ඇතුව මේ ගරු සභාවට ඉදිරිපත් කරන්නය කියා මා එතුමාට කියනවා. මෙය ජනතාව නොමග යැවීමක් විධියටයි මා පෞද්ගලිකව දකින්නේ. මා බොහොම පැහැදිලිව වග කීමකින් යුතුවයි මේ කරුණු කියන්නේ.

අපේ දුමින්ද දිසානායක ඇමතිතුමා කිව්වා, ගමේ පන්සල හදපු විධිය. අද අපේ රටේ පාසල් නවදහස් ගණනක් තිබෙනවා. අපි අතීතය ගැන බැලුවොත් මේ පාසල් නවදහස් ගණනින් පාසල් පන්දහසකට පමණ ඉඩම් පරිත්‍යාග කර තිබෙන්නේ එම ප්‍රදේශවල දානපතීන්, ප්‍රභූන් වැනි පෞද්ගලික අයයි. මේවා අතීතයේදීත් සිද්ධ වෙලා තිබෙනවා. මේවා අලුත් දේවල් නොවෙයි. ගරු අධ්‍යාපන ඇමතිතුමා ඉදිරියේදී මේ පිළිබඳව පැහැදිලි චක්‍රලේඛයක් නිකුත් කරන්න අනිවාර්යයෙන්ම කටයුතු කරයි.

මෙම කල් තැබීමේ යෝජනාවේ ඇතුළත් වෙලා තිබෙන්නේ පාසල් වැසී යෑම පිළිබඳවයි. පාසල් වැසී යෑම අධ්‍යාපනය කඩා වැටීමක්, අධ්‍යාපනය දුර්වල වීමක් කියන එකයි මෙම යෝජනාවෙන් කියන්න උත්සාහ කරන්නේ. අද අපේ රටේ ජනගහන වර්ධනය සියයට 7කට ආසන්න ප්‍රමාණයක තිබෙන බව අපි දන්නවා. 2006 අවුරුද්දේ පාසල් දරුවෝ 3,837,548දෙනායි අපේ රටේ රජයේ පාසල්වල සිටියේ. 2012 වන විට පාසල් දරුවෝ 3,996,531දෙනෙක් අපේ රටේ පාසල්වල ඉන්නවා.

මේ ආකාරයෙන් සමස්ත පාසල් පද්ධතිය තුළ දරුවන්ගේ වැඩි වීමක් වෙලා තිබෙනවා. ඒ අය අතරින් අයින් කරන්න ඕනෑ අපේ රටේ පෞද්ගලික සහ ජාත්‍යන්තර පාසල්වලට ඇතුළත් කරන දරුවන් ප්‍රමාණය. අද ලක්ෂයකට ආසන්න දරුවන් ප්‍රමාණයක් රජයේ පාසල්වලට යන්නේ නැතිව පෞද්ගලික පාසල්වලට යනවා. අද සමහර පාසල්වල දරුවන් අඩු වෙනවා වාගේම සමහර පාසල්වල දරුවන් වැඩි වෙනවා. නගරයේ ප්‍රාථමික පාසලක අද පන්ති 4ක් තිබුණොත් ලබන අවුරුද්දේ පන්ති 5ක් වෙනවා. නගරයේ පාසල්වලට ඉල්ලුමක් ඇති වෙනවා. මා අර මුලින් කියපු කරුණු අනුව දෙමව්පියන් හැම අවස්ථාවකම උත්සාහ කරන්නේ තමන්ගේ දරුවා කුමන හෝ ආකාරයකින් උසස්ම තත්ත්වයේ පාසලකට ඇතුළත් කිරීමටයි. එයයි දෙමව්පියන්ගේ අපේක්ෂාව. ඒ අයගේ ආර්ථික මට්ටම ශක්තිමත් වෙන කොට, ඒ අයගේ හැකියාව වැඩි වෙන කොට ඒ අය අනිවාර්යයෙන් තම දරුවන් නගරයේ පාසල්වලට ඇතුළත් කරනවා. ඒකයි සත්‍ය තත්ත්වය, ප්‍රායෝගික තත්ත්වය. අද අපේ පාර්ලිමේන්තුවේ බොහෝ අයගේ දරුවන් යන්නේත් නගරයේ පාසල්වලටයි. ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරුන්ගේ දරුවන් ගත්තත් එහෙමයි. ඒක නරක නැහැ. හැබැයි ඒ අය පාසල ළඟට ගිහිල්ලා වාහනයෙන් එළියට බහින්නේ නැතිව දරුවා වාහනයෙන් බස්වලා යනවා. ඒ අය පෙනෙන්න යන්නේ නැහැ. ඒකයි තිබෙන එකම වෙනස. නමුත් ඔවුන් ගමේ දරුවා ගමේ පාසල පිළිබඳව කථා කරනවා. ඒකයි යථාර්ථය. ඒ අයට ඒ අයගේ දරුවන් පිළිබඳව ඒ හැඟීම තිබෙනවා වාගේම ගම්වල දෙමව්පියන්ටත් ඒ හැඟීම තිබෙන බව, ඒ අවශ්‍යතාව තිබෙන බව ඒ අය අවබෝධ කර ගත යුතුව තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ අධ්‍යාපනය කඩා වැටිලා පාසල් වැසී යෑමක් මොනම ආකාරයකටවත් සිද්ධ වෙලා නැහැ. ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා ගෙන ආ මේ

යෝජනාවේ සඳහන්ව තිබෙනවා පාසල්වල විදුලිය, වැසිකිළි, කැසිකිළි පහසුකම් යනාදිය ගැන. පාසල්වල වැසිකිළි, කැසිකිළි කීයක් තිබෙන්න ඕනෑද කියන මතය කෙරෙහි අපේ රටේ අවධානය යොමු වුණේ ප්‍රථම වතාවටයි. අතිගරු ජනාධිපතිතුමා සෑම දවසකම අරලියගහ මන්දිරයේදී දරුවන් මුණ ගැහෙනවා. ඒ එක දරුවකු කියපු කරුණු අනුව එතුමා ගරු අධ්‍යාපන ඇමතිතුමාටත්, අපේ ගරු ආර්ථික සංවර්ධන ඇමතිතුමාටත් උපදෙස් දීලා වැසිකිළි, කැසිකිළි ඉදි කර දීම සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කළා. සාමාන්‍යයෙන් පාසලක දරුවන් 70දෙනකුට, අඩුම තරමින් එක වැසිකිළියක්වත් තිබිය යුතුයි. එය යුනෙස්කෝ ආයතනයේ සෞඛ්‍ය අංශයෙන් ඉදිරිපත් කර තිබෙන මතයයි. අද අපි මේ තත්ත්වය ඇති කරමින් යනවා. ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා කිව්වා සියයට 8ක පමණ ප්‍රමාණයකටයි අද ඒ පහසුකම් නැත්තේ කියලා. එතුමාම ඒක කිව්වා. මේ තත්ත්වය පසු ගිය කාලයේ තිබුණේ නැහැ. ගිය අවුරුද්දේ වැසිකිළි, කැසිකිළි 50,000කට ආසන්න ප්‍රමාණයක් අපේ රටේ පාසල්වල ඉදි කළා. ඉතිරි ටික මේ අවුරුද්දේ ඉදි කරනවා. අපේ රටේ සෑම පාසලකම දරුවන් 70දෙනකුට එක වැසිකිළියක් බැගින් තිබිය යුතුයි කියන ප්‍රමිතියට පාසල් පද්ධතිය ගෙන ඒමේ යුතුකම, වගකීම රජයක් විධියට ඉටු කරන්න අපි අනිවාර්යයෙන් කටයුතු කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද විපක්ෂය අධ්‍යාපනය ගැන කිසිවක් කථා කළේ නැහැ. විදුහල්පති පත්වීම්, දේශපාලන පළිගැනීම්, අධ්‍යාපන පරිපාලන සේවයේ පත්වීම් ආදිය ගැනයි කථා කළේ. ඒ අතින්ලු අධ්‍යාපනය කඩා වැටිලා තිබෙන්නේ. විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු අධ්‍යාපනය පිළිබඳව නොදැන කථා කළා. අපේ ගරු අකිල විරාජ් කාරියවසම් මන්ත්‍රීතුමා කිව්වා පාසල්වලට කඩා පනින හමුදාවක් ගැන. අපේ රටේ කලින් තිබුණේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපනයක්. අද මුළු ලෝකයේම අධ්‍යාපනය වෙනස් වෙලා තිබෙනවා. අද ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයක් තිබෙන්නේ. වේවැල තියා ගෙන දරුවන්ට උගන්වන ක්‍රමය අද මුළු ලෝකයම පිළිගන්නේ නැහැ. අද දරුවන්ට ඉගෙන ගන්න උගන්වනවා. ඉගෙනීමටයි උගන්වන්නේ. එහෙම නැතිව වේවැල තියා ගෙන උගන්වන සංකල්පය අද ක්‍රියාත්මක වන්නේ නැහැ. ඒ වාගේම පාසල් පරීක්ෂකවරුන් පාසල්වලට කඩා පනින සංකල්පයත් අද අධ්‍යාපන ක්‍රමය තුළ නැහැ. ගුරු උපදේශකවරුන් සහ විෂයය අධ්‍යක්ෂවරුන් ඇතුළු කණ්ඩායම් පාසල්වලට ගිහිල්ලා පන්ති කාමරවලදී ගුරුවරුන්ට සහාය දෙන ආකාරයේ වැඩ පිළිවෙළක් තමයි අද අපේ රටේ අධ්‍යාපන ක්‍රමය තුළ ක්‍රියාත්මක වන්නේ.

දැන් ඇවිල්ලා අහනවා, පාර්ලිමේන්තුවේ කලින් කඩා පනින හමුදා තිබුණා, ඒ පරීක්ෂා කරන ඒවා දැන් කෝ කියලා. අධ්‍යාපන ක්‍රමය තුළ දැන් ඒ සංකල්ප නැහැ. එම නිසා මා බොහොම පැහැදිලිව කියන්න කැමැතියි, රටක් විධියට අද ලෝකයේ ඉතාමත් දියුණු අධ්‍යාපන මට්ටමකට අපේ රටේ අධ්‍යාපන තත්ත්වය පත්වෙලා තිබෙන බව. මේ වෙනුවෙන් විශේෂයෙන්ම අපේ විදුහල්පතිවරුන්, ගුරු මහත්ම මහත්මීන් කරන කැපවීම අපි කෘතවේදීව සිහිපත් කළ යුතුයි. විශේෂයෙන්ම දැනුමේ කේන්ද්‍රස්ථානයක් බවට මේ රට පත් කිරීමේ ඒ කාර්ය භාරයේ වගකීම අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක වෙමින් පවතින මොහොතකයි මෙවැනි ඉතාමත්ම අසාර්ථක කල් තැබීමේ යෝජනා පවා අද මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් වන්නේ. ඒ නිසා මේ සියලු දෙනාගෙන්ම අපි ඉල්ලීමක් කරන්න කැමැතියි. මේ ආකාරයට අධ්‍යාපනයේ සාර්ථක ප්‍රතිඵල තිබියදී, දේශපාලන වාසි ලබා ගැනීමේ අරමුණ ඇතිව ඒ ගැන සෘනාත්මකව, අසුබවාදීව කථා කරන්නේ නැතිව මේ දරුවන් ගැන හිතලා සිදුවන දේ ගැන හරියට කථා කරලා කියන්න. සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා කියන විධියට නම් එතුමාගේ තාත්තා ජනාධිපති කාලයේ, එතුමා නියෝජ්‍ය ඇමතිවරයකු වශයෙන් කටයුතු කළ කාලයේ හම්බන්තොට දිස්ත්‍රික්කය ගත්තොත් එහි කිසිම පුරප්පාඩුවක් ඇති වෙලා තිබිලා නැහැ. ඒ විධියට තමයි තේරෙන්නේ. රටට තේරෙන්නේ එහෙමයි. නමුත් එතුමන්ලා සිටි කාලයේ ඒ තත්ත්වය ඊට වඩා වැඩියි. අද ඊට වඩා අඩුයි. මේ අඩුවීම පිළිබඳව කථා කරලා, තව සුළු වශයෙන් හෝ අඩුවීමක් තිබෙනවා නම් ඒකත් දරුවන් වෙනුවෙන් නිවැරදි කර ගැනීමට ඒකරාශී වීම තමයි අද මහජන නියෝජිතයින් විධියට අපට පැවරී තිබෙන වගකීම. ඒ බව අවබෝධ කරගෙන අපි කටයුතු කරමුයි කියන ආරාධනය කරමින් මා නිහඬ වනවා.

[4.13 p.m.]

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Mr. Deputy Chairman of Committees, I would like to participate in this Adjournment Debate on the state of education in the country. This is one of the more serious issues afflicting the country today. The Hon. Deputy Minister who spoke before me appealed that we should look at these issues beyond political affiliations and I would like to endorse that and appeal to the Government to trod that path.

Today, the Mover of this Motion and, more particularly, the Hon. Member of Parliament of the UNP from the Hambantota District placed before this House several statistics, several facts and up to now, none of those have been addressed from the Government side. We see the Hon. Minister of Education running here and there, up to the Officials' Box, outside the Chamber, back in, consulting various people, Monitors and all. We will await to see what he will say today in response to all the facts that have been placed in this House. The Hon. Member from Hambantota made very serious allegations against the Hon. Minister about Questions that have been asked in this House, the replies given by the Hon. Minister himself and that those Questions have been repeated. So, the Hon. Minister has got yet another opportunity to place before this House and to the country the actual situation with regard to all of those statistics that have been asked of him.

தற்போது 'ஆயிரம் பாடசாலைகள் திட்டம்' அரசினால் அறிமுகப்படுத்தப்பட்டிருக்கிறது. பாடசாலைகளுக்கு மேலதிக வசதிகளை வழங்கி அவற்றை ஒரு நிறைவான கல்வி நிறுவனமாக மாற்றுவதுதான் அரசின் நோக்கமாகும். ஆயினும், குறைபாடுகளுக்கு மத்தியில் இயங்கும் எங்கள் பாடசாலைகளில் இந்தத் திட்டத்தினை அமுல்படுத்துவதால் மட்டும் பிரச்சினைகளைத் தீர்த்துவிட முடியாது. எங்கள் பகுதிகளில் 'ஆயிரம் பாடசாலைகள் திட்டம்' அமுல்படுத்தப்படுகின்றபோது நாங்கள் சில நெருக்கடிகளைச் சந்திக்கவேண்டி வருகிறது. குறிப்பாக, இன்று யாழ்ப்பாணம், கிளிநொச்சி மற்றும் வன்னி மாவட்டங்களில் இருக்கின்ற உயர்நிலைப் பாடசாலைகளில் ஏற்கெனவே ஏராளமான வளப் பற்றாக்குறைகள் இருக்கின்றன. ஆயிரம் பாடசாலைத் திட்டத்தின் அபிவிருத்தியில் முதற்கட்டமாகத் தெரிவு செய்யப்பட்ட 26 பாடசாலைகளுக்கு விஞ்ஞானகூடங்கள் வழங்கப்படுவதை நாங்கள் வரவேற்கிறோம். ஆனால், விஞ்ஞானகூடங்கள் மட்டும் அந்தப் பாடசாலைகளின் குறைபாடுகளைத் தீர்த்துவிடாது. ஏனென்றால், பிரபல பாடசாலைகள் உட்படப் பெரும்பாலான பாடசாலைகளில் 15 வகுப்பறைகளுக்கு மேல் கட்டிட வசதிகள் இல்லை. ஆகவே, கட்டிட வளப் பற்றாக்குறையைத் தீர்ப்பதற்கு கல்வி அமைச்சு உரிய விசேட நடவடிக்கைகளை எடுக்கவேண்டும். எங்களுக்கு அதற்கான நிதி வசதிகளைப் பெற்றுத்தருவதற்கு உதவ வேண்டுமென்பதை நான் இச்சந்தர்ப்பத்திலே தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

ஆசிரியர் பற்றாக்குறையைப் பொறுத்தவரை எங்கள் பகுதிகளில் பாரிய பிரச்சினைகளை நாங்கள் எதிர்கொள்கின்றோம். குறிப்பாக வட மாகாணத்திலே கணிதம், விஞ்ஞானம், Physics, Chemistry, Biology, ICT, English போன்ற பாடங்களுக்கு 1,338 ஆசிரியர்களுக்கான பற்றாக்குறை காணப்படுகின்றது. இதில் முக்கியமாக ஆங்கில பாடத்தைப் பொறுத்தவரை 713 ஆசிரியர்களுக்கான பற்றாக்குறை இருக்கின்றது. அதுபோல ICT பாடத்துக்காக 175 ஆசிரியர்கள் பற்றாக்குறையாக இருக்கின்றனர். கணித பாடத்தைப் பொறுத்தவரை 121 ஆசிரியர்களும் விஞ்ஞான பாடத்தைப் பொறுத்தவரை 159 ஆசிரியர்களும் மேலும் சில பாடங்களுக்குமாக மொத்தம் 1,338 ஆசிரியர்கள் எங்களுக்குத் தேவைப்படுகின்றார்கள். இப்பாடங்களுக்கான ஆசிரியர்கள் பற்றாக்குறையானது வட மாகாணத்தில் பாரியதொரு பிரச்சினையாகக் காணப்படுகின்றது. இப்பற்றாக்குறையானது கல்வியின் தரத்தை மேம்படுத்துவதற்கு மிகவும் இடையூறாக இருக்கின்றது என்பதை நான் இந்த அவையிலே தெரிவிக்க விரும்புகின்றேன். இங்கு எனக்குத் தரப்பட்டுள்ள குறுகிய நேரத்துக்குள் வடமாகாணத்திலுள்ள ஆசிரியர் பற்றாக்குறை பற்றி வலய ரீதியாகத் தனித்தனியாகக் குறிப்பிட முடியாததால், அந்தப் *பட்டியலை ஹன்சாட்டில் பதிவுசெய்ய அனுமதிக்குமாறு கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களை வேண்டிக்கொள்கின்றேன்.

யுத்த காலத்திலும் சரி, யுத்தத்துக்குப் பின்னரான காலத்திலும் சரி - மக்கள் மீள்குடியேறிய காலத்திலும் சரி - எங்களது பிரதேசத்தில் தொண்டர் ஆசிரியர்கள் ஆற்றிய பணி மிகவும் மகத்தானது. வன்னி மாவட்டத்திலுள்ள பாடசாலைகளில் ஆசிரியர்கள் இல்லாமையினால் அவை இயங்க முடியாத நிலைமை ஏற்பட்டபோது, இந்தத் தொண்டர் ஆசிரியர்கள்தாம் அர்ப்பணிப்புடனான அளப்பெரும் சேவையை ஆற்றினார்கள். இவ்வாறு வன்னி மாவட்டத்தில் கிட்டத்தட்ட 600 பேர் பத்து வருடங்களுக்கு மேலாகத் தொண்டர் ஆசிரியர்களாகக் கடமையாற்றிக் கொண்டிருக்கின்றார்கள். இவர்களை ஆசிரியர் சேவைக்குள் உள்வாங்குவதற்கான முயற்சிகளைக் கௌரவ அமைச்சர் டக்ளஸ் தேவானந்தா அவர்களும் கௌரவ அமைச்சர் பந்துல குணவர்தன அவர்களும் முன்னெடுத்து வருகின்றார்கள். அவர்களின் பத்துவருட கால - யுத்தகால மற்றும் மீள்குடியேற்ற கால - சேவையை மதித்து, அவர்களுடைய உண்மையான அர்ப்பணத்துக்குரிய பரிசாக அவர்களுக்கு நிரந்தர ஆசிரியர் நியமனங்கள் வழங்குவதனை விரைவுபடுத்தவேண்டும் என்று நான் இந்தச் சபையிலே வேண்டுகோள் விடுக்க விரும்புகின்றேன்.

அவ்வாறே, இன்னுமொரு முக்கியமாக விடயத்தையும் நான் இங்கு குறிப்பிட விரும்புகின்றேன். இப்பிரச்சினையானது நாடுதழுவிய ஒரு பிரச்சினையாகக்கூட இருக்கின்றது. அதாவது, கிராமப்புறப் பாடசாலைகளின் அபிவிருத்தி வடக்கிலே மிகவும் மோசமாக இருக்கின்றது. நகர்ப்புறங்களில் கல்வி வளர்ச்சி வேகம் அதிகமாக இருக்கின்ற அதேநேரத்தில், கிராமப் புறங்களில் அவ்வேகம் குறைவாக

---

** කථාව අවසානයේ පළ කර ඇත.*
** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of speech.*

இருக்கின்றது. இதனால், ஏராளமான மாணவர்கள் நீண்டதூரம் பயணம் செய்து, கல்வி நடவடிக்கைகளில் ஈடுபடவேண்டிய துர்ப்பாக்கிய நிலைமையும் ஏழைப் பெற்றோர்களின் பிள்ளைகள் தங்களது உயர் கல்வி வாய்ப்பை இழக்கவேண்டிய நிலைமையும் ஏற்படுகின்றது. இதனால், கிராமப்புறங்களி லிருந்து நல்ல அறிவார்ந்த சமூகம் உருவாகுவதற்கு தடை ஏற்படுகின்றது. ஆகவே, நாங்கள் இது தொடர்பாக கூடிய கவனம் செலுத்தி, எதிர்காலத்தில் கிராமப்புறப் பாடசாலைகளின் முன்னேற்றத்தில் அதிக அக்கறை செலுத்தவேண்டும். கிராமப்புறப் பாடசாலைகளில் உயர்தரத்தில் குறிப்பாக விஞ்ஞான, கணிதப் பிரிவுகளை நடத்துவதற்கான வசதிகள் இல்லாமையினால், க.பொ.த. சாதாரண தரப் பரீட்சையில் விஞ்ஞானம் மற்றும் கணித பாடங்களில் சிறந்த பெறுபேறுகளைப் பெற்ற மாணவர்கள்கூட, கலைத்துறையில் கற்க வேண்டிய நிர்ப்பந்தத்துக்கு உள்ளாகின்றார்கள். இல்லையெனில், அவர்கள் விரும்பினால் கிட்டத்தட்ட 40-50 கிலோமீற்றர் தூரம் சென்றுதான் - குறிப்பாக வன்னி போன்ற பிரதேசங்களில் உள்ள மாணவர்கள் - விஞ்ஞான, கணித துறைகளில் உயர்தரம் கற்கவேண்டிய கட்டாயநிலை ஏற்படுத்தப்பட்டிருக்கின்றது. ஆகவே, இந்த நிலைமைகளை மாற்றவேண்டும்; கிராமப்புறக் கல்வி வளர்ச்சிக்கு அதிக முக்கியத்துவம் கொடுக்கப்பட வேண்டும் என்பதை நான் இங்கே வலியுறுத்துகின்றேன்.

கல்வி நிருவாக சேவையைப் - SLEAS - பொறுத்தவரையில், கல்வியைச் சீரான நிர்வாகக் கட்டமைப்புக்குள் கொண்டுவந்து, அதனைச் செயல்படுத்து வதற்காக வட மாகாணத்தில் 141 பேருக்கான பற்றாக்குறை இருக்கின்றது. இவ்வெற்றிடங்களை நிரப்புவதற்கு விசேட பரீட்சையொன்றினை நடத்தி, அதன்மூலம் தகுதியானவர்களை அச்சேவைக்குள் உள்வாங்குவதற்கு நடவடிக்கை எடுப்பதாக கௌரவ அமைச்சர் அவர்கள் உறுதியளித்திருக்கின்றார். எனவே, அதனை விரைவுபடுத்த வேண்டும். அவ்வாறே, எங்களது மாகாணத்தில் அதிபர் சேவையிலும் - SLPS - 550 பேருக்கான பற்றாக்குறையாக இருக்கின்றது. இப்போது கிட்டத்தட்ட 550 பேர் பதில் கடமை நிறைவேற்று அதிபர்களாக - performing principals - ஆசிரியர் துறைக்குள்ளிருந்து உள்வாங்கப்பட்டிருப்பதால், அங்கு ஆசிரியர் வளங்கூட தேவையில்லாமல் முடக்கப்படும் நிலைமை தோன்றியிருக்கின்றது. ஆகவே, இந்த SLPS 550 பேரையும் அதிபர் சேவைக்குள் உள்வாங்குவதற்குரிய நடவடிக்கைகளை கௌரவ அமைச்சர் அவர்கள் மேற்கொள்ளவேண்டும்.

அவ்வாறே, ஆங்கில ஆசிரியர்களின் பற்றாக்குறை தொடர்பாகவும் நான் இங்கு வலியுறுத்துகின்றேன். வட மாகாணத்தில் தமிழ் மொழிமூலப் பாடசாலைகளில் ஆங்கில ஆசிரியர்களை உள்வாங்குவதற்கு தகைமையானவர்கள் பற்றாக்குறையாக உள்ளனர். அங்கு ஆங்கிலப் பட்டதாரிகள் அல்லது டிப்ளோமா முடித்தவர்கள் மிகவும் குறைவாகவே உள்ளனர். இவ்வாறானவர்கள் ஏற்கெனவே ஆசிரிய சேவைக்குள் உள்வாங்கப்பட்டு விட்டார்கள். ஆகவே க.பொ.த. உயர்தரப் பரீட்சையில் ஆங்கிலத்தில் விசேட சித்தி பெற்றவர்களை உள்வாங்கி, அவர்களுக்கு விசேட பயிற்சி அளிப்பதன்மூலம் ஆங்கில ஆசிரியர்களை நியமிப்பதற்கு நடவடிக்கை எடுக்க முடியும் என்பதையும் நான் இங்கு வலியுறுத்துகின்றேன். ஒட்டுமொத்தமாக எமது பிரதேசத்தில் நிலவுகின்ற பாடசாலைக் கட்டிடங்கள் பற்றாக்குறை, ஆசிரியர்கள் பற்றாக்குறை, கல்விசார் உத்தியோகத்தர்கள் பற்றாக்குறை, நூலகம் மற்றும் கணினிக்கூடப் பற்றாக்குறை, ஆய்வுகூட வசதிகள் இல்லாமை போன்றவற்றைக் கௌரவ அமைச்சர் அவர்கள் கவனத்தில் எடுத்து அவற்றைப் பூர்த்தி செய்வதற்கான நடவடிக்கைகளை எடுக்க வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

அதேவேளையில் எமது பிரதேசத்திலுள்ள 330 primary ஊட்டப் பாடசாலைகளில் 129 பாடசாலைகள் மட்டுமே பாடசாலைகள் அபிவிருத்தித் திட்டத்தின்கீழான அபிவிருத்திக்கெனத் தெரிவுசெய்யப்பட்டுள்ளன. எனவே, ஏனைய ஊட்டப் பாடசாலைகளையும் அபிவிருத்தி செய்வதற்கு உரிய நடவடிக்கை மேற்கொள்ள வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன். எமது பிரதேசப் பாடசாலைகளின் அபிவிருத்திக்கு உதவிய அவுஸ்திரேலியா, சுவிற்சர்லாந்து, இந்தியா, அமெரிக்கா போன்ற நாடுகளுக்கும் பாடசாலைக் கல்வி வளர்ச்சிக்கு உதவிய UNICEF, ChildFund Sri Lanka, ChildFund Korea, Save the Children Fund, Sewalanka Foundation, FORUT ஆகிய நிறுவனங்களுக்கும் நான் இச்சந்தர்ப்பத்தில் நன்றி தெரிவிக்கக் கடமைப்பட்டுள்ளேன்.

அதேநேரத்தில் இன்னுமொரு முக்கியமான விடயத்தையும் நான் இச்சந்தர்ப்பத்தில் குறிப்பிட வேண்டியவனாக இருக்கின்றேன். தமிழ்த் தேசியக் கூட்டமைப்பின் பாராளுமன்ற உறுப்பினர் ஒருவர் இந்தச் சபையிலே, கௌரவ அமைச்சர் டக்ளஸ் தேவானந்தா அவர்கள் கல்வி வளர்ச்சிக்கு இடையூறாக இருக்கின்றார் என்னும் கருத்தை முன்வைத்திருக்கின்றார். இது அப்பட்டமாக ஏற்றுக்கொள்ளப்பட முடியாத நியாயமற்ற கருத்து. யுத்த காலத்திலும் யுத்தத்துக்குப் பின்னரும் வட மாகாணத்திலே, குறிப்பாக யாழ்ப்பாணம், கிளிநொச்சி போன்ற மாவட்டங்களிலே, வீழ்ச்சியடைந்திருந்த கல்வி நிலையை உயர்நிலைக்குக் கொண்டுவருவதற்காக மாண்புமிகு அமைச்சர் டக்ளஸ் தேவானந்தா அவர்கள் எடுத்துவரும் முயற்சியை அம்மாகாணக் கல்விச் சமூகம் மறுக்க முடியாது; பாராட்டுகிறது. மேலும், உடுவில் பெண்கள் கல்லூரியிலே நடைபெற்ற சம்பவத்தைத் திரிபுபடுத்தி அவர் இங்கு குறிப்பிட்டார். உண்மை அதுவல்ல. அந்தக் கல்லூரியிலே நடைபெற்ற பிரச்சினை ஒன்றுக்காக உடுவில் கல்விச் சமூகம் - ஆசிரியர்கள், பெற்றோர்கள், மாணவர்கள் - அப்பிரச்சினையிலே தலையிட்டு நடவடிக்கை எடுக்க வேண்டுமென கௌரவ அமைச்சர் அவர்களை வலியுறுத்தியிருந்தனர். அவர் ஒரு பொறுப்புள்ள அமைச்சர் என்ற வகையிலே அப்பிரச்சினையில் தலையிட்டு தென்னிந்தியத் திருச்சபை, கல்வித் திணைக்களம், உடுவில் கல்விச் சமூகம், ஆசிரியர்கள், பெற்றோர்கள், மாணவர்கள், ஆகியோரின் ஏற்றுக்கொள்ளுதலுடன் கூடிய சுமுகமான ஒரு தீர்வை ஏற்படுத்தி அக்கல்லூரி பிரச்சினைகள் எதுவுமின்றித் தொடர்ந்தும் இயங்குவதற்கு நடவடிக்கை எடுத்தார். ஆகவே, நியாயமற்ற வகையில் அவரைக் குறைகூறுவதை விடுத்து, அச்சேவையைப் பாராட்டுவதுதான் பொருத்தமானதென நான் நினைக்கின்றேன்.

உண்மையிலேயே வட மாகாணத்தில் தமிழ் மக்களின் கல்வியைச் சீரழித்த தமிழ் தேசியக் கூட்டமைப்பின் பாராளுமன்ற உறுப்பினர்கள், தாம் கல்வி மேம்பாட்டில் அக்கறை செலுத்துவதுபோன்று நடிப்பது வேதனையானது. பாடசாலைகளிலிருந்தும் பல்கலைக்கழகங்களிலிருந்தும் மாணவர்களை வீதிகளில் இறக்கி, வலுக்கட்டாயமாக ஆயுதப் பயிற்சிக்கு இழுத்துச்சென்று அவர்களின் கல்வியைச் சீரழிக்க முற்பட்ட தமிழ்த் தேசியக் கூட்டமைப்பின் பாராளுமன்ற உறுப்பினர்கள் இன்றும் இந்த அவையிலே இருக்கின்றார்கள். நாங்கள் கல்வியைச் சீரழிப்பதாக அவர்கள் கூறுவது மிகவும் வேடிக்கையான விடயம். இவர்கள் சீரழித்த கல்வியை

[ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා]

மேம்படுத்துவதற்காகத்தான் நாங்கள் அயராது உழைத்து வருகின்றோம். எமது கௌரவ அமைச்சர் அவர்கள் கல்வியின் மேம்பாட்டுக்காக மேற்கொண்ட நடவடிக்கைகள் பற்றி கல்வி அமைச்சர் மாண்புமிகு பந்துல குணவர்தன அவர்கள் நன்கு அறிவார். எமது அமைச்சர் அவர்கள் பல விசேட கூட்டங்களுக்கூடாகவும் விசேட நடவடிக்கைகளுக்கூடாகவும் கல்வியில் மேம்பாடுகளைக் கொண்டுவந்துள்ளார். ஆகவே, இவைபற்றி அறியாமல், அந்த உறுப்பினர் கூறிய இந்த விடயத்தை நான் வன்மையாகக் கண்டித்து அதனை மறுக்கின்றேன். யாழ். கல்விச் சமூகமோ, வட மாகாண கல்விச் சமூகமோ இவர்களுடைய கருத்தை ஒருபொழுதும் ஏற்றுக்கொள்ளாது என்பதை நான் இந்த அவையிலே தெரிவித்து, எமது கல்வி மேம்பாட்டுக்காக கல்வி அமைச்சும் கல்வித் திணைக்களங்களும் தொடர்ந்தும் உதவ வேண்டுமென வலியுறுத்தி, விடைபெறுகின்றேன். வணக்கம்.

**සභාමේසය මත තබන ලද ලියවිල්ල:*
**சபாபீடத்தில் வைக்கப்பட்ட அட்டவணை :*
**Schedule tabled:*

**Vacancy for the subjects Science , Maths, ICT & English**
**Ministry of Education -NP - 01.03.2013**

| Zone → | Kilinochchi | | | | Mullaithivu | | | Thunukkai | | | Madhu | | Mannar | | | Vavuniya North | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| Division → | Kandavalai | Karachchi | Poonagari | Palai | Karaithuraipattu | Puthukudyiruppu | Veli Oya | Manthai East | Oddusuddan | Thunukkai | Manthai West | Madhu | Mannar | Nanaddan | Musali | Omanthai | Nedunkerny |
| Maths | 7 | 27 | 7 | | | | 6 | 1 | 1 | 4 | 2 | 2 | 5 | 10 | 5 | 5 | 7 |
| Combined Maths | 1 | 1 | 1 | | 2 | 2 | | | | | 1 | 1 | 6 | 3 | | 1 | 1 |
| Science | 9 | 30 | 7 | | 7 | 6 | 5 | 2 | 4 | 3 | 4 | 1 | 6 | 8 | 5 | 7 | 7 |
| Physics | 1 | 2 | 1 | | 3 | 3 | 1 | 1 | 2 | 1 | | 1 | 8 | 3 | 1 | 1 | 1 |
| Chemistry | | 2 | | | 2 | 3 | 1 | | 1 | | | 1 | 9 | 3 | 1 | 1 | 1 |
| Biology | | 4 | 1 | | 2 | 2 | 1 | 1 | 2 | 1 | | 1 | 4 | 3 | 1 | | 1 |
| ICT | | 1 | 1 | | 5 | 4 | 6 | 2 | 6 | 2 | 6 | 1 | 4 | 5 | 6 | 2 | 3 |
| English | 30 | 52 | 30 | 12 | 4 | 2 | 6 | 11 | 21 | 13 | 3 | 1 | 8 | 20 | 6 | 55 | 49 |
| Total | 48 | 119 | 48 | 12 | 25 | 22 | 26 | 18 | 37 | 24 | 16 | 9 | 50 | 55 | 25 | 72 | 70 |
| Sub Total | 227 | | | | 73 | | | 79 | | | 25 | | 130 | | | 142 | |

| Zone → | Vavunya South | | | Jaffna | | | Valikamam | | | | Thenmaradchy | Island | | | | Vadamaradchy | | | Total |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| Division → | Vavuniya | Cheddikulam | Sinhala Medium | Jaffna | Nallur | Kopay | Uduvil | Thellipalai | Sandilipay | Sankanai | Chavakachcheri | Karainagar | Velanai | Kayts | Nedunthivu | Point Pedro | Karaveddy | Maruthankerny | |
| Maths | 6 | 4 | 3 | | | | | | | | 6 | | 4 | 5 | 4 | | | | 121 |
| Combined Maths | 7 | 3 | 4 | | | | | | | | 6 | | | | | | | | 40 |
| Science | 5 | 10 | 7 | | | | | | | | 8 | | 5 | 6 | 4 | | | 3 | 159 |
| Physics | 1 | 1 | 4 | | | | | | | | 5 | 1 | | 1 | | 1 | 1 | | 45 |
| Chemistry | 1 | 1 | 4 | | | | | | 1 | | 4 | | | 1 | 1 | 1 | 1 | | 40 |
| Biology | 1 | 1 | 4 | | | | | | 1 | | 4 | 2 | 2 | 2 | | 2 | 2 | | 45 |
| ICT | 17 | 6 | 6 | 13 | 9 | 12 | | | | | 8 | 1 | 3 | 3 | 2 | 18 | 14 | 9 | 175 |
| English | 39 | 49 | 17 | 14 | 30 | 32 | 22 | 19 | 33 | 22 | 50 | | 3 | 3 | 3 | 26 | 25 | 3 | 713 |
| Total | 77 | 75 | 49 | 27 | 39 | 44 | 22 | 19 | 35 | 22 | 91 | 4 | 17 | 21 | 14 | 48 | 43 | 15 | 1338 |
| Sub Total | 201 | | | 110 | | | 98 | | | | 91 | 56 | | | | 106 | | | 1338 |

Grand Total - 1338

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Will an Hon. Member propose the Hon. Yogarajan to take the Chair?

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු ආර්. යෝගරාජන් මහතා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු ආර්. යෝගරාජන් මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஆர். யோகராஜன் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. R. YOGARAJAN *took the Chair.*

[අ.භා. 5.30]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තබන අවස්ථාවේ ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා විසින් ගෙනෙන ලද යෝජනාව සම්බන්ධයෙන් -අද රටේ අධ්‍යාපනික ප්‍රශ්නය සම්බන්ධයෙන්- අදහස් ටිකක් එකතු කිරීමයි මගේ අභිලාෂය වන්නේ.

මා හිතන විධියට ගරු ඇමතිතුමාට ගරු මන්ත්‍රීවරු ගණනාවක් මේ සම්බන්ධයෙන් අදහස් යොමු කරලා ඇති. රටක අධ්‍යාපනය කියන්නේ ඉතාමත්ම වැදගත් විෂයක්. මේක රටක් හදන්න පුළුවන් වාගේම රටක් නැති කරන්න පුළුවන් විෂයක්. අධ්‍යාපනය පාවිච්චි කරලා තමයි සිංගප්පූරුව ශීඝ්‍රයෙන් සංවර්ධනය වුණේ. මැලේසියාවත් සංවර්ධනය වුණේ ඒ ආකාරයෙන්මයි. අපේ රටට ආසන්නයේ තිබෙන මාලදිවයින අධ්‍යාපනය පාවිච්චි කරලා ඉතාමත් කෙටි කාලයකින් ශීඝ්‍ර සංවර්ධනයක් ඇති කර ගත් ආකාරයත් අපට පෙනෙන්න තිබෙනවා. The literacy rate there is 99. 9 per cent. It only exemplifies what I am basically trying to say, that this is not a regional deficiency. If you want to make a thing happen, it can certainly be made to happen.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1994 එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ පොදුජන එක්සත් පෙරමුණට මේ රට භාර දෙන අවස්ථාවේදී පාසල් 11,832ක් මේ රටේ තිබුණා. ජාතික පාසල් වෙන්න පුළුවන්; පළාත් සභා පාසල් වෙන්න පුළුවන්. නමුත් ඒකකයක් වශයෙන් ඉස්කෝල 11,832ක් තිබුණා. මේ සම්බන්ධයෙන් ගිය අවුරුද්දේ නොවැම්බර් මාසයේ ප්‍රශ්නයක් ඇහුවාම ලැබුණු පිළිතුර අනුව මේ රටේ දැන් තිබෙන පාසල් ප්‍රමාණය 8,900ට අඩු වෙලා තිබෙනවා කියා දැන ගන්න ලැබුණා. අඩු වැඩි වීම ගැන නොවෙයි මෙතැන ප්‍රශ්නය තිබෙන්නේ. මේ රටේ අධ්‍යාපනයේ සාරවත්භාවය තිබෙනවාද, නැද්ද කියන එක ගැනයි ප්‍රශ්නය තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිදහස් අධ්‍යාපනයක් තිබෙනවා කියන රටක 1946 සිට මේ අධ්‍යාපන ක්‍රමය පාවිච්චි කර තිබෙන්නේ රටේ අභිවෘද්ධියටද, නැත්නම් දේශපාලන අරමුණකටද, නැත්නම් දරුදැරියන් වැරදි මාර්ගයේ යවන්නද කියන ප්‍රශ්නය ඇති වෙලා තිබෙනවා. ඒ නිසා මේ අවස්ථාවේදී ප්‍රථමයෙන්ම ආණ්ඩුවේ අධ්‍යාපන ප්‍රතිපත්තිය මොකක්ද කියන එක හෙළිදරවු කරන්න අවශ්‍යයි. මා දන්නා විධියට ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා නිර්දේශපාලනීකරණයක් තුළින් ලොකු කාර්ය භාරයක් කරන්න හදනවා. අපි ඒක අගය කරනවා. මගේ සිතිවිල්ල අනුව දේශපාලනඥයින් විදුහලක ගේට්ටුවට එහා යන්න හොඳ නැහැ. ගියොත් ඒ පාසල නැති වෙන එක විතරයි වෙන්නේ. ඒ නිසා නිර්දේශපාලනීකරණය තුළින් කටයුතු කිරීමයි අවශ්‍ය වන්නේ. හැබැයි හැම කොනකම දේශපාලනය තිබෙන නිසයි අද අධ්‍යාපනය මෙවැනි තත්ත්වයකට වැටිලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධ්‍යාපනය ගැන කථා කරද්දී අපට නොයෙක් තර්ක විතර්ක ගෙනෙන්න පුළුවන්; සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරන්න පුළුවන්. නමුත් අධ්‍යාපනය සඳහා දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 1.8ක් මුදල් වෙන් කර තිබෙනවා කියන එක බොහොම පැහැදිලිව දැන් ඔප්පු වෙලා තිබෙනවා. දැන් මේකෙදී නොයෙක් කාරණා කියන්න පුළුවන්. වෘත්තීය පුහුණුවීම් කරන අමාත්‍යාංශයක කොටසක් තිබෙනවා කියාවි; සෞඛ්‍ය අමාත්‍යාංශයේ තව කොටසක් තිබෙනවා කියාවි. ඒවා සම්පූර්ණයෙන් ගණනය කරලා එකතු කළාම ඒවායේ කොච්චර ප්‍රතිශතයක් තිබෙනවාද කියලා මා දන්නේ නැහැ. නමුත් අධ්‍යාපනය සඳහා අපේ අය වැය තුළින් වෙන් කර තිබෙන්නේ සියයට 1.8යි කියන එක දැන් හෙළිදරවු වෙලා ඉවරයි. දැන් මේක ඇතිද රටක ඉදිරි දැක්මක් සහිතව කටයුතු කරන්න? සංඛ්‍යා ලේඛන පෙන්නුවාට මදි. අධ්‍යාපනයේ සාරවත්භාවයට මේ සල්ලි ප්‍රමාණය ඇතිද කියන ප්‍රශ්නය ඇති වෙලා තිබෙනවා. මෑතක ඉඳලා බොහොම දුක් මුසු තත්ත්වයේ කථාන්දර අපට අහන්න ලැබිලා තිබෙනවා. මම මේවා උපුටා ගෙන කථා කරන්න හදන්නේ දේශපාලන අරමුණකින් නොවෙයි. මෙහි බැරෑරුම්කම පෙන්වන්නයි.

මාර්තු මාසයේ 05 වැනිදා "දිවයින" පුවත් පතේ මෙසේ සඳහන් වෙනවා.

> "තාත්තා පවුල ජීවත් කළ ඔරුව විකුණා දුව පාසලට යාන්නට මුදල් ගෙවලා."

මේ සිද්ධිය සිදු වී තිබෙන්නේ හුංගම දකුණු බටඅත ප්‍රදේශයේ. තංගල්ල, හුංගම විජයබා විදුහලට- [බාධා කිරීම්] ඉතින් තංගල්ලේ මෙවැනි දෙයක් ඇති වෙනවා නම් ඒක ලොකු ප්‍රශ්නයක්. ඒ වාගේම තමයි හොරණ ප්‍රදේශයේ කුඩා දැරියක් තමන්ගේ අධ්‍යාපන කටයුතු ඉදිරියට ගෙන යන්න අවශ්‍ය නිසා අල්ලපු වත්තෙන් පොල් ගෙඩි අටක් ගත්තාය කියලා ලොකු ආන්දෝලනයක් ඇති වුණා. ඒ සම්බන්ධයෙන් ඇති වුණු ප්‍රශ්නය අපි සියලු දෙනාම දන්නවා. මේක දැක්ක ජනාධිපති බොහොම කම්පා වෙලා ඒ ගැන විමර්ශනයට ලක් කරන්න කිව්වා. එයින් පසු සිදු වුණ දේ මොකක්ද? මේවා වෙනවා කියලා මුලින් දැන ගත්තේ නැද්ද? මීට පෙර කුඩා දරුවෙක් කළු ගඟට විසි කළ එක දැක්කේ නැද්ද? මම කියන්නේ මෙවැනි ප්‍රශ්නයක් ඇති වුණාම එහි තිබෙන බැරෑරුම් තත්ත්වය ගැනයි. මේවා මධ්‍යය තුළින් පෙන්වන්න අවශ්‍යයද? ඒ නිසා මානුෂික ආණ්ඩුවක්ය කියන මේ ආණ්ඩුව අධ්‍යාපන ක්‍රමයේ තිබෙන බැරෑරුම්කම ගැන මීට වඩා ඕනෑකමකින් කටයුතු කරන්න අවශ්‍යයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මෑතකදී පානදුර ප්‍රදේශයේ පියකු විසින් තමන්ගේ බිරිඳත් ළමයින් දෙදෙනාත් මැරුවේ අධ්‍යාපනයට යන වියදම් සහ ජීවත් වන්න බැරි තත්ත්වයකුත් ඇති වුණු නිසායි. එහෙම නම් මේ රටේ අධ්‍යාපනයට මුදල් ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවාය කියන එක මේවායින් බොහොම හොඳින් ඔප්පු වෙලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් ආණ්ඩුව මොනවාද කරන්නේ? වෙන් කරන්න මුදල් මදියි කියනවා. නමුත් අනෙකුත් අමාත්‍යාංශවලට හරියාකාරව මුදල් බෙදා දී තිබෙනවාද කියන ප්‍රශ්නය ඇති වෙනවා. මේ රටේ සල්ලි නැහැ නොවෙයි. ඕනෑ තරම් සල්ලි තිබෙනවා. නමුත් ඒ සල්ලි; සීමිත සම්පත් අසීමිත ඉල්ලීම් සඳහා වෙන් කරන කොට ඒවා වෙන් කළ අමාත්‍යාංශ ඒ කටයුතු හරියට කරලා තිබෙනවාද නැද්ද කියන එක තමයි තිබෙන ලොකුම ප්‍රශ්නය. දැන් බලන්න, රටේ සල්ලි නැහැයි කියන ආණ්ඩුව මාගම්පුර වරාය ළඟ තට්ටු 14ක රජයේ බිල්ඩිමක් හදනවා, US Dollar මිලියන 900ක්, එහෙම නැත්නම් රුපියල් කෝටි 11,700ක් වියදම් කරලා. එතැන වරායක් හදලා තිබෙනවා. මාස 25කට නැව් 25ක්වත් ඇවිල්ලා නැති මේ අවස්ථාවේ රුපියල් කෝටි 11,700ක් තරම් මුදල් ප්‍රමාණයක් වෙන් කරන්නට අවශ්‍යද? මේවා අධ්‍යාපනයට පාවිච්චි කළා නම් කොයි තරම් ප්‍රයෝජනයක් තිබෙනවාද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තමයි සල්ලි නැහැයි කියා මේ ආණ්ඩුව කියනවා. නමුත් ගිය මාසයේ ඇමතිවරු 10 දෙනෙක් පැටව් ගැහැව්වා. ඒ සඳහා අවශ්‍ය වියදම් කවුද ගෙවන්නේ? බදු ගෙවන අහිංසක ජනතාවයි. ඒ තුළින් අන්තිමේදී අධ්‍යාපනයට තිබෙන පෝෂණය නැති වෙනවා. ඉදිරි දැක්මක් සහිතව කටයුතු කරන්නය කියා ඇමති මණ්ඩලයට කිව්වත් ඒ වියදම නාස්තියක් නොවෙයිද කියා මම ගරු ඇමතිතුමාගෙන් අහනවා. සල්ලි නැහැ කිය කියා අධ්‍යාපන ඇමතිතුමා එහෙ මෙහෙ ගියාට වැඩක් නැහැ. ගරු ඇමතිතුමනි, ඔබතුමාම ඉඳගෙන සිටින, 67 දෙනෙක් ඉන්න කැබිනට් මණ්ඩලයක අත උස්සා සම්මත කළාම ඔබතුමාත් මේ ප්‍රශ්නයේ කොටස්කරුවෙක් බවට පරිවර්තනය වෙනවා. ඒ සම්බන්ධයෙන් මට එක කාරණයක් අහන්න තිබෙනවා. මේ වනකොට පාසල් ගණනාවක් -3200ක්- අඩු කරලා තිබෙනවා. ඒ 3200 අඩු කිරීමෙන් තිබෙන පාසල් ඊට වඩා හොඳ තත්ත්වයකට ගෙනල්ලා තිබෙනවාද? අප දන්නා විධියට යම් යම් තැන්වල ශීඝ්‍ර සංවර්ධනයක් කෙරෙනවා. කිසි ප්‍රශ්නයක් නැතිව ඒක අපි කියනවා. නමුත් ඉතිරි පාසල් ටික තවත් කඩා වැටෙන්න ඉඩ දීමෙන් ඒවා වහන්න වෙන තත්ත්වයට ගෙනල්ලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාත් අපිත් දේශපාලනය කරන කොළඹ දිස්ත්‍රික්කයේ පාසල්වල පවා යම් යම් දුර්වලතා තිබෙනවා. සමහර විදුහල්පතිවරුන් හම්බ වෙන්න ගියාම කියන්නේ අමාත්‍යාංශයට ලියුම් යැව්වාම ඒවාට උත්තර ලැබෙන්නේ නැහැ; ඇමතිතුමන්ලා හම්බවෙන්න ගියාම ඒවාට පිළිතුරක් ලැබෙන්නේ නැහැ කියායි. නමුත් ඒ මුදල් අසල්වැසි පාසල්වලට වෙන් කර තිබෙනවාය කියනවා. මම හිතන්නේ Corporate Plan එකක් අනුව මේ කටයුතු කරන එක තමයි අවශ්‍ය වෙන්නේ. ඒක ජාතික ප්‍රතිපත්තියක්. ගරු ඇමතිතුමනි, අධ්‍යාපනය සම්බන්ධයෙන්

[ගරු රවි කරුණානායක මහතා]

ඔබතුමා ලොකු blue print එකක් දමලා අවුරුදු දෙකක් විතර කථා කරලා තිබෙනවා. මේ ප්‍රශ්නය ගැන මෙච්චර කල් කථා කරන්න අවශ්‍යද? තව දුර දිග යන්නේ නැතිව මේකට විසඳුමක් ලබා දෙන්න. විදුහල්පතිවරුන් සියලු දෙනාම ගෙන්වා මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරලා දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයටවත් කඩිනමින් මේ කටයුතු කර ගෙන යන්න. මා නියෝජනය කරන උතුරු කොළඹ ප්‍රදේශයේ තවම ජාතික පාසලක් නැහැ. අවුරුදු ගණනාවක් තිස්සේ ඒ ප්‍රශ්නය තිබෙනවා. නමුත් ඒ සම්බන්ධයෙන් තවම විසඳුමක් ඉදිරිපත් කරලා නැහැ. නිල ඡන්ද දායකයෝ 115,000ක් ඉන්නවා; 185,000ක ජනතාවක් වාසය කරනවා. අනික් ප්‍රදේශවලිනුත් ළමයින් මේ පාසල්වලට එන ඉතාමත් හොඳ පළාත් සභා පාසල් තිබෙනවා. නමුත් ජාතික පාසලක් බවට ඒවා වැඩිදියුණු කළාම ඒවාට සම්පත් ලැබෙන බව අප සියලු දෙනාම දන්නා කරුණක්. ඇයි ඒකට අපට උත්තරයක් දීලා නැත්තේ? ඒ වාගේම කොළඹ නගර සභා ප්‍රදේශය තුළ ජාතික පාසල් පහක්, හයක් තමයි තිබෙන්නේ. නමුත්මේ බල ප්‍රදේශය තුළ දරුවන් කී දෙනෙක් බිහි වෙනවාද?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! Hon. Member, you have to conclude. You have only one more minute.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
I was given 15 minutes. I started at 5.32 p.m. අධ්‍යාපනය සම්බන්ධයෙන් කථා කරන මෙවැනි අවස්ථාවක සංවර්ධනාත්මක විවේචනයක් කිරීම තමයි අවශ්‍ය වෙන්නේ. මම හිතන හැටියට ඔබතුමා දක්ෂ නිලධාරින් ගණනාවක් යොදා ගෙන තිබෙනවා. එතුමන්ලාගේ සේවය නිසියාකාරව පාවිච්චි කරන්නේ නැති ප්‍රශ්නයයි තිබෙන්නේ. කරුණාකරල එතුමන්ලා ගෙන්වා මේ සම්බන්ධයෙන් ශීඝ්‍ර සංවර්ධනයක් ලබා දෙන්න. රනිල් වික්‍රමසිංහ මැතිතුමා අධ්‍යාපනයට ඉමහත් සේවයක් කළා. ඒ තල්ලු වීම නිසා තමයි, එදා කරපු දෙය නිසා තමයි තවමත් ඉදිරියට යන්න හැකියාව ලැබී තිබෙන්නේ. දිවංගත ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා අවුරුදු දෙකක් මේ තනතුර රැක ගෙන අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ විශාල පෙරළියක් කළා. ඒ නිසා තමයි අද අපට අධ්‍යාපනය තුළින් ඉදිරියට යන්න හැකියාව ලැබී තිබෙන්නේ. ඒ සම්බන්ධයෙන් කරුණාකරල ඔබතුමන්ලාගේ ස්ථාවරය, ඉදිරි දැක්ම පෙන්නුම් කරන්න අවශ්‍යයි කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම විශ්වවිද්‍යාල සම්බන්ධයෙන් කථා කළොත්, අද දරුවන් ලක්ෂයක් විතර විශ්වවිද්‍යාල වරම් ලැබීමට සමත් වුණත් ඔවුන් සියලු දෙනාටම විශ්වවිද්‍යාලවලට යන්න අවස්ථාවක් නැහැ. ඒ නිසා තමයි ආණ්ඩුව පෞද්ගලික විශ්වවිද්‍යාල සංකල්පය ඉදිරියට ගෙනැල්ලා තිබෙන්නේ. නමුත් අත පත ගගා තමයි ඔබතුමන්ලා ඒක ගේන්නේ. එහි ස්ථාවරයක් නැහැ. එස්.බී. දිසානායක ඇමතිතුමාගෙන් ඇහුවාම කියනවා "ඔව්, ගේන්න ඕනෑ" කියලා. ලේකම්තුමාගෙන් ඇහුවාම කියනවා, "ආණ්ඩුවේ ප්‍රතිපත්තිය තවම හෙළිදරව් කරලා නැහැ" කියලා.

2013 මාර්තු මාසයේ 04වැනිදා -මීට දවස් තුන හතරකට ඉස්සෙල්ලා- "Daily Mirror" පුවත් පතේ පළ වූ වාර්තාවක මෙහෙම සඳහන් වනවා:

"SB Asks Students to Explore Indian Education Market"

එස්.බී. දිසානායක මැතිතුමා උසස් අධ්‍යාපන ඇමති වන්නේ ඉන්දියාවටද, ලංකාවටද? මේ වාගේ ඇමතිවරු ඕනෑයැ ලංකාවට? "SB Asks Students to Explore Indian Education Market" ඉතින් මේක කියන්න ඇමතිවරයෙක් ඕනෑයැ? මේ සම්බන්ධයෙන් ඔබතුමන්ලා තීන්දුවක් ගන්න. අපේ යම් විදේශ විනිමය ප්‍රමාණයක් එළියට යනවා නම්, එම විදේශ විනිමය ප්‍රමාණය ලංකාව තුළ රඳවා ගන්න අවශ්‍යතාවක් තිබෙනවා නම් කරුණාකරලා භය නැතුව තීන්දුව ගන්න. ඔබතුමන්ලා මීට සම්බන්ධ අය ගෙනැල්ලා, ලොකු ප්‍රශ්න ඇති කරලා, ජාතිවාදී, ආගම්වාදී ප්‍රශ්න ඇති කරමින් ඒක වටේ දඟලමින් දේශපාලනය කරන්න හදනවා. ජාතික ප්‍රශ්නවලදී එහෙම කරන්න එපා. අධ්‍යාපන ප්‍රශ්නය කියන්නේ ජාතික ප්‍රශ්නයක්. ඒ සඳහා විසඳුමක් ලබා ගන්න අවශ්‍යයි. අපි නිදහස ලබා ගෙන අවුරුදු 65ක් ගත වෙලාත් තවම එක තැන කැරකි කැරකී ඉන්නේ මේ වාගේ ඉතාම ළාබාල දේශපාලන වැඩ කරන නිසායි. ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමනි, ඔබතුමා තීන්දුවක් ගත්තොත් මම දන්නවා ඒක ක්‍රියාත්මක කරනවා කියලා. ඒ වාගේම එස්.බී. දිසානායක ඇමතිතුමාට අපි අභියෝග කරනවා, කරුණාකරලා ආණ්ඩුවේ තත්ත්වය සහ ඉදිරි දැක්ම හෙළිදරව් කරන්න කියලා. මෙවැනි ප්‍රකාශ කරනවාට වැඩිය හොඳයි "ඔව්, අපි මෙහෙම තමයි ගෙනි යන්න හදන්නේ. අපි පෞද්ගලික විශ්වවිද්‍යාල මෙන්න මෙච්චර ප්‍රමාණයක් ගේන්න හදනවා" කියලා කිව්වා නම්. දැන් ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමාට කියන්න පුළුවන් ඒක එස්.බී. දිසානායක ඇමතිතුමාගේ පෞද්ගලික මතයක් කියලා.

පෙබරවාරි 16 වැනිදා "Daily Mirror" පුවත් පතේ මෙහෙම තිබෙනවා:

"Private Universities to be set up through BOI"

ඒ කියන්නේ ආයෝජන මණ්ඩලය තුළින් මෙවැනි විශ්වවිද්‍යාල ඇති කරන්න අවස්ථාව -අවකාශය- සලසා දෙනවා කියන එකයි. මේක හරිද නැද්ද කියන එක පිළිබඳව උසස් අධ්‍යාපන ඇමතිතුමා හරියට පිළිතුරක් දුන්නේ නැතත්, අඩු ගණනේ අධ්‍යාපන ඇමතිතුමා මේ සම්බන්ධයෙන් ප්‍රකාශයක් කළ යුතුයි කියන එක මම මේ අවස්ථාවේ මතක් කරනවා. පෙබරවාරි 03 වැනිදා "The Sunday Times" පුවත් පත් වාර්තාවේ තව දුරටත් මෙහෙම තිබෙනවා:

"Foreign Universities invited to invest in Sri Lanka."
"Ferdinando appointed Acting Secretary of Investment Promotion Ministry"

ඉතින් ඇයි මේ වාගේ ප්‍රතිවිරුද්ධ අදහස් ඇති ප්‍රකාශ මේ ආණ්ඩුව තුළින් ඉදිරිපත් වෙන්නේ? තමාගේ වම් අත දන්නේ නැහැ දකුණු අත කරන්නේ මොකක්ද කියන එක. මේක තුළින් දේශපාලන ප්‍රශ්නයක් ඇති නොවෙනවා නොවෙයි. අහිංසක දරුවාගේ අනාගතයත් එක්ක සෙල්ලම් කරන එක තමයි මේ කරන්නේ.

මට අවශ්‍ය වන්නේ ඔබතුමන්ලාට මේ අදහස් ඉදිරිපත් කරන්නයි. අද විදුහල්පතිවරු 1,200 දෙනෙකුගේ පමණ අඩුවක් තිබෙනවා. මීට පෙර දෙමළෙන් කථා කළ කිළිනොච්චි දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීතුමා මතක් කළා යාපනය දිස්ත්‍රික්කයට ඉංග්‍රීසි ගුරුවරුන් 1,400ක් මදියි කියලා. ඒ තත්ත්වය ලංකාව පුරාම බැලුවොත් ඉංග්‍රීසි ගුරුවරුන් 15,000ක් විතර හිඟ වෙලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් ඔබතුමන්ලා මොකක්ද කරන්න හදන්නේ? මේවාට වැඩිය ඔබතුමන්ලා බොහොම ආඩම්බරයෙන් කියනවා අපේ ඉංග්‍රීසි ගුරුවරු 25,000ක් විතර මාලදිවයිනට, කොරියාවට, ඉන්දියාවට ගිහින් තිබෙනවා කියලා. අපේ ගුරුවරු පිට රට යවන්නේ නැතුව අපේ රටේ අධ්‍යාපනය

පෝෂණය කරන්න වැඩ කටයුතු කරන්න ඕනෑය කියන එක මම මේ අවස්ථාවේ මතක් කරනවා. කරුණාකරල අධ්‍යාපනය සම්බන්ධයෙන් බොහොම ඍජු ප්‍රතිපත්තියක් ඉදිරිපත් කරන්න. මොකද, මේක භය නැතිව ඉදිරිපත් කරන්න අවශ්‍යයි. අධ්‍යාපනය තුළ නිර්දේශපාලනීකරණ ප්‍රතිපත්තියක් ඇති කරන්න අවශ්‍යයි. මෙන්න මේක කරලා රටට බුද්ධිමත් තරුණ තරුණියන් බිහි කරන අධ්‍යාපන ක්‍රමයක් නිර්භීතව ඇති කරන්න ඕනෑය කියන එක මතක් කරමින්, කරුණාකරල ඒ සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කරන්න කියන අදහස නැවතත් ඉදිරිපත් කරමින් මම නිහඬ වෙනවා.

[අ.භා. 5.45]

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரன)
(The Hon. S.C. Mutukumarana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ පාසල් වැසී යාම පිළිබඳව අද දින ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා විසින් යෝජනාවක් ඉදිරිපත් කළා. එතුමාගේ යෝජනාවේ අන්තර්ගත වෙලා තිබෙනවා මේ රටේ පාසල්වලට අවශ්‍ය කරන පහසුකම් නොලැබීම එසේ පාසල් වැසී යාමට හේතුවක් වෙලා තිබෙනවා කියලා. මම සන්තෝෂ වෙනවා, ලක්ෂ 40ක් පමණ වූ මේ රටේ ශිෂ්‍ය දරුවන් වෙනුවෙන් මේ අවස්ථාව ලබා ගැනීම ගැන. අද ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයෙක් තම කථාවේදී එතුමන්ලාගේ සුපුරුදු දේශනයම කළා. මට මතකයි 1969 දී විතර ඔය වාගේ දේශනයක් තිබුණා. ශිෂ්‍යයෝ වශයෙන් අපිත් ඒ දේශනයට සහභාගි වුණා.

ඒ කථා ශෛලිය, ඒ අදහසම තමයි අද මේ සභාව තුළ රැව් පිළිරැව් දුන්නේ. ඔවුන්ට කරන්න පුළුවන් දෙයක් නැහැ. එතුමාගේ කථාවෙන් මේ පාසල් වැසී යාම නතර කිරීම පිළිබඳව යම් කිසි අර්ථ නිරූපණයක් වුණාද කියා මට තේරුණේ නැහැ. අපි දකින විධියට පාසල් වැසී යන්න තිබෙන ප්‍රධාන හේතුව තමයි මේ රටේ ගම්බද ශිෂ්‍යයෝ ක්‍රමානුකූලව නගරයේ පාසල්වලට පැමිණීම. ඒ අනුව ශිෂ්‍යයෝ වැඩි නගරයේ පාසල්වලට පහසුකම් දීම සිදු වන විට ගමේ පාසලට අවශ්‍ය කරන පහසුකම් ලබා දීමේදී විවිධ ගැටලු ඇති වෙනවා. මේ ආපු අධ්‍යාපන රටාව තුළ අත් දැකීම් ලබමින් තමයි අද අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ අපේ ආණ්ඩුව අලුත් ක්‍රමයක් හැටියට මහින්දෝදය පාසල් ඇති කරලා, ඒ අවට පෝෂිත පාසල් ඇති කරලා සෑම ළමයකුටම ලබා දිය හැකි සම්පත් ලබා දීමේ උපක්‍රමය කර ගෙන යන්නේ.

අනුරාධපුර මධ්‍ය මහා විද්‍යාලයට වාගේම අනුරාධපුර නගරයේ තිබෙන බාලිකා විද්‍යාලයට එප්පාවල වාගේ ප්‍රදේශවල සිට සෑම දාම උදේ වාහන 10ක් 12ක් යනවා. අනෙක් පාරවලිනුත් එනවා. 4,000ක්, 5,000ක් වාගේ ශිෂ්‍ය සංඛ්‍යාවක් එම විද්‍යාලවල ඉගෙනුම ලබනවා. මේකෙන් බහුතරයක් ගම්බද පාසල් ශිෂ්‍යයෝ. මේකට පිළියම් යොදන මේ අවස්ථාවේදී පාසල් 1,000 වැඩසටහන තුළ අපේ නගරබද වාගේම ගම්බද ශිෂ්‍යයාටත් කෙටි දුරක් ඇතුළත තමන්ගේ අධ්‍යාපනය ලැබීමට මෙන්ම, ඒ අධ්‍යාපනයට අවශ්‍ය කරන පහසුකම් ටික ලබා දෙනවා නම් ඇත්ත වශයෙන්ම සෑම ශිෂ්‍යයෙකුටම තමන්ගේ අධ්‍යාපනය ලබා ගැනීමට අවශ්‍ය කරන පහසුකම් එක හා සමානව ලැබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනවාරි මාසය වන විට සමහර පාසල්වල ක්‍රමානුකූලව ශිෂ්‍ය සංඛ්‍යාව අඩු වෙලා ළමයි සංඛ්‍යාව නව දෙනා, අට දෙනා එහෙම නැත්නම් හත් දෙනා වෙනවා. මම ජනවාරි මාසයේ අලුත්වැව ඉස්කෝලෙට ගියා. ඒ ඉස්කෝලයේ ඉන්නේ ශිෂ්‍යයෝ නව දෙනායි. ඒ ශිෂ්‍යයෝ නව දෙනාට ගුරුවරුන් හතර දෙනෙකු ඉන්නවා. ඊට කිලෝමීටර් දෙකකට, දෙකහමාරකට විතර එහා තවත් ඉස්කෝලයක් තිබෙනවා. එම ශිෂ්‍යයෝ නව දෙනා ඒ ඉස්කෝලයට යැව්වා නම් අර ගුරුවරුන් හතර දෙනා වෙනත් ඉස්කෝලවලට අවශ්‍ය කරන පුරප්පාඩු පුරවන්නට යොදා ගන්න තිබුණා. නමුත් එය සිදු වන්නේ නැහැ. ක්‍රමානුකූලව ඒ පාසල ඊළඟ අවුරුද්ද වන විට අනිවාර්යයෙන්ම වැහෙනවා. ඒ වැසී යෑම මේ චක්‍රලේඛනයෙන් මුදල් ලබා ගැනීම නිසාවත් එහෙම නැත්නම් අධ්‍යාපන ක්‍රමයේ වෙනසක් නිසාවත් ඇති වන තත්ත්වයක් නොවෙයි. ඒ ශිෂ්‍ය සංඛ්‍යාව ක්‍රමානුකූලව අඩු වීම තුළ අපි දකිනවා ඒ පාසල් ක්‍රමානුකූලව -ටිකෙන් ටික, ටිකෙන් ටික- වැහෙන බව. අපේ සමහර අය එවැනි අවස්ථාවල තමන්ගේ ඉස්කෝලේ අඩු වන ළමයින් ප්‍රමාණය දිහා බලන්නේ නැහැ. තමන්ගේ ගමේ තමන් ඉගෙන ගත්ත ඉස්කෝලය තියා ගන්න ඕනෑ කියන චින්තනය තුළ ඉඳ ගෙන තමයි සමහර අය පාරට බැහැලා උද්ඝෝෂණය කරන්නේ. ඉස්කෝලයේ ළමයින් දස දෙනෙකු සිටියත් කමක් නැහැ, පාසල තියා ගන්න උත්සාහ කරනවා. ඒ මානසිකත්වයෙන් දෙමවුපියන් මුදා ගන්නට පුළුවන් වුණොත් අපට මේ පාසල් 1,000 වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීමට පුළුවන් වනවා.

මම ගිය සතියේ අපේ ප්‍රදේශයේ තිබෙන ගල්වඩුවාගම ඉස්කෝලයට ගියා. ඒ පාසලට අවුරුදු 28කට පසුව තමයි සංගීත ගුරුවරයෙක් සහ නැටුම් ගුරුවරියක් ඇවිල්ලා තිබෙන්නේ. දෙමවුපියන් ඉල්ලා සිටිනවා ඒ පාසල හුදකලා විද්‍යාලයක් බවට පරිවර්තනය කරලා දිගටම ගෙන යන්න කියලා. නමුත් ඊට කිලෝමීටර් දෙකහමාරකට එහායින් මහින්දෝදය පාසල් 1,000 වැඩසටහන යටතේ පිහිටු වූ පාසලක් මේ අවුරුද්දේ සිට ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම ඒ පාසලේ සිට එප්පාවල මධ්‍ය මහා විද්‍යාලයට තිබෙන්නේත් කිලෝමීටර් තුනක් විතර දුරක්. මේ ගල්වඩුවාගම ඉස්කෝලය පවත්වා ගෙන ගිහින්, මේ ගුරුවරුන් දෙදෙනා බැරි වෙලාවත් මේ පාසලෙන් අයින් වුණොත් සාමාන්‍ය පෙළ හා උසස් පෙළ පන්ති දක්වා යන විට ඒ ළමයින්ට ගුරුවරුන් නැති වනවා. එවිට ඒ ළමයින්ගේ අධ්‍යාපනය කඩා හැලෙනවා.

එසේ කඩා හැලෙන නිසා, දෙමව්පියන්ගේ තිබෙන සංකල්පය වෙනස් කර අතිගරු ජනාධිපතිතුමාගේ සංකල්පය මේකයි, ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ සංකල්පය මේකයි කියා කල්පනා කර කටයුතු කරන්න ඕනෑ. සමහර ප්‍රායෝගික ප්‍රශ්න තිබෙන පාසල් තිබෙනවා. සියයට සියයක් නොවෙයි. ප්‍රාථමික පාසලක් හැදුවාම ඒ ප්‍රාථමික පාසලට ළමයින්ට කිලෝ මීටර් කිහිපයක් දුර පයින් යන්නට තිබෙනවා. අප ඉස්කෝලේ ගිය කාලයේ කිලෝ මීටර් හතරක් විතර පයින් ගිහිල්ලා තමයි අප අධ්‍යාපනය ලැබුවේ. මේ ක්‍රමය වෙනස් කිරීම සඳහා ජනතාව තුළ තිබෙන මානසික මට්ටම වෙනස් කරන්නට ඕනෑ. අප ඒ කාලයේ පාසල් කටයුතු කර ගෙන ගියේ කොහොමද කියා හිතන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ සමහර ගරු මන්ත්‍රීවරු විවිධ දේවල් සම්බන්ධව කථා කළා. පාසල්වල ශාරීරික අභ්‍යාස සම්බන්ධව කථා කළා. පොල් ගෙඩි කථාව විටින් විට උලුප්පා පෙන්වන්නට උත්සාහ ගත්තා. ඉස්කෝල වැසී යාම වළක්වා ගැනීමේ යෝජනාවට මේ පොල් ගෙඩි සම්බන්ධ කථාව සම්බන්ධ නැහැ. පොල් ගෙඩි කථාව එක්තරා පුවත් පතක මා දැක්කා. ඒ ගැන අප කථා කළ යුතු නැහැ. මොකද, ඒ නිසා ඒ දැරිය ලොකු අපහසු තත්ත්වයකට පත් වෙනවා. පොල් ගෙඩි කථාව එක එක පුවත් පත් එක එක ආකාරයට වාර්තා කර තිබුණා. මෙතුමන්ලා පොල් ගෙඩි කථාව ගෙන ඒම තුළ මේ යෝජනාවට යම් කිසි ප්‍රයෝජනයක් ඇති වුණාය කියා අප විශ්වාස කරන්නේ නැහැ.

[ගරු එස්. සී. මුතුකුමාරණ මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාසල් පිහිටුවීමේදී භූමිය පිළිබඳව හිතන්නේ නැතිව, ඉදිරි ජනගහනය ගැන හිතන්නේ නැතිව යම් යම් ව්‍යාපෘති ඒ ප්‍රදේශවල ක්‍රියාත්මක කරනකොට පාසල් ගොඩනැඟිලි හැදුවා. ළඟ තිබෙන ඉස්කෝලය ගැන හිතුවේ නැහැ. ඒ වාගේම තමයි ගල්වඩුවාගම තිබෙන ඉස්කෝලයට කිලෝ මීටර් භාගයක් එහා තිබුණා, කාගම කට්ටියාව ජනපදය බිහි වෙනකොට බිහි වුණු යාය 2 විද්‍යාලය. ඊට මෙහායින් තිබෙන ගල්වඩුවාගම ඉස්කෝලය මහවැලියත් එක්ක ආවා. එතකොට මුල් ජනපදයේ තිබුණු කාගම කට්ටියාව 2 විදුහල ඉබේම වැහුණා. මොකද, මේ ඉස්කෝල දෙක අතර තිබෙන පරතරය එතරම් විශාල නොවන නිසා. මේ රටේ නායකයා වශයෙන් අතිගරු ජනාධිපතිතුමා මේ ගෙන යන වැඩ පිළිවෙළ-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාට තව විනාඩියක් තිබෙනවා.

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரன)
(The Hon. S.C. Mutukumarana)
එතුමා ශිෂ්‍යයන්ගෙන් කරුණු දැනගෙන තමයි මේ කැසිකිළි වැසිකිළි පන්දාහක් එකවර ලබා දුන්නාය කියන්නේ. එය ඉතාම වටිනා දෙයක්. මට නියමිත කාලය අවසාන නිසා දීර්ඝ වශයෙන් කථා කරන්නට අවස්ථාවක් නැහැ. මීට ප්‍රථම කථා කළ ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, විලච්චිය මහා විද්‍යාලයේ ගුරුවරුන් 18 දෙනෙක් අඩුයි කියා ස්ට්‍රයික් එකක් තිබුණාය කියා. ඒක අමූලික අසත්‍යයක්. මෙම විද්‍යාලයට අවශ්‍ය වී තිබෙන්නේ එකම එක පුහුණු ගුරුවරියක් පමණයි. අනෙක් ගුරු අවශ්‍යතා සියල්ලම තියෙනවා. මොකද එතැන ගැටලුවක් තිබෙනවා. යුද්ධ කාලයේ එම විද්‍යාලයට ගුරුවරුන් නො එන වෙලාවේ එහි පැමිණ ඉගැන්වූ ආරක්ෂක අංශයට සම්බන්ධ ගුරුවරුන් දැන් පළාත් සභාව විසින් ස්ථිර කර තිබෙනවා. ඒ ගුරුවරුන්ගේ ඉගැන්වීම හොඳ නැත කියන මතයක් ගෙන ගිහින් තමයි මේ තත්ත්වය ඇති වී තිබෙන්නේ. එම නිසා උතුරුමැද පළාත් සභාව දැන් ඒ ප්‍රදේශයට ආවේනික ගුරුවරුන් බඳවා ගැනීම සඳහා ගැසට් කර ඉල්ලුම් පත්‍ර කැඳවා තිබෙනවා. ඒ ගුරුවරුන් අවුරුදු 10ක් එම විද්‍යාලයේ සේවය කිරීම අවශ්‍ය වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතිගරු ජනාධිපතිතුමාට හා අධ්‍යාපන අමාත්‍යතුමාට මා මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙනවා. ඉස්කෝල පිළබඳව අධ්‍යාපනය පිළිබඳව හොඳ අධ්‍යයනයක් කර හතළිස් ලක්ෂයක් පමණ වන සිසුන්ට සේවය කිරීමට, ඔවුන්ගේ අනාගතය ගොඩ නැඟීමට අවස්ථාව ලැබේවායි කියා මා ප්‍රාර්ථනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උතුරු මැද පළාත් සභාවේ අධ්‍යාපන අමාත්‍යවරයා ගැනත් මා මේ අවස්ථාවේදී මතක් කරන්නට ඕනෑ. මොකද, එතුමා උතුරු මැද පළාත් සභාවෙන් කර ගෙන යන වැඩ පිළිවෙළ තුළ එක්තරා රටාවකට ඉගැන්වීමට නැත්නම් ගුරුවරුන්ට නිකරුණේ කාලය ගත කරන්නට ඉඩ නොදී ඉගැන්වීමට කාලසටහනක් හදා තිබෙනවා. ඒ කාල සටහන තුළ උතුරු මැද පළාතේ පාසල්වල අධ්‍යාපනය ලබන සියලුම සිසුන්ගේ අධ්‍යාපනය සාර්ථකව ඉදිරියට ගෙන යාමට හැකි වේවායි පතමින් වෙමින් මා නිහඬ වෙනවා. බොහෙම ස්තුතියි.

[අ.භා. 5.56]

**ගරු ජානක වක්කුඹුර මහතා**
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගම්බද පාසල් වැසීයාම සම්බන්ධයෙන් මෙම යෝජනාව ගෙනා ගරු මන්ත්‍රීතුමා මේ ගරු සභාවේ මේ අවස්ථාවේ නොසිටියත්, මගේ මැතිවරණ කොට්ඨාසයේ වැසී ගිය පාසල් රාශියක් යළි විවෘත කළ මන්ත්‍රීවරයෙකු හැටියට ඊට විරුද්ධ මතයකුයි මා දරන්නේ. මගේ මැතිවරණ කොට්ඨාසයේ වැසී ගිය පාසල් තුනක් යළි විවෘත කර තිබෙනවා. අලුතෙන් පාසල් දෙකකුත් හදා ඒ කටයුතු කරගෙන යනවා. ඒ පාසල් වැසී යන්නට හේතු රාශියක් තිබෙනවා. ගම්බද පාසල්වල අඩු පාඩු විතරක් නොවෙයි ජනගහනය පිළිබඳ ප්‍රශ්නයකුත් තිබෙනවා. ගරු බන්දුල ගුණවර්ධන අමාත්‍යතුමා ද්විතියික පාසල් සංකල්පය ගෙනා අවස්ථාවේ එතුමාට මගේ සම්පූර්ණ සහයෝගය ලබා දුන්නා. මේක හොඳ කටයුත්තක්.

එතුමාගේ දේශපාලනය ගැන හිතන්නේ නැතුව අතිගරු ජනාධිපතිතුමාගේ ආශිර්වාදයත් එක්ක එතුමා මේ රටේ අහිංසක දුප්පත් දරුවන් වෙනුවෙන් ගත්ත එඩිතර තීන්දුවක් ඒ. මගේ මැතිවරණ කොට්ඨාසයේ විතරක් පාසල් 9ක් ද්විතියික පාසල් කරන්න කටයුතු කරන විට එක පාසලක විරෝධයක් ආවා, කරන්න එපාය කියා. මම පාසලට ගිහින් සොයා බැලුවාම දැනගන්න ලැබුණා, "මේ පාසලේ පළමුවන පන්තිය තියෙන්න ඕනෑ. ඒ නිසා මේ පාසල ද්විතියික පාසලක් කරන්න එපා" කියා පාසල් සංවර්ධන සමිතියෙන් යෝජනාවක් ගෙනාවාම නිකම් ඉඳලා තිබෙනවා.

අනෙක් පාසල පටන් ගන්නා විට ලොකු උද්ඝෝෂණයක් කළා. පාර වහලා, පාර මැද වළං ගෙනැවිත් බත් උයාගෙන ගමේ ඔක්කොම නැවත පාසල ඉල්ලන්න පටන් ගත්තා. මම අපේ ඇමතිතුමාට කථා කර කිව්වා, මෙහෙම ප්‍රශ්නයක් තිබෙනවාය කියා. ඇමතිතුමා කිව්වා, ඒ උදවිය එක්කගෙන එන්න කියා. මම ඒ අය එක්කගෙන ගියා. එතුමා බොහොම සංවේදී පුද්ගලයෙක්. මගේ අදහස මම එතුමාට ඉදිරිපත් කරමින් කිව්වා, "මේ දුෂ්කර ගම්මාන ඔක්කෝගේම දරුවෝ එන්න තිබෙන පාසල මේක. ඒ ගොල්ලෝ තේරුම් ගත්තේ නැහැ. දේශපාලකයෙක් පිටුපස ඉඳලා මේ සංකල්පය හොඳ නැහැ කියලා කියපු නිසා ඒ උගුලේ මේ මිනිස්සු වැටිලා තිබෙන්නේ. එම නිසා මේ පාසල නැවත වරක් ලබා දෙන්න" කියා. එතුමා බොහොම නිහතමානීව නැවත වරක් ඒ පාසල ලබා දුන්නා. ළඟදි තවත් පාසලක එහෙම ගැටලුවක් ආවා. ඒ පාසල තියෙනවා. නමුත් ඒ පාසල අවශ්‍ය නැහැ කියා ආපහු කිව්වා. මගේ ආසනයේ දෙපැත්තටම උද්ඝෝෂණ ආවා. එක උද්ඝෝෂණයක් ආවා පාසල ඕනෑ කියා. අනෙක් උද්ඝෝෂණය ආවේ පාසල එපා කියා. එහිදිත් මම ගරු ඇමතිතුමා එක්ක සම්බන්ධ වෙලා එතුමාට කරුණු ඉදිරිපත් කර දැන් අලුතෙන් ඉස්කෝලයක් හදනවා. ලබන මාසයේ ඒ ඉස්කෝලය විවෘත කරනවා. ගැටලුවක් තිබුණා නම් අපේ රජය ඒ ගැටලුව විසඳන්න කටයුතු කර තිබෙනවා. කලවාන අලුත් ඉඩමක් අරගෙන අද දෙමව්පියෝ එකතු කර ගෙන අපි නව ප්‍රාථමික පාසලක් හදනවා.

මා ළඟ තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2011, 2012 සහ 2013 පළමුවන පන්තියට ශිෂ්‍යයෝ ඇතුළත් වුණු පාසල්වල විස්තර. 2011 අවුරුද්දේ සමන්පුර මහා විද්‍යාලයේ දරුවෝ දහ දෙනායි හිටියේ. අපේ ඇමතිතුමාගේ ද්විතියික පාසල් සංකල්පය නිසා මේ අවුරුද්දේ දරුවෝ 28 දෙනෙක් ඒ පාසලට ඇතුළත් කළා. ගමේ පාසලේ අඩු පාඩු සියල්ලම හදලා දුන්නා. සමන්පුර මහා විද්‍යාලයට ගමේ සියලුම දරුවන් ඇතුළත් කළා. ඒ

වාගේම හඟරංගල විද්‍යාලයේ පළමුවන පන්තියට 2011 වර්ෂයේ දරුවන් තුන් දෙනායි හිටියේ. මේ අවුරුද්දේ 85 දෙනෙක් ඇතුළත් කළා. හඟරංගල විද්‍යාලය කියන්නේ දුෂ්කර පාසලක්. ඒ වාගේම වෙවැල්කඳුර පාසලේ පළමුවන පන්තියට ළමයි 20 දෙනායි හිටියේ. මේ වතාවේ පළමුවන පන්තියට දරුවෝ 32 දෙනෙක් ඇතුළත් වුණා. කුකුලේගම විද්‍යාලය කියා දරුවෝ තුන් දෙනෙක් හිටපු ඉස්කෝලෙට මේ වතාවේ 17 දෙනෙක් ඇතුළත් වුණා. ඒ වාගේම කලවානේ කෝපි කැල්ල පාසල වහපු ඉස්කෝලයක්. අපේ ජානක බණ්ඩාර මන්ත්‍රීතුමා එදා සබරගමු පළාතේ ආණ්ඩුකාරවරයා වශයෙන් සිටි කාලයේ මා එතුමාත් සමඟ ගිහින් වහපු පාසලේ දරුවෝ තුන් දෙනෙක් එක්කාසු කරලා ගුරුවරු දෙදෙනෙක් දීලා පාසලක් විවෘත කළා. මගේ මැතිවරණ කොට්ඨාසයේ කන්දක් උඩ ඉහළම තිබෙන පාසල. ඒ පාසලට දරුවෝ 11 දෙනෙක් මේ අවුරුද්දේ ඇතුළත් වුණා. දැන් දරුවෝ 22 දෙනෙක් සිටිනවා. ඒ විධියට වැහී යන පාසල් ගණනාවක් අපි ඇරියා. ඊළඟට තපස්සර කන්ද විද්‍යාලය කියා විද්‍යාලයක් තිබුණා. මේ විද්‍යාලයට සිංහල එක දරුවායි හිටියේ. ගරු ඇමතිතුමනි, මේක කලවාන නගරයේ තිබුණු ඉස්කෝලයක්. දරුවෝ 12 දෙනායි ඉස්කෝලයටම ඇතුළත් කර හිටියේ. මම ඉස්කෝලයේ නම වෙනස් කළා. කලවාන රාජකීය විද්‍යාලය කියා නම තැබුවා. ඒ ඉස්කෝලයට අවශ්‍ය රුපියල් ලක්ෂ 20ක විතර සම්පත් ලබා දුන්නා. මේ වතාවේ ළමයි 138 දෙනෙක් පළමුවන පන්තියට ඇතුළත් කරලා දැන් 168 දෙනෙක් ඒ ඉස්කෝලයේ ඉන්නවා. රුපියල් පනස් තුන් ලක්ෂයක් දීලා ගොඩනැඟිල්ලක් හදලා තිබෙනවා. ඒක මැයි මාසයේ විවෘත කරනවා. මේ රජයෙන් පාසල්වලට උදව් කළේ නැහැ කියා කාටවත් කියන්න බැහැ. මගේ ආසනය හා අගලවත්ත ආසනය යාබදව කොළඹෑව පාසල කියා ඉස්කෝලයක් තිබෙනවා. පසු ගිය අවුරුද්දේ මේ විද්‍යාලයේ දරුවෝ පස් දෙනෙක් හිටියා. ඒ පස් දෙනා සිටින විට මා ඉස්කෝලයට ගිහින් ඇහුවා, ලබන 2013 අවුරුද්දට පළමුවන පන්තියට දරුවෝ කී දෙනෙක් ඇතුළත් කරනවාද කියා. ගමේම ඉන්නේ හතර දෙනායි. ඒ හතර දෙනාම ඇතුළත් කරනවා; ඉස්කෝලේ හදලා දෙන්න කිව්වා. ඉස්කෝලෙට තීන්ත ගාලා, දැල් ගහලා, වැසිකිළි පද්ධතියක් හදලා දීලා දරුවෝ හතර දෙනෙක් මේ ඉස්කෝලයේ පළමුවන පන්තියට ගන්න රුපියල් ලක්ෂ 7කට වඩා වැඩි වියදමක් කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කියන්න කනගාටුයි. ඒ ඉස්කෝලය හැදුවාට පසු හිටපු පස් දෙනාත් ජනවාරි මාසයේ අයින් කර ගෙන ගියා.

මා ගිය මාසයේ 14 වැනිදා ඒ ඉස්කෝලයට ගියා. ගිහිල්ලා ගමේ ඔක්කොම අය එකතු කරලා ඇහුවා, "රජයේ සල්ලි ලක්ෂ ගණනක් දීලා හදපු ඉස්කෝලය වැහෙන විධියට කවුද මේ දරුවෝ ටික ගෙනිච්චේ කියලා." මේවා අද මේ යෝජනා ගෙනෙන කට්ටියගේ වැඩ. රට හැම තැනම පෙත්සම් ගැහුවා, "ඉස්කෝලය රජයෙන් වැහුවා" කියලා. ඒ ඉස්කෝලය අපි වැහුවේ නැහැ. ඒ ඉස්කෝලයට අපි අවශ්‍ය කරන සම්පත් දුන්නා. මා මුළු ගමේම කට්ටිය එකතු කරලා මේ ගැන දැනුවත් කළා. දරුවෝ හය දෙනෙකු ගෙනැල්ලා ඊට පහු වැනි සුමානයේ මා ආපසු ඉස්කෝලය විවෘත කළා, ගරු ඇමතිතුමනි. රුපියල් ලක්ෂ හත හමාරක් දීලා හදපු ඉස්කෝලය වහන්න කවුද කටයුතු කළේ? ගමේ මිනිසුන්ට විෂබීජ දාලා, "ඔන්න ආණ්ඩුවෙන් ඉස්කෝල වහනවා" කියනවා. මේක තමයි අලුත් ක්‍රමය. කරන්න මොකක්වත් නැත්නම් ඉන්න ළමයි ටික අයින් කරලා හරි, "ඉස්කෝලය වහනවා" කියනවා. මා අතිගරු ජනාධිපතිතුමාටත් මේ කාරණය කිව්වා. රුපියල් ලක්ෂ පහක් දීලා ඒ ඉස්කෝලය හදලා, තව රුපියල් ලක්ෂ දෙකක් දීලා වැසිකිළි පද්ධතියකුත් හදලා අවශ්‍ය කරන සම්පත් ලබා දුන්නා.

ගරු ඇමතිතුමාට බොහොම හොඳ සංකල්පයක් තමයි තිබෙන්නේ. ගමේ දරුවෙකුට මේ රටේ ඉහළම තැනකට යන්න තමයි අප මේ ද්විතීයික පාසල් දාහ හදන්නේ. ඒ ද්විතීයික පාසල් දාහත් එක්ක, ප්‍රාථමික පාසල් පන්දාහක් හදන කොට අවට පාසල්වල සිටින දරුවන්ගේ අඩු වීමක් වෙනවා. මා ළඟ තොරතුරු තිබෙනවා. කලවාන කොට්ඨාසයේ පාසල්වල 2005 වර්ෂයේ දරුවන් 10,099ක් හිටියා. 2012 වන කොට ඉන්නේ දරුවන් 8,875යි. මේ අවුරුදු හත තුළ කලවාන කොට්ඨාසයේ පාසල්වල විතරක් දරුවන් 1,224 දෙනෙක් අඩු වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, පාසල්වල ඉන්න දරුවන් ප්‍රමාණය අඩු වෙනවා. ඒකට ඔබතුමාටවත් මටවත් කරන්න දෙයක් නැහැ. මොකද, ඒ නිසා නගරබද පාසල්වලට දරුවෝ වැඩි වෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩියයි තිබෙන්නේ.

**ගරු ජානක වක්කුඹුර මහතා**
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
අපේ ගරු ඇමතිතුමාට මේ ඔක්කෝටම උත්තර දෙන්න තිබෙන නිසා මා වැඩි වෙලා කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. ඔබතුමාගේ දේශපාලනය ගැන තීන්දුවක් අරගෙන නොවෙයි, ඔබතුමා මේ කටයුතු කරන්නේ. මේ රටේ අනාගතය බාර ගන්න ඉන්න දරුවන් වෙනුවෙන්, අපේ අතිගරු ජනාධිපතිතුමාගේ ඒ වැඩ පිළිවෙළත් එක්ක කටයුතු කරන්නට ඔබතුමාට ශක්තිය, ධෛර්යය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වනවා. ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා - නැත.

[අ.භා. 6.04]

**ගරු බන්දුල ගුණවර්ධන මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு பந்துல குணவர்தன - கல்வி அமைச்சர்)
(The Hon. Bandula Gunawardane - Minister of Education)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ජනතා විමුක්ති පෙරමුණේ විජිත හේරත් මන්ත්‍රීතුමා අධ්‍යාපනය සම්බන්ධයෙන් වූ කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කළත් එතුමා මේ අවස්ථාවේ සභාවේ නැහැ. එතුමා මේ අවස්ථාවේ සභාවේ නැතත්, අධ්‍යාපනය පිළිබඳව විපක්ෂයට කියන්න තිබෙන සියලුම දේ කියන්න ඉඩ හැරලා, අප නිහඬවම එතුමන්ලාට අවස්ථාව ලබා දුන්නා. නමුත් ඒවාට උත්තර දෙනකොට දරුවන්ට ආදරය කරන කිසිම කෙනෙකු විපක්ෂයේ නොසිටීම පිළිබඳව මා කනගාටු වෙනවා.

පසු ගිය කාල පරිච්ඡේදය තුළ, විපක්ෂයේ මන්ත්‍රීවරුන් කරපු කථා අතරින් ගරු යෝගරාජන් මන්ත්‍රීතුමාත්, රවි කරුණානායක මන්ත්‍රීතුමාත්, අජිත් කුමාර මන්ත්‍රීතුමාත් තමයි -අප පිළි ගත්තත්, නොගත්තත්- අධ්‍යාපනය පිළිබඳ සාධනීය වූ කරුණු රාශියක් ඉදිරිපත් කළේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ රටේ ද්‍රවිඩ ජාතිකයකු ලෙස විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබා, ඉංජිනේරුවකු විධියට, අධ්‍යාපනයට ගැළපෙන ආකාරයට පාර්ලිමේන්තුව තුළ හැසිරීමේ ආදර්ශය දෙන්න පුළුවන්කම තිබෙන බුද්ධිමත් මන්ත්‍රීවරයෙකු නිසායි එසේ කථා කරන්න ඔබතුමාට පුළුවන්කම ලැබුණේ. ඒ ගැන ඔබතුමාට උගන්වපු ගුරුවරුන්ට ස්තුතිවන්ත වේවා කියලා මා කියන්න කැමැතියි.

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

අපි නිදහස් අධ්‍යාපනයේ දරුවෝ. සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා ලංකාවේ ප්‍රථම අධ්‍යාපන ඇමතිතුමා වශයෙන් නිදහස් අධ්‍යාපනය හඳුන්වා දෙන අවස්ථාවේ පැවසුවේ, "වරප්‍රසාද ලත් සුළු පිරිසකට සීමා වෙලා තිබෙන අධ්‍යාපනය දුප්පතුන්ගේ නිත්‍ය උරුමයක් බවට පත් කරන බව"යි. උපතින් ඉඩ කඩම්, යාන වාහන, හරකා බාන අහිමි පරම්පරාවල දරුවන්ට, නැත්නම් ප්‍රාග්ධනය අහිමි අයට ලාංකීය සමාජ ක්‍රමය තුළ දෙමවුපියන්ට බරක් වෙන්නේ නැතිව දෙපයින් නැඟී සිටින්නට ශක්තිය ලබා දෙන්නටත්, බහුවිධ කුසලතා හා නිර්මාණාත්මක හැකියා සහිත සත්පුරුෂයන් පිරිසක් සමාජයට දායාද කිරීමත් අරමුණු කරගෙන තමයි මධ්‍ය විද්‍යාල සංකල්පය එතුමා හඳුන්වා දුන්නේ.

ඒ අනුව මධ්‍ය විද්‍යාල සංකල්පය හා මහා විද්‍යාල හරහා බිහි වුණු පරම්පරාව තමයි අද දිනයේ විවිධ ක්ෂේත්‍රවල ශ්‍රී ලාංකීය ආර්ථිකයේ ඉහළ තැන්වලට පැමිණ සිටින්නේ. ඒත් අවාසනාවකට වාගේ, ඒ වෙනස කරන අවස්ථාවේදී එවකට තිබුණු රාජ්‍ය මන්ත්‍රණ සභාවත්, එවකට තිබුණු මාධ්‍යයත් එළව එළවා කන්නන්ගර මැතිතුමාට පහර දුන්නා. එතුමාට පහර දෙමින් ඒ අවස්ථාවේ කිව්වේ, "එතුමා මෝඩයෙක්, එතුමා ගොඩයෙක්" කියලායි. එතුමාට "ගොඩයෙක්" කිව්වේ, එතුමා කළුතර දිස්ත්‍රික්කයේ ඉත්තෑපාන කියන ගමේ උපන් නිසා. මෝඩයෙක් කිව්වේ, ලංකාවේ ඈත එපිට ගම්මානවල දරුවන්ටත් අධ්‍යාපනයෙන් ඉහළට නඟින්න අවස්ථාව ලබා දෙන්න උත්සාහ දැරීම මෝඩ ප්‍රයත්නයක් ලෙස සැලකූ නිසා. විශේෂයෙන්ම පළමුවන අධ්‍යාපන ඇමතිවරයා වූ ඒ ඇමතිතුමාට ඉංග්‍රීසි මාධ්‍ය විසින් එල්ල කරපු ප්‍රහාරය තරම් ප්‍රහාරයකට වෙන කෙනෙක් මුහුණ දීලා තිබුණේ නැහැ. එතුමා නිදහස් අධ්‍යාපන පනත ගෙන ඒමෙන් පසු, එහි ප්‍රතිඵලයක් ලෙස, මැතිවරණයට ඉදිරිපත් වුණු අවස්ථාවේ ඒ මැතිවරණයෙන් පරාජයට පත් වුණා. පරාජයට පස්සේ ජීවිතයේ අවසාන භාගයේදී ඉතාම දුඃඛිත තත්ත්වයකට පත් වෙලා, ජීවත්ව සිටින තෙක් ජීවිතය ගෙවීම සඳහා මසකට රුපියල් 500ක දීමනාවකුත්, රුපියල් ලක්ෂයක ප්‍රදානයකුත් මේ ගරු සභාව මඟින් ලබා ගන්න එතුමාට සිද්ධ වුණා.

ඊට කලින් බ්‍රිතාන්‍ය යටත් විජිත යුගයේදී, අතිමහත් බහුතර සිංහල බෞද්ධ පිරිසකට මිෂනාරි අධ්‍යාපනය ක්‍රමය යටතේ සිද්ධ වෙච්ච අසාධාරණය නැති කිරීම සඳහා යුග මෙහෙවරක් ඉෂ්ට කළ යුග පුරුෂයා වුණේ ශ්‍රීමත් අනගාරික ධර්මපාල මැතිතුමායි. එතුමා, හෙන්රි ඔල්කට් මැතිතුමා, මිගෙට්ටුවත්තේ ගුණානන්ද හාමුදුරුවෝ, හික්කඩුවේ ශ්‍රී සුමංගල හාමුදුරුවෝ සමඟ එකතු වෙලා විශාල අභියෝගවලට මුහුණ දෙමින්, තමන්ගේ පෞද්ගලික ඉඩකඩම්, දේපොළ ඇතුළු සියලුම පෞද්ගලික ධනය පරිත්‍යාග කරලා ආනන්දය, ධර්මරාජය, ගාල්ලේ මහින්දය වැනි පාසල් පිහිටුවමින් ලංකාවේ උපනූපන් දරුවන්ට අධ්‍යාපනය ලබන්න පාසල් 122ක් සාදන්න වෙහෙසුණා. එතුමා තරම් බරපතළ ලෙස විවේචනයට, විචාරයට හා නිර්දය ප්‍රහාරයට ලක් වුණු ජන නායකයෙක් අපේ මෑත ඉතිහාසය තුළ නැහැ. බොහෝ දේ දරා ගැනීමේ අසීමිත ශක්තියක් තිබූ එතුමා පාසල් 122ක් හදලා ඒ කර්තව්‍යය කර ගෙන යන කාලයේදී එතුමාට කිව්වේ, "මුට්ටකාසිකාරයෙක්, හොරෙක්" කියලා. ඒ අවස්ථාවේ, බැරිම තැන එතුමා තීන්දුවක් ගත්තා, මේ රට දාලා යන්න. එතුමා ඉන්දියාවට ගිහිල්ලා, බුද්ධගයාව ගොඩනඟලා ඒ ජාතික වැඩ පිළිවෙළ ඉන්දියාව තුළ ක්‍රියාත්මක කරමින් ශාසනික මෙහෙවරක යෙදුණා. එක අවස්ථාවක එතුමා අත් අකුරින් ලියලා සඳහන් කරලා තිබුණා, "මම මිය ගිය පසු බැරි වෙලාවත් ලංකාව පැත්තට හිසවත් හරවන්න එපා" කියලා. ඒ මළ මිනියේ හිසවත් ලංකාව පැත්තට හරවන්න එපා කියලා තමයි පාසල් 122ක් හදලා අධ්‍යාපනයට සේවය කළ අනගාරික ධර්මපාල මැතිතුමා කිව්වේ.

ලෝකයේ ප්‍රථම අග්‍රාමාත්‍යතුමිය වූ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය තමයි පාසල් රජයට පවරා ගත්තේ. ඒ පවරා ගන්න අවස්ථාවේදී මෙහෙම නොවෙයි විරෝධය තිබුණේ. පාසල් වහලා, පාසල් ඇතුළට දෙමවුපියෝ ඇවිල්ලා, පාසලේ වැඩ කටයුතු නතර කරලා, දෙමවුපියෝ පල්ලියේ මිදුලේ -පාසල තිබෙන තැන- උයලා, පිහලා, කන්න දීලා, පාසල් මාස ගණන් වහලා තමයි උද්ඝෝෂණය කළේ. පාසල් පවරා ගැනීමේ සිද්ධියෙන් පස්සේ ඒ ආණ්ඩුව නැවත බලයට ආවේ නැහැ. ගම් මට්ටමට, බිම් මට්ටමට ගමේ සාමාන්‍ය ජනයාට ඕනෑම වෙනසක් කරන්න යනවා නම්, ඒ වෙනසට එළව එළවා පහර දීම අපේ රට තුළ ඉතිහාසය පුරාම ක්‍රියාත්මක වෙලා තිබෙනවාය කියන එක අපේ ඉතිහාසයේ සාක්ෂිවලින් පැහැදිලි වෙනවා.

අතිගරු ජනාධිපතිතුමා මේ රට නිදහස් කර ගත්තාට පසුව, ආපස්සට ගිට රට නැවත ගොඩනැඟීම සඳහාත්, මේ රටේ සම්පත් හා මිනිස්සු මත වැඩි විශ්වාසය තියලා රට ආසියාවේ ආශ්චර්යය බවට පත් කිරීම සඳහාත්, දැනුම කේන්ද්‍රීය සංවර්ධන අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහාත්, අධ්‍යාපනයේ දැවැන්ත වූ වෙනසක් කිරීම සඳහාත්, සාමාන්‍ය ගමේ ජනතාවගේ දරුවාගේ අධ්‍යාපනයේ ඇත්ත හැරවුම් ලක්ෂ්‍යයක් නිර්මාණය කිරීම සඳහාත් ජාතික වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමේ වගකීම අපට භාර දුන්නා.

එහිදී මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර සහිත පාසල් 1,000ක් ප්‍රතිනිර්මාණය කිරීමත්, ඒ මත පදනම් වූ පෝෂිත පාසල් 5,000ක් ළමා මිතුරු ප්‍රවේශයක් සහිත පාසල් ලෙස ගොඩ නැංවීමත් 2012 සිට 2016 දක්වා ආරම්භ වෙලා තිබෙනවා. ඒ අතර කාල පරිච්ඡේදය තුළදී විවිධ ප්‍රශ්න, අර්බුද, චෝදනා, ඇතැම් විට අභූත චෝදනා රාශියක් ලැබෙන්න පුළුවන්. නමුත් අපි නිදහස් අධ්‍යාපනයේ දරුවෝ ලෙස හෘදය සාක්ෂියට එකඟවත්, අවංකවත් නිදහස් අධ්‍යාපනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම සඳහා දිවිහිමියෙන් කැප වෙලා සිටින බව මේ ගරු සභාවේදී මා මතක් කරන්න කැමැතියි. ඉතිහාසයේදීවත් නොවුණු වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වන මේ අවස්ථාවේදී විපක්ෂයේ විවිධ දේශපාලන අරමුණු තිබෙන ඇතැම් අයගෙන් මෙවැනි ප්‍රහාරයක් එල්ල වන්නේ ඇයි කියන එක මා ඔබතුමාට පැහැදිලි කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එකක් තමයි, ඇති හැකි අයගේ දරුවොත්, නැති බැරි අයගේ දරුවොත් කියන දෙගොල්ලෝම දෙමවුපියන්ගේ දරුවෝ. ඔවුන් ජාතියේ සම්පතක්. ඒ දරුවන්ගෙන් ලක්ෂ තුනක්, තුනහමාරක් වර්ෂයකට පළමු ශ්‍රේණියට ඇතුළු වනවා. ඒ ඇතුළු වන දරුවන්ගෙන් ඉතා විශාල ප්‍රමාණයක් 1 සිට 5 ශ්‍රේණිය දක්වා ප්‍රාථමික අධ්‍යාපනය සාර්ථකව නිම කරනවා. සමහර වෙලාවට ගුණාත්මක වශයෙන් යම් යම් ප්‍රශ්න තිබෙන්න පුළුවන්. නමුත් ඉන්දියාව, බංග්ලාදේශය, පාකිස්තානය, නේපාලය, භූතානය, ඇෆ්ගනිස්ථානය වැනි රටවල් සමඟ සාපේක්ෂව සැසඳීමේදී අපේ ප්‍රාථමික අධ්‍යාපනය තිබෙන්නේ ලෝකයේ ඉතාම ඉහළ මට්ටමක. ඒත් ද්විතීයික අධ්‍යාපන ලබලා අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය වන විට ලක්ෂ ගණනක් සමාජගත වෙනවා. එතැනින් එහාට අධ්‍යාපනයක් ලබන්නේ නැහැ. සියයට 60ක්, 65ක් පමණයි උසස් පෙළ අධ්‍යාපනය ලබන්න ඉදිරිපත් වෙන්නේ. ඔවුන් 12, 13 ශ්‍රේණිවලදී අධ්‍යාපනය ලබලා, උසස් පෙළ විභාගයට පෙනී සිටීමෙන් පස්සේ අපි විශ්වවිද්‍යාලට ඇතුළු කර ගන්නේ 20,000ක්, 25,000ක් පමණයි. උසස් පෙළ විභාගය විශ්වවිද්‍යාලයට දරුවන් ඇතුළු කර ගැනීමේ විභාගයක් නොවෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නවා, අපේ ගජදීර ඇමතිතුමාත් දන්නවා ඒ කාලයේ විශ්වවිද්‍යාලයට ඇතුළු

කර ගත්තේ University Entrance Exam කියලා වෙනම විභාගයක් පවත්වලා බව. උසස් පෙළ විභාගය තිබෙන්නේ විශ්වවිද්‍යාලයට ළමයින් ඇතුළත් කර ගන්න නොවෙයි. දරුවෙකුගේ පළමු වැනි ශ්‍රේණියේ සිට ආරම්භ වන අධ්‍යාපනය සාමාන්‍ය පෙළ, උසස් පෙළ දක්වා ගිහින් ඒ දක්වා ලබා ගත්ත සාධන මට්ටම නිර්ණය කිරීමේ විභාගයක් තමයි අ.පො.ස (උසස් පෙළ) පරීක්ෂණය. එහිදී තව ලක්ෂ ගණනක් සමාජගත වෙනවා, විශ්වවිද්‍යාල ප්‍රවේශය හෝ ඉහළ අධ්‍යාපනය නොලබා. දැන් සෑම වර්ෂයකදීම ලක්ෂ තුනක්, තුනහමාරක් අධ්‍යාපන පද්ධතියට ඇතුළු වන කොට, එයින් 25,000ක් පමණ විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබන කොට, වර්ෂ ගණනක් මේ අධ්‍යාපන කඩ ඉමේ ගිහිල්ලා සෑම වර්ෂයකදීම ලක්ෂ තුනක් පමණ දරුවෝ නිසි දක්ෂතා, කුසලතා හා නිර්මාණාත්මක හැකියාවන් අත්පත් කර නොගෙන විභාග කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමය විසින් අතර මං කරනවා. ඒ දරුවන්ට එසේ වෙලා තිබෙන්නේ අපේ අධ්‍යාපනයේ සම්පත් බෙදී යෑමේ විෂමතාව නිසා කියලා අපි පැහැදිලිව පසු ගිය කාලය තුළදී තේරුම් බේරුම් කර ගත්තා. මක්නිසාදයත් උසස් පෙළ හදාරන දරුවන්ගෙන් සියයට 21ක් පමණයි විද්‍යා සහ ගණිත අංශයෙන් අධ්‍යාපනය ලබන්නේ. ඇත එපිට ගම්මානවල පාසල්වල විද්‍යාගාර නැහැ. විද්‍යා ගුරුවරු නැහැ. විද්‍යා ගුරුවරයාව අපි ඒ ප්‍රදේශයට යැව්වත් විවිධ හේතුන් හදා ගෙන -ඉස්සර කාලයේ- නගරයට මාරු වෙනවා. ඒ නිසා 1AB එකම පාසලක්වත් නැති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 72ක් තිබෙනවා.

තමුන්නාන්සේ කිව්වා හරි. සබරගමුව පළාතේ දෙමළ මාධ්‍යයෙන් උසස් පෙළ විද්‍යා අංශයෙන් අධ්‍යාපනය ලබන්න එකම පාසලක්වත් තිබුණේ නැහැ. මුස්ලිම් ප්‍රදේශවලත් එහෙමයි. මේ නිසා සියයට 21ක දරුවන් ප්‍රමාණයකටයි විද්‍යා, ගණිත අංශයෙන් අධ්‍යාපනය ලබා දුන්නේ. වෛද්‍යවරුන්, ඉංජිනේරුවන්, ගණිතඥයන්, විද්‍යාඥයන්, පර්යේෂකයන්, නව නිපැයුම්කරුවන් කියන විද්‍යාත්මක චින්තනයක් සහිත අය බිහි කරන්න දරුවන්ගෙන් සියයට 21කටයි අධ්‍යාපනය ලබා දුන්නේ.

ලෝකයේ රක්ෂා අවස්ථා බහුල ලෙස තිබෙන්නේ; ජීවනෝපාය වැඩිය තිබෙන්නේ; රක්ෂා ඉල්ලා සිටින අය නොවෙයි, රක්ෂා ලබා දෙන අය බිහි කරන්නේ වාණිජ අංශයෙන්. ඒ අය ව්‍යවසායකයන් ලෙස හඳුන්වනවා. අවදානමකට මුහුණ දෙමින්, යම් යම් තීන්දු තීරණ අරගෙන තව ලක්ෂ ගණන් පිරිසකට කර්මාන්තශාලා, ව්‍යාපාර, වෙනත් පරිශ්‍ර යනාදිය තුළින් රැකියා අවස්ථා ජනිත කරනවා. ඒ ක්ෂේත්‍රය ගෝලීයකරණය යටතේ දිනෙන් දින වැඩෙනවා.

බැංකු, රක්ෂණය, ප්‍රවාහනය, ගබඩාකරණය, සන්නිවේදනය, සංචාරක, අලෙවිකරණය, කළමනාකරණ ක්ෂේත්‍ර ඒ යටතට වැටෙනවා. හැබැයි අධ්‍යාපනය ලබන්නේ දරුවන්ගෙන් සියයට 27යි. වාණිජ විද්‍යාගාර නැහැ. ගණකාධිකරණ ගුරුවරයෙක් නැහැ. ආර්ථික විද්‍යාවට ගුරුවරයෙක් ඈත පළාත්වලට දෙන්න බැහැ. උපාධිධාරි ගුරුවරයා ඇම්මත් ටික දවසකින් ආපහු මාරුව හදාගෙන එනවා. ඒ නිසා සියයට 27යි වාණිජ අංශයෙන් අධ්‍යාපනය ලබන්නේ.

සියයට 51ක් දරුවන් උසස් පෙළ කලා අංශයෙන් අධ්‍යාපනය ලබනවා. ඔවුන් විෂයයන් වශයෙන් තෝරා ගන්නේ මොනවාද? සිංහල භාෂාව, බෞද්ධ සංස්කෘතිය, දේශපාලන විද්‍යාව. ඒ සියයට 51ක් කියන්නේ භාගයකට වැඩි පිරිසක්. විශ්වවිද්‍යාල පද්ධතිය තුළ කලා උපාධිධාරි පාඨමාලාවන් වැඩි වශයෙන් තිබුණු නිසා සිංහලයි, බෞද්ධ සංස්කෘතියයි, දේශපාලන විද්‍යාවයි කරලා, කලා උපාධිධාරීන් තොග වශයෙන් බිහි වුණා. ඒ අය ඉගෙන ගත්ත දේට සරිලන රැකියාවක් තිබුණේ නැහැ. තිබෙන රැකියාවලට අවශ්‍ය උගතුන් බිහි වුණේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමා නිදහස් සෞඛ්‍යයට හෙද, හෙදියන් බඳවා ගන්න අපොස උසස් පෙළ සමත් අය සෙව්වා. හෙද, හෙදි වෘත්තිය සඳහා, ඈත එපිට දිස්ත්‍රික්කවල උසස් පෙළ විද්‍යා අංශයෙන් සමත් අය අවශ්‍ය ප්‍රමාණයට සොයා ගන්නට කිසිසේත් පුළුවන්කමක් තිබුණේ නැහැ. මම මේ පාසල් දහසේ සංකල්පය යටතේ අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයේ අනුමැතියෙන් ඉංග්‍රීසි මාධ්‍ය උපාධිධාරීන් දහසක් මේ පාසල්වලට යවන්න බඳවා ගන්න උත්සාහයක් දැරුවා. ඉංග්‍රීසි උපාධිධාරීන් දෙසීයහැට දෙනෙකු පත්වීම් ගත්තා. අද වෙන කොට පත්වීම් අරගෙන පාසල්වලට ගිහිල්ලා වාර්තා කරලා තිබෙන්නේ අනූතුන් දෙනයි. ඉංග්‍රීසි ගුරුවරුන් වශයෙන් උපාධිධාරීන් දහසක් බඳවා ගන්න රජය අනුමැතිය දීලා ඒ අනුව දෙසීය අනූදෙනෙකු පත්වීම් ලිපි අරගෙන තිබුණත්, ජනාධිපතිතුමා අය වැය ලේඛනයේ සඳහන් කළ පරිදි පාසල් පාදකව ඔවුන් බඳවා ගැනීම නිසා - school-based appointments දීපු නිසා- අනූතුන් දෙනායි තවම පත්වීම් භාර අරගෙන තිබෙන්නේ. තව නවසිය ගණනකට ඉංග්‍රීසි ගුරු පත්වීම් තිබෙනවා. හැබැයි උපාධිධාරීන් නැහැ. ඒ නිසා අපි ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමාධාරීන් බඳවා ගැනීම සඳහා කැබිනට් මණ්ඩලයේ විශේෂ අනුමැතියක් ලබා ගන්න කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරනවා. බලහත්කාරයෙන් ගිහිල්ලා උද්ඝෝෂණ කළාය, පිකටිං කළාය කියලා ඉංග්‍රීසි ගුරුවරයා දාන්න පුළුවන්කමක් ඇත්තේ නැහැ. ඒ අයට, ඊට වඩා විවිධ අවස්ථා පෞද්ගලික අංශයේ තිබෙනවා නම් ඒ අය ගුරුවරුන් වශයෙන් එන්නේ නැහැ.

මේ සමාජයේ රැකියා විශාල ප්‍රමාණයක් තිබෙන විවිධ ක්ෂේත්‍ර තිබෙනවා. ගුවන් නියමුවෝ ඉන්නවා. වරාය කේන්ද්‍රීය සංවර්ධනයක්, ගුවන් කේන්ද්‍රීය සංවර්ධනයක්, බල ශක්ති කේන්ද්‍රීය සංවර්ධනයක්, වාණිජ හා වෙළෙඳ කේන්ද්‍රීය සංවර්ධනයක් සඳහා අපි ගමන් කරනවා. මෙවැනි සංවර්ධන ඉලක්ක සාක්ෂාත් වෙන කොට, ආර්ථිකය ප්‍රසාරණය වෙන විට දැනුම කේන්ද්‍රීය සංවර්ධනය තුළින් අවශ්‍ය දැනුම් සම්භාරය රටේ දරුවන්ට එකතු කරන්න ඕනෑ. එහෙම එකතු කරන්න බැරිවීම නිසා පසු ගිය දශක තුන තුළ සිද්ධ වුණේ මොකක්ද? ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමාට කිසි අයිතියක් නැහැ, ඒ ගැන කථා කරන්න. මොකද, පෑන, පැන්සල, පොතපත අතට දෙන්න ඕනෑ තරුණයන්ට සයනයිඩ් කරලක් බෙල්ලේ ගැට ගහලා, මුහුදු වෙරළෙන් තුනෙන් දෙකක්, මහ පොළොවෙන් තුනෙන් එකක් වශයෙන් වෙනම රටක් ලෙස කඩා ගැනීම සඳහා මරා ගෙන මැරෙන්න කියා උගන්වපු එක තමයි එතුමන්ලාගේ කාලයේ කළේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඒ කාලයේ. දැන් ඕවා ජිනීවාවලට ගිහින් කියන්න.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
එදා අපි කුඩා කාලවල වෛද්‍ය විශේෂඥයන්, ගණකාධිකාරිවරුන්, දිසාපතිවරුන්, උපදිසාපතිවරුන්, ඉංජිනේරුවරුන් වශයෙන් මේ රටේ පාලනයට හවුල්කරුවන් බවට පත් වුණු වැඩි පිරිසක් ද්‍රවිඩ ජාතිකයන්. නමුත් ප්‍රභාකරන් ඇතුළු එල්ටීටීඊ එක තමන්ගේ වර්ගයට, තමන්ගේ වර්ගයේ දරුවන්ට කරපු විනාශය මුදලින් තක්සේරු කරන්න බැහැ. ඒ පසු බෑම නිසා අද මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර සහිත පාසල් දහස යටතේ ඒ ප්‍රදේශවල, උතුරු නැඟෙනහිර පළාතේ හැදෙන ද්විතීයික පාසල් සඳහා උපාධිධාරීන් සොයා ගන්න බැහැ. ඔවුන්

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

අවුරුදු 30ක් යුද්ධය කළා. ළමා සොල්දාදුවන් ලෙස යුද්ධයට ළමයින් බඳවා ගත්තා. යුද්ධයේදී ඔවුන් නැති වුණා. ඒ ප්‍රදේශවල ප්‍රචණ්ඩත්වය ඇති වුණා. දකුණේත් ඒකම සිද්ධ වුණා, ඊට පෙර සිට. 1971 කැරැල්ලට, 1989 කැරැල්ලට මේ අධ්‍යාපනය වගඋත්තරකරුවකු වනවා. ඇයි? අවුරුදු 20ක්, අවුරුදු 22ක්, අවුරුදු 25ක්වන කොට ඔවුන් ජීවිතය ගොඩ නඟන්න අපේක්ෂා කරනවා. තමන් ලබා ගත් අධ්‍යාපනයට අනුව රක්ෂාවක් ලැබෙන්නේ නැහැ. එම නිසා ජීවනෝපායයක් සලසා ගන්න බැහැ. ගෙදරට බරක් වෙලා තව දුරටත් ඉන්න බැහැ. එම අවස්ථාවේදී මේ දේශපාලන න්‍යායවාදියෝ ඇවිල්ලා, ඔවුන් තුළ වෛරය පමණක් ඇති කරලා, වෛර දේශපාලනය තුළ දං ගෙඩිය දක්වා ඔවුන් අරගෙන ගියා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
න්‍යායවාදියෝ නොවෙයි යක්ෂයෝ.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

එම අවස්ථාවේදී ඒ තරුණ තරුණියන්ගේ හිත්වලට දුන්නු අදහස්වලට අනුව ඔවුන් පළමුවෙන් තමන් හැදූ වැඩූ දෙමවුපියන්ට වෛර කළා; තමන්ට ඉගැන්වූ පාසලට, ගුරුවරුන්ට වෛර කළා. ඊට පස්සේ සමස්ත සමාජයටම වෛර කරලා හිනැහෙන්න බැරි පිරිසක් බවට පත් වුණා. හිනැහෙන්නේ නැතුව ඔවුන් පළි ගත්තා. ඔවුන් සමස්ත සමාජයේම පාසල් ටික ගිනි තැබුවා. ඔවුන් විදුහල්පතිගේ ගෙදරට ආවා, T56 එකක් අරගෙන. ඊට පස්සේ විදුහල්පතිතුමාට දණ ගහන්න කිව්වා. දණ ගහපු විදුහල්පතිට කිව්වා, "ඔළුව වැඩියි. තට්ටය ගාන්න ඕනෑ"යි කියලා. ඊට පස්සේ විදුහල්පතිතුමාව අරගෙන ගිහින් ගහේ බැන්දා. ගහේ බැඳලා මැරුවා. මරලා දණිස්සට පහළින් මිනිය අරගෙන ගිහින් වළලන්න කිව්වා. මනුස්සකම දණිස්සෙන් පහළට දැම්මා. මේ රටේ දරුවන් පාරට ඇදලා දැම්මා. මේ විෂබීජ තුළ පාසල බේරා ගැනීම සඳහා දෙමවුපියන්ට පාසල් තාප්පයේ ලියන්න සිද්ධ වුණා, "මෙය ඔබේ දරුවාගේ පාසලයි" කියලා. මේ අධ්‍යාපනයට අවශ්‍ය වෙනස නොකිරීම නිසා උතුරේත්, දකුණේත් සමස්ත සමාජයේ නිදහස් අධ්‍යාපනයේ දරුවෝ තමන් හැදූ වැඩූ දෙමවුපියන්ට, උපන් බිමට ආදරය කරන්නේ නැති පිරිසක් බවට පත් වුණා. ඔවුන්ට පාසලට ගිනි තබන්න පුළුවන් නම්, කෘෂි සේවා මධ්‍යස්ථානයට ගිනි තබන්න පුළුවන් නම්, තමන්ට ඉගැන්වූ ගුරු හාමුදුරුවන් මරන්න පුළුවන් නම්, තමන්ට ඉගැන්වූ විදුහල්පති හාමුදුරුවන් මරන්න පුළුවන් නම්, විදුහල්පතිව මරන්න පුළුවන් නම් ඒ ලබා දුන්නු අධ්‍යාපනයෙන් ඇති ඵලය කුමක්ද මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි?

දශක තුනක් අපේ රටේ ඉතිහාසය ලේවලින් ලිව්වා. මේ දශක තුනේම අපට ඇහුණේ යකඩ ගැටෙන අමිහිරි ශබ්දයයි; අපට දැනුණේ උණ්ඩයේ අමිහිරි සුවඳයි. හිටපු ජනාධිපති ප්‍රේමදාස මැතිතුමාගේ කාලයේ තරුණ අසහනය පිළිබඳව වාර්තාවක් සකස් කරන්න කියලා කිව්වා. ඒ වාර්තාව සකස් කිරීම භාර වුණේ මහාචාර්ය ජී.එල්. පීරිස් මැතිතුමාටයි. මේ කරුණු විභාග කර බලා එතුමා කිව්වා, "මේ තරුණයන්ට වෛරය දීලා මෙහෙම කුලප්පු කරන්න පුළුවන්කම ලැබුණේ, මේ විභාග කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමය වෙනුවට මානව හිතවාදී දරුවන් පිරිසක් හදන අධ්‍යාපන ක්‍රමයක් කළේ නැති නිසා"යි කියලා. එතුමන්ලාමයි අද දවසේ මේ යෝජනාව ගෙනෙන්නේ.

මේ තත්ත්වය හොඳින් තේරුම් ගෙන, රාජ්‍ය නායකයා ලෙස අතිගරු ජනාධිපතිතුමා තීන්දුවක් ගත්තා, මේ රටේ කොළඹ නගරයේ, ගාල්ල නගරයේ, මාතර නගරයේ, කුරුණෑගල නගරයේ, මහනුවර නගරයේ, යාපනය නගරයේ යම් කිසි පාසලක මොනවා හෝ පහසුකමක් තිබෙනවා නම්, එවැනි පහසුකම් සහිතව සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම අඩුම වශයෙන් පාසල් තුන බැගින් ද්විතීයික පාසල් දහසක් ප්‍රතිනිර්මාණය කළ යුතුයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැනට සිතියම්ගතකරණය කරලා මේ පාසල් දහසෙන් පාසල් 834ක් තෝරා ගෙන තිබෙනවාය කියන කාරණය මම ඔබතුමාට සඳහන් කරන්න ඕනෑ. එහි උතුරු නැඟෙනහිරත් සහිතව දෙමළ මාධ්‍ය පාසල් 206ක් තිබෙනවා. විදුලිබල හා බලශක්ති නියෝජ්‍ය ඇමතිතුමා නියෝජනය කරන මැතිවරණ කොට්ඨාසය වන රත්නපුර දිස්ත්‍රික්කයේ කලවාන ප්‍රදේශයේ මේ ද්විතීයික පාසල පිහිටුවන විට විද්‍යා අංශයක් කවදාවත් තිබුණේ නැති ඒ වතුකරේ ජනතාවට විද්‍යා අංශය සහිත මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාරයත් ඉදි වනවා.

ඊට පස්සේ රත්නපුර දිස්ත්‍රික්කය අවසන් වන විට ඊට මෙහායින් තිබෙන අවිස්සාවේල්ලේ තිබෙන ද්‍රවිඩ පාසලේ ප්‍රාථමික අංශය අපි ඉවත් කළා. ඉවත් කරලා ඊට කිට්ටුව වත්තේ වෙන කොටසක් අරගෙන ප්‍රාථමිකය පළාත් සභාව විසින් හදන අතර, ද්විතීයිකය අපි සංවර්ධනය කරනවා. හැබැයි මේ ද්‍රවිඩ පාසල්වලට වඩා වෙනස් ප්‍රතිපත්තියක් මුස්ලිම් ජනතාව සිටින ප්‍රදේශවල මේ වැඩ පිළිවෙළේදී පාවිච්චි කළා.

ප්‍රාථමිකය ඉවත් කර ගැනීමට මුස්ලිම් ප්‍රදේශවල දෙමවුපියෝ ඇතුළු ව්‍යාපාරික ප්‍රජාව එකතු වෙලා ස්වකැමැත්තෙන් ඒ ඉඩම් සල්ලිවලට ගත්තා. සමහර තැන්වල ප්‍රාථමිකය ඔවුන්ගේ සල්ලිවලින් හැදුවා. ද්විතීයිකය අපට හදා දෙන්න කිව්වා.

මම උදාහරණයක් ලෙස සඳහන් කළොත්, බණ්ඩාරගම මැතිවරණ කොට්ඨාසයේ අටලුගම කියලා ගමක් තිබෙනවා. ඒ ගමේ 26,000ක මුස්ලිම් ජනතාවක් ජීවත් වනවා. ඒ ගමට එක පාසලයි තිබෙන්නේ. හැබැයි කවදාවත් ඒ 26,000න් කිසිම මුස්ලිම් ජාතිකයෙක් ඒ ගමේ පාසලට ගිහිල්ලා ඉගෙන ගෙන කිසි දවසක විශේෂඥ වෛද්‍යවරයෙක්, ඉන්ජිනේරුවෙක්, ගණකාධිකාරිවරයෙක් වෙලා නැහැ. ඒ නිසා ඒ පළාතේ ද්විතීයික පාසල හදන කොට; ඒ සංකල්පය අරගෙන එක්සත් ජාතික පක්ෂය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ තිබෙන අනෙක් පක්ෂ ඔක්කොටම අයත් මුස්ලිම් ජාතිකයෝ එකතු වෙලා රුපියල් කෝටි එක හමාරකට ඉඩමක් සල්ලිවලට ගත්තා. මම ඒ ප්‍රදේශයට ගිය අවස්ථාවකදී ඒ ප්‍රදේශයේ අම්මලා මට කිව්ව ආකාරයට තමන්ගේ විවාහයේදී දමන ඉතාම වටිනා තැල්ලක් වාගේ ආභරණයක්- ඒකට වෙන වචනයක් කිව්වා, මම හරියට දන්නේ නැහැ. [බාධා කිරීමක්] "තාලිය" කියන ඒ රත්තරන් ආභරණයත් ඒ සම්මාදමට දමා අවශ්‍ය මුදල් සියල්ල එකතු කරලා තමයි ඒ මුස්ලිම් ජනතාව රුපියල් කෝටි එක හමාරකට ඉඩමක් අරගෙන ඒ ගත් ඉඩමේ ප්‍රාථමිකය හැදුවේ. ද්විතීයික පාසල හැදීම අපි ආරම්භ කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම පාසලක් පටන් ගත්තා, කුලියාපිටිය මැතිවරණ කොට්ඨාසයේ කැකුණගොල්ලේත්. කැකුණගොල්ලේත් ප්‍රාථමිකය ඉවත් කරන්න, මේ ප්‍රදේශයේ මුස්ලිම් ව්‍යාපාරික ප්‍රජාවත්, දෙමවුපියනුත් එකතු වෙලා ඉඩමක් අරගෙන ප්‍රාථමිකය හැදුවා. ද්විතීයිකය අපෙන් ඉල්ලා ගත්තා.

මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමා නියෝජනය කරන නාවලපිටිය මැතිවරණ කොට්ඨාසයේ මුස්ලිම්වරුනුත් ඒ ක්‍රියා මාර්ගයම ක්‍රියාත්මක කළා. අපේ සිංහල දරුවන් ඉගෙන ගන්නා ප්‍රාථමිකය ඉවත් කරන කොට සමහර බංකොලොත් දේශපාලන පක්ෂ ඒ දරුවන්ගේ අම්මලා පාරේ බුදි කරවද්දී, මුස්ලිම් ජනතාව අලුත් ආදර්ශයක් තමන්ගේ දරුවෝ වෙනුවෙන් රටට පෙන්වා දුන්නාය කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි. ඒ ඔවුන් ඒක තේරුම් ගත් නිසායි. මේ නිදහස් අධ්‍යාපනයේ වෙනසට කරන ප්‍රහාරය එන්නේ මොකද කියන එක පිළිබඳව ඔවුන් දැන ගත්තා.

මේ කිසිවෙකුත් මේ පාර්ලිමේන්තුවේ කථා කළේ නැති; මාධ්‍යය තුළ වත් කිසිම ප්‍රහාරයක් එල්ල වන්නේ නැති ඇති හැකි අයගේ අධ්‍යාපනය සහ නැති බැරි බහුතර පිරිසගේ අධ්‍යාපනය අතර ප්‍රධාන වෙනස්කම් පහක් තිබෙනවා. එය ඇති වන්නේ කෙසේද? මේ සභාවේදී ඒ ගැන කථා වෙලා නැහැ. මේ ගරු සභාවට මම බොහොම වග කීමකින් යුතුව එම කරුණු ඉදිරිපත් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රජයට පවරා නොගත් පාසල් 78ක් තිබෙනවා. මේ පාසල් 78න්, 36ක් රජයේ ආධාර ලබනවා. ඒ 36ට රජයේ ආධාර වශයෙන් ලැබෙන මුදලින් ගුරුවරුන්ට වැටුප් ගෙවීම සඳහා වර්ෂයකට රුපියල් මිලියන 704ක් ලබා දෙනවා. ඒ කියන්නේ බදු ගෙවන ජනතාවගෙන් රුපියල් මිලියන 704ක් පෞද්ගලික පාසල්වල ගුරුවරුන්ට වැටුප් ගෙවන්න අපි ලබා දෙනවා.

ඒ පුද්ගලික පාසල්වල ජාතියේ දරුවෝ 123,519දෙනෙක් ඉගෙනුම ලබනවා. ගුරුවරු 5,474දෙනෙක් ඉන්නවා. St. Thomas' College, St. Joseph's College, St. Peters College, St. Benedict's College, Zahira College, Musaeus College, Carey College, Ladies' College, Bishop's College, St. Anthony's College, Trinity College, Holy Cross College, Holy Family Convent, Wesley College, De Mazenod College, Hillwood College එම පුද්ගලික පාසල්වලින් සමහරක්. ශාන්ත ජෝෂප් විද්‍යාලයේ ශිෂ්‍යයෝ 5,787දෙනෙක් ඉන්නවා. ශාන්ත පීතර විද්‍යාලයේ ශිෂ්‍යයෝ 5,826ක් ඉන්නවා. සහිරා විද්‍යාලයේ 4,736ක් ඉන්නවා. මියුසියස් විද්‍යාලයේ 5,632ක් ඉන්නවා. මේවා පෞද්ගලික පාසල්. ඒවායෙන් සමහරක් රජයෙන් වැටුප් ලබනවා. සමහර ඒවා එහෙම නැහැ. හැබැයි වටිනා මනුෂ්‍ය ජීවිත 123,000කට වඩා වැඩි ප්‍රමාණයක් හොඳින්, විනය ගරුකව, ඉතාම ශික්ෂණයෙන් යුතුව, ඉතාම කැපවීමෙන් යුතුව, ඉතා විශාල වගකීමක් සහිතව, ඉලක්කයක් ඇතිව, ක්‍රීඩා කෞශල්‍යයෙන් යුතුව ඉගෙනුම ලබනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම, ජාත්‍යන්තර පාසල් පද්ධතියකුත් ඇති වුණා. ඒ ජාත්‍යන්තර පාසල්වලත් ලක්ෂ තුනකට ආසන්න දරුවෝ පිරිසක් ඉගෙනුම ලබනවා. ලක්ෂ හතරක් පහක් පමණ වන ඒ දරුවනුයි, අපේ පාසල්වලට යන දරුවනුයි අතර බොහෝ අවස්ථාවලදී පෙනෙන වෙනස්කම් 5ක් තිබෙනවා. ඒ ගැන කවුරුවත් කථා කරන්නේ නැහැ. අපේ පාසල්වලට දරුවන් ඇතුළත් කිරීම සඳහා මව්පියෝ දරුවා ඉපදෙන්නත් කලින් උප්පැන්නය හදනවා; වතුර බිල වෙනස් කරනවා; විදුලිය බිල වෙනස් කරනවා; ගෙවල් කුලියට ගන්නවා; ගෙවල්වලට ගිහිල්ලා කලින් පදිංචි වෙනවා. දරුවා පාසලට දැමීම පිළිබඳව තමයි දරුවා ඉපදෙන්නත් කලින් සිතන්නේ. එහෙම සිතුවාට ඒ සියලු දරුවන් ඒ පාසල්වලට ඇතුළත් කර ගන්න ඉඩක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් මේ වර්ෂයට අදාළ සංඛ්‍යා ලේඛනයක් මා ඉදිරිපත් කරනවා. කොළඹ රාජකීය විද්‍යාලයේ 2013 වර්ෂයේ පළමුවැනි වසරට සිසුන් ඇතුළත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍ර ලැබුණා 2,429ක්. එහි පළමුවැනි ශ්‍රේණියේ පන්ති 10යි තිබෙන්නේ. 411දෙනකු පමණයි ඇතුළත් කර ගත්තේ. අනෙක් දරුවන් 2,018 දෙනාගේම මව්පියෝ කියනවා තම දරුවා කොහොම හරි රාජකීය විද්‍යාලයට ඇතුළත් කර දෙන්න කියලා. විශාඛා විද්‍යාලයට 1,908දෙනෙක් ඉල්ලුම් කළා. 210 දෙනකු පමණයි ඇතුළත් කර ගත්තේ. තවත් 1,698 දෙනකුට ඒ පාසලට යන්න ඉඩ නැහැ. පානදුර සුමංගල බාලිකා විද්‍යාලයට 725 දෙනෙක් ඉල්ලුම් කළා. 210 දෙනකු පමණයි ඇතුළත් කර ගත්තේ. මහනුවර ධර්මරාජ විද්‍යාලයට 1,105 දෙනෙක් ඉල්ලුම් කළා. 210 දෙනකු පමණයි ඇතුළත් කර ගත්තේ. 895 දෙනකුට ඉඩ නැහැ. මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයට 1,239 දෙනෙක් ඉල්ලුම් කළා. 205දෙනකු පමණයි ඇතුළත් කර ගත්තේ. 1,034 දෙනකුට ඉඩ නැහැ. මාතර රාහුල විද්‍යාලයට ඉල්ලුම් කළා 961 දෙනෙක්. ඇතුළත් කර ගත්තේ 245 දෙනකු පමණයි. 716 දෙනකුට ඉඩ නැහැ. මාතර සුජාතා බාලිකා විද්‍යාලයට ඉල්ලුම් කළා 800 දෙනෙක්. ඇතුළත් කර ගත්තේ 207 දෙනකු පමණයි. මේ විධියට සියලු පාසල් ගැන කියන්න පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විස්තරය ඇතුළත් ලේඛනය මගේ කථාවේ කොටසක් ලෙස හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කරන්න කියලා ඉල්ලා සිටිමින් මම එය **සභාගත*** කරනවා.

මට නොවෙයි කිසිම අධ්‍යාපන ඇමතිවරයකුට මේ ප්‍රශ්නය විසඳන්න බැහැ. මොකද, මේ පාසල් කීපයට දරුවා ඇතුළත් කිරීම සඳහා දෙමව්පියෝ පොරබදනවා. හැබැයි ඇති හැකි කවුරුවත් දරුවකු පාසලට දැමීම ගැන පොඩ්ඩක්වත් සිතන්නේ නැහැ. ඇයි ඒ? අය කරන මුදල ගෙවීමම තමන්ගේ ළමයා පෞද්ගලික හෝ ජාත්‍යන්තර පාසලකට ඇතුළත් කරන්න ඒ අයට පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක්තරා පෞද්ගලික පාසලක 2013 වර්ෂයට පමණක් එක දරුවකු වෙනුවෙන් අය කර තිබෙන ගාස්තුව රුපියල් 303,750යි. විගණනය කළාම අපේ අමාත්‍යාංශය සොයා ගත් තොරතුරු අනුව, 2013 වර්ෂයට දෙමව්පියෝ එක දරුවකු වෙනුවෙන් ඒ පාසලට ගෙවලා තිබෙනවා රුපියල් 303,750ක්. ඒ, මුදල් අය කරන පාසලක්. ඇති හැකි අයට කිසි ප්‍රශ්නයක් නැහැ. නමුත්, අර පොල් ගෙඩි 8 සහ රුපියල් 800 සම්බන්ධයෙන් සමාජ සංවාදයක් ඇති කරන්නේ නැති බැරි අයගේ කතන්දරය තවත් හැල්ලුවට ලක් කරන්නයි. එතකොට ඒ එක වෙනසක්.

දෙවැනි වෙනස තමයි, සාමාන්‍යයෙන් අපේ රටේ ප්‍රාථමික අධ්‍යාපනය ලබන්නේ මවු භාෂාවෙන්; සිංහල හෝ දෙමළෙන්. මවුගේ උකුලේ නැළවෙනකොට අපිට කථා කරපු භාෂාවෙන් තමයි අපි මූලික අධ්‍යාපනය ලබන්නේ. ඒ ලෝකයේ පිළිගැනීම. ජර්මනියේ ජර්මන් භාෂාවෙනුත්, ප්‍රංශයේ ප්‍රංශ භාෂාවෙනුත්, චීනයේ මැන්ඩරින් භාෂාවෙනුත් වශයෙන් තමන්ගේ මවු භාෂාවෙන් ප්‍රාථමික අධ්‍යාපනය ලබන්නට ඕනෑ කියලා තමයි UNESCO එකෙන් කියන්නේ. හැබැයි, ඇති හැකි අයගේ දරුවන් අද පළමුවැනි පන්තියේ ඉඳලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබනවා. සිංහල අම්මා ඇවිල්ලා සමහර වෙලාවට අපටම කියලා තිබෙනවා, "දරුවාට ඉංග්‍රීසි නම් හොඳටම පුළුවන්, පොඩි ප්‍රශ්නයකට තියෙන්නේ සිංහල භාෂාවයි. සිංහල උගන්වන්න

---

** කථාව අවසානයේ පළ කර ඇත.*
** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of speech.*

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

හාමුදුරු කෙනෙක්වත් සොයසොයා ඉන්නේ" කියලා. දරුවන්ට උගන්වන්නේ ඉංග්‍රීසි භාෂාවෙන්. ඊළඟට තුන්වැනි වෙනස මේකයි. අපේ දරුවන් විතරක් නොවෙයි, දරුවන්ගේ අම්මලාත් අතිරේක පන්තිවලට ගිහින් පහ වසර ශිෂ්‍යත්ව විභාගයට දරුවන් ඉදිරිපත් කරනවා. දරුවාට ළමා කාලයක් දෙන්නේ නැතිව, දරුවාගේ ළමා කාලය උදුරා ගෙන ඔවුන්ව පහ වසර ශිෂ්‍යත්ව විභාගයට යවනවා. හැබැයි, ඇති හැකි අයගේ දරුවාට swimming, dancing, music උගන්වමින් ළමා කාලය ගත කරන්න දෙනවා. ඒ දරුවන්ව ශිෂ්‍යත්ව විභාගයට වාඩි කරවන්නේම නැහැ. ඊළඟට හතරවැනි වෙනස මේකයි. ඇති හැකි අයගේ දරුවාට 10,11 වසරවල උගන්වන්නේ, Chemistry, Physics, Zoology, Botany, Accounts, Economics. ඒ දරුවන්ට රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, ගණකාධිකරණය යන මේවා තමයි 10,11 වසරවල උගන්වන්නේ. අපේ ළමයින්ට 10, 11 වසරවල දී උගන්වනවා, අනිවාර්ය විෂයයන් හයක්. ඊළඟට, මේ basketවලින් තුනක් තෝරා ගන්න කියලා කියනවා. අපේ දරුවා අපොස සාමාන්‍ය පෙළ විභාගයට ඉදිරිපත් වෙද්දී, ඇති හැකි අයගේ දරුවා British Council එකෙන් පවත්වන London O/Level Exam එකට ඉදිරිපත් වෙනවා. ඊට පසුව මේ සහතික දෙකම එක සමාන - equal - කරනවා. ඒ ජාත්‍යන්තර විභාගවල ප්‍රශ්න පත්‍ර අපේ විභාගවල ප්‍රශ්න පත්‍රවලට වඩා බොහොම ලේසියි. ඒ ප්‍රශ්න පත්‍රවල කොම්බු, ඉස්පිලි, පාපිලි වැරැදියි කියලා බලු කපුටෙක්වත් කියන්නේ නැහැ. ඒවා ගැන කිසිම උද්ඝෝෂණයක් නැහැ. ඒ ප්‍රශ්න පත්‍රවලට ලෝකයේ රටවල් 180ක ළමයින් මුහුණ දෙනවා. ඒවායේ වැරැදි හැටහුටහමාරක් තිබෙනවා. කිසිම රටක් ඒ ගැන වචනයක් කථා කරන්නේ නැහැ. ඒ නිසා ඇති හැකි කෙනාගේ සහතිකයයි මේ සහතිකයයි සමාන කරනවා.

ඇති හැකි අයගේ දරුවෝ අද දවසේ සාමාන්‍ය පෙළ විභාගයෙන් පසුව ඉගෙන ගන්නේ නැහැ. පසු ගිය සතියේ "The Sunday Times" පුවත් පත මා ළඟ තිබෙනවා. එහි තිබෙනවා, "Do you know what to do after O/Levels?" සාමාන්‍ය පෙළ විභාගයෙන් පසුව මොකක්ද කරන්නේ කියලා අහලා තිබෙනවා. ඊළඟට තිබෙනවා, "Visit Malaysia Education Exhibition on March 16 & 17" මැලේසියාවේ අධ්‍යාපන ප්‍රදර්ශනය බලන්න එන්න කියනවා. "Malaysia's Top Seven Universities" ඊළඟට, "O/Level Entry" කියලා තිබෙනවා. ඒ කියන්නේ O/Level සමත් නම් යන්න පුළුවන්. "Access to over 100 Universities after O.Levels" දැන් විශ්ව විද්‍යාලයට යන්න පුළුවන් O/Level සමත් නම්. ඒ ගැන මේ මන්ත්‍රීතුමන්ලා කවුරුවත් කියනවාද? සල්ලි තිබෙන අයගේ දරුවන් London O/Level දක්වා විතරයි ඉගෙන ගන්නේ. එතැනින් එහාට මේ රටේ අපේ දරුවන්ට, ජාතියේ දරුවන්ට - හැබැයි සල්ලි තිබෙන්නට ඕනෑ- වෙනත් රටකට ගිහිල්ලා එහි University College එකකට ඇතුළත් වෙන්න පුළුවන්. විශ්වවිද්‍යාල විද්‍යායතනයකට ඇතුළත් වෙන්න පුළුවන්. ඊට පසුව අවුරුදු තුනකින් උපාධිය ලැබෙනවා. අපි අපේ දරුවාට කියනවා, 12, 13 වසරවල ඉගෙන ගෙන උසස් පෙළ විභාගය කරන්න කියලා. උසස් පෙළ විභාගය කරලා, ප්‍රතිඵලවලට රණ්ඩු වෙලා, Z-Scoreවලට රණ්ඩු වෙලා, ඒවා අපේ රටේ ප්‍රධාන මාතෘකා බවට පත් කරනවා. මේ මනුෂ්‍ය ජීවිත ගැන තඹ දොයිතුවකට හිතන්නේ නැතිව, ඒ ප්‍රශ්න පත්‍ර නිරීක්ෂණය කිරීම වර්ජනය කරන්නට සූදානම් වෙනවා. අපේ දරුවන්ට අන්නන්න පුළුවන් ඔක්කොම අන්නලා, අපේ දරුවා විශ්වවිද්‍යාලයට යන්න බලා ගෙන ඉන්නකොට අර සල්ලි තිබෙන කෙනාගේ දරුවා සාමාන්‍ය පෙළ විභාගය කරලා අවුරුදු තුනකින් උපාධිධාරියෙක් බවට පත් වෙනවා. ඒක නොවෙයිද ඇත්ත? ඒ ගැන විවාදයක් කවදාවත් මේ පාර්ලිමේන්තුවේ කරලා තිබෙනවාද? මේ ජනතා විමුක්ති පෙරමුණ ඒ ගැන විවාදයක් කරලා තිබෙනවාද? ජනතා විමුක්ති පෙරමුණට "The Sunday Times" පුවත් පත පෙනෙන්නේ නැද්ද? ඒ පුවත් පතේ වරදක් ගැන නොවෙයි මම මේ කියන්නේ. ඕනෑම පුවත් පතක් ගත්තාම අපිට දකින්නට ලැබෙන ප්‍රායෝගික යථාර්ථය.

ඇයි, මේ නිදහස් අධ්‍යාපනයට ගහන කට්ටියට මේවා පෙනෙන්නේ නැත්තේ? දැන් අපේ රටේ හා ලෝකයේ වෙනත් රටවල අයට ඕස්ට්‍රේලියාවට යන්න ඕනෑ වුණාම බෝට්ටුවල එල්ලිලා ගිහිල්ලා, මුහුදු වතුර බීලා, මිනී මස් කකා ඉඳලා පොලිසියට අහු වෙලා එළියට දමනවා. නමුත් London O/L කරලා ගිහිල්ලා ඒ සල්ලි ටික බැන්දාට පස්සේ Australian මහ කොමසාරිස් කාර්යාලය ශබ්දය ඇහෙන්න උඩ පැනලා තමයි visa එකට සීල් එක ගහන්නේ. එතකොට උඩින් ඕස්ට්‍රේලියාවට යනවා. එල්ලිලා බෝට්ටුවල යන්න ඕනෑ නැහැ. හැබැයි කවුරුවත් ඒ ගැන කථා කරන්නේ නැහැ. මේ වරප්‍රසාද ලත් අයගේ දරුවන්ට තිබෙන අයිතිය ගැන කථා නොකර, වරප්‍රසාද අහිමි අතිමහත් බහුතරයට හා මධ්‍යම පන්තියේ දරුවන්ගේ අධ්‍යාපනයට එළව එළවා පහර දීම තමයි මෙතැන දී සිද්ධ වන්නේ. අපි මහින්ද චින්තන ඉදිරි දැක්මෙන් කරන්න බලාපොරොත්තු වන්නේ ඇති හැකි අයගේ දරුවන්ට සල්ලිවලට යම් කිසි අවස්ථාවක් නිර්මාණය වෙනවා නම්, ඒ සියලු අවස්ථා ටික ගමේ දරුවන්ටත් ලබා දීමේ අධ්‍යාපන වෙනසයි. ඒක තමයි අපි මේ කරන්නේ කියන එක මම බොහොම අවංකව තමුන්නාන්සේලාට කියන්නට කැමැති වෙනවා. ඒ වෙනසයි මේ කරන්නේ. ඒක අමාරු වෙනසක්. එතකොට අපි දන්නවා මේ පන්තිය වෙනස් කිරීම මහින්ද රාජපක්ෂ යුගයේදී කරන්න බැරි නම් සසර වසනා තාක් කල් මේ අධ්‍යාපනයේ ගමේ මිනිස්සුන්ට අවශ්‍ය වෙනස කරන්නට ලැබෙන්නේ නැහැයි කියන ටිකත් මම මේ අවස්ථාවේදී කියන්නට කැමැති වෙනවා.

මම මේ අවස්ථාවේ පෞද්ගලික පාසල්වල ගුරු සිසු සංඛ්‍යාව හා ඇතුළත් වීමේ ගාස්තු සම්බන්ධ වාර්තාවක් **සභාගත*** කරනවා.

ඊළඟට සමහර මන්ත්‍රීවරු අද කිව්වා සමහර පාසල් වහනවා කියලා. එහෙම කවුරුවත් පාසල් වහන්නේ නැහැ. කිසිම පාසලක් ඕනෑකමින් වැසීමේ ප්‍රතිපත්තියක් රජයට නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාසල් තිබෙන්නේ මෙහෙමයි. අපේ රටේ දරුවෝ 50ට අඩුවෙන් එන පාසල් සියයට 17ක් තිබෙනවා. ඒ පාසලට එන්නේ දරුවෝ 50කට අඩුවෙන්. ඒ, ලංකාවේ තිබෙන පාසල් 9731න් සියයට 17ක්. ඒ පාසල්වල දරුවෝ සංඛ්‍යාව කොහොමද? පාසල් 275කට එක දරුවෙක්වත් ඇතුළු වෙලා නැහැ. ඒ පාසල් 275 පළමුවැනි ශ්‍රේණියට එක් කෙනෙක්වත් ඇවිල්ලා නැහැ. අපි ජීවත් වන මේ බස්නාහිර පළාතේ පාසල් 15කට එක්කෙනෙක්වත් ඇවිල්ලා නැහැ. එක ළමයෙක් විතරක් ඉන්න පාසල් 123ක් තිබෙනවා. විදුහල්පතිතුමා ඉන්නවා. ගුරුතුමන්ලා ඉන්නවා. ළමයි එක්කෙනායි ඉන්නේ. එහෙම පාසල් 123ක් තිබෙනවා. ඒ වුණත් තියා ගන්න කියලා නේ කියන්නේ. වහන්න එපා කියනවා. ළමයි දෙදෙනෙක් ඉන්න පාසල් 147ක් තිබෙනවා. ළමයි තුන් දෙනෙක් ඉන්න පාසල් 181ක් තිබෙනවා. ළමයි තුන් දෙනායි ඉන්නේ. ළමයි හතර දෙනෙක් ඉන්න පාසල් 210ක් තිබෙනවා. ළමයි පස් දෙනෙක් ඉන්න පාසල් 223ක් තිබෙනවා. මේ අය වැසිකිළි ගැන කථා කරනවා. වැසිකිළි ගැන නොවෙයි කියන්න ඕනෑ. වැසිකිළි

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

යන්න මනුෂ්‍ය ජීවිත ඕනෑ. පාසලක එක ළමයෙක් විතරක් ඉන්න කොට ඒ ළමයාට සමාජානුයෝජනයක් ඇති වෙනවාද, ඉගෙන ගන්න උත්තේජකයක් ඇති වෙනවාද කියලා ඔබතුමාම කල්පනා කර බලන්න. මුළු පාසලේම ඉන්නේ ළමයි තුන් දෙනායි. ඉගෙන ගන්න පුළුවන්ද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාවේ තිබෙන පාසල්වලින් සියයට 25ක් ළමයි දස දෙනකුට අඩු පාසල්. මේ තිබෙන මුළු පාසල් 9731න් සියයට 25ක් කියන්නේ හතරෙන් එකක්. හතරෙන් එකකට පළමුවැනි ශ්‍රේණියට ළමයින් දහ දෙනෙක්වත් ඇතුළත් වෙලා නැහැ. මේවා මේ මතු පිට කථා නොවෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට මම අනෙක් ටිකත් කියලාම ඉන්නම්. ළමයි 100ට අඩු පාසල් සියයට 31ක් තිබෙනවා. ළමයි 500ට අඩු පාසල් සියයට 70ක් තිබෙනවා. මේ රටේ මුළු පාසල් පද්ධතියෙන් පාසල් සියයට 70ක ළමයි 500ට අඩුයි. පාසල් සියයට 90ක ළමයි 1000ට අඩුයි. ළමයි 50ට අඩු මුළු පාසල් ගණන 1621යි.

ලංකාව පුරා පැතිරුණු මේ පාසල් 1621 තුළ දරුවන් 45,425 දෙනායි ඉගෙන ගන්නේ. පාසල් 1621ක ළමයි 50,000ට අඩුයි. ගුරුවරු 8,732ක් ඉන්නවා. ඒ කියන්නේ සෑම ළමයි පස් දෙනකුටම එක ගුරුවරයකු ඉන්නවා. ලෝකයේ දියුණුම රටකවත් මෙහෙම නැහැ. දියුණුම රටක පාසලක වුණත් සාමාන්‍යයෙන් ළමයි 20 දෙනකුට ගුරුවරයකු බැගින් ඉන්නේ. අපේ රටේ පාසල් 1,621ක ළමයින් 45,425 දෙනකුට ගුරුවරු 8,732ක් ඉන්නවා කියන්නේ ගුරු සිසු අනුපාතය 1:5යි. ඒ වාගේම ළමයින් 5,000ට වැඩි පාසල් 11ක් තිබෙනවා. ඒ ටික ගැන තමයි අපි කථා කරන්නේ. 5,000කට වඩා ළමයින් ඉන්න දැවැන්ත, ඉහළ කීර්ති නාමයක්, සම්ප්‍රදායක් හා දීර්ඝ කාලීන ප්‍රෞඪ ඉතිහාසයක් තිබෙන පාසල් 11ක් තිබෙනවා. ඒ පාසල් 11 තුළ ළමයින් 55,000ක් ඉගෙනුම ලබනවා. නමුත් රට පුරා විසිරුණු පාසල් 1,621ක ඉගෙනුම ලබන්නේ 45,000යි. මේ සංඛ්‍යා ලේඛන සියල්ල හැන්සාඩ් ගත කිරීම සඳහා මා **සභාගත*** කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිමල් ප්‍රේමසිරි මහතා තමන්ගේ උසස් අධ්‍යාපනය පිණිස පාසල් වැසී යාමට හේතු පිළිබඳ පර්යේෂණයක් කර තිබෙනවා. මේවා නිකමට හිතෙන දේශපාලන කාරණා නොවෙයි. ඒ පර්යේෂණ වාර්තාවට අනුව 2009 දී වැසුණු පාසල් සංඛ්‍යාව 104යි. 2010 දී වැසුණු පාසල් සංඛ්‍යාව 79යි. 2011 දී වැසුණු පාසල් සංඛ්‍යාව 16ට අඩු වෙලා තිබෙනවා. 2012 දී වැසුණු පාසල් සංඛ්‍යාව 36යි. ඒ වාගේම ඒ පර්යේෂණ වාර්තාවේ මෙහෙම සඳහන් වෙනවා :

"පාසල් වැසී යාමට බලපෑ සාධක නම්, විදුහල්පතිවරුන්ගේ දුර්වල කළමනාකරණය හා පරිපාලනය,

දීර්ඝ කාලයක් තිස්සේ පැවතෙන ගුරු හිඟය, ග්‍රාමීය පාසල් පිළිබඳ ඉහළ නිලධාරින්ගේ අවධානය

අඩු වීම, ළමා ජනගහනය අඩු වීම, කිලෝ මීටර් 2-3ක් වැනි දුරකින් පාසල් 3-4ක්

ආරම්භ කිරීම, පාසල හා දෙමාපියන් අතර තිබෙන අන්‍යෝන්‍ය සම්බන්ධතාවය අඩු මට්ටමක පැවතීම,

දරුවන් පාසල වෙත යොමු කරන ලද දෙමාපියන්ගේ අඩු අධ්‍යාපන මට්ටම නිසා පාසල සමඟ

පවත්වන දුරස්ථ සම්බන්ධතාවය හා දරුවන් පාසල වෙත යොමු කරන ලද දෙමාපියන්ගෙන්

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

බහුතරය කම්කරු වෘත්තියෙහි යෙදෙන නිසා පාසල පිළිබඳ සොයා බැලීමට තිබෙන කාලය අඩු වීම."

මේ සඳහා යෝජනා කිහිපයක් ඉදිරිපත් කර තිබෙනවා. 01. "පාසල් පද්ධතිය තුළ විශාල බෙදීම් නිර්මාණය කිරීමට හේතු වී ඇති ඉසුරු පාසල්, නවෝදය පාසල්, ජනප්‍රිය පාසල්, 1ඒබී පාසල්, 1සී පාසල්, 2 වර්ගයේ පාසල්, 3 වර්ගයේ පාසල් ආදී වර්ගීකරණය ඉවත් කර සියලුම පාසල් ප්‍රාථමික, කනිෂ්ඨ, ජ්‍යෙෂ්ඨ ලෙස පොදු වර්ග කිරීමකට ලක් කළ යුතුය". ඒක තමයි මේ කරලා තිබෙන්නේ. අපි මේ පාසල් වැසී යාම වළක්වන්න පොදු වර්ගීකරණයක් කර තිබෙනවා. පාසල් වර්ග දෙකයි. ගෙවල් ළඟ කිලෝ මීටර් දෙකක් දුරින් දරුවාට යන්න හොඳ ළමා මිතුරු ප්‍රවේශයක් සහිත ප්‍රාථමික පාසලක් මේ තුළින් ලැබෙනවා. 2012 සිට 2016ට විදුලිය, පානීය ජලය, ළමා මිදුල, ක්‍රියාකාරී කාමරය, ගුරුවරු, ආරක්ෂිත වැට මේ සියල්ල සහිත 1ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා ඇති පාසල් 5,000ක් නිර්මාණය කරනවා. එයින් 1600 ගණනක මූලික අඩිතාලම් ගිය අවුරුද්දේ පටන් ගත්තා. මේ වර්ෂයේ පළමු වාරය නිම වීමෙන් පසු ඒ පෝෂිත පාසල්වල ඉතිරි සියල්ල සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ලක්ෂ 5 බැගින් ලබා දීමේ ක්‍රියාවලිය ගරු ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා මට ඉෂ්ට කරලා දෙනවා කියන ප්‍රතිඥාව දීලායි ගියේ කියන එක මා තමුන්නාන්සේලාට මතක් කරනවා. ඒ නිසා පොතේ තිබෙන ඒවා නොවෙයි. මේ ආණ්ඩුවට සැලසුමක් තිබෙනවා; වැඩ කරන විධියක් තිබෙනවා. වැඩ කරන්න සම්පත් හොයා ගන්නේ අමාරුවෙන්. මේ වන විට මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර 409ක් මේ මහ පොළොවේ ඉදි වෙනවා. මගේ අධීක්ෂණ මන්ත්‍රීතුමා වශයෙන් ගරු මොහාන් ලාල් ග්‍රේරු මන්ත්‍රීතුමා ඒ වැඩ පිළිවෙළේ ඉදි කිරීම් කටයුතු භාරව, ඒ සඳහා අවශ්‍ය ගුරුවරු ලබා දීම භාරව සිටිමින් ඉතාම විශාල කාර්ය භාරයක් කැපවීමෙන් යුතුව ඉෂ්ට කරන බවත් මා මේ ගරු සභාවට දැනුම් දෙනවා.

පාසල් 1000 වැඩසටහන යටතේ 2012 වර්ෂයේදී පමණක් නැවත විවෘත වෙච්ච පාසල් තිබෙනවා, 34ක්. බස්නාහිර පළාතේ 8යි, මධ්‍යම පළාතේ 2යි, දකුණු පළාතේ 2යි, උතුරු පළාතේ 6යි, නැඟෙනහිර පළාතේ 5යි, වයඹ පළාතේ 7යි, උතුරු මැද පළාතේ 3යි, සබරගමුව පළාතේ1යි. එකතුව 34යි. ඒ පාසල්වල සිටින ගුරුවරු 145යි, දරුවන් සංඛ්‍යාව 1325යි.

මම මෙතැනදී එක මැතිවරණ කොට්ඨාසයකට අදාළ විස්තර විතරක් කියන්න කැමැතියි. බණ්ඩාරගම මැතිවරණ කොට්ඨාසයේ මිල්ලනිය දේවරක්ෂිත විද්‍යාලය ද්විතීයික පාසලක්. ඒ යටතේ වසා දමා තිබුණු පාසල් දෙකක් ඇරියා. කැටගොඩ ප්‍රාථමික විද්‍යාලයේ 2012දී හිටියේ ළමයින් 50යි, 2013දී ළමයින් 53 දෙනායි. ඉඹුලහේන ප්‍රාථමිකයේ 2012 දී හිටියේ ළමයින් 33 දෙනායි, මේ අවුරුද්දේ ළමයින් 38 දෙනෙක් ඇතුළු වුණා. දොඹගොඩ සීලරතන විද්‍යාලය ද්විතීයික පාසලක්. ඊට සම්බන්ධ ප්‍රාථමිකය අලුතින් ඇරියා. ඒක වසා දමා තිබුණු පාසලක්. බටගොඩ ප්‍රාථමික පාසලේ ළමයින් 42 දෙනායි හිටියේ. නව පාසලක් විවෘත වීම නිසා මේ අවුරුද්දේ ඒ පාසලට ඇතුළු වුණේ ළමයින් 36 දෙනායි. ඒ වාගේම, වල්ගම සද්ධාතිස්ස විද්‍යාලය සහ වීදාගම ලෝකපිල ලක්ෂ්මී විද්‍යාලය. එහි ප්‍රාථමිකය වසා තිබුණු එකක්. ළමයින් 22 දෙනායි හිටියේ. මේ අවුරුද්දේ ළමයින් 54 දෙනෙක් ඉන්නවා, පන්ති දෙකයි. තක්ෂිලා මධ්‍ය විද්‍යාලයට සම්බන්ධ කරලා විවෘත කළා, හැගල්ල ප්‍රාථමික විද්‍යාලය. එහි මේ අවුරුද්දේ ළමයින් 42 දෙනෙක් ඉන්නවා. බෝපේ රාජසිංහ විද්‍යාලය ද්විතීයික පාසලක් බවට පත් කළා. එහි 2011දී හය වසරේ පන්ති 2යි, 2012දී හය වසරේ පන්ති 3යි. 2013දී හය වසරේ පන්ති 4යි. ළමයින් 168ක් අලුතින් ඇතුළු වුණා. වේරගල කණිෂ්ඨ පාසල, අංගම්පිටිය කණිෂ්ඨ පාසල, බෝපේ කණිෂ්ඨ පාසල, දඹෝර කණිෂ්ඨ පාසල, උඩගම කණිෂ්ඨ පාසල යන මේවා ඊට පෝෂිත පාසල් වශයෙන් තිබෙනවා.

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

"ශ්‍රී ලාංකීය නිදහස් අධ්‍යාපනය සැබෑ හැරවුම් ලක්ෂ්‍යය. මහින්දෝදය ද්විතියික පාසල් වැඩසටහනින් පිබිදෙන බණ්ඩාරගම" යනුවෙන් නම්කොට, "හිත මිතුරෝ" නම් හොරණ අධ්‍යාපන කලාපයේ විශ්‍රාමික අධ්‍යාපන පරිපාලන හා විදුහල්පති පදනම මට පොතක් එවා තිබෙනවා. හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා මම ඒ පොත **සභාගත*** කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම පාසල් වැසී යෑමට හේතුව, පාසල් පද්ධතිය කඩා වැටිලාය කියන මිථ්‍යාව බිඳ ලන්නට අවශ්‍ය කරුණු සඳහන් පත්‍රිකා දෙකක් ඔබතුමාගේ අවසරය ඇතිව හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා මම **සභාගත*** කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
**(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)**
(The Presiding Member)
ගරු ඇමතිතුමනි. තව විනාඩි පහයි තිබෙන්නේ.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
සම්මත කරන යෝජනාවක් නොවන නිසා, මගේ ඉවර කරන්න සභාවේ එකඟතාව ඇතිව විනාඩි 15ක් දෙන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
**(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)**
(The Presiding Member)
7.00න් පසුව සභාව ගෙන යන්න බැහැ. Adjourn කරලායි තිබෙන්නේ.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මුදල් එකතු කිරීමේ වගකීම පුරුදු කිරීමේ කාර්යය, අධ්‍යාපනය පෞද්ගලීකරණය කිරීමේ කටයුත්ත කළේ, 1983 සැප්තැම්බර් මාසයේ 29 වැනිදා එක්සත් ජාතික පක්ෂ රජය සමයේ හිටපු එස්.බී.කේ.කේ. වේරගොඩ අධ්‍යාපන ලේකම්තුමායි. ඒ අනුව පාසල් සංවර්ධන අරමුදලක් පිහිටෙව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ඉතාම කෙටියෙන් ඒ තොරතුරු කියවනවා. ඒ අනුව අනු කමිටු පිහිටුවා තිබෙනවා. ඒවා යටතේ පහත සඳහන් කටයුතු කළ යුතුව තිබෙනවා.

භෞතික සම්පත් අනු කමිටුව :

රාජ්‍ය අංශය හා පාසල් ප්‍රජාව සපයන සම්පත් උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීමෙන් හා නාස්තිය වළක්වාලීමේ අරමුණින්, පාසල් ගොඩනැගිලි, පාසල් භූමිය වටා වැට, තාප්පය, ජලය හා විදුලිය සැපයීම ආදිය සැලසුම් කිරීම, ඉදි කිරීම හා නඩත්තු කටයුතුවල යෙදීම, පාසල් ප්‍රජාව සතුව ඇති භෞතික හා මානව සම්පත් පදනම් කරගෙන ඇස්තමේන්තු සකස් කිරීම, පාසල් ලී බඩු සහ පන්ති කාමර උපකරණ නඩත්තුව, පාසල් වත්ත පවිත්‍රව තබා ගැනීම සහ එයින් උපරිම ප්‍රයෝජනය ලබා ගැනීම.

පුස්තකාල හා අධ්‍යාපනික උපකරණ අනු කමිටුව:

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

පුස්තකාලය සඳහා පොත් සඟරා සැපයීම, අධ්‍යාපන උපකරණ සපයා ගැනීම හා නඩත්තුව, පුස්තකාල උපකරණ සපයා ගැනීම හා නඩත්තුව.

පෙළ පොත් දිවා ආහාර, නිල ඇඳුම් හා නේවාසිකාගාර කටයුතු පිළිබඳ අනු කමිටුව:

පෙළ පොත් අවශ්‍යතා නිර්ණය කිරීම, ලබා ගැනීම, බෙදා හැරීම හා ඵලදායී පරිහරණය, පාසල් දිවා ආහාර සංඛ්‍යා ලේඛන සහ අවශ්‍යතා පිළියෙල කිරීම.

මේ ආදී වශයෙන් ඉතා විශාල චක්‍රලේඛයක් සකස් කරලා මුළු රටම කළඹලා, ඒවාට සල්ලි දෙන අයට බදු සහන දීලා වෙනම පාසල් සංවර්ධන අරමුදලක් ඇති කරන්නයි මේ චක්‍රලේඛනය නිකුත් කළේ. මේ කල් තැබීමේ යෝජනාව ගෙනාපු මහත්වරුන්ගේ කියවීම සඳහා මේ මුළු චක්‍රලේඛයම හැන්සාඩ් වාර්තාවට ඇතුළු කිරීම සඳහා **සභාගත*** කරනවා.

ඒ සමඟම චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය බලයට පත් වුණාට පස්සේ, 1995දී එම්.ඩී.ඩී. පීරිස් මහතා විසින් පාසල් සංවර්ධන මණ්ඩල අහෝසි කරමින් නිකුත් කරපු නිවේදනයත් මා හැන්සාඩ් වාර්තාවට ඇතුළු කිරීම සඳහා **සභාගත*** කරනවා.

සල්ලි එකතු කරන්නම කියලා සියලුම විධිවිධාන ඇතුළත් කරපු චක්‍රලේඛනය තමයි, 1993 සැප්තැම්බර් 29වැනි දා වේරගොඩ ලේකම්තුමා අත්සන් කරලා එක්සත් ජාතික පක්ෂයේ අධ්‍යාපන ඇමතිතුමා හා ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරපු චක්‍රලේඛය. ඒ ගැන නොදන්නා අය වැඩි වැඩියෙන් ඒක කියවන්න. මොකද, ඒ සමහර අයගේ තාත්තලා නායකයන්, අධ්‍යාපන ඇමතිලා, ජනාධිපතිතුමන්ලා වෙලා ඉඳලා තිබෙනවා. ඒ නිසා ඒ කාලයේ තිබුණු චක්‍රලේඛනත් කියවලා එන එක හොඳයි. මේ රටේ දරුවෙකුගෙන් අනිවාර්ය කිරීමෙන් හා බලහත්කාරයෙන් -අවශ්‍යයෙන්ම ගෙවන්න කියලා- කිසිදු මුදලක් පාසල් අධ්‍යාපනය තුළ අය කිරීම වැළැක්වීම සඳහා අවශ්‍ය චක්‍රලේඛනයක් ජනාධිපතිතුමාගේ උපදෙස් අනුව නිකුත් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. මේ රටේ පාසල්, පන්සල්, පල්ලි යන ඒවා ගොඩ නැඟිලා තිබෙන්නේ ජනතාව විසින්, සුබ පතන්නන් විසින් හැම දාම කරන පරිත්‍යාගවලින් තමයි.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ඔබතුමන්ලා ඒ චක්‍රලේඛනය නිකුත් කරනවාද?

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ඔව්. එය නිකුත් කිරීම ගැන පළාත්වල ඉන්න මහ ඇමතිතුමන්ලා සමඟ අප පසු ගිය සතියේ කථා කළා. ඔවුන්ගේ අදහසුත් සැලකිල්ලට ගෙන තමයි එය කරන්න වන්නේ. මොකද අපට අවශ්‍ය නැහැ නැති බැරි මිනිසුන්ගේ, අමාරුවෙන් ජීවත් වෙන අයගේ සල්ලි ගන්න. එවැනි දරුවන්ගේ අනාගතය වෙනුවෙන් මුදල් ගෙවන, ඒ දරුවන්ට ශිෂ්‍යත්ව දෙන, නේවාසික ගාස්තු ගෙවන මනුෂ්‍යයන් විශාල පිරිසක් මේ රටේ ඉන්නවා. වෙනත් දරුවෙක් තමන්ගේ දරුවා මෙන් සලකා, කැපකරු ලෙස

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ඉදිරිපත් වෙලා ඒ දරුවා හදා ගන්නා අම්මලා තාත්තලා ඉන්නවා. දරුවන් නැති අයට, දරුවන්ගේ අගය දන්නේ නැති අයට, දරුවන්ට තිබෙන අමාරුකම් පිළිබඳ ඇත්ත දැනුමක් නැති අයට, ජාත්‍යන්තරකරණය වුණු අයට මේ තිබෙන ප්‍රශ්නය වැටහෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තව එක කරුණක් විතරක් සඳහන් කරන්න ඕනෑ.

2013.03.04 දින පළ වූ "දිනමිණ" පුවත් පතේ 10වැනි පිටුවේ මෙසේ සඳහන් කර තිබෙනවා:

"සා. පෙළ විභාගය අසමත් ගණන වසරින් වසර වැඩි වෙලා
මුදල් හා ක්‍රම සම්පාදනය අමාත්‍යාංශය පවසයි"

මෙහෙම පවසන්නේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය නම්, එම අමාත්‍යාංශයේ කාගේ හරි වයර් මාරුවීමක් වෙලා තිබෙනවා. මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය මගෙන් මොකුත් වැඩිදුර අහගන්නේ නැත්නම් හොඳයි. මා හිතන්නේ නැහැ, මේ වාර්තාව මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයෙන් නිකුත් කරපු එකක් කියලා. නමුත් පළ වුණු විධිය බලනකොට-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමනි, දැන් කථාව අවසන් කළ යුතුයි.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ඒ නිසා, 1994, 2005, 2011 යන වර්ෂවල අපොස සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ කියන විභාග දෙකේම සම්පූර්ණ ප්‍රතිඵලවල විශ්ලේෂණාත්මක විග්‍රහය ඇතුළුව -වසරින් වසර මේ විභාගවල ප්‍රතිඵල වැඩි වෙලා තිබෙන ආකාරය දැක්වෙන- අධ්‍යාපනයේ අනිකුත් ප්‍රවණතා ඇතුළත් මේ සම්පූර්ණ වාර්තාවත් හැන්සාඩ් වාර්තාවට ඇතුළු කිරීම සඳහා මා **සභාගත*** කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තව එක කාරණයක් කියලා අවසන් කරනවා. අධ්‍යාපනයේ දර්ශක අනුව 1994දී ප්‍රාථමික අධ්‍යාපනයට ඇතුළු වීමේ ප්‍රතිශතය 89.2ක් වූ අතර, 2011 වන විට එය 98.26 දක්වා වැඩි වෙලා තිබෙනවා. ද්විතියික පාසල් සඳහා ශිෂ්‍ය පිවිසීමේ අනුපාතය වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම සාක්ෂරතාව වැඩි වෙලා තිබෙනවා. මේ දර්ශක අතරින් ප්‍රාථමික අධ්‍යාපනයෙන් ඈද හැලීමේ අනුපාතය අඩු වෙලා තිබෙනවා. ඒ සියලු විස්තරත් මා **සභාගත*** කරනවා.

මම අවසාන වශයෙන් කියන්නේ මේකයි. මේ දරුවන් ජාතියේ දරුවන්. ඔවුන් හදන්න අපි එකතු වෙලා වැඩ කරමු. මේ දරුවන් මිනීමරුවන් කරලා, ප්‍රචණ්ඩත්වයට නැඹුරු කරලා, රටට ආදරය කරන්නේ නැති මිනිසුන් බවට පත් කරලා ලබන සක්විති රජකමට වඩා, මේ දරුවන්ට අවශ්‍ය සම්පත් ටික දීලා කානුවක මැරිලා වැටෙන එක හොඳයි කියන කාරණය මතක් කරමින් මගේ වචන ස්වල්පය සමාප්ත කරනවා.

---

***පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

***සභාමේසය මත තබන ලද ලියවිල්ල :***
*சபாபீடத்தில் வைக்கப்பட்ட ஆவணம்:*
*Document tabled:*

2013 වර්ෂයේ දී 1 වසරට සිසුන් ඇතුළත් කිරීම

| පළාත | පාසල | ලැබුණු සමස්ත ඉල්ලුම්පත් සංඛ්‍යාව | පන්ති සංඛ්‍යාව | ඇතුළත් කරගත් සිසුන් ප්‍රමාණය |
|---|---|---|---|---|
| බස්නාහිර | රාජකීය විද්‍යාලය, කොළඹ | 2429 | 10 | 411 |
| | විශාඛා විද්‍යාලය, කොළඹ | 1908 | 05 | 210 |
| | පානදුර සුමංගල බා. වි. | 725 | 05 | 210 |
| මධ්‍යම | ධර්මරාජ විද්‍යාලය මහනුවර | 1105 | 05 | 210 |
| | මහාමායා බාලිකා විද්‍යාලය, මහනුවර | 1239 | 05 | 205 |
| දකුණ | රාහුල විද්‍යාලය, මාතර | 961 | 06 | 245 |
| | සුජාතා බා. විද්‍යාලය මාතර | 800 | 06 | 207 |
| | මහින්ද විද්‍යාලය ගාල්ල | 1060 | 05 | 208 |
| | රිච්මන්ඩ් විද්‍යාලය ගාල්ල | 1241 | 06 | 254 |
| | සංඝමිත්තා බා. විද්‍යාලය ගාල්ල | 1278 | 07 | 294 |
| වයඹ | මලියදේව පිරිමි විද්‍යාලය කුරුණෑගල | 843 | 06 | 250 |
| | මලියදේව බා.විද්‍යාලය කුරුණෑගල | 827 | 05 | 209 |
| සබරගමුව | ශා. ජෝෂප් බා. විද්‍යාලය කෑගල්ල | 1620 | 05 | 208 |
| | පර්ගසන් උසස් බා. විද්‍යාලය රත්නපුර | 1400 | 06 | 252 |

***එකල්හි වේලාව අ. භා.7.00 වුයෙන් මූලාසනාරූඪ මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2013 මාර්තු 08 වන සිකුරාදා අ. භා. 1.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது, பி. ப. 7.00 மணியாகிவிடவே தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*அதன்படி பாராளுமன்றம், 2013 மார்ச் 08, வெள்ளிக்கிழமை பி. ப. 1.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது*

*It being 7.00 p.m.,* MR. PRESIDING MEMBER *adjourned Parliament without Question put.*

*Adjourned accordingly until 1.30 p.m. on Friday, 08th March, 2013.*

# ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
## வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
## WRITTEN ANSWERS TO QUESTIONS

### පදියතලාව ජුම්මා දේවස්ථානය: දේපළ
### பதியதலாவ ஜும்மா பள்ளிவாசல்: ஆதனங்கள்
### PADIYATALAWA JUMMA MOSQUE: PROPERTIES

3009/’12

**1. ගරු මොහමඩ් අස්ලම් මහතා**
(மாண்புமிகு மொஹமட் அஸ்லம்)
(The Hon. Mohamed Aslam)
අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අම්පාර - මහනුවර ප්‍රධාන මාර්ගයේ පිහිටි පදියතලාව ජුම්මා දේවස්ථානය සඳහා වකුෆ් මණ්ඩලය විසින් අවසන් වරට භාරකරුවන් පත් කරනු ලැබූ දිනය කවරේද;

[ගරු මොහමඩ් අස්ලම් මහතා]

(ii) එම භාරකරුවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) ඔවුන්ට ලබාදුන් භාරකාරත්වය අවසන් වන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත සඳහන් මුස්ලිම් පල්ලියට අයත් ව්‍යාපාරික ස්ථාන සඳහා වකුෆ් පනතේ විධිවිධාන අනුව බදුගිවිසුම් නොමැති වීම නිසා එම දේපල එහි පදිංචිකරුවන්ගේ හෝ කළමනාකරුවන්ගේ ආධිපත්‍යයට යටත් දේපල බවට පත් වී තිබෙන බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) ඉහත (ආ) හි සඳහන් තත්ත්වය පිළිබඳව නොපමාව මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව මගින් විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමටත්;

(ii) එකී මුස්ලිම් පල්ලියට අයත් දේපල ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට උපදෙස් දීමටත්;

කටයුතු කරන්නේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) அம்பாறை - கண்டி பிரதான வீதியில் அமைந்துள்ள பதியதலாவ ஜும்மா பள்ளி வாசலுக்கு வக்பு சபையினால் இறுதியாக நம்பிக்கைப்பொறுப்பாளர்கள் நியமிக்கப்பட்ட திகதி யாதென்பதையும்;

(ii) மேற்படி நம்பிக்கைப் பொறுப்பாளர்களின் பெயர்கள் மற்றும் முகவரிகள் யாவை யென்பதையும்;

(iii) இவர்களுக்கு வழங்கப்பட்ட பொறுப்புடைமை முடிவுறும் திகதி யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) மேற்படி பள்ளிவாசலுக்கு சொந்தமான வர்த்தக நிலையங்களுக்கு வக்பு சட்டத்தின் ஏற்பாடுகளின் பிரகாரம் குத்தகை உடன்படிக்கைகள் இன்மையால் மேற்படி ஆதனங்கள் இவற்றில் வதிபவர்களின் அல்லது முகாமையாளர்களின் ஆதிக்கத்திற்கு உள்ளாகிய ஆதனங்களாக ஆகியுள்ளதை அவர் அறிவாரா?

(இ) (i) மேற்படி (ஆ)இல் குறிப்பிடப்பட்டுள்ள நிலைமை பற்றி முஸ்லிம் சமய, கலாசார அலுவல்கள் திணைக்களத்தின்மூலம் தாமதமின்றி முறை சார்ந்ததொரு விசாரணையை மேற்கொள் வதற்கும்;

(ii) மேற்படி முஸ்லிம் பள்ளிவாசலுக்கு சொந்தமான ஆதனங்களை பாதுகாப்பதற்குத் தேவையான நடவடிக்கைகளை மேற்கொள்வதற்கு ஆலோசனை வழங்குவதற்கும்

நடவடிக்கை எடுப்பாரா என்பதையும் அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he state—

(i) the date on which the trustees for the Padiyatalawa Jumma Mosque located on the Ampara-Kandy main road, were appointed for the last time by the Wakf Board ;

(ii) the names and addresses of those trustees ; and

(iii) the date on which the trusteeship entrusted to them lapses?

(b) Is he aware of the fact that the business establishments belonging to the aforesaid mosque have become properties of the persons who reside in them or manage them owing to non availability of lease agreements in terms of the provisions of the Wakf Act?

(c) Will he also state whether arrangements will be made to—

(i) initiate a formal inquiry into the state of affairs mentioned in (b) above through the Department of Muslim Religions and Cultural Affairs without delay; and

(ii) to give instructions to take necessary steps to preserve the properties belonging to the aforesaid mosque?

(d) If not, why ?

**ගරු දි.මු. ජයරත්න මහතා (අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு டி.எம்.ஜயரத்ன - பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சரும்)
(The Hon. D.M. Jayaratne - Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs)

(අ) (i) 2009.08.02.

(ii) නම: අල්හාජ් එම්.එම්. සිද්දික්
ලිපිනය : සිද්දික් ස්ටෝර්ස්, කෙළින් වීදිය, පදියතලාව
(2009.08.02 සිට 2010.08.01 දක්වා විශේෂ භාරකරු ලෙස ද, 2010.08.02 සිට නව භාරකාර මණ්ඩලය පත් කරන තෙක් පනතේ විධිවිධාන පරිදි ස්ථාන භාරකරු ලෙස ද කටයුතු කරයි.)

(iii) 2010.08.01.

නව භාරකාර මණ්ඩලයක් 2013.01.20 දින ඡන්ද විමසීමක් පවත්වා පත් කරගෙන ඇති අතර අදාළ නෛතික ලියකියවිලි දෙපාර්තමේන්තුව වෙත ලද පසු වකුෆ් මණ්ඩලය වෙත යොමු කර අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ.

(ආ) නැත.

(ඇ) (i) ඔව්.

(ii) ඔව්.

දැනටමත් බදු ගිවිසුම් කෙටුම්පත් කර වකුෆ් මණ්ඩලයේ අනුමැතිය සඳහා යොමු කර ඇත.

(ඈ) අදාළ නොවේ.

(அ) (i) 2009.08.02

(ii)பெயர்: அல்ஹாஜ் எம்.எம். சித்தீக்

முகவரி: சித்தீக் ஸ்டோர்ஸ், பிரதான வீதி,
பதியதலாவ.

2009.08.02 ஆம் திகதி முதல் 2010.08.01 வரை விசேட நம்பிக்கையாளராகவும் 2010.08.02 முதல் புதிய நம்பிக்கையாளர் சபை நியமிக்கப்படும் வரை வக்பு சபை விதிகளுக்கமைய நம்பிக்கைப் பொறுப்பாளராகவும் கடமையாற்றுகிறார்.

(iii) 2010.08.01

புதிய நம்பிக்கையாளர் சபையொன்று 2013.01.20ஆம் திகதிய வாக்கெடுப்புமூலம் நியமிக்கப்பட்டிருப்பதோடு, அதற்குரிய ஆவணங்கள் திணைக்களத்திற்கு கிடைத்ததன் பின்னர், வக்பு சபைக்கு சமர்ப்பித்துச் சபையின் அனுமதிக்குப் பின்னர், தேவையான நடவடிக்கைகள் மேற்கொள்ளப்படுமம்.

(ஆ) இல்லை.

(இ) (i)ஆம்.

(ii)ஆம். தற்போது ஆதனவரி நகல் பிரதி ஒன்றைத் தயாரித்து, வக்பு சபையின் அனுமதிக்காகச் சமர்ப்பித்துள்ளோம்.

(ஈ) பொருத்தமற்றது.

(a) (i) 02nd August, 2009

(ii) Name: Al-Haj M.M. Siddik

Address: Siddik Stores, Main Street,
Padiyatalawa

(He was appointed as the special trustee from 02nd August, 2009 to 01st of August, 2010 and thereafter he was functioning as person in charge of the mosque until new trustees are appointed as per the provisions of the Wakfs Act.)

(iii) 01st August, 2010

The new Board of Trustees has been selected on 20th January, 2013 by an election. They will be appointed as Trustees of the aforesaid mosque by the Wakf Board after receiving the legal documents.

(b) No.

(c ) (i) Yes.

(ii) Yes.

The Department has submitted a draft lease agreement to the Wakf Board for its approval.

(d) Not applicable.

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය**
**නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.**

**சந்தா ;** ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year .
Late applications for subscriptions will not be accepted.